# අභිධර්ම භාවනා

## (ධම්මසඞ්ගණී මාතිකා විභාගය)

**ප්‍රථම මුද්‍රණය - 1996**
**දෙවන මුද්‍රණය - 2009**
**නව මුද්‍රණය (තනි පොතක් ලෙස) - 2022 පෙබරවාරි**

**ප්‍රකාශනය**

පට්ඨාන ධර්ම සභාව
487/25, තිඹිරිගස්යාය පාර, නාරාහේන්පිට, කොළඹ 05.
දු.ක. 0112580417

**පරිගණක අක්ෂරකරණය සහ පිටුසැකසුම**

චේතක ජයසෝම

**සෝදුපත් බැලීම**
පට්ඨාන ධර්ම සභාවේ ආභිධම්මික ශිෂ්‍ය සංසදය

**මුද්‍රණය**
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැගිරිවත්ත පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
දු.ක 0112 809 499

# නව මුද්‍රණය ගැන . . .

සවිස්තරව චිත්ත, චෛතසික, රූප ධර්මයන් සංග්‍රහකොට ඇති බැවින් "ධම්මසඞ්ගණී" යැයි සුමඞ්ගල විලාසිනියෙහි දක්වා ඇත. නාමස්ඛන්ධය වශයෙන් දක්වන හැට පහක් (65) නාම ධර්මයෝද භූතරූප, උපාදා රූප වශයෙන් දෙපරිදිව දක්වන රූප ධර්මයෝ සත් විස්සක් ද (27) මෙහි සංග්‍රහ කොට ඇත. මෙසේ ධර්ම සංග්‍රහයක් වන ධම්මසඞ්ගණී ප්‍රකරණයඃ

- චිත්තුප්පාද කාණ්ඩය
- රූප කාණ්ඩය
- නික්ඛේප කාණ්ඩය
- අට්ඨකථා කාණ්ඩය

වශයෙන් චතුර්විධය. සියල්ල පරමාර්ථ ධර්මයෝය. රූප, වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ යැයි දක්වන පඤ්චවිධ ස්ඛන්ධයෝය.

චිත්තුප්පාද කාණ්ඩය වශයෙන් දක්වන මෙහි කොටස් දෙකකි. මාතිකා, පද භාජනීය වශයෙනි. මාතිකා යැයි දක්වා ඇති මාතෘකා පාඨයෝ කොටස් තුන බැගින් බෙදූ තික මාතිකා වශයෙන් ද කොටස් දෙක බැගින් බෙදූ දුක මාතිකා වශයෙන් ද සංග්‍රහ කොට ඇත.

පද භාජනීයේදී මාතිකාවන්ගේ දක්වන කරුණු ප්‍රභේද කොට විග්‍රහ කොට දක්වමින්ඃ

- ධම්මවවත්ථානු වාරය
- සංග්‍රහ වාරය
- සුඤ්ඤත වාරය

වශයෙන් ති වාරයකට බෙදූ ඇත. මෙම වාර සංග්‍රහයෙහි පදයන් පිළිබඳව දක්වන විභජනය මනහරය. චිත්තයත් චෛතසික ධර්මයත් පිළිබඳ පරිවාර වචන රාශියක යෙදුමෙන් එහි ගම්භීරතාවය වටහා ගත හැක.

මෙසේ මාතෘකා අනුමාතෘකා යටතේ විස්තර වන චිත්තුප්පාද කාණ්ඩය ධම්මසඞ්ගණියේ වැදගත් පරිච්ඡේදයකි. මෙහි සංගෘහිත මාතිකා අභිධම්ම සුත්තන්ත වශයෙන් ද්විවිධය. එහි අභිධම්ම මාතිකා දෙසිය හැට හයකි (266). සුත්තන්ත මාතිකා අසූ හතරකි (84) කි. පරිච්ඡේද පසළොසක් (15) පුරා විකසිත මාතිකා දේශනාව අභිධර්මය හැදෑරීමේදී අතිශයින් ප්‍රයෝජනවත් ය. ධම්මසඞ්ගණිය, ධාතුකථා, යමක, පට්ඨාන ආදී ප්‍රකරණයන් ඉගෙනීමේ යෙදෙන්නන් හට එය මනාව වැටහෙනු ඇත.

අභිධම්ම භාවනා.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක සහ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාධිපතිව වැඩවිසූ අග්ග මහා කම්මට්ඨානාචරිය ත්‍රිපිටක විශාරද අතිපූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම අභිධර්ම භාවනා පොත සම්පාදනය කොට ඇත. රාජ්‍යසේවා බෞද්ධ සඞ්ගමයේ ආරාධනාවෙන් මසකට වරක් පැවැත්වූ භාවනා පාඩම් පෙළ මෙම ගතට පෙරළී ඇත. ස්කන්ධ, ධාතු, ආයතන, සත්‍ය වශයෙන් බෙදූ නාම-රූප විදර්ශනාවට මාතිකා ඉදිරිපත් කොට ඇත. අතිපූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ පට්ඨාන ධර්ම සභාවට ද වැඩමවමින් අභිධර්ම දේශනා අභිධර්ම සම්මන්ත්‍රණ සිදුකිරීම් ආදියේදී මුලසුන හොබවමින් පට්ඨාන ධර්ම සභාවට මහත්සේ හිතෛශීව වැඩ සිටි බව ගෞරව පූර්වකව සිහිපත් කරමි.

පට්ඨාන ධර්ම සභාව ඇසුරෙන් ආභිධර්මෝත්ග්‍රහනයෙහි යෙදෙන අභිධර්මකාමීන් අභිධර්ම භාවනා ග්‍රන්ථ පරිශීලනය කරති. නිවැරදි ධර්ම ඥානයක් සඳහා උත්සුක වන ධර්ම කාමීන්හට මහෝපකාරයකි. ලංකාවේත් වෙනත් රටවලත් වාසය කරණ බොහෝ දෙනෙක් වාර්ෂිකව පට්ඨාන ධර්ම සභාව සමඟ සම්බන්ධ වී සප්තප්‍රකරණය ඉගෙනීමට උත්සුක වෙති. ඉන් අභිධම්මාචරිය, අභිධර්ම විශාරද උපාධි ලාභීන් බොහොමයක් බිහිවී ඇත.
මෙකී ආභිධම්මිකයින් විසින් මෙම අභිධර්ම භාවනා 1, 2 ග්‍රන්ථයන් එක පොතක් වන පරිදි මුද්‍රණය කිරීමට කටයුතු කිරීම මෙම නව මුද්‍රණයට හේතු විය. මුද්‍රණ දෝස ආදී සියල්ල සකසාලමින් මෙම නව මුද්‍රණයට උත්සුකවූ පට්ඨාන ධර්ම සභාවේ ආදී සිසු ආභිධම්මිකයිනට මෙහි ගෞරවය හිමිවිය යුතුය. අනාගත සිසුන්ගේ පරිහරණය පිණිස නොමිළයේ බෙදදීමේ අරමුණින් කළ අගනා ධර්ම දානයකි.

මාතිකාවන්ට ලියන ලද අර්ථ විග්‍රහයන් අතර 1910 වර්ෂයේදී ඌවේ, මිරහවත්තේ පුෂ්පාරාමාධිපති පූජ්‍යතම විමලසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ලියන ලද "අභිධම්මමාතිකාපාලිය හා සුත්තන්තමාතිකාපාලිය පදර්තත්ථ, භාවාර්තත්ථ සන්න ගණ්ඨිපද විවරණය" නම් ග්‍රන්ථයද,

1949 වර්ෂයේ බදුල්ලේ සොරණාතොට අභිධම්මාචරිය සද්ධම්මපාල රත්නායක දසසිල් උපාසක තුමා විසින් ලියන ලද "විස්තර සහිත අභිධම්මමාතිකා පාළි ව්‍යාඛ්‍යානය" ද අප සතුව ඇත. ඉහත කී ග්‍රන්ථ දෙකම අභිධර්ම භාවනා ග්‍රන්ථයටද පූර්වාදර්ශය වී ඇති බව එම ග්‍රන්ථයන්

සැසඳීමේදී පෙනීයන්නකි. එකී පූර්වාචාර්‍ය උත්‍තුමෝද මෙහිදී මහත් කෘතවේදීව සිහිපත් කරමි.

මෙකී අභිධර්ම භාවනා ග්‍රන්ථය අභිධර්ම අධ්‍යනයේදී සොයා ගැනීමේ දුලබ බව වටහා ගත් අප ආදිශිෂ්‍ය ආභිධම්මිකයින් නව මුද්‍රණය සඳහා සකස් කළ මෙය ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ලේඛකාධිකාරී ත්‍රිපිටකාචාර්‍ය අතිපූජනීය කහගොල්ලේ සෝමවංශ නායක ස්වාමින් වහන්සේ වෙත මුද්‍රණයට අවසරය සඳහා ඉදිරිපත් කළෙමි. එහි වැදගත්කම වටහා ගත් ගරුතර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ කාරුණික අවසරය මහත් කෘතවේදීව සිහිපත් කොට පුණ්‍යානුමෝදනා කරමි.

මෙම උතුම් ධර්ම දානයෙන් ලත් කුසලය පට්ඨාන ධර්ම සභාවේ සමුත්පාදක අතිපූජනීය ආභිධම්මික වාගීශ්වර යාගොඩ ධර්මප්‍රභ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත ආචාර්‍යභක්තිපූර්වකව අනුමෝදන් කරමි. පට්ඨාන ධර්ම සභාවේ ගරු සභාපති තුමන් ප්‍රමුඛ නිළධාරී මණ්ඩලයද නිස්සරණාද්ධ්‍යාශයෙන් යුතුව තම කාලය දනුම ධර්මකාමීන් වෙත යොමු කරමින් බොදු ජනතාව අතර ආභිධම්මිකයින් බිහි කිරීමේ මහඟු උත්සාහයක යෙදෙන අප ධර්මාචාර්‍ය මණ්ඩලයද සිහිපත් කරණුයේ ඉමහත් කෘතවේදීව ය. මෙම මුද්‍රණය සඳහා බරපැන දරා ධර්ම දානයට එකතු වූ සැදැහැවත්හු ද, සෝබනව මුද්‍රණය කර දුන් දෙල්කඳ කොලිටි මුද්‍රණාලයාධිපති තුමන් ද, දහම් නැණ මුදුන්පත් කර ගනිත්වා!

**කොරතොට වෙස්සභූ මහා ස්ථවිර,**
පට්ඨාන ධර්ම සභාවේ අනුශාසක සහ අධ්‍යක්ෂ
2021.12.22.

**වර්ෂ 1996 දී අභිධර්ම භාවනා පොත මුද්‍රණයේ දී**
**අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම නාහිමිපාණන් වහන්සේ ඉදිරිපත් කළ**

# පෙරවදන

සියලු බුදු ගුණ සම්පිණ්ඩනය වන ඉතිපිසෝ ගාථා පාඨයේ නව වැනි භගවා බුදුගුණය විසුද්ධි මාර්ගයෙහි අර්ථ සයකින් විග්‍රහ කොට ඇත. ''භාග්‍යවා භග්ගවා යුත්තෝ - භගේහි ච විභත්තවා, භත්තවා වන්ත ගමනෝ භවෙසු භගවා තතෝ'' විසුද්ධි මාර්ගයෙහි එන මෙම ගාථාවෙහි තේරුම මෙසේ ය.

1. පුණ්‍ය භාග්‍යය ඇත්තේ, 2. කෙලෙසුන් හා පඤ්චමාරයන්බිඳින ලද්දේ. 3. භාග්‍ය ධර්ම සයෙකින් යුක්ත වූයේ, 4. ලෞකික ලෝකෝත්තර ධර්ම බෙදන ලද්දේ, 5. උත්තරීමනුෂ්‍ය ධර්මයන් භජනය කරන ලද්දේ, 6. සසර භව ගමන වමාරන ලදදේ ද, එසේ හෙයින් භගවා නම් වන සේක.

මෙහි සතර වැනි තේරුම වනුයේ ලෞකික ලෝකෝත්තර ධර්මයන් බෙදමින් ධර්ම දේශනා කළ වග ය. බුදු බවට පත් වූ අළුයම අර්හත් මාර්ගඵලාවබෝධයත් සමග පෙර පසු නොවී සියල්ල දත්තා වූ සර්වඥතාඥානය ප්‍රධාන කොට ඇති සියලු බුදු ගුණ සියලු බුදු නැණ එකවිට සමෘද්ධ වූයේ බෝධි සම්භාර පිරීමේ ප්‍රතිඵල වශයෙනි.

බුදුවීමෙන් සතර වැනි සතියෙහි රතනාඝරයෙහි වැඩහිඳ සතියක් තුළදී ධර්මය සම්මර්ශනය කළ සේක. බුදුවීමෙන් දෙවැනි වූ ඇසළ පුර පසළොස්වක දින ඇරඹූ ධර්ම දේශනාව පුරා පන්සාලිස් වසක් තිස්සේ අවස්ථානුකූලව පැවැත්වූ සේක. සකල බුද්ධ ධර්මය ස්කන්ධ වශයෙන් අසූසාර දහසකි. අංග වශයෙන් දෙකකි. නිකාය වශයෙන් පසකි. පිටක වශයෙන් තුනකි. ධර්ම විනය වශයෙන් දෙකකි. රස වශයෙන් එකකි.

මහා සාගරයේ ජලය බින්දුවක් පාසා එක ම ලුණු රසයෙන් රස වුවා සේ බුද්ධ ධර්මයේ අකුරක් පාසා ඇත්තේ එකම විමුක්ති රසය යි. එයම ධර්ම, විනය වශයෙන් දෙවැදෑරුම් වන අතර ධර්මය - ධර්ම - අභිධර්ම නමින් බෙදෙන බැවින් විනය - සූත්‍ර - අභිධර්ම වශයෙන් පිටක තුනකින් යුක්ත වෙයි. ආඥා දේසනා, වෝහාර දේශනා පරමත්ථ දේශනා නමින් තුන් පිටකය හැඳින්වේ. අණදීමට සුදුසු වූ සර්වඥයන් වහන්සේගේ විනය පිටකය ආඥා දේශනාව යි. ලෞකික මහජනතාවගේ ව්‍යවහාරයට ගැලපෙන පරිදි සම්මුතියෙහි පිහිටා වදාරන ලද සූත්‍ර පිටකය වෝහාර දේශනාව ය. පරමාර්ථ

සතර ඉතිරි නැතිව විග්‍රහ කරන අභිධර්ම පිටකය, පරමත්ථ දේශනාව නමින් හැඳින්වේ.

තවද විනය පිටකය යථාපරාධ සාසනය, සූත්‍ර පිටකය යථානුලෝම සාසනය, අභිධර්ම පිටකය යථා ධර්ම සාසනයයි ද, විනය පිටකය සංවරාසංවර කථාය, සූත්‍ර පිටකය දිට්ඨි විනිවේඨන කථාය, අභිධර්ම පිටකය නාමරූප පරිච්ඡේද කථා යයි ද, විනය පිටකය අධිසීල සික්ඛා යයි ද, සූත්‍රාන්ත පිටකය අධිචිත්ත සික්ඛා යයි ද, අභිධර්ම පිටකය අධිපඤ්ඤා සික්ඛා යයි ද, විනය පිටකය තදංග ප්‍රහාණ යයි ද, සූත්‍ර පිටකය වික්ඛම්භන ප්‍රහාණ යයි ද, අභිධර්ම පිටකය සමුච්ඡේද ප්‍රහාණ යයි ද බෙදා වදාරන ලද්දේ අර්ථාන්විත දේශනාවන් බැවිනි.

මේ විග්‍රහයන් අතුරෙන් අභිධර්ම පිටකය පරමාර්ථ දේශනාවකි. යථා ධර්ම ශාසනයකි. නාමරූප පරිච්ඡේද කථාවකි. අධි ප්‍රඥා ශික්ෂාවකි. සමුච්ඡේද ප්‍රහාණයකි. අර්ථ ගාම්භීර ධර්ම ගාම්භිර දේශනා ගාම්භීර ප්‍රතිවේධ ගාම්භීර ධර්මයෙකි. එසේ හෙයින් සූත්‍රාන්ත ධර්මයෙන් අභිධර්මය විශේෂ ධර්මයකි. අතිරේක ධර්මයකි.

සූත්‍රාන්ත පිටකයෙහි නාමරූපය දක්වනුයේ ඒකදේශ මාත්‍රයකිනි. අභිධර්ම පිටකයෙහි වනාහි ඉතිරි නැතිව නාම රූප බෙදා දක්වේ. සූත්‍රාන්තයෙහි ස්කන්ධ, ආයතන, ධාතු, ආර්ය සත්‍ය ධර්මයන් දක්වෙනුයේ ඒකදේශ මාත්‍රයෙනි. අභිධර්මයෙහි වනාහි නිරවශේෂ ව ඒ ධර්මයන් බෙද බෙදා දක්වනු ලැබෙන බැවින් අභිධර්මය සූත්‍රාන්ත පිටකයට වඩා විශේෂ වූ ද, අධික වූ ද, අතිරේක වූ ද පරමාර්ථ ධර්ම විග්‍රහයකි. අභිධර්ම සප්තප්‍රකරණය ම විදර්ශනා භාවනාවකි. එහෙත් එය අති විස්තාර බැවින් අනුපිළිවෙළින් විදර්ශනා මාර්ගයට ගොනුකරගත යුතුව ඇත.

කොළඹ රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මගින් 1984 ජුනි 06 දින ආරම්භ කරන ලද මාසික භාවනා පාඩම් පෙළ අනුව චතුරා රක්ෂා භාවනාව ආදිකොට සම සතලිස් සමථ භාවනාවත්, සතර සතිපට්ඨාන සහිත සවිස්තර විදර්ශනා භාවනාවත් සපුරා ග්‍රන්ථ සතකින් ප්‍රකාශයට පත්කොට ඇත. ඉන් අනතුරු ව අභිධර්ම පිටකය අනුව විදර්ශනා භාවනා පටන්ගෙන පුරා වසර දෙකකින් තික මාතිකාව නිමවා අභිධර්ම විදර්ශනා භාවනා ග්‍රන්ථය මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අභිධර්ම සප්ත ප්‍රකරණයට ම සාධාරණ වන ධම්මසංගණී මාතිකා අතුරෙන් තික මාතිකා දෙවිස්ස මෙහි ඇතුලත් වෙයි. චිත්ත චෛතසික රූප නිර්වාණ යන සතර පරමාර්ථය ම ස්කන්ධ ආයතන ධාතු ආර්ය සත්‍යයට

නංවා භාවනා වඩන ආකාරය පළමු වැනි පාඩමෙහි දක්වෙයි. තික මාතිකා දෙවිස්සට අනුපිළිවෙළින් භාවනා පාඩම් දෙවිස්සක් ඉදිරිපත් කොට ඇත. ප්‍රයෝගික වශයෙන් මේ අභිධර්ම විදර්ශනා භාවනා පාඩම් හදාරන ගිහි පැවිදි යෝගාවචරයනට මෙයින් ලැබෙන ආභාසයත් අවබෝධයත් අති විශාලවනු ඇත.

සිත් අසූනවය අතුරෙන් එකක් පාසා ස්කන්ධ ආයතන ධාතු ආර්ය සත්‍යයනට බෙද බෙදා සම්මර්ශනය කළ හැකිය. චෛතසික දෙපනස අතුරෙන් එකක් පාසා ද, අටවිසි රූපය අතුරෙන් එක එකක් ද අසංඛත ධාතු නිර්වාණය ද යන සියල්ල එකක් පාසා ස්කන්ධ - ආයතන - ධාතු - ආර්ය සත්‍යයට නංවමින් බෙද බෙදා බැලිය හැකි ය.

නිදසුනක් - සිත් අසූනවය ස්කන්ධ වශයෙන් විඥානස්කන්ධයකි. ආයතන වශයෙන් මනායතනයකි. ධාතු වශයෙන් සතකි. චක්ඛුවිඤ්ඤාණ සිත් 2 චක්ඛු විඤ්ඤාණ ධාතුවයි, සෝත විඤ්ඤාණ සිත් 2 සෝත විඤ්ඤාණ ධාතුවයි, ඝාන විඤ්ඤාණ සිත් 2 ඝාන විඤ්ඤාණ ධාතුවයි, ජිව්හා විඤ්ඤාණ සිත් 2 ජිව්හා විඤ්ඤාණ ධාතුවයි, කාය විඤ්ඤාණ සිත් 2 කාය විඤ්ඤාණ ධාතුවයි, පඤ්චද්වාරාවර්ජනය හා සම්පටිච්ඡන දෙක ද යන සිත් තුන මනෝ ධාතුව ය. ඉතිරි සිත් සැත්තෑසයම මනෝ විඤ්ඤාණ ධාතුව ය. ආර්ය සත්‍ය වශයෙන් ලෞකික සිත් එක් අසූව ම දුක්ඛ සත්‍යයකි. ලෝකෝත්තර සිත් අට දෙන ම සත්‍ය විනිර්මක්ත ය. දෙපනස් චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධයකි. සංඥාව සංඥාස්කන්ධයකි. ඉතිරි චෛතසික සමපනස ම සංස්කාරස්කන්ධයකි. ආයතන වශයෙන් දෙපනස් චෛතසිකය ම ධම්මායතනයකි. ධාතු වශයෙන් ධර්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් ලෞකික සිත්හි යෙදෙන චෛතසික අතුරෙන් ලෝභය හැර ඉතිරි එක් පනස දුක්ඛසත්‍යයකි. ලෝභය සමුදය සත්‍යයකි. මාර්ග සිත් සතරෙහි ප්‍රඥා - විතර්ක - සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව - වීර්ය - සතිය - ඒකග්ගතා යන අට දෙන මාර්ග සත්‍යයකි. ඉතිරි චෛතසික විසි අට දෙනා ද ඵලසිත් සතරේ චෛතසික සතිස ද සත්‍ය විනිර්මුක්ත ය.

නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත ය ; ධර්මායතනයකි ; ධර්ම ධාතුවකි. නිරෝධ සත්‍යයකි. ලෝකෝත්තර ධර්ම කිසිවක් ම අනිත්‍යාදී ත්‍රිලක්‍ෂණයට නංවා විදර්ශනා නොකරනු ලැබේ. එහෙත් ශාන්ත ප්‍රණීත වශයෙන් මෙනෙහි කළ යුතුවන බැවින් ඒ පිළිබඳ ධර්ම විභාග උගත යුතුම වන බව සැළකිය යුතු ය.

ඉහත සඳහන් නිදසුන අනුව මේ පාඩම් පෙළ හදාරන බෞද්ධයනට සදොරින් ගනු ලැබෙන සෑම අරමුණක් ම කුසලත්‍රික මාතිකා ආදී එක එකක්

ගෙන ස්කන්ධ ආයතන ධාතු ආර්ය සත්‍යයට නංවමින් විසිතුරු ලෙස විදර්ශනා මාර්ගයෙහි ඉදිරියට යා හැකි වනු ඇත. බුද්ධ ධර්මයෙහි සාරවත් වූ සතර පරමාර්ථ ධර්මයන් අනුව කෙරෙන විදර්ශනා මාර්ගයක් මේ භාවනා ග්‍රන්යෙන් ප්‍රකාශ වන බැවින් ධර්මකාමී සියලු දෙනා විසින් ම මෙය සාවධානව නැවත නැවතත් කියවා අවබෝධ කරගනු ලැබේවා. ප්‍රායෝගික වශයෙන් මේ විදර්ශනා භාවනාවෙහි යෙදෙනු ලැබේවා.

මේ භාවනා මාර්ගය ඉතා මැනැවැයි හෘදයංගම ආශිර්වාද පූර්වාංගම ව අනුමත කොට වදාළ, රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ ප්‍රධාන අනුශාසක, අග්ගමහා පණ්ඩිත විද්‍යා විශාරද අතිපූජනීය මඩියේ පඤ්ඤාසීහාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේට සහ අස්මදාචාර්යෝත්තම අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන, ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක ප්‍රධාන අනුශාසක මාහිමිපාණන් වහන්සේට ද නිදුක් නිරෝගී සුවපත් භාවයෙන් විංශත් ශත වර්‍ෂාධික කාලයක් දීර්‍ඝායු ශ්‍රී සම්පත්තිය ද මතු උතුම් ලොවුතුරා බුදුබව ද අත්වේවායි පතමින් ගෞරවාදර භක්ත්‍යාවන්තව නමස්කාර කරමි.

භාවනා ග්‍රන්ථය මුද්‍රණය කරවීමෙහිලා පූර්ණ අනුග්‍රහය දැක්වූ ගරු බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමාණන්ට ද කොළඹ රජයේ මුද්‍රණාලයාධිපතිතුමාණන්ට ද, රාජ්‍ය සේවා බෞද්ධ සංගමයට ද, මාසික භාවනා පන්තියට සහභාගී වන සැමට ද රත්නත්‍රයාශිර්වාදයෙන් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් සිදුධ ව ශාන්ත නිර්වාණාවබෝධයට හේතු වාසනා වේවා. මෙය කියවන භාවිත කරන සැමටත් විදර්ශනා භාවනා මාර්ගය ආලෝකමත් වේවා. ධර්මඥාන භාවනාඥාන මුදුන්පත් වේවා. ශාන්ති නිර්වාණධාතුව සාක්‍ෂාත් වේවා.

''සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා''

මෙයට,<br>
**මෙතැති, නාඋයනේ අරියධම්ම ස්ථවිර**<br>
ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය,<br>
ගල්දූව,<br>
කහව.<br>
2540 - 1996.07.19

**වර්ෂ 1996 දී අභිධර්ම භාවනා පොත මුද්‍රණයේ දී**
**අතිපූජ්‍ය මඩියේ පඤ්ඤාසීහ මහානායක හිමිපාණන් වහන්සේ ලබාදුන් ලිපිය**

# භාවනාව නම් කවරේ ද?

''භාවෙති කුසලධම්මෙ ආසෙවති වඩ්ඪෙති එතායාති භාවනා'' යනු නිර්වචන හෙයින් යම් චේතනාවක් කරන කොට ගෙනැ කුසල ධර්මයන් වැඩේ ද, වැඩි දියුණු කෙරේ ද ඒ චේතනාව භාවනා නම් වේ.

භාවනා නම් වැඩීම යි. දියුණු කිරීම යි. කුමක් වැඩීම ද? සිත යහපත් අරමුණෙක්හි වැඩීම යි. නොයෙක් අරමුණු ගැනීම් වශයෙන් එහෙ මෙහෙ විසිර යෑම සිතේ සාමාන්‍ය ස්වභාවය යි. එහෙයින් ඉෂ්ටාරම්මණයෙහි ඇලීමත් අනිෂ්ටාරම්මණයෙහි ගැටීමත් ඇති වෙයි. එයින් අකුසල චේතනා පහළ වෙති. එසේ එහෙ මෙහෙ විසිර යා නොදී යහපත් අරමුණෙක්හි මැ නැවත නැවත ඉපදවීම් වශයෙන් බැඳ තැබීමෙන් සිත ස්ථිර වෙයි. එයින් කුසල චේතනා බහුල වෙයි. සුළු සුළු කරුණුවල දී ඇලීම් ගැටීම් අඩු වෙයි. එයින් අකුසල චේතනා ද අඩු වෙයි. තේරුම් ගැනීමේ පහසුව සඳහා ගල්ඔය මහවැවේ වේල්ල ගැන සිතා බලන්න.

ඒ වේල්ල තනා ඇත්තේ වැලිවලිනි. සාමාන්‍යයෙන් වැලි විසිරී තිබෙන විට සුළු වතුර පාරකට ද සේදී යයි. එසේ වූ වැලි රියන අඟලට බසින සේ එහි එහි මැ තද කැර ස්ථිර කිරීම නිසා මහ වතුර පාරකට ද ගසා ගෙනැ නො යයි. එසේ ම ඉතා සුළු ඉෂ්ටානිෂ්ට අරමුණක දී පවා විසිර යන සිත මෙසේ එක්මැ අරමුණෙක්හි නැවත නැවත ඉපදීම් වශයෙන් ස්ථිර කැරැ ගත් විට අතිශයින් ඉෂ්ටානිෂ්ට ආරම්මණයක දී හෝ විසිරැ යා නොදී රැක ගත හැකි වෙයි. එයින් කුසල චේතනා බහුල වෙයි. අකුසල චේතනා අඩු වෙයි. භාවනාවෙන් කුසල ධර්මයන් වැඩේ යැයි කීවේ එහෙයිනි.

## කවර හෙයින් භාවනා අවශ්‍ය ද?

බුද්ධ ධර්මය නො දන්නාහු ද දන්නවා යැයි සිතා ගත්තාහු ද බුද්ධ ධර්මය පරලොවට තිබෙන ආගමෙකැ යි සිතති, කියති. එබඳු අන්ධබාල පෘථග්ජනයනට අනුකම්පා කරනවා හැරැ අන් කරන්නට දෙයක් නැත. බුද්ධාගම මෙලොවට තිබෙන ධර්මයෙකි. මෙලොවැ හොඳින් සිටියොත් පරලොව ද හොඳ වන බව යි, බුද්ධාගමේ උගන්වන්නේ. බුද්ධාගමෙහි තිබෙන කරුණුවලින් සියයට අසූවක් පමණ මෙලොවැ

දියුණුවටයි. සාධකයක් වශයෙන් ගත්තොත් බුද්ධාගමෙහි උසස් ම පිළිවෙත් වන සීල භාවනා දෙකින් මනා ව වැටහෙනු ඇත. ශීලයෙහි ප්‍රධාන ආනිසංස පසෙකි. එයින් හතරක් මෙලොවට යි, එක යි පරලොවට. භාවනාවෙහි විශේෂයෙන් මෛත්‍රී භාවනාවෙහි ආනිසංස එකොළොසෙකි. එයින් දහයක් මෙලොවට යි, එක යි පරලොවට. භාවනාවෙහි ආනිසංසයෝ බොහෝ ය.

## අභිධමම භාවනා

අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මහා ස්ථවිරයන් වහන්සේ වර්තමාන යුගයෙහි වාසය කරන උත්තරීතර කම්මට්ඨානාචරීය මහා ස්ථවිරයන් වහන්සේ නමකි. උන්වහන්සේගේ ආචාර්යපාදයන් වහන්සේ ද උගත් සිල්වත් ගුණවත් මහ තෙරුන් වහන්සේ නමකි.

අරියධම්ම මහා ස්ථවිරයන් වහන්සේ ත්‍රිපිටකය හොඳින් හදාරා ජීවිතයට සම්බන්ධ කර ගෙන කහව ගල්දූව ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මූලස්ථානයෙහි වාසය කෙරෙමින් විශාල ශිෂ්‍ය පිරිසක් හදාගෙන යෝගාශ්‍රම රාශියක් පාලනය කරමින් සිටින උතුමෙකි.

අරියධම්ම මහා ස්ථවිරයන් වහන්සේ අභිධම්ම භාවනා නමින් ධර්මානුකූලව අළුත් භාවනා ක්‍රමයක් සම්පාදනය කොට ඇත. එය දක්නට ලැබුණේ නැත. අරියධම්ම මහා ස්ථවිරයන් වහන්සේගේ බලාපොරොත්තුව නිවන් මග පැහැදිලි කොට ජනතාව ඒ මග යවන්නට උත්සාහ දැරීම යි. ඒ බලාපොරොත්තුව සඵල වේවා යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

මේ උතුම් මාර්ගය සැදැහැවත් මහා ජනයා අතට පත් කිරීමට පොත් මුද්‍රණය කරවන බුද්ධ ශාසන අමාත්‍යාංශයටත් සහාය දෙන හැම දෙනාටත් ධර්ම දානමය පිනෙන් නිවන් සුව අත් වේවා.

**මඩිහේ පඤ්ඤාසීහ,**
ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ
උත්තරීතර මහානායක ස්ථවිර

# භාවනාවේ ඇති වැදගත්කම

භාවනාවේ බුඬධර්‍මයෙහි සඳහන් වන උසස් ම පිළිවෙතකි. නිවන් මග සීල සමාධි පඤ්ඤා යන ගුණකඳු තුනෙන් සම්පූර්ණ වෙයි. එයින් සමාධි පඤ්ඤා දෙකෙන් ම කියැවෙන්නේ භාවනා ය. එහෙයින් නිවන් දැකීමට භාවනා නැතිව ම බැරි බව සක්සුදක් සේ පැහැදිලි ය.

වර්‍තමාන ලෝකයෙහි භාවනාව පිළිබඳ මහත් උද්‍යෝගයක් ඇති වී තිබේ. එහෙයින් භාවනාක්‍රම ද රාශියක් බිහි වී ඇත. දැන් භාවනාව ද වැරදි අතට හරවා කොතරම් දුර ගොස් තිබේ දැයි කිව හොත් සමහරු මුදල් උපයන ව්‍යාපාර බවට ද යොදා ගෙන ඇත. එහෙයින් බෞද්ධයන් නුවණින් ක්‍රියා කළ යුතු වැ ඇත. මග දැන ගෙන ගියොත් කතරගම ය, නො දැන ගියොත් අතරමග යැයි කීවා සේ භාවනා දැන හැඳින ගියොත් නිර්‍වාණාවබෝධය යි. නො දැන ගියොත් සංසාරසාගරය යි යන්න සිත තබා ගත යුතු වේ.

බෞධයන් භාවනා කරන්නෙ නිර්‍වාණාවබෝධය පරමාධ්‍යාශය කැර ගෙන ය. ඒ අතර ම දිට්ඨධම්ම වෙදනීය උපපජ්ජවෙදනීය හා අපරාපරියවෙදනීය වශයෙන් ලැබෙන ඉෂ්ටවිපාක ද දනිති. ඒ බෞධයෝ නිර්‍වාණාවබෝධය කරන ආකාර වශයෙන් සතරකට බෙදෙති. එනම්. 1. උද්ඝටිතඥ, 2. විපචිතඥ, 3. නෙය්‍ය, 4. පදපරම යනු යි. ඒ පුද්ගලයන් සතර දෙනා පුග්ගලපඤ්ඤත්තිප්පකරණයෙහි විස්තර කැරැ ඇත.

ධර්‍මපදය යම්තම් නගා දැක්වූ කල්හි ම ධර්‍මාවබෝධය වන පුද්ගලයා උද්ඝටිතඥ නම් වේ. සැකෙවින් දේශිත ධර්‍මය විස්තර කරන කල්හි ධර්‍මාවබෝධය වන පුද්ගලයා විපචිතඥ නම් වේ. ධර්‍මය උදෙසීමෙන් පිළිවිසීමෙන් කරුණු වශයෙන් මෙනෙහි කිරීමෙන් කල්‍යාණ මිත්‍රයන් සේවනයෙන් භජනයෙන් ළං වැ ඇසුරු කිරීමෙන් ද යන පිළිවෙළින් ධර්‍මාභිසමය වන පුද්ගලයා නෙය්‍ය නම් වේ. ධර්‍මය බොහෝ කොට අසන්නේ බොහෝ කොට කියන්නේ බොහෝ කො දැන්නේ බොහෝ කොට උගන්වන්නේ නමුදු එම ජාතියෙහි ධර්‍මාභිසමය නොවන පුද්ගලයා පදපරම නම් වේ. මෙම සතරාකාර පුද්ගලයන්ගේ ගති ලක්‍ෂණ දැක්වූයේ ඉතා කෙටියෙනි.

පූජ්‍යපාද නාඋයනේ අරියධම්ම මහා ස්ථවිරයන් වහන්සේ අභිධම්ම භාවනා නමින් ධර්‍මානුකූලව බොහෝ දෙනාට එතරම් පලපුරුදු නැති භාවනා ක්‍රමයක් සම්පාදනය කොට ඇත. ප්‍රථම භාගය දැනට මුද්‍රණය වී

ඇත. ඉතිරි කොටස් ද සැහැදෑවත් මහ ජනයා අතට පත්කිරීමට උත්සාහවත් වී පින්කමකි. රාජ්‍ය සේවා බෞද්ධ සංගමය බුධජයන්තිය අනුස්මරණය කිරීම සඳහා පිහිට වූ සංගමයකි. සම්බුද්ධ ශාසනයේ උනන්තියත් බෞද්ධ ප්‍රබෝධය සඳහාත් රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මගින් සිදුවන සේවය ඉතා වැදගත් ය. මෙම උතුම් ක්‍රියාවනට මුල් වූ රාජ්‍ය සේවා බෞද්ධ සංගමයටත් මුද්‍රණ දායකත්වය සපයන පින්වතුන්ටත් සහාය දෙන හැමදෙනාටත් ධර්ම දානමය පිනෙන් නිවන් සුව අත් වෙවා!

**මඩියේ පඤ්ඤාසීහ මහානායක ස්ථවිර**
ශ්‍රී ලංකා අමරපුර මහා සංඝසභාවේ
උත්තරීතර මාහිමිපාණෝ

**පටුන** පිටුව


01 වැනි පාඩම - සබ්බත්ථික මාතිකා

02 වැනි පාඩම - කුසල ත්‍රිකය

03 වැනි පාඩම - වේදනා ත්‍රිකය

04 වැනි පාඩම - විපාක ත්‍රිකය

05 වැනි පාඩම - උපාදින්න ත්‍රිකය

06 වැනි පාඩම - සංකිලිට්ඨ ත්‍රිකය

07 වැනි පාඩම - විතර්ක ත්‍රිකය

08 වැනි පාඩම - ප්‍රීති ත්‍රිකය

09 වැනි පාඩම - දස්සන ත්‍රිකය

10 වැනි පාඩම - දස්සනහේතු ත්‍රිකය

11 වැනි පාඩම - ආචයගාමී ත්‍රිකය

12 වැනි පාඩම - සෙක්ඛ ත්‍රිකය

13 වැනි පාඩම - පරිත්ත ත්‍රිකය

14 වැනි පාඩම - පරිත්තාරම්මණ ත්‍රිකය

15 වැනි පාඩම - හීන ත්‍රිකය

16 වැනි පාඩම - මිච්ඡත්ත ත්‍රිකය

17 වැනි පාඩම - මග්ගාරම්මණ ත්‍රිකය

18 වැනි පාඩම - උප්පන්න ත්‍රිකය

19 වැනි පාඩම - අතීත ත්‍රිකය

20 වැනි පාඩම - අතීතාරම්මණ ත්‍රිකය

21 වැනි පාඩම - අජ්ඣත්ත ත්‍රිකය

22 වැනි පාඩම - අජ්ඣත්තාරම්මණ ත්‍රිකය

23 වැනි පාඩම - සනිදස්සන ත්‍රිකය

01 වැනි පාඩම - හේතු ගොච්ඡකය

02 වැනි පාඩම - චූල්ලන්තර දුකය

03 වැනි පාඩම - ආසව ගොච්ඡකය

04 වැනි පාඩම - සංයෝජන ගොච්ඡකය

05 වැනි පාඩම - ගන්ථ ගොච්ඡකය

06 වැනි පාඩම - ඕඝ ගොච්ඡකය

07 වැනි පාඩම - යෝග ගොච්ඡකය

08 වැනි පාඩම - නීවරණ ගොච්ඡකය

09 වැනි පාඩම - පරාමාස ගොච්ඡකය

10 වැනි පාඩම - මහන්තර දුකය

11 වැනි පාඩම - උපාදාන ගොච්ඡකය


12 වැනි පාඩම - කිලේස ගොච්ඡකය

13 වැනි පාඩම - පිට්ඨි දුකය - 01 වැනි කොටස (01 - 14)

14 වැනි පාඩම - පිට්ඨි දුකය - 02 වැනි කොටස (15 - 18)

15 වැනි පාඩම - සූත්‍රාන්ත මාතිකා - 01 වැනි කොටස (01 - 22)

16 වැනි පාඩම - සූත්‍රාන්ත මාතිකා - 02 වැනි කොටස (23-42)



ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති මහා කම්මට්ඨානාචරිය අතිපූජනීය

නාඋයනේ අරියධම්ම අනුනායක මහා ස්වාමීන්වහන්සේ

# අභිධර්ම භාවනා

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් තිස්සේ පිරූ බෝධිසම්භාර හේතුවෙන් දඹදිව නේරඤ්ජරා නදී තීරයෙහි බුද්ධගයා ශුද්ධ භූමියෙහි පිහිටි බෝධි මණ්ඩලයේ දී උපතින් පන්තිස් (35) වන වසරෙහි වෙසක් පුර පසළොස්වක් පොහෝ දින අළුයම් කාලයේ දී සර්වඥතා ඥාන ප්‍රතිලාභයත් සමග පෙරපසු නොවී ගාම්භීර අභිධර්මය ස්වයම්භූ ඥානයෙන් අවබෝධ කොට දැන වදාළ සේක.

02. බුද්ධත්වයට පත්වීමෙන් පසු සතර වැනි රතනඝර සතියේ දී ගාම්භීර අභිධර්මය සම්මර්ශනය කරමින් ශ්‍රී බුද්ධ දේහයෙන් සවණක් ඝන බුද්ධරශ්මීන් විහිදුවමින් ඥාන ක්‍රීඩාවක් මෙන් ආවර්ජනා කළසේක. බුද්ධත්වයෙන් සත්වැනි වසරෙහි සැවැත් නුවර දී යමා මහ පෙළහැර පා වදාරා තව්තිසා භවනයට වැඩම කරවා වස්සාන තුන්මාසයක් තිස්සේ මාතෘ දිව්‍යරාජයාණන් ප්‍රධාන දසදහසක් සක්වල දෙවිබඹුන් මැද අතිවිස්තාර අභිධර්මය දේශනා කොට වදාළ සේක.

03. දින අනූවක් තිස්සේ අතරක් නැතිව අභිධර්ම දේශනය පවත්වමින් සැමදා දිවා පිණ්ඩපාත වේලාව සලකා නිර්මිත බුදු රුවක් මවා පා මෙතෙක් මේ දේශනය කෙරේවා යි අදිටන් කොට උතුරුකුරු දිවයිනට පිඬුසිඟා වැඩ හිමවත අනවතප්ත විල්තෙර පැන් සැනසී දන් වළඳා එහි දී උපස්ථානයට වඩින සැරියුත් මහරහතන් වහන්සේට අති සංක්ෂිප්ත අභිධර්ම දේශනාව පවත්වා වදාළ සේක.

04. සැවැත් නුවර දී යමාමහ පෙළහැර දැක සසුන්ගත ව පැවිදි වූ පන්සියයක් පමණ වූ නවක සඟ පිරිසට සැරියුත් මහරහතන් වහන්සේ විසින්, උගන්වන ලද්දා වූ සර්වඥයන් වහන්සේගේ ම ශ්‍රී මුඛයෙන් දේශනා කරන ලද අභිධර්මය නාතිවිස්තාර නාතිසංක්ෂිප්ත දේශනාව නම් වේ. එය වනාහි ධම්මසංගණී ප්‍රකරණය, විභංග

ප්‍රකරණය, ධාතුකථා ප්‍රකරණය, පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණය, කථාවත්ථු ප්‍රකරණය, යමක ප්‍රකරණය සහ පට්ඨාන මහා ප්‍රකරණය නමින් ප්‍රකරණ සතකින් සමන්විත වෙයි.

05. දෙව්ලොව දී වදාළ අතිවිස්තාර වූ ද, අනවතප්ත විල්තෙර දී වදාළ අතිසංක්ෂිප්ත වූ ද සප්තප්‍රකරණයෙන් සමන්විත වූ නාතිවිස්තාර නාතිසංක්ෂිප්ත වූ ද ත්‍රිවිධ වූ ගාම්භීර අභිධර්ම දේශනාවෙහි සකල පරමාර්ථ ධර්මයෝ සතර දෙනෙක් වෙති. චිත්ත පරමාර්ථය - චෛතසික පරමාර්ථය - රූප පරමාර්ථය සහ නිර්වාණ පරමාර්ථය නමිනි.

## අභිධම්ම තික මාතිකාව

01. කුසලා ධම්මා - අකුසලා ධම්මා - අව්‍යාකතා ධම්මා.

02. සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා - දුක්ඛාය වේදනාය සම්පයුත්තා ධම්මා - අදුක්ඛමසුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා.

03. විපාකා ධම්මා - විපාකධම්ම ධම්මා - නේව විපාක න විපාකධම්ම ධම්මා.

04. උපාදින්න උපාදානීයා ධම්මා - අනුපාදින්න උපාදානීයා ධම්මා - අනුපාදින්න අනුපාදානීයා ධම්මා.

05. සංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා - අසංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා - අසංකිලිට්ඨ අසංකිලේසිකා ධම්මා.

06. සවිත්තක සවිචාරා ධම්මා - අවිතක්ක විචාරමත්තා ධම්මා - අවිතක්ක අවිචාරා ධම්මා.

07. පීති සහගතා ධම්මා - සුඛ සහගතා ධම්මා - උපෙක්ඛා සහගතා ධම්මා.

08. දස්සනේන පහාතබ්බා ධම්මා - භාවනාය පහාතබ්බා ධම්මා - නේව දස්සනේන න භාවනාය පහාතබ්බා ධම්මා.

09. දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා - භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා - නේව දස්සනේන න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා.

10. ආචයගාමිනෝ ධම්මා - අපචයගාමිනෝ ධම්මා - නේව ආචයගාමිනෝ න අපචයගාමිනෝ ධම්මා.

11. සෙක්ඛා ධම්මා - අසෙක්ඛා ධම්මා - නේව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා.

12. පරිත්තා ධම්මා - මහග්ගතා ධම්මා - අප්පමාණා ධම්මා.

13. පරිත්තාරම්මණා ධම්මා - මහග්ගතාරම්මණා ධම්මා - අප්පමාණාරම්මණා ධම්මා.

14. හීනා ධම්මා - මජ්ඣිමා ධම්මා - පණීතා ධම්මා.

15. මිච්ඡත්ත නියතා ධම්මා - සම්මත්ත නියතා ධම්මා - අනියතා ධම්මා.

16. මග්ගාරම්මණා ධම්මා - මග්ගහේතුකා ධම්මා - මග්ගාධිපතිනෝ ධම්මා.

17. උප්පන්නා ධම්මා - අනුප්පන්නා ධම්මා - උප්පාදිනෝ ධම්මා.

18. අතීතා ධම්මා - අනාගතා ධම්මා - පච්චුප්පන්නා ධම්මා.

19. අතීතාරම්මණා ධම්මා - අනාගතාරම්මණා ධම්මා - පච්චුප්පන්නාරම්මණා ධම්මා.

20. අජ්ඣත්තා ධම්මා - බහිද්ධා ධම්මා - අජ්ඣත්ත බහිද්ධා ධම්මා.

21. අජ්ඣත්තාරම්මණා ධම්මා - බහිද්ධාරම්මණා ධම්මා - අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා.

22. සනිදස්සන සප්පටිඝා ධම්මා - අනිදස්සන සප්පටිඝා ධම්මා - අනිදස්සන අප්පටිඝා ධම්මා.

## 1 වැනි පාඩම

# සබ්බත්ථික මාතිකා

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාරන ලද්දා වූ අභිධර්ම සප්තප්‍රකරණයෙහි වූ අති උත්තම අර්ථයෙන් ද අවිපරීත අර්ථයෙන් ද පරමාර්ථ නම් වූ ධර්මයෝ චිත්තය - චෛතසිකය - රූපය - නිර්වාණය යයි සතරාකාර වන්නාහ.

02. එකුන්අනූ (89) චිත්තයෝ ය, දෙපණස් (52) චෛතසිකයෝ ය, අටවිසි (28) රූපයෝ ය, නිර්වාණය යයි කියන ලද්දා වූ ඒ සතර පරමාර්ථ ධර්මයෝ වනාහි,

03. ස්කන්ධ වශයෙන් පස් (5) වැදෑරුම් වන්නාහ. ආයතන වශයෙන් දොළොස් (12) වැදෑරුම් වන්නාහ. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ. ආර්ය සත්‍ය වශයෙන් සිව් (4) වැදෑරුම් වන්නාහ.

04. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, රූප අටවිස්ස (28) රූපස්කන්ධය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සිත් එකුන්අනූව (89) විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය උත්පාද ඨිති භංග නම් වූ අවස්ථාවන් නැති බැවින් ද, අතීත අනාගත වර්තමාන ආදී කාලභේදයකට අයත් නැති බැවින් ද ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

05. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝතායතනය නම් වන්නේ

ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කායායතනය නම් වන්නේ ය.

06. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

07. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

08. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූප අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කාය ධාතුව නම් වන්නේ ය.

09. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි, තේජෝ, වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

10. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන සිත සහ සම්පටිච්ඡන දෙසිත මනෝ ධාතුව නම්

වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

11. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, ලෝභ චෛතසිකය හැර ඉතිරි එක්පණස් (51) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර සතර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ මාර්ගාංග අට දෙන මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

## පද විවරණය

01. **අභිධර්මය** - අභිවිශිෂ්ට වූ අභිඅතිරේක වූ ධර්මය අභිධර්මය ය. සූත්‍රාන්ත පිටකයෙහි ස්කන්ධ, ආයතන, ධාතු ආදී වූ ද, චිත්ත චෛතසික රූප නිර්වාණ නම් වූ ද පරමාර්ථ ධර්මයන් එක් එක් කොටසක් විනා ඉතිරි නැතිව දේශනා කොට නොමැත. අභිධර්ම සප්තප්‍රකරණයෙහි වනාහි පරමාර්ථ ධර්මයන් ඉතිරි නැතිව සර්වසම්පූර්ණව දේශනා කොට ඇත. එනිසා සූත්‍රාන්තයට වඩා විශිෂ්ට වූ ද, අතිරේක වූ ද පරමාර්ථ ධර්මය අභිධර්මය නම් වේ.

02. **තුන්ලෝකාග්‍ර** - කාම රූප අරූප නම් වූ තුන් ලෝකයෙහි ම සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් විමුක්තියෙන් විමුක්ති

ඥානදර්ශනයෙන් රූපයෙන් දේශනා විලාශයෙන් පාරමී පුණ්‍ය භාග්‍යයෙන් අග්‍ර වූ තථාගතයන් වහන්සේ ය.

03. **භාග්‍යවත්** - සදේවක ලෝකවාසීන්ගේ පුණ්‍ය භාග්‍යයට වඩා ශත සහස්‍ර ගුණයෙන් අධික වූ පාරමී පුණ්‍ය භාග්‍යයෙන් සමන්වාගත බැවිනුත්, පංචමාරයන් භග්න කළ බැවිනුත්, ඓශ්චර්ය භාග්‍යාදී සයාකාර භාග්‍ය ගුණයෙන් යුක්ත බැවිනුත්, සියලු ධර්මය බෙදා දහම් දෙසූ බැවිනුත්, උතුම් මිනිස්දම් භජනය කළ බැවිනුත්, සසර ගමනට හේතු වූ අවිද්‍යා තෘෂ්ණා කර්ම ක්ලේශයන් වමාරා දමා නිර්වාණ අමෘතය වැළඳූ බැවිනුත් භාග්‍යවත් නම් වෙති.

04. **අර්හත්** - වාසනා සහිත සකල ක්ලේශයන් කෙරෙන් දුරු වූ බැවිනුත්, රාගාදී කෙලෙස් සතුරන් නැසූ බැවිනුත්, සංසාර භව චක්‍රය සිඳ බිඳ දැමූ බැවිනුත්, සියලු පූජාවන්ට සුදුසු බැවිනුත්, රහසිනුත් පවක් නැති පිරිසිදු සන්තාන ඇති බැවිනුත් අර්හත් නම් වෙති.

05. **සම්‍යක් සම්බුද්ධ** - පිරිසිඳ දතයුතු වූ දුක්ඛ ය, ප්‍රහාණය කළ යුතු වූ සමුදය ය, ප්‍රත්‍යක්ෂ කළ යුතු වූ නිරෝධය ය, භාවනා වශයෙන් වැඩිය යුතු වූ මාර්ගය යන චතුරාර්ය සත්‍යය අනුන්ගේ උපදෙසක් නැතිව ද, කිසිවක් ඉතිරි නැතිව මනාසේ තමන් ම අවබෝධ කළ හෙයින් සම්‍යක් සම්බුද්ධ නම් වෙති.

06. **සර්වඥ රාජෝත්තමයන් වහන්සේ** - හේතුවෙන් හටගත් සංඛත නම් වූ ද, හේතුවකින් හට නොගත් අසංඛත ධාතු නම් වූ නිර්වාණය ද යන ලෞකික ලෝකෝත්තර වූ සියලු දේ ද සංස්කාර විකාර ලක්ෂණ ප්‍රඥප්ති නිර්වාණ නම් වූ පංචවිධ ඥෙය්‍ය මණ්ඩලය සර්වාකාරයෙන් දැන වදාළ බැවින් ද සර්වඥ රාජෝත්තමයන් වහන්සේ එනම් වෙති.

07. පර්වත උපමාවෙන්, සාසප උපමාවෙන් කල්පනා කොට ගනු ලැබෙන කාලය කල්ප නම්. ආයු කල්ප, අන්තර කල්ප, අසංඛ්‍ය කල්ප, මහා කල්ප නමින් එය සතරාකාර ය. මනුෂ්‍ය ලෝකයෙහි ඒ ඒ කාලයට නියමිත පරමායුෂය ආයුෂ් කල්පය ය. ලෝකයෙහි අවුරුදු අසංඛෙය්‍ය ආයුෂය අඩුවී දශවර්ෂයට බැසගන්නා කාලය අන්තර කල්පය ය. එවැනි අන්තර කල්ප (20) විස්සක් එක අසංඛ්‍ය කල්පයකි. අසංඛ්‍ය කල්ප සතරක් මහා කල්ප එකකි. මහා කල්පයක හතරෙන් එක කොටසක් වූ විවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පය තුළ පමණක් සතර අපාය, මනුෂ්‍ය ලෝකය, දිව්‍ය

ලෝකය, බ්‍රහ්ම ලෝක තුන යන ස්ථානයන්හි සත්වයෝ වාසය කරති. එය අන්තර කල්ප (20) විස්සකි. ගින්නෙන් හෝ ජලයෙන් හෝ වාතයෙන් හෝ ලෝකය විනාශ වෙමින් පවත්නා වූ අන්තර කල්ප (20) විස්සක් පමණ කාලය සංවට්ට අසංඛ්‍ය කල්පය නම්. ලෝකය විනාශ වී අජටාකාශ බවට පත් වී පවතින්නා වූ අන්තර කල්ප (20) විස්සක් පමණ කාලය සංවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පය නම්. නැවත සක්වල හැදෙමින් පවත්නා වූ අන්තර කල්ප (20) විස්ස පමණ කාලය විවට්ට අසංඛ්‍ය කල්පය නම්. මෙසේ අන්තර කල්ප අසූවක දීර්ඝ කාලය එක් මහා කල්පයකි.

08. **අසංඛෙය්‍ය** - සංඛ්‍යා පථයෙහි අන්තිම දීර්ඝ සංඛ්‍යාව අසංඛෙය්‍ය යි.

එකයි බින්දු එකසිය හතලිහක් ඇත්තේ අසංඛෙය්‍යට ය.

| | |
|---|---|
| එක් වරක් දසය | - 1 × 10 = 10 දසය යි. |
| දස වරක් දසය | - 10 × 10 = 100 සියය යි. |
| සිය වරක් දසය | - 100 × 10 = 1000 දහස යි. |
| දහස් වරක් දසය | - 1000 × 10 = 10000 දසදහස යි = නහුතය යි. |
| දසදහස් වරක් දසය | - 10000 × 10 = 100000 ලක්ෂය යි. සියදහස යි = දසනහුතය යි. |
| ලක්ෂ වරක් දසය | - 100000×10 = 1000000 දශලක්ෂය යි. |
| දසලක්ෂ වරක් දසය | - 1000000 × 10 = කෝටිය යි . එකයි බින්දු 7 යි. |
| කෝටි වරක් කෝටිය | - ප්‍රකෝටිය යි. එකයි බින්දු 14 යි. |
| ප්‍රකෝටි වරක් කෝටිය | - කෝටිප්‍රකෝටි එකයි. එකයි බින්දු 21 යි. |
| කෝටි ප්‍රකෝටි වරක් කෝටිය | - නහුත එකයි. එකයි බින්දු 28 යි. |
| නහුත වරක් කෝටිය | - නින්නහුත එකයි. එකයි බින්දු 35 යි. |
| නින්නහුත වරක් කෝටිය | - අක්ඛෝහිණී එකයි. එකයි බින්දු 42 යි. |

| | |
|---|---|
| අක්ඛෝහිණී වරක් කෝටිය | - බින්දු එකයි. එකයි බින්දු 49 යි. |
| බින්දු වරක් කෝටිය | - අබ්බුද එකයි. එකයි බින්දු 56 යි. |
| අබ්බුද වරක් කෝටිය | - නිරබ්බුද එකයි. එකයි බින්දු 63 යි. |
| නිරබ්බුද වරක් කෝටිය | - අහහ එකයි. එකයි බින්දු 70 යි. |
| අහහ වරක් කෝටිය | - අබබ එකයි. එකයි බින්දු 77 යි. |
| අබබ වරක් කෝටිය | - අටට එකයි. එකයි බින්දු 84 යි. |
| අටට වරක් කෝටිය | - සෝගන්ධික එකයි. එකයි බින්දු 91 යි. |
| සෝගන්ධි වරක් කෝටිය | - උත්පල එකයි. එකයි බින්දු 98 යි. |
| උත්පල වරක් කෝටිය | - කුමුද එකයි. එකයි බින්දු 105 යි. |
| කුමුද වරක් කෝටිය | - පුණ්ඩරීක එකයි. එකයි බින්දු 112 යි. |
| පුණ්ඩරීක වරක් කෝටිය | - පදුම එකයි. එකයි බින්දු 119 යි. |
| පදුම වරක් කෝටිය | - කථාන එකයි. එකයි බින්දු 126 යි. |
| කථාන වරක් කෝටිය | - මහාකථාන එකයි. එකයි බින්දු 133 යි. |
| මහාකථාන වරක් කෝටිය | - අසංඛෙය්‍යයි. එකයි බින්දු 140 යි. |

09.**සාරාසංඛ්‍ය කල්ප ලක්ෂය** - කල්ප ලක්ෂයක් අධික කොට ඇති ඉහත දැක්වූ මහාකල්පය අසංඛ්‍ය සතරක් වූ අති දීර්ඝ කාලයකි.

10. **බෝධි සම්භාර** - සතර මාර්ග ඥාන, සර්වඥතා ඥාන, නිර්වාණ ධාතු නමැති බෝධිය පිණිස රැස්කරනු ලැබෙන පාරමී ගුණ ධර්ම.

11. **දඹදිව** - ආදිකල්පයෙහි හටගත් ස්වර්ණමය ජම්බුවෘක්ෂය හේතුකොට ලැබූ නම් ඇති මහාද්වීපය දඹදිව ය.

12. **නේරඤ්ජරා** - බුද්ධගයාව හරහා ගලා යන මහා ගංගාවකි.

13. **බුද්ධගයා** - ගයාව නම් වූ ප්‍රදේශයෙහි දී තථාගතයන් වහන්සේ බුදු බවට පත් වූ තැන් සිට ඒ ප්‍රදේශය බුද්ධගයා නමින් ප්‍රසිද්ධ විය.

14. **බෝධි මණ්ඩලය** - ආදි කල්පයෙහි සියල්ලට පළමුවෙන් මතුවන පොළෝතලය බෝධි මණ්ඩලය යි. කකුසඳ, කෝණාගමන, කාශ්‍යප නම් වූ අතීත බුදුවරුද බුද්ධත්වයට පැමිණි තැන එතැනම ය. සිද්ධාර්ථ

කුමාරෝත්පත්තිය සමගම පෙරපසු නොවී එතැන අස්වත්ථ බෝධි වෘක්ෂය පහළ වී ඇත. අති ශ්‍රේෂ්ඨ, අති උත්තමාර්ථයෙන් එතැන බෝධි මණ්ඩලය නමින් හැඳින්වේ.

15. **ස්වයම්භූ ඥානය** - අන් කෙනෙකුගේ උපදේශයකින් තොරව තමන් වහන්සේගේ ම සන්තානයෙහි පහළවන ඥානය ස්වයම්භූ ඥානය ය.

16. **රතනඝර** - බුදුවීමෙන් සතර වැනි සතියෙහි දී සර්වඥයන් වහන්සේ බෝධි වෘක්ෂයට වයඹ දෙසින් තැනක වැඩ හිඳ ධර්මය සම්මර්ශනය කළ සේක. එතැන වැඩ හිඳීමට දෙවියන් විසින් රුවන් ගෙයක් මවන ලදී. ධර්මරත්නය සම්මර්ශනය කළ හෙයින් ද එතැන රතනඝර නමින් හැඳින්වෙයි.

17. **සවණක් ඝන බුදුරැස්** - සර්වඥ ශ්‍රී දේහයෙන් නිකුත් වූ නිල්, කහ, ලේ, සුදු, මදටිය, මිශ්‍ර යන පාට සයකින් යුක්ත වූ අසිරිමත් බුදුරැස් සවණක් ඝන බුදුරැස් නමින් හැඳින්වේ.

18. **ඥාන ක්‍රීඩාව** - මහා සාගර පත්ලෙහි මහා මත්ස්‍යයන්ට ක්‍රීඩා කරන්නට ලැබෙන්නා සේ සර්වඥතා ඥානයට නිසි සේ හැසිරීමට ඉඩ ලැබුණේ අභිධර්මයෙහි සමන්ත පට්ඨාන මහා ප්‍රකරණයෙහි ය. එය ඥාන ක්‍රීඩාවක් වැනිය.

19. **සැවැත් නුවර** - අචිරවතී ගඟ අසබඩ පිහිටි, කෝසල රාජධානියේ අගනුවරයි. තථාගතයන් වහන්සේ වස් විසිපහක්ම වැඩි සිටියේ සැවැත් නුවර ඇසුරු කොටගෙන ය.

20. **යමා මහ පෙළහැර** - සර්වඥයන්වහන්සේ හැර කිසිම ඍද්ධිවන්තකෙනෙකුට පෑ නොහැකි අතිවිශේෂ ප්‍රාතිහාර්යයකි. බුදු වී දෙවැනි සති අන්තයේ දී ද, ඥාති සමාගමයෙහි දී ද, සැවැත් නුවර ගණ්ඩම්බ රුක්මුල දී ද පාටික සමාගමයෙහි දී ද තථාගතයන් වහන්සේ සතර වරක දී යමා මහ පෙළහැර පා ඇත.

21. **වස්සාන තුන්මාසය** - වසරකට ඍතු තුනකි. හේමන්ත, ගිම්හාන, වස්සාන යනුවෙනි. බක්, වෙසක්, පොසොන්, ඇසල මාස සතර ගිම්හානය යි. නිකිණි, බිනර, වප්, ඉල් මාස සතර වස්සානය යි. උඳුවප්, දුරුතු, නවම්, මැදින් මාස සතර හේමන්තය යි. ඇසළ පෝය ගෙවී අව පෑළවිය දින සිට වප් පුර පසළොස්වක් දින තෙක්

මාස තුන වස්සානය යයි ද ඉල් මස චීවර මාසය යයි ද කියනු ලැබේ.

22. **තව්තිසා භවන** - මහපොළොවේ සිට යොදුන් හතළිස් දෙදාහක් ඉහලින් චාතුර්මහාරාජික දෙව්ලොව ද, එතැන් සිට යොදුන් හතළිස් දෙදාහක් ඉහළින් තව්තිසා භවන ද පිහිටා තිබේ. ශක්‍ර භවන යනු ද එයට නමකි. මිනිස් ලොව අවුරුදු සියයක් එහි එක දවසකි. එවැනි දවස් තිහක් මාසයකි. මාස දොළහක් වසරකි. දිව්‍ය වර්ෂ දහසක් එහි පරමායුෂ වෙයි. මිනිස් ලොව වර්ෂ ගණනින් වර්ෂ තුන්කෙළ හැට ලක්ෂයකි. සර්වඥයන් වහන්සේ තෙමසක් තිස්සේ අභිධර්ම දේශනා කළසේක් තව්තිසා භවනයේ දීය. අපට තෙමස එහි විනාඩි නවයකි.

23. **මාතෘ දිව්‍යරාජයාණෝ** - බුද්ධාංකුර සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ බිහිකළ මහමායා මවුබිසව එයින් සත්වැනි දින එනම් වෙසක් අව සතවක දින මනුලොවින් චුත වී තුසිත දෙව්ලොව දිව්‍ය රාජයෙක් වී උපනි. මාතෘ දිව්‍යරාජයාණෝ යනු එතුමාය. සියලු බෝසත් මවුවරු බෝසත් උපතින් සත්වැනි දින මනුලොවින් චුතවීමත් තුසිත භවනයෙහි දෙව්රජ කෙනෙකු වී ඉපදීමත් ආවේණික ධර්මතාවකි.

24. **දස දහසක් සක්වළ** - අවීචියේ සිට භවාග්‍රය තෙක් ඇති එක්තිස් (31) භූමිය එක සක්වළකි. මේ මඟුල් සක්වළ අවට ඇත්තා වූ එවැනි සක්වළ දසදහස ජාති ක්ෂේත්‍රය නමින් ද හැඳින්වෙයි. තථාගතයන් වහන්සේගේ ප්‍රතිසන්ධිය, උත්පත්තිය, බුද්ධත්වය, ධම්මචක්ක දේශනය, ආයු සංස්කාර අත්හැරීම, පිරිනිවීම යන අවස්ථාවන්හි දී කම්පිත වන්නේ මේ දස දහසක් සක්වළය. බුදුසසුනක දී මග ඵල නිවන් ලැබෙන්නේ ද මේ දසදහසක් සක්වළ වාසීන්ටය.

25. **දෙව්බඹුන්** - දසදහසක් සක්වළින් බණ ඇසීමට පැමිණි කාමාවචර දිව්‍යලෝකයන්හි දෙවියෝ ද රූපාවචර බ්‍රහ්ම ලෝකයන්හි බ්‍රහ්මයෝ ද වූහ.

26. **අතිවිස්තාර අභිධර්මය** - සර්වඥයන් වහන්සේ තෙමසක් තිස්සේ දෙසූ ධර්මය අනන්තාපරිමාණය. සාමාන්‍ය මිනිසකු එක වචනයක් කියන කෙටි කාලය තුළ අනඳ මාහිමියෝ වචන අටක් කියති. අනඳ මාහිමියන් වචනයක් කියන කෙටි කාලය තුළ සර්වඥයන් වහන්සේ වචන දහසයක් කියති. සුවසේ පියවෙන දෙතොල, දිගු පුළුල් තුනී දිව ධාතුව, දොළොස් වක් චන්ද්‍රරේඛාව වැනි වූ දෙහනුව, නාභියේ

සිට පිත් සෙම් නොබැඳුණු ස්වර නාලය, අෂ්ටාංග සමන්නාගත බ්‍රහ්මස්වරය, මානෙල් මල් සුවඳ විහිදෙන ශ්‍රී මුඛ පත්මය, සුදු බුදුරැස් විහිදෙන දළදා සතර, කල්ප කෝටි සත සහස්‍ර ගණනක් තිස්සේ පිරූ වාග් සුචරිතය යනාදී සම්පත්හි පිහිටා දිවා රාත්‍රී අතරක් නැර සර්වඥයන්වහන්සේ දෙසූ අභිධර්මය අනන්තාපරිමාණ බැවින් එය අතිවිස්තාර අභිධර්ම දේශනාව නම් වේ.

27. **උතුරුකුරු දිවයින** - නියතයෙන් පන්සිල් රකින, මගේ කියා කිසිවක් නොගන්නා, ස්වයංජාත සුවඳ රත්හැල් අනුභව කරන, කල්ප වෘක්ෂයෙන් ඇඳුම් පැළඳුම් ආදී සම්පත් විඳින, මග ඵල නිවන් යාමට ආශාවක් නැති මිනිසුන් වෙසෙන මහාද්වීපයකි.

28. **අනවතප්ත විල** - චිත්‍රකූට, කාලකූට, ස්වර්ණකූට, රජතකූට, ගන්ධමාදන නම් වූ පර්වත පහකින් වටවී ඉරු එළියක් නොවදින යොදුන් පනහක් වට ඇති ඉතාමත් සිසිල් පිරිසිදු ජලය පිරි විලකි, අනවතප්ත විල.

29. **සැරියුත් මහරහතන් වහන්සේ** - එකාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇති, ප්‍රඥාවෙන් අගතැන්පත් වූ ධර්ම සේනාධිපති අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ ය.

30. **පන්සියයක් පමණ වූ සඟ පිරිස** - කාශ්‍යප බුද්ධ ශාසන කාලයේ දී අභිධර්ම සජ්ඣායනාවකට නිතර කන්දී සිත් පහදවාගත් කිරිවවුලෝ පන්සියයක් දෙනා එපිනෙන් ම දෙව්ලොව ඉපිද සැප විඳ සැවැත් නුවර පින් ඇති දරු පිරිසක්ව ඉපිද සිටියහ. යමා මහ පෙළහැර දැක පැහැදී සැරියුත් මහරහතන් වහන්සේ වෙත පැවිදි වූහ. එම තෙමස තුළ අභිධර්ම පිටකය උගෙන අවසන් වූ දින රහත් ඵලයට පත්වූහ.

31. **අතිසංක්ෂිප්ත අභිධර්ම දේශනාව** - සර්වඥයන් වහන්සේ දිනපතා සැටපැයක් තිස්සේ දෙසූ ධර්මයේ මාතිකා සියල්ල සැරියුත් මහරහතන් වහන්සේට දෙසූ සේක. අභිධර්ම සප්ත ප්‍රකරණයටම සාධාරණ වූ එම මාතිකා දේශනය අතිසංක්ෂිප්ත අභිධර්ම දේශනය ය.

32. **නාතිවිස්තාර නාතිසංක්ෂිප්ත අභිධර්ම දේශනාව** - සර්වඥයන් වහන්සේගෙන් ලැබුණ මාතිකා අනුව මනුෂ්‍යයන්හට උද්ග්‍රහණ, ධාරණ, දේශන වාචනයට තරම් ප්‍රමාණවත්ව සැරියුත් මහ රහතන්

වහන්සේ ශිෂ්‍යයනට උගැන්වූ අභිධර්ම සප්තප්‍රකරණය නාතිවිස්තාර නාතිසංක්ෂිප්ත අභිධර්ම දේශනාව ය.

33. **චිත්තය** - විසිතුරු දේ නිපදවන, තමන් ම විසිතුරු, කර්මක්ලේශයන් විසින් උපදවන, සන්තානය රකින, ආත්ම සන්තානය ගොඩනගන, විසිතුරු අරමුණු ගන්නා අර්ථ සයකින් චිත්තය නම් අරූපී ධර්මයකි. සිත් 89 හෝ 121 හෝ වෙති.

34. **චෛතසික** - සිතෙහි හටගත් අර්ථයෙන් එනම් වෙයි. ඒවා දෙපණස (52) කි.

35. **රූප** - ශීතෝෂ්ණාදී විරුද්ධ ප්‍රත්‍යයෙන් වෙනස්වන සුළු ඖදාරික පරමාර්ථයකි. එය 28 ක් වෙයි.

36. **නිර්වාණය** - හේතු ප්‍රත්‍යයකින් සකස් නො වූ අසංඛත ධාතුවය. තෘෂ්ණාවට අරමුණු නොවන බැවින් හා එකොළොස් මහා ගිනිමැල නිවුණු බැවින් ද නිර්වාණය නම් වේ.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. සබ්බත්ථික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සබ්බත්ථික මාතිකාව යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 2 වැනි පාඩම

# 1. කුසල ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **කුසලා ධම්මා - අකුසලා ධම්මා - අව්‍යාකතා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළා වූ අභිධර්ම පිටකය වනාහි ධම්මසංගණි, විභංග, ධාතුකථා, පුග්ගල පඤ්ඤත්ති, කථාවත්ථු, යමක සහ පට්ඨාන මහා ප්‍රකරණය නමින් සත් වැදෑරුම් වන්නාහ.

03. ඒ අභිධර්ම සප්තප්‍රකරණය අතුරෙන් ද **ධම්මසංගණි ප්‍රකරණය** පළමු කොට වදාළ සේක. එය ද චිත්තෝත්පාද කාණ්ඩය, රූප කාණ්ඩය, නික්ෂේප කාණ්ඩය සහ අර්ථකථා කාණ්ඩයැයි සිව් වැදෑරුම් වන්නාහ.

04. ඒ කාණ්ඩ සතර අතුරෙන් ද **චිත්තෝත්පාද කාණ්ඩය** පළමු කොට වදාළ සේක. ඒ චිත්තෝත්පාද කාණ්ඩය ද මාතිකාව, පදභාජනීය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ. ඒ දෙක අතුරෙන් ද **මාතිකාව** පළමුකොට වදාළ සේක.

05. ඒ මාතිකාව ද ත්‍රික මාතිකා, දුක මාතිකා වශයෙන් දෙවැදෑරුම් වන්නාහ. ඒ දෙක අතුරෙන් **ත්‍රික මාතිකාව** පළමු කොට වදාළ සේක. ඒ ත්‍රික මාතිකාව ද කුසලත්‍රික, වේදනාත්‍රිකාදී වශයෙන් දෙවිසි (22) වැදෑරුම් වන්නාහ.

06. ඒ දෙවිස්ස (22) අතුරෙන් **කුසල ත්‍රිකය** පළමු කොට වදාළ සේක. ඒ කුසල ත්‍රිකය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

07. ඒ තුන අතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **කුසලා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අකුසලා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අව්‍යාකතා ධම්මා** යනුවෙනි.

08. **කුසලා** - අනවද්‍ය ඉෂ්ට විපාකදීම ලක්ෂණ කොට ඇත්තා වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව ස්වභාව පරමාර්ථ ධර්ම කෙනෙක් (සන්ති සංවිජ්ජන්ති) විද්‍යමානව ඇත්තාහ.

09. **අකුසලා** - සාවද්‍ය අනිෂ්ට විපාකදීම ලක්ෂණ කොට ඇත්තා වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව ස්වභාව පරමාර්ථ ධර්ම කෙනෙක් (සන්ති සංවිජ්ජන්ති) විද්‍යමානව ඇත්තාහ.

10. **අව්‍යාකතා** - කුසලාකුසල වශයෙන් නොවදාරා අන්‍ය ස්වභාවයකින් වදාරන ලද්දා වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව ස්වභාව පරමාර්ථ ධර්ම කෙනෙක් (සන්ති සංවිජ්ජන්ති) විද්‍යමානව ඇත්තාහ.

11. **කුසලා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එක්විසි (21) කුසල චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් (38) චෛතසිකය ද ලැබෙන්නාහ.

12. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

13. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටතිස් (38) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එක්විසි (21) කුසල චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

14. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එක්විසි (21) කුසල චිත්තය මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

15. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එක්විසි (21) කුසල චිත්තය මනෝවිඥ්ඥාණ ධාතුව නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

16. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් (38) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර මාර්ග

චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝතාපත්ති මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ එකුන්තිස (29) සත්‍ය විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

17. **අකුසලා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත සත්විසි (27) චෛතසිකය ද යන මේ ධර්මයෝ ලැබෙන්නාහ.

18. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

19. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සත්විසි (27) චෛතසිකය අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පස්විසි (25) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. දොළොස් අකුසල චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

20. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය මනායතනය නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

21. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල් චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත සවිසි (26) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ

චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

23. **අව්‍යාකතා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතිස් (36) විපාක චිත්තය ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් (38) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද යන මේ ධර්මයෝ ලැබෙන්නාහ.

24. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

25. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සතිස් (36) විපාක චිත්තය ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

26. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කායායතනය නම් වන්නේ ය.

27. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

28. සතිස් (36) විපාක චිත්තය ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති

රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

29. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කාය ධාතුව නම් වන්නේ ය.

30. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

31. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන දෙසිත ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සූවිසි (24) විපාක චිත්තය ද, එකුන්විසි (19) ක්‍රියා චිත්තය ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

32. අටතිස් (38) චෛතසික ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද යන මේ ධර්ම සමූහය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

33. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත පන්තිස් (35) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද යන මේ ධර්ම සමූහය දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය

නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාදයෝ සත්තිස (37) සත්‍ය විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

34. මේ ශබ්දාවලිය හෙවත් කුසල ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනකින් වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. ආදිලබ්ධ නාම, සර්වලබ්ධ නාම ත්‍රිකයන් අතුරෙන් මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සප්පදේස, නිප්පදේස ත්‍රිකයන් අතුරෙන් සකල පරමාර්ථ ධර්මයන් මෙහි ඇතුලත් වන බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **කුසලා ධම්මා** - නින්දිත වූ පාපධර්මයන් සලනය, චලනය, කම්පනය, විද්වංසනය කරන අර්ථයෙන් කුසල ධර්ම නමි. **''කුච්ඡිතේ පාපකේ ධම්මේ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලා'';**

නින්දිතාකාරයෙන් සන්තානයෙහි සයනය කරත්නුයි අකුසලයෝ 'කුස' නම් වෙති. ඒ කුස නම් වූ අකුසලයන් ලූනනය, ඡින්දනය කෙරෙත්නුයි ද කුසල ධර්ම නම් වෙති. **''කුච්ඡිතේන වා ආකාරේන සයන්තීති කුසා, තේ අකුසල සංඛාතේ කුසේ ලුනන්ති ඡින්දන්තීති කුසලා'';**

නින්දිත වූ පාපයන් ලියාලන තුනී කරන කෙළවර කරන බැවින් ද ප්‍රඥාව 'කුස' නම් වේ. ඒ කුස නම් වූ ප්‍රඥාවෙන් ගතයුතු බැවින් ද, පැවැත්විය යුතු බැවින් ද කුසල ධර්ම වෙති. **''කුච්ඡිතානං වා සානතෝ තනුකරණතෝ ඕසානකරණතෝ ඤාණං කුසං නාම, තේන කුසේන ලා තබ්බාති කුසලා, ගහේතබ්බා පවත්තේ තබ්බාති අත්ථෝ '' ;**

තව ද කුසතණ කොලය දෙපැත්තෙන් කැපෙන්නේ යම් සේ ද, එසේම මේ කුසලය, උපන්නා වූ ද උපදින්නට තිබෙන්නා වූ ද කෙලෙස් සිඳින බැවින් කුසල ධර්ම නම් වෙති. **''යථා වා කුසා උභය භාග ගතං හත්ථප්පදේසං ලුනන්ති, ඒවමිමේපි උප්පන්නානුප්පන්නභාවේන උභයභාගගතං කිලේසපක්ඛං ලුනන්ති, තස්මා කුසා විය ලුනන්තීතිපි කුසලා''**

02. **ධම්මා** - තමන්ගේ ස්වභාවය දරන්නේනුයි ධර්ම නම්. ''**අත්තනෝ සභාවං ධාරෙන්තීති ධම්මා**'' ප්‍රත්‍යයන්ගෙන් දරනු ලැබෙත්නුයි ද, ස්වභාව ධර්මයෙන් දරනු ලැබෙත්නුයි ද ධර්ම නම් වෙති. ''**ධාරියන්ති වා පච්චයෙහි ධාරියන්ති වා යථා සභාවතෝති ධම්මා**''.

03. **අකුසලා ධම්මා** - මිත්‍රයාට ප්‍රතිවිරුද්ධ වූවහු අමිත්‍රයා නම් වන්නා සේ ද, ධර්මයට ප්‍රතිපක්ෂ වූයේ අධර්මය නම් වන්නා සේ ද, කුසලයට ප්‍රතිපක්ෂ වූ විරුද්ධ වූ ධර්මය අකුසල ධර්මය නම්. ''**න කුසලා අකුසලා, මිත්තපටිපක්ඛා අමිත්තා විය ලෝභාදිපටිපක්ඛා අලෝභාදයෝ විය කුසල පටිපක්ඛාති අත්ථෝ**''.

04. **අව්‍යාකතා ධම්මා** - කුසල අකුසල වශයෙන් නොවදාළා වූ ධර්මයෝ අව්‍යාකෘත නම් වන්නාහ. ''**කුසලාකුසල භාවේන අකථිතාති අත්ථෝ** ''

තව ද නිවැරදි සැප විපාක ගෙනදීම ලක්ෂණ කොට ඇත්තේ කුසලය ය. සාවද්‍ය හෙවත් කළ වරදට අනුව දුක් විපාක ගෙනදීම ලක්ෂණ කොට ඇත්තේ අකුසලය ය. විපාක ගෙනදෙන කුසලාකුසල නොවූයේ අව්‍යාකෘතය ය. ''**අනවජ්ජ සුඛ විපාක ලක්ඛණා කුසලා, සාවජ්ජ දුක්ඛ විපාක ලක්ඛණා අකුසලා, අවිපාක ලක්ඛණා අව්‍යාකතා**''

තව ද කුසල ශබ්දය ආරෝග්‍යාර්ථය, අනවද්‍යාර්ථය, දක්ෂාර්ථය, සුඛ විපාකාර්ථය යන අර්ථ සතරක යෙදේ. ''**කච්චිනු භෝතෝ කුසලං කච්චිනු භෝතෝ අනාමයං**'' යනාදී තන්හි කුසලං යනු ආරෝග්‍යයට, නිරෝගී බවට නමකි. ''**කතමෝ පන භන්තේ කායසමාචාරෝ කුසලෝ? යෝ ඛෝ මහාරාජ! කායසමාචාරෝ අනවජ්ජෝති ච පුන ච පරං භන්තේ ඒතදනුත්තරීයං යථා භගවා ධම්මං දේසේති කුසලේසු ධම්මේසූති**'' යනාදී තැන්හි නිවැරදි අර්ථයෙහි කුසල ශබ්දය යෙදේ. '' **කුසලෝ ත්වං රථස්ස අංග පච්චංගානං, කුසලා නච්චගීතස්ස, සික්ඛිතා චාතුරිත්ථියෝ** '' යනාදී තැන්හි දක්ෂාර්ථයෙහි කුසල ශබ්දය යෙදේ. ''**කුසලානං ධම්මානං කතත්තා උපචිත්තතා**'' යනාදී තැන්හි සුඛ විපාකාර්ථයෙහි කුසල ශබ්දය යෙදේ. ''**කුසලානං ධම්මානං කතත්තං උපචිතත්තා**'' යනාදී තැන්හි සුඛ විපාකාර්ථයෙහි කුසල ශබ්දය යෙදේ. මේ අභිධර්ම ත්‍රික මාතිකා කුසල ශබ්දය වනාහි ආරෝග්‍ය අනවද්‍ය සුඛ විපාක යන අර්ථ තුනෙහිම යෙදේ.

තව ද ධර්ම ශබ්දය පර්යාප්ති, හේතු, ගුණ, නිස්සත්ව යන අර්ථ සතරක යෙදේ. මෙහි පර්යාප්තිය නම් උද්ග්‍රහණ ධාරණ දේශනා වාචනාදී වශයෙන් පුහුණු කළයුතු වූ ත්‍රිපිටක ධර්මයයි. **''ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං''** යනාදී වශයෙනි. හේතුවෙහි ඥාණය ධම්ම පටිසම්භිදාවය. **''හේතුම්හි ඥාණං ධම්ම පටිසම්භිදා''** යනාදී තැන්හි ධම්ම යනු හේතුවය, ධර්මයත් අධර්මයත් දෙක සමාන විපාක දෙන්නාහු නොවෙති. අධර්මය නිරයට යවයි. ධර්මය සුගතියට යවයි. **''නහි ධම්මෝ අධම්මෝ ච, උභෝ සම විපාකිනෝ අධම්මෝ නිරයං නේති, ධම්මෝ පාපේති සුග්ගතිං''** යනාදී තන්හි ධර්මය යනු ගුණයට නමකි. **''තස්මිං ඛෝ පන සමයේ ධම්මා හොන්ති, ධම්මේසු ධම්මානුපස්සී විහරති''** යනාදී තන්හි ධර්මය යනු නිස්සත්ව නිජ්ජීව පරමාර්ථයට නමකි. මේ අභිධර්මයෙහි වනාහි නිස්සත්ව නිජ්ජීවාර්ථයෙහි ධම්ම ශබ්දය වැටේ.

මෙහි දී අනවද්‍ය ඉෂ්ට විපාකදීම ලක්‍ෂණ කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ධර්මයෝ කුසල ධර්මයෝය. සාවද්‍ය අනිෂ්ට විපාකදීම ලක්‍ෂණ කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ධර්මයෝ අකුසල ධර්මයෝ ය. විපාක දීමක් නැති බව ලක්‍ෂණ කොට ඇත්තෝ අව්‍යාකෘත ධර්මයෝ ය.

05. **මාතිකා** - **''මාතා වියාති මාතිකා''** දරුවන් බිහිකරන මවක් මෙන් අර්ථයන් බිහිකරන බැවින් ද 'මාතිකා' නම්. **''මාතිකා වියාති මාතිකා''** කෙත්වතු සරු කරන ගලායන දිය ඇල මෙන් අර්ථයන් වෙත ගලායන බැවින් ද 'මාතිකා' නම්.

මාතිකා යනු උද්දේශයට නමකි. එය නිර්දේශ පද නිපදවන බැවින් මවක් වැනිය.

06. ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදය, ප්‍රධානාර්ථයෙන් ද, ප්‍රශංසාර්ථයෙන් ද යුක්ති යුක්තාර්ථයෙන් ද ලෞකික ලෝකෝත්තර සැප ගෙනදීම් අර්ථයෙන් ද කුසල පදය පළමු කොට වදාරා ඇත. කුසලයට සෘජුවම ප්‍රතිපක්‍ෂ බැවින් ඉන් අනතුරුවම ද්විතීය පදය වන අකුසලය වදාරා ඇත. ඒ දෙකටම වෙනස් බැවින් තෘතීය පදය අව්‍යාකෘත නමින් වදාරා ඇත.

තව ද ආස්වාද දක්වනු පිණිස පළමුව කුසලය ද, ආදීනව දක්වනු පිණිස දෙවනුව අකුසලය ද, නිස්සරණය දක්වනු පිණිස නිවන ඇතුලත් වන අව්‍යාකෘතය ද වදාරා ඇත.

තව ද නුවණැත්තෝ කුසලයෙහි පිහිටා අකුසලය නසා නිවන සාදාගනිති. එහෙයින් ප්‍රතිපත්ති ක්‍රමය අනුව ද කුසල ත්‍රිකය වදාරා ඇත.

07. **ආදිලබ්ධ නාම** - තික, දුක මාතිකාවන්ගේ මුල් පදයට අනුව තබන ලද නම් ඇත්තේ ආදිලබ්ධ නාම වේ.

08. **සර්වලබ්ධ නාම** - පද සියල්ලටම අනුව නම ලැබේ නම් සර්වලබ්ධ නාම නම් වේ.

09. **සප්පදේස ත්‍රික** - පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් නො වූ ත්‍රිකය සප්පදේස ත්‍රික නම් වේ.

10. **නිප්පදේස ත්‍රික** - පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් වූ ත්‍රිකය නිප්පදේස ත්‍රික නම් වේ. දුක මාතිකාවන්ට ද එසේම ය.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. කුසල ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**කුසල ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 3 වැනි පාඩම
# 2. වේදනා ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා - දුක්ඛාය වේදනාය සම්පයුත්තා ධම්මා - අදුක්ඛමසුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ කුසල ත්‍රිකයට අනතුරුව වේදනා ත්‍රිකය දේශනා කොට වදාළ සේක. ඒ වේදනා ත්‍රිකය ද ප්‍රථම පදය ද්විතීය පදය තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඒ තුන අතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **දුක්ඛාය වේදනාය සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අදුක්ඛමසුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා** යනුවෙනි.

04. **සුඛාය වේදනාය** - ඉෂ්ටාරම්මණ රසානුභවනය ලක්ෂණ කොට ඇත්තා වූ සැප වේදනාව හා සමග, **සම්පයුත්තා** - ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක් (සන්ති - සංවිජ්ජන්ති) විද්‍යමානව ඇත්තාහ.

05. **දුක්ඛාය වේදනාය** - අනිෂ්ටාරම්මණ රසානුභවනය ලක්ෂණ කොට ඇත්තා වූ දුක් වේදනාව හා සමග, **සම්පයුත්තා** - ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක් (සන්ති - සංවිජ්ජන්ති) විද්‍යමානව ඇත්තාහ.

06. **අදුක්ඛමසුඛාය වේදනාය** - මධ්‍යස්ථාරම්මණ රසානුභවනය ලක්ෂණ කොට ඇත්තා වූ සැපක් නො වූ දුකක් නො වූ උපේක්ෂා වේදනාව හා සමග, **සම්පයුත්තා** - ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක් (සන්ති - සංවිජ්ජන්ති) විද්‍යමානව ඇත්තාහ.

07. **සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සුඛ සහගත තෙසැට (63) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ඡ විචිකිච්ඡා වර්ජිත සසාලිස් (46) චෛතසිකය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

09. ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සසාලිස් (46) චෛතසික අතුරෙන් සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පන්සාලිස් (45) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සුඛ සහගත තෙසැට (63) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සුඛ සහගත තෙසැට (63) චිත්තය මනායතනය නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සුඛ සහගත කායවිඤ්ඤාණ චිත්තය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සුඛ සහගත සිත් දෙසැට (62) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සුඛ සහගත සිත් එක්තිස (31) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත පන්සාලිස් (45) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර සුඛ සහගත මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී (ප්‍රථම ධ්‍යාන) සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් ද, සංකප්ප වර්ජිත (ද්විතීය, තෘතීය, චතුත්ථ ධ්‍යාන) සෝවාන් මාර්ගාංග සත් දෙන තුන් වරක් ද, මෙලෙසම සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන තුන් වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන තුන් වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන තුන් වරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි සුඛ සහගත මාර්ග

චිත්තෝත්පාදයෝ අටවිස්ස (28) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාදයෝ සතිස (36) ද සත්‍ය විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

13. **දුක්ඛාය වේදනාය සම්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දුක්ඛ සහගත සිත් තිදෙන ද, තත් සම්ප්‍රයුක්ත වේදනා ප්‍රීති ලෝභ මාන දිට්ඨි විචිකිච්ඡා වර්ජිත එක්විසි (21) චෛතසිකය ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

15. ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දුක්ඛ සහගත එක්විසි (21) චෛතසිකය අතුරෙන් සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමවිසි (20) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. දුක්ඛ සහගත සිත් තිදෙන විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

16. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දුක්ඛ සහගත සිත් තිදෙන මනායතනය නම් වන්නේ ය. එක්විසි (21) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

17. ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. දෝමනස්ස සහගත දෙසිත මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. එක්විසි (21) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, දුක්ඛ සහගත සිත් තිදෙන ද, තත් සම්ප්‍රයුක්ත එක්විසි (21) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

19. **අදුක්ඛමසුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උපේක්ෂා සහගත සිත් පස්පණස (55) ද, තත් සම්ප්‍රයුක්ත වේදනා ප්‍රීති දෝස ඉස්සා

මච්ඡරිය කුක්කුච්ච වර්ජිත සසාලිස් (46) චෛතසිකය ද ලැබෙන්නාහ.

20. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් සතකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

21. ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සසාලිස් (46) චෛතසිකය අතුරෙන් සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පන්සාලිස් (45) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. උපේක්ෂා සහගත සිත් පස්පණස (55) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

22. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, උපේක්ෂා සහගත සිත් පස්පණස (55) මනායතනය නම් වන්නේ ය. තත් සම්ප්‍රයුක්ත සසාලිස් (46) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

23. ධාතු වශයෙන් සත් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිවහාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන සිත ද, සම්පටිච්ඡන දෙසිත ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි උපේක්ෂා සහගත සිත් සූසාලිස (44) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් සත් වැදෑරුම් වන්නාහ.

24. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික උපේක්ෂා සහගත සිත් සත්සාලිස (47) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත පන්සාලිස් (45) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර උපේක්ෂා සහගත පඤ්චම ධ්‍යාන මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා සංකප්ප වර්ජිත සම්මා දිට්ඨි, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ සෝවාන් මාර්ගාංග සත් දෙන එක් වරක් ද, සකදාගාමී මාර්ගාංග සත් දෙන එක් වරක් ද, අනාගාමී මාර්ගාංග

සත් දෙන එක් වරක් ද, අර්හත් මාර්ගාංග සත් දෙන එක් වරක් ද, මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද සවිස්ස (26) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද තෙතිස (33) ද සත්‍ය විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

25. මේ ශබ්දාවලිය හෙවත් වේදනා ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනකින් වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. පද තුනෙන් ලබන ලද නම් ඇති හෙයින් සර්වලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

26. සුඛ වේදනා තෙසැට (63) ද, දුක්ඛ වේදනා තිදෙන ද, උපේක්ෂා වේදනා පස්පණස (55) ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද යන ධර්මයන් මේ ත්‍රිකයට ඇතුලත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **ඉෂ්ටාරම්මණ රසානුභවනය** - ස්වභාවයෙන්ම යහපත් වූ රූප ශබ්දාදී අරමුණු ඉෂ්ටාරම්මණ නම් වෙති. එවැනි යහපත් ස්වභාව ඇති අරමුණක රස විඳගැනීම සිදුවනුයේ සතුටු සිතකිනි. එම සතුට සුඛ වේදනාව නම් වේ.

02. **ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ** - චිත්ත චෛතසිකයන්ගේ මිශ්‍ර බව කරුණු සතරකින් යුක්ත වේ. ඒකෝත්පාද, ඒකනිරෝධ, ඒකාරම්මණ, ඒකවත්ථුක යන කරුණු සතරෙනි. **ඒකෝත්පාද** - පෙර පසු නොවී, එකවර ඉපදීම ; **ඒකනිරෝධ** - පෙර පසු නොවී එකවර නිරුද්ධ වීම ; **ඒකාරම්මණ** - වෙන වෙන අරමුණු නොගෙන එකම අරමුණක් ගැනීම ; **ඒකවත්ථුක** - වෙන වෙන වස්තුවක නොඉපදී එකම වස්තුවක ඉපදීම යනුවෙනි. මෙහි වස්තුව යනු සිත උපදින ස්ථානයට නමකි. සිත උපදින ස්ථාන සයක් ඇත. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය නම් වූ ප්‍රසාද වස්තු පසත් හෘදය වස්තුවත් යන සයය. ඔවුනතුරෙන් ප්‍රසාද වස්තු රූප ආශ්‍රිතව උපදින සිත් දෙපස් විඤ්ඤාණය පමණි. ඉතිරි සිත් 79 අතුරෙන් අරූපාවචර විපාක සතර හැර සෙසු සිත් 75 උපදිනුයේ හෘදය වස්තුව ආශ්‍රිතවය. සිත උපදින වස්තු රූපය ඇසුරු කොට ගෙනම ඒ චිත්ත චෛතසිකයෝ ද උපදිත්. මෙසේ මේ කරුණු සතරින් යුක්ත වූ විට ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ යයි කියන ලදී.

03. **අනිෂ්ටාරම්මණ රසානුභවන ලක්ෂණ** - ස්වභාවයෙන්ම යහපත් නො වූ රූපාදී අරමුණු අනිෂ්ටාරම්මණ නම් වේ. එවැනි අනිෂ්ට අරමුණක් ගන්නා සිතේ පහළවනුයේ දුක්ඛ, දෝමනස්ස වැනි දුක්ඛ වේදනාවකි.

04. **මධ්‍යස්ථාරම්මණ රසානුභවන ලක්ෂණ** - යහපත් හෝ අයහපත් හෝ නොවන ස්වභාවය ඇති රූපාදී අරමුණු මධ්‍යස්ථාරම්මණ නමින් හැඳින් වේ. එවැනි මධ්‍යස්ථ අරමුණක රස විඳගන්නා වේදනාව උපේක්ෂා වේදනාව නම් වේ.

05. **උපේක්ෂා** - උපේක්ෂා ජාති දශයක් තිබේ. ඡලංගුපෙක්ඛා, බ්‍රහ්මවිහාරුපෙක්ඛා, බොජ්ඣංගුපෙක්ඛා, තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, වේදනුපෙක්ඛා, විපස්සනුපෙක්ඛා, සංඛාරුපෙක්ඛා, විරියුපෙක්ඛා, ඣානුපෙක්ඛා, පාරිසුද්ධුපෙක්ඛා යනු උපේක්ෂා දශය ය. ඔවුනතුරෙන් මේ වේදනා ත්‍රිකයේ එන්නේ වේදනුපේක්ෂාව ය.

06. **අභිධෙය්‍යාර්ථය** - කුසල, අකුසල, සුඛාය වේදනාය සම්ප්‍රයුක්ත යනාදී එක එක වචනයක් ඇතුලේ පරමාර්ථ වශයෙන් ඇත්තා වූ චිත්ත චෛතසික රූප නිර්වාණ යන යම් ධර්මයක් වේ නම් එය අභිධෙය්‍යාර්ථය නම් වේ. නිදසුනක් වශයෙන් මෙසේය,

**කුසලා ධම්මා** - යන පදයට කුසල් සිත් 21 හා එහි ම ඇත්තා වූ කුසල චෛතසික 38 ලැබෙන්නාහ. එම චිත්ත චෛතසික සමූහය කුසලා ධම්මා යන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් වෙති. ස්වරූපාර්ථය යනු ද එම තේරුමය.

07. **සුඛ සහගත තෙසැට (63) චිත්තය** - ලෝභ මූල සෝමනස්ස සහගත සිත් 4 යි, සුඛ සහගත කායවිඤ්ඤාණ 1 යි, සෝමනස්ස සහගත සන්තීරණ 1 යි, හසිතෝත්පාද 1 යි, කාමසෝභන සෝමනස්ස සහගත සිත් 12 යි, රූපාවචර සෝමනස්ස සහගත සිත් 12 යි, සවිස්තර ලෝකෝත්තර සෝමනස්ස සහගත සිත් 32 යි. සියල්ල 63 කි.

08. **දුක්ඛ සහගත සිත් තුන** - දුක්ඛ සහගත කායවිඤ්ඤාණ 1 යි, දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සිත් 2 යි. සියල්ල තුනකි.

09. **උපේක්ෂා සහගත සිත් පස්පණස (55)** - ලෝභ මූල උපේක්ෂා සහගත සිත් 4 යි, මෝහ මූල සිත් 2 යි, අහේතුක සිත් අතුරෙන් කායවිඤ්ඤාණ සිත් දෙක ද සුඛ සහගත සන්තීරණය ද හසිතෝත්පාදය ද යන සිත් සතර හැර සිත් 14 යි, කාමසෝභන

උපේක්ෂා සහගත සිත් 12 යි, මහග්ගත උපේක්ෂා සහගත සිත් 15 යි, ලෝකෝත්තර උපේක්ෂා සහගත සිත් 8 යි. සියල්ල 55 කි.

10. **නිස්සත්ව** - සත්වයෙක් පුද්ගලයෙක් නොවන්නේ නිස්සත්ව නම් වේ.

11. **නිජ්ජීව** - ජීවයක් නොවන්නේ නිජ්ජීව නම් වේ.

12. **පරමාර්ථ ස්වභාව ධර්ම** - සම්මුතිය නම් වූ ලෝක ව්‍යවහාරයට අයත් නොවන චිත්ත චෛතසික රූප නිර්වාණ නම් වූ ධර්ම කොට්ඨාශයට අයත් දේ.

13. (සන්ති - සංවිජ්ජන්ති) සමානාර්ථ ඇති ආඛ්‍යාත පද දෙකකි. **සන්ති** - යනුද විද්‍යමානව ඇත්තාහ යන තේරුමය. සංවිජ්ජන්ති යනු ද එම අර්ථයමැයි.

14. **කුසල ත්‍රිකයට අනතුරුව වේදනා ත්‍රිකය වදාරා ඇත්තේ මන්ද?** කුසල, අකුසල, අව්‍යාකෘත සියලුම චිත්තයන් සමග බොහෝසෙයින් අරමුණු රස විඳින වේදනාව ප්‍රකට චෛතසිකයක් බැවින් අවබෝධය පහසු වනු පිණිස වේදනා ත්‍රිකය, කුසල ත්‍රිකයට අනතුරුව වදාරා ඇත.

15. **ත්‍රික මාතිකාවන්ගේ අනුපිළිවෙළ කෙසේද? ''අවයවානං අනේක භේදත්තං දස්සනත්ථං තිකන්තර දේසනා''** සතර පරමාර්ථ නම් වූ අවයවයන්ගේ අනේකප්‍රකාර බව දක්වනු පිණිස ත්‍රික මාතිකාවන්ගේ අනුපිළිවෙළ දේශනාව කරන ලදී.

16. **වේදනා චෛතසිකය වේදනා ත්‍රිකයේ එකම පදයකටවත් ඇතුලත් නොවූයේ මන්ද?** එක සිතක ඇත්තේ එක වේදනා චෛතසිකයකි. වේදනාව සම්ප්‍රයුක්ත වීමට තවත් වේදනාවක් ඒ සිතේ නැති බැවින් වේදනාව වේදනා ත්‍රිකයට ඇතුලත් නොවේ. සම්ප්‍රයුක්ත වීම නම් ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වීම යි.

17. **වේදනා ත්‍රිකයට සර්වලබ්ධ නාම ත්‍රිකය යයි කියන ලද්දේ මන්ද?** අවයවූපචාරයෙනි. ''වේදනා'' යන වචනය සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යන පද තුනටම අයත් වන අවයව වචනයකි. එහෙයින් එම අවයව වචනය ගෙන ඉතිරි පද තුනට සාධාරණ වනසේ වේදනා ත්‍රිකය යයි නම් කරන ලදී.

18. ***අවයවෙ පවත්තෝ යෝ - වෝහාරො සමූහේ කතෝ***

***තං යථා වෙ සමං චුණ්ණං - සමන්තෙත්ථවයවං මතං***

***(ශබ්දසාරාර්ථ ජාලිනී)***

අවයවයෙහි පැවති වචනය සමූහයකට එකතු කරන ලද නම් එය අවයවූපචාරය යි. ඉඟුරු මිරිස් තිප්පිලි අරළු බුළු නෙල්ලි ආදිය සමව ගෙන චූර්ණ කොට ගැනීම **''සමං චුණ්ණං''** යි කියනු ලැබේ. එහි **''සමං''** යනු බෙහෙත් වර්ග සියල්ලනට පොදු වචනය යි. එය එකතු කිරීමෙන් සමව සුණු කොට යන අර්ථය ලැබේ. වේදනා ත්‍රිකයට සර්වලබ්ධ නාම ත්‍රිකය යයි කියනුයේ ද එසේ අවයවූපචාර වශයෙනි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. වේදනා ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**වේදනා ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 4 වැනි පාඩම

# 3. විපාක ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **විපාකා ධම්මා - විපාකධම්ම ධම්මා - නේව විපාක න විපාකධම්ම ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ වේදනා ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව විපාක ත්‍රිකය වදාළ සේක. ඒ විපාක ත්‍රිකය ද ප්‍රථම පදය ද්විතීය පදය තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළසේක් ද යත්, **විපාකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **විපාකධම්ම ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නේව විපාක න විපාකධම්ම ධම්මා** යනුවෙනි.

04. **විපාකා** - ඔවුනොවුන් හට ප්‍රතිපක්ෂ වූ කුසලාකුසලයන්ගේ විපාක නම් වූ **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **විපාකධම්ම** - සැප දුක් විපාක උපදවන ස්වභාව ඇත්තා වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **නේව විපාක** - ඔවුනොවුන් හට ප්‍රතිපක්ෂ වූ කුසලාකුසලයන්ගේ විපාක ද නො වූ, **න විපාකධම්ම** - සැප දුක් උපදවන ස්වභාව ද නැත්තා වූ, **ධම්මා** - නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **විපාකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතිස් (36) විපාක චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් (38) චෛතසිකය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

09. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටතිස් (38) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සතිස් (36) විපාක චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) විපාක චිත්තය මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සම්පටිච්ඡන දෙසිත මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සූවිසි (24) විපාක චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, තත් සම්ප්‍රයුක්ත පන්තිස් (35) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාදයෝ සත්තිස (37) සත්‍ය විනිර්මුක්ත නම් වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

13. **විපාකධම්ම ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල චිත්තය ද, එක්විසි (21) කුසල චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

15. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දෙපණස් (52) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. දොළොස් අකුසල් චිත්තය ද, එක්විසි (21) කුසල චිත්තය ද විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

16. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය ද, එක්විසි (21) කුසල චිත්තය ද මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

17. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය ද, එක්විසි (21) කුසල චිත්තය ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත එක්පණස් (51) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය.

19. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකූන්තිස (29) සත්‍ය විනිර්මුක්ත වෙති. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

20. **නේව විපාක න විපාකධම්ම ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි සමවිසි (20)

ක්‍රියා චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත පන්තිස් (35) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද යන මේ ධර්මයෝ ලැබෙන්නාහ.

21. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් තෙළෙස (13) කි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

22. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. පන්තිස් (35) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි තෙතිස් (33) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සමවිසි (20) ක්‍රියා චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

23. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කායායතනය නම් වන්නේ ය.

24. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ නම් වූ භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

25. සමවිසි (20) ක්‍රියා චිත්තය මනායතනය නම් වන්නේ ය. පන්තිස් (35) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

26. ධාතු වශයෙන් තෙළෙස් (13) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම්

වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කාය ධාතුව නම් වන්නේ ය.

27. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරවර්ජන චිත්තය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි එකුන්විසි (19) ක්‍රියා චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

28. පන්තිස් (35) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් තෙළෙස් වැදෑරුම් වන්නාහ.

29. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමවිසි (20) ක්‍රියා චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත පන්තිස් (35) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍ය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

30. මේ ශබ්දාවලිය හෙවත් විපාක ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුලත් කොට වදාළ හෙයින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **විපාකා** - විපාක සිත් 36 සහ තත් සම්ප්‍රයුක්ත චෛතසික 38 විපාක නමින් හැඳින්වෙති. කුසලාකුසලයන් අනුව ලැබෙන කර්මජ රූපයන් හඳුන්වනුයේ කටත්තා රූප නමිනි. රූප ධර්මයන්ට විපාක යන ව්‍යවහාරයක් නොමැත. නිදසුනක් වශයෙන් මෙසේ දතයුතුය.

වී ඇටයකින් ගොයම් පඳුරක් හටගනී. එහෙත් එහි අස්වැන්න, ඵලය හැටියට ගනුයේ වී කරල්, වී ඇට පමණකි. එය එහි ප්‍රධාන ඵලයයි. ගොයම් ගස ගොයම් කොළ ආදිය ප්‍රධාන ඵලය නොවේ. එමෙන් කුසලාකුසල කර්මයන්ගේ ඵලය නමින් ගැනෙනුයේ කුසලාකුසල නාමධර්මයන්ට සමාන වූ විපාක චිත්ත චෛතසික පමණකි. **''අඤ්ඤමඤ්ඤ විරුද්ධානං කුසලාකුසලානං පාකාති විපාකා, අරූප ධම්මානමේතං අධිවචනං''** යන ධම්මසංගණී අටුවා පාඨයෙන් ද මෙසේම පැහැදිලි කොට ඇත.

02.**විපාකධම්ම** - විපාක ඉපදවීමට සමර්ථයෝ ය. ඔවුහු නම් කුසලාකුසල ධර්මයෝම ය.

03.**සතිස් (36) විපාක චිත්තය** - අකුසල විපාක සිත් 7 කි. අහේතුක කුසල විපාක සිත් 8 කි. සහේතුක කාමාවචර විපාක සිත් 8 කි. මහග්ගත විපාක සිත් 9 කි. ලෝකෝත්තර ඵල සිත් 4 කි. සියලු විපාක සිත් 36 කි.

04.**අටතිස් (38) චෛතසිකය** - අන්‍යසමාන චෛතසික 13 කි. සෝභන චෛතසික 25 කි. සියල්ල 38 කි.

05.**ලෞකික විපාක 32** - අහේතුක කාමාවචර විපාක 15 කි. සහේතුක කාමාවචර විපාක 8 කි. මහග්ගත විපාක 9 කි. සියල්ල 32 කි.

06.**ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද 37** - ලෝකෝත්තර සිතෙහි යෙදෙන චෛතසික 36 සහ ඵල සිත් සියල්ල එකක් බැගින් ගත් කල්හි ලැබෙන චිත්ත චෛතසික 37 වෙති.

07.**දොළොස් අකුසල චිත්තය** - ලෝභ මූල සිත් 8 කි. දොස මූල සිත් 2 කි. මෝහ මූල සිත් 2 කි. අකුසල් සිත් සියල්ල 12 කි.

08.**එක්විසි (21) කුසල චිත්තය** - කාමාවචර කුසල් සිත් 8 කි. රූපාවචර කුසල් සිත් 5 කි. අරූපාවචර කුසල් සිත් 4 කි. ලෝකෝත්තර මාර්ග කුසල් සිත් 4කි. සියල්ල 21 කි.

09.සම**විසි (20) ක්‍රියා චිත්තය** - පඤ්චද්වාරාවර්ජන චිත්තය, මනෝද්වාරාවර්ජන චිත්තය, ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලාට පමණක් ලැබෙන හසිතෝද්පාදය, මහා ක්‍රියා 8, මහග්ගත ක්‍රියා 9 යන මේ සියල්ල ක්‍රියා සිත් 20 කි.

10. **නේව විපාක න විපාකධම්ම ධම්මා -** විපාක චිත්ත චෛතසික නො වූ ද, විපාක ඉපදවීමට සමත් කුසලාකුසල නො වූ ද සියල්ල මේ නමින් ගැනෙයි. ක්‍රියා සිත් 20 ද, එහි යෙදෙන චෛතසික 35 ද, රූප 28 ද, නිර්වාණය ද මෙයට ඇතුලත් ය.

11. **රූප ජාති අතුරෙන් කර්මජ රූපයන් විපාක නමින් නොගන්නේ මන්ද?** කර්මයෙන් හට ගන්නා රූප කටත්තා රූප නමින් ගනු විනා විපාක නමින් නොගැනේ. " **කුසලාකුසල කම්ම සමුට්ඨානානම්පි කටත්තා රූපානං නත්ථි විපාක වෝහාරෝ** " යනුවෙන් විභාවිනී ටීකාවෙහි දැක්වෙනුයේ මේ තේරුමය.

12. **එසේනම් උපාදින්න ත්‍රිකයේ දී උපාදින්න පදයෙන් කර්මජ රූපයන් ගන්නා ලද්දේ මන්ද?** විපාක නමින් ප්‍රධාන ඵලය ද, උපාදින්න නමින් ප්‍රධාන අප්‍රධාන ඵල දෙක ද යන දෙකම ගැනෙන බැවිනි. විපාක යන ප්‍රධාන ඵලයෙන් නාම ධර්ම පමණක් ද උපාදින්න යන ප්‍රධාන අප්‍රධාන ඵලයෙන් නාමරූප දෙක ද ගනු ලැබෙන බව සැලකිය යුතුය.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. විපාක ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**විපාක ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 5 වැනි පාඩම

# 4. උපාදින්න ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **උපාදින්න උපාදානීයා ධම්මා - අනුපාදින්න උපාදානීයා ධම්මා - අනුපාදින්න අනුපාදානීයා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විපාක ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව උපාදින්න ත්‍රිකය වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළසේක් ද යත්, **උපාදින්න උපාදානීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනුපාදින්න උපාදානීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනුපාදින්න අනුපාදානීයා ධම්මා** යනුවෙනි.

04. **උපාදින්න -** දැඩිකොට ගන්නා ලද අරමුණක් අනුව රැස්කළ කර්මය විසින් ස්වකීය ඵලභාවයෙන් ළඟාකොට ගන්නා ලද්දා වූ ද, **උපාදානීයා -** තෘෂ්ණා දෘෂ්ටි උපාදානයන්ට හිත වූ ද, **ධම්මා -** නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අනුපාදින්න -** දැඩිකොට ගන්නා ලද අරමුණක් අනුව රැස්කළ කර්මයක ඵලභාවයෙන් ළඟාකොට නොගන්නා ලද්දා වූ නමුත්, **උපාදානීයා -** තෘෂ්ණා දෘෂ්ටි උපාදානයන්ට හිත වූ **ධම්මා -** නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අනුපාදින්න -** දැඩිකොට ගන්නා ලද අරමුණක් අනුව රැස්කළ කර්මයක ඵලභාවයෙන් ළඟා කොට නොගන්නා ලද්දා වූ ද, **අනුපාදානීයා -** තෘෂ්ණා දෘෂ්ටි උපාදානයන්හට හිත නො වූ ද, **ධම්මා -** නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **උපාදින්න උපාදානීයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික විපාක සිත් දෙතිස (32) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස (35) ද, කර්මජ රූප සමවිස්ස (20) ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් එකොළොසකි. ධාතු වශයෙන් සතළොසකි (17). ආර්ය සත්‍ය වශයෙන් එකකි.

09. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමවිසි (20) කර්මජ රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. පන්තිස් (35) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි තෙතිස් (33) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෞකික විපාක සිත් දෙතිස (32) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමවිසි (20) කර්මජ රූපයන් අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කායායතනය නම් වන්නේ ය.

11. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

12. ලෞකික විපාක සිත් දෙතිස (32) මනායතනය නම් වන්නේ ය. පන්තිස් (35) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, උපචය රූපය, සන්තති රූපය යන සුඛුම රූප නවය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් සතළොස් (17) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමවිසි (20) කර්මජ රූපයන් අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කාය ධාතුව නම් වන්නේ ය.

14. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

15. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සම්පටිච්ඡන දෙසිත මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි ලෞකික විපාක සිත් සමවිස්ස (20) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

16. පන්තිස් (35) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, උපචය රූපය, සන්තති රූපය යන සුඛුම රූප නවය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් සතළොස් (17) වැදෑරුම් වන්නාහ.

17. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස (35) ද, කර්මජ රූප සමවිස්ස (20) ද යන සියල්ල දුක්ඛ සත්‍ය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

18. **අනුපාදින්න උපාදානීයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස (12) ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස (52) ද, චිත්තජ රූප සතළොස (17) ද, ඍතුජ රූප පසළොස (15) ද, ආහාරජ රූප තුදුස

(14) ද, ජරතා අනිච්චතා රූපද්වය ද යන මේ ධර්මයෝ ලැබෙන්නාහ.

19. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් සතකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

20. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චිත්තජ රූප සතළොස (17) ද, ඍතුජ රූප පසළොස (15) ද, ආහාර රූප තුදුස (14) ද, ජරතා අනිච්චතා රූපද්වය ද රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

21. ආයතන වශයෙන් සත් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, තිජරූපයන් අතුරෙන් වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

22. අකුසල් සිත් දොළොස (12) ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය, ආපෝ ධාතුව, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප දොළොස ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් සත් වැදෑරුම් වන්නාහ.

23. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, තිජ රූපයන් අතුරෙන් වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

24. පඤ්චද්වාරාවර්ජන චිත්තය මනෝ ධාතුව නම් වන්නේ ය. අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, එකුන්විසි (19) ක්‍රියා චිත්තය ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

25. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප දොළොස ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

26. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත එක්පණස් (51) චෛතසිකය ද, චිත්තජ රූප සතළොස (17) ද, ඍතුජ රූප පසළොස (15) ද, ආහාර රූප තුදුස (14) ද, ජරතා අනිච්චතා රූපද්වය ද දුක්ඛ සත්‍ය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

27. **අනුපාදින්න අනුපාදානීයා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත සතිස් (36) චෛතසිකය ද, නිර්වාණය ද යන මේ ධර්මයෝ ලැබෙන්නාහ.

28. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

29. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෝකෝත්තර සිත් අට විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

30. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනායතනය නම් වන්නේ ය. සතිස් (36)

චෛතසිකය ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

31. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

32. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

33. මේ ශබ්දාවලිය හෙවත් උපාදින්න ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහි ලා ඇතුලත් කොට වදාළ හෙයින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **උපාදින්න -** උප + ආදින්න = උපාදින්න, දැඩිකොට ගන්නා ලද දෙය ය. 'උප' යනු දළ්හාර්ථයෙහි උපසර්ග පදයකි. දැඩිකොට ගන්නා ලද අරමුණක් ඇතිව රැස්කළ කර්මයක ප්‍රතිඵලය උපාදින්න යන්නෙන් කියැවේ. එනම් විපාක චිත්ත චෛතසික හා කර්මජ රූපයෝ ය.

02. **උපාදානීය** - උප + ආදානීය = උපාදානීය, තෘෂ්ණා දෘෂ්ටි දෙකින් දැඩිව මමය, මගේ යයි ගනු ලබන සියල්ල උපාදානිය යි. එනම් ලොවට අයත් චිත්ත චෛතසික රූපධර්ම සියල්ලටම නමකි.

03. **අනුපාදින්න** - තෘෂ්ණා, දෘෂ්ටි උපාදානයන් විසින් දැඩිකොට ගන්නා ලද අරමුණක් ඇතිව රැස්කළ කර්මයක ප්‍රතිඵලයක් නොවන සියල්ලට සාධාරණ වචනයකි. විපාක චිත්ත චෛතසික හා කර්මජ රූප හැර සෙසු කුසල, අකුසල, ක්‍රියා, රූප, නිර්වාණයට නමකි.

04. **අනුපාදානීය** - තෘෂ්ණා දෘෂ්ටි උපාදානයන්ට කිසිසේත්ම අරමුණු නොවන ලොවට අයත් නැති ලෝකෝත්තර චිත්ත, චෛතසික සහ නිර්වාණයට නමකි.

05. **උපාදාන** - මමය, මගේය යයි දැඩි ලෙස අල්වා ගන්නා වූ තෘෂ්ණා, දෘෂ්ටි දෙකට නමකි.

06. **උපාදානයන්ට හිත වූ** - තෘෂ්ණා දෘෂ්ටි උපාදානයන්ට අරමුණු වන ලෞකික ධර්ම සියල්ලට නමකි.

07. **පූර්ව භව** - මේ ආත්මයට පෙර ඉපදී සිටි සියළු ආත්මභාවයන් පූර්ව භව නමින් ගැනේ.

08. **කර්මජ රූප 20 - ඒකාන්ත කර්මජ රූප 9 කි** - චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන ප්‍රසාද රූප පසත්, භාව රූප දෙකත්, හෘදය සහ ජීවිත රූපත් සමග නවයකි. **අනේකාන්ත කර්මජ රූප 11 කි** - පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන භූත රූප සතර ද, වර්ණ, ගන්ධ, රස, ඕජා සතරත්, ආකාස, උපචය, සන්තති තුනත් සමග එකොළොසකි. (ඒකාන්ත කර්මජ රූප 9 යි. අනේකාන්ත කර්මජ රූප 11 යි.) සියල්ල 20 කි.

09. **චිත්තජ රූප 17 - ඒකාන්ත චිත්තජ රූප 2 කි** - කායවිඤ්ඤත්තිය, වචීවිඤ්ඤත්තිය යන දෙක ය. **අනේකාන්ත චිත්තජ රූප 15 කි** - එනම් පඨවි, ආපෝ, තේජෝ. වායෝ යන භූත රූප සතර ය. වර්ණ, ශබ්ද, ගන්ධ, රස යන විෂය රූප සතර ය. ආහාර, ආකාස, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා, උපචය, සන්තති යන සත ය. (ඒකාන්ත චිත්තජ රූප 2 යි. අනේකාන්ත 15 යි.) සියල්ල 17 කි.

10. **ඍතුජ රූප 15** - චිත්තජ රූප දාහතෙන් විඤ්ඤත්ති රූප දෙක අඩු කොට ගත් කල්හි ලැබෙන රූප 15 යි. ඒකාන්ත ඍතුජ රූපයක්

නොමැත. ඍතුජ රූප පසළොසම අනේකාන්ත වෙති. අනේකාන්ත යනු වෙනත් සමුට්ඨානයන්ට සාධාරණ බව යි.

11. **ආහාරජ රූප 14 -** ඉහත සඳහන් ඍතුජ රූප 15 අතුරෙන් ශබ්ද රූපය අඩු කොට ඉතිරි රූප 14 ආහාරජ රූප වශයෙන් ලැබෙන්නාහ. ඒකාන්ත ආහාරජ රූපයක් නැත. ආහාරජ රූප 14 ම අනේකාන්ත ය.

12. **තිජ රූප** - චිත්තජ, ඍතුජ සහ ආහාරජ යන රූප ජාති තුනටම තිජ රූපයෝ යයි කියති. තිජ රූපය යයි කී තැනක එම රූප ජාති තුනම ගත යුතුය.

13. **මාර්ග චිත්තෝත්පාද -** ලෝකෝත්තර මාර්ග චිත්තයක උපරිම පරිච්ඡේදයෙන් චෛතසික 36 ක් සම්ප්‍රයුක්ත වෙති. සිතත් සමග ධර්ම 37 කි. මාර්ගාංග අට මාර්ග සත්‍යය නමින් වෙන්කොට ගත් කල්හි ඉතිරිවනුයේ චෛතසික 28 කි. සිතත් සමග 29 කි.

14. **ඵල චිත්තෝත්පාද 37 -** ඉහත සඳහන් පරිදි ලෝකෝත්තර ඵල සිතක ද වැඩිම චෛතසික ගණන 36කි. සිතත් සමග 37 කි. ඒ සියල්ල ඵලචිත්තෝත්පාද නම් වෙති.

15. **සත්‍ය විනිර්මුක්ත -** දුක්ඛ සත්‍යය පිරිසිඳ දතයුත්තකි. සමුදය සත්‍යය ප්‍රහාණය කළයුත්තකි. නිරෝධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කළයුත්තකි. මාර්ග සත්‍යය භාවනා වශයෙන් වැඩිය යුත්තකි. ඉහත සඳහන් මාර්ග චිත්තෝත්පාද 29 සහ ඵල චිත්තෝත්පාද 37 ඒ කෘත්‍ය ජාති සතරෙන් එකකටවත් නොවැටෙන බැවින් ඒවා සත්‍ය විනිර්මුක්ත නම් වෙති.

16. **නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි -** ස්කන්ධ පසට අයත් නාම රූප සියල්ල උත්පාද, ඨිති, භංග ක්ෂණත්‍රයට වැටෙන බැවින් අතීතය, අනාගතය, වර්තමාන ආදී ප්‍රභේදයන්ට යටත් වෙයි. එහෙත් නිර්වාණ ධාතුව උත්පාදාදී ක්‍ෂණත්‍රයට හෝ අතීතාදී කාලයකට හෝ අයත් නොවන බැවින් ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත යි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. උපාදින්න ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**උපාදින්න ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 6 වැනි පාඩම

# 5. සංකිලිට්ඨ ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **සංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා - අසංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා - අසංකිලිට්ඨ අසංකිලේසිකා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ උපාදින්න ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **සංකිලිට්ඨ ත්‍රිකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අසංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අසංකිලිට්ඨ අසංකිලේසිකා ධම්මා** යනුවෙනි.

**04. සංකිලිට්ඨ** - ලෝභාදී කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දා වූ, **සංකිලේසිකා ධම්මා** - ලෝභාදී කෙලෙසුන්ට හිත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අසංකිලිට්ඨ** - ලෝභාදී කෙලෙසුන් විසින් නොකෙලෙසන ලද්දා වූ **සංකිලේසිකා ධම්මා** - ලෝභාදී කෙලෙසුන්ට හිත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අසංකිලිට්ඨ** - ලෝභාදී කෙලෙසුන් විසින් නොකෙලෙසන ලද්දා වූ, **අසංකිලේසිකා ධම්මා** - ලෝභාදී වූ කෙලෙසුන්ට හිත නො වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **සංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත සත්විසි (27) චෛතසිකය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

09. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සත්විසි (27) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පස්විසි (25) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. දොළොස් අකුසල චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය මනායතනය නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දොළොස් අකුසල චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත සවිසි (26) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. **අසංකිලිට්ඨ සංකිලේසිකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

15. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය

අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

16. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

17. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඓාට්ඨබ්බායතනය නම් වන්නේ ය.

18. ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

19. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

20. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස

රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

21. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා විඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන සිත ද, සම්පටිච්ඡන දෙසිත ද මනෝ ධාතුව නම් වන්නේ ය. ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ඉතිරි ලෞකික විපාක සිත් සමවිස්ස (20) ද, එකුන්විසි (19) ක්‍රියා චිත්තය ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

22. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

23. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

24. **අසංකිලිට්ඨ අසංකිලේසිකා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත සතිස් (36) චෛතසිකය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

26. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසිකය අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය.

ලෝකෝත්තර සිත් අට විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

27. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

28. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

29. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

30. මේ ශබ්දාවලිය හෙවත් සංකිලිට්ඨ ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සකල පරමාර්ථ ධර්මයන් මෙහි ලා ඇතුළත් කොට වදාළ හෙයින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **සංකිලිට්ඨ -** කෙලෙසන බාධාකරන දවන තවන උපතාපනය කරන කෙලෙසුන් සමග යෙදුනාවූ ධර්මතා සියල්ල සංකිලිට්ඨ නම් වෙයි. **"සංකිලේසේතීති සංකිලේසෝ, විබාධති උපතාපේතිවාති අත්ථෝ,**

**සංකිලේසේන සමන්නාගතා සංකිලිට්ඨා**" යන අටුවා පාඨයෙන් ඉහත සඳහන් අර්ථය කියැවේ.

02. **සංකිලේසා** - සන්තානය දවන තවන හිංසා පීඩාවට පත්කරන ක්ලේශ ධර්ම 10 දෙනෙක් ඇත. ලෝභය, ද්වේශය, මෝහය, මානය, දෘෂ්ටිය, විචිකිච්ඡාව, ථීන, උද්ධච්ච, අහිරික, අනෝත්තප්ප යන 10 දෙනා ය.

03. **සංකිලේසිකා** - කෙලෙසුන්ට අරමුණු වන බැවින් ද, කෙලෙසුන්ට ගොදුරුවන බැවින් ද, කෙලෙසුන්ට අරමුණු වීම නොවැළැක්විය හැකි බැවින් ද, කෙලෙස් පහළවීමට ආරම්මණ ප්‍රත්‍ය වන බැවින් ද සංකිලේසික නම් වන්නේ ය.

**"අත්තානං ආරම්මණං කත්වා පවත්තනේන සංකිලේසං අරහන්ති, සංකිලේසේ වා නියුත්තා, තස්ස ආරම්මණභාවං අනතික්කමනතෝති සංකිලේසිකා, සංකිලේසස්ස ආරම්මණ පච්චය භූතානං ඒතං අධිවචනං**" යන අටුවා පාඨයෙන් ඉහත දැක්වූ තේරුම කියැවේ.

04. **අසංකිලිට්ඨා** - දස විධ කෙලෙසුන් සමග මිශ්‍ර නො වූ ලෞකික ලෝකෝත්තර ධර්ම සියල්ල ගැනේ.

05. **අසංකිලේසිකා** - කෙලෙසුනට අරමුණු නොවන ලෝකෝත්තර ධර්ම සියල්ල ගැනේ.

06. **ලෝභාදී කෙලෙසුන්ට හිතවූ** - ලෝභ ආදී දශ කෙලෙසුන්ට අරමුණු වූ යන අදහස යි.

07. **අකුසල් සිත් 12** - ලෝභ මූල 8, දෝස මූල 2, මෝහ මූල 2. සියල්ල 12 කි.

08. **සත්විසි (27) චෛතසිකය** - සර්ව චිත්ත සාධාරණ 7, ප්‍රකීර්ණක 6, අකුසල 14. සියල්ල 27 කි.

09. **ලෞකික කුසල් සිත් 17** - කාමාවචර මහා කුසල් සිත් 8, රූපාවචර ධ්‍යාන කුසල් සිත් 5, අරූපාවචර ධ්‍යාන කුසල් සිත් 4. සියල්ල 17 කි.

10. **ලෞකික විපාක සිත් 32** - අකුසල විපාක සිත් 7, අහේතුක කුසල විපාක සිත් 8, මහා විපාක සිත් 8, මහද්ගත විපාක සිත් 9. සියල්ල 32 කි.

11. **ක්‍රියා සිත් 20** - පඤ්චද්වාරාවර්ජනය, මනෝද්වාරාවර්ජනය, හසිතෝත්පාදය, මහා ක්‍රියා සිත් 8, මහද්ගත ක්‍රියා සිත් 9. සියල්ල 20 කි.

12. **චෛතසික 38** - අන්‍යසමාන 13, සෝභන සාධාරණ 19, විරති 3, අප්පමඤ්ඤා 2, පඤ්ඤින්ද්‍රිය 1. සියල්ල 38 කි.

13. **රූප 28** - මහාභූත රූප 4, ප්‍රසාද රූප 5, විෂය රූප 4, භාව රූප 2, ජීවිත රූප 1, විඤ්ඤත්ති රූප 2, විකාර රූප 3, ලක්ෂණ රූප 4, හදය රූප 1, ආහාර රූප 1, ආකාස රූප 1. සියල්ල 28 කි.

14. **ලෝකෝත්තර සිත් 8** - ලෝකෝත්තර මාර්ග කුසල් සිත් 4, ලෝකෝත්තර ඵල සිත් 4. සියල්ල 8 කි.

15. **චෛතසික 36** - අන්‍යසමාන 13, සෝභන සාධාරණ 19, විරති 3, පඤ්ඤින්ද්‍රිය 1. සියල්ල 36 කි.

16. කෙලෙසුන් සමග එකට උපදින චිත්තජරූප ඇතත් සිත සමග සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර නොවන බැවින් රූප ධර්ම සංකිලිට්ඨ නොවෙති. එහෙත් ත්‍රෛභූමික නාමරූප සියල්ලම සංකිලේසිකා පදයට ඇතුලත් වෙයි. කෙලෙසුන්ට අරමුණු වන බැවිනි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. සංකිලිට්ඨ ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සංකිලිට්ඨ ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 6. විතර්ක ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **සවිතක්ක සවිචාරා ධම්මා - අවිතක්ක විචාරමත්තා ධම්මා - අවිතක්ක අවිචාරා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ සංකිලිට්ඨ ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව විතර්ක ත්‍රිකය වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සවිතක්ක සවිචාරා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අවිතක්ක විචාරමත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අවිතක්ක අවිචාරා ධම්මා** යනුවෙනි.

04. **සවිතක්ක -** විතර්කය ද සහිත වූ, **සවිචාරා ධම්මා -** විචාරය ද සහිත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අවිතක්ක -** විතර්කය රහිත වූ, **විචාරමත්තා ධම්මා** - විචාරය පමණක් ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අවිතක්ක** - විතර්කය ද රහිත වූ, **අවිචාරා ධම්මා** - විචාරය ද රහිත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **සවිතක්ක සවිචාරා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් විතර්ක විචාර සහිත පස්පණස් (55) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක විචාර දෙක වර්ජිත සමපණස් (50) චෛතසිකය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

09. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමපණස් (50) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි අටසාලිස් (48) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සවිතක්ක සවිචාර සිත් පස්පණස (55) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සවිතක්ක සවිචාර සිත් පස්පණස (55) මනායතනය නම් වන්නේ ය. සමපණස් (50) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන දෙසිත ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සවිතක්ක සවිචාර සිත් දෙපණස (52) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සමපණස් (50) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සවිතක්ක සවිචාර සිත් සත්සාලිස (47) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත චෛතසික එකුන්පණස (49) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය.

13. ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ (සම්මා සංකප්ප වර්ජිත) සම්මා දිට්ඨි, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ සත් දෙන එක් වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ සත් දෙන එක් වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ සත් දෙන එක් වරක් ද, අර්හත් මාර්ගාංගයෝ සත් දෙන එක් වරක් ද මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසි (28) දෙන ද, ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන ඵල චිත්තෝත්පාදයෝ (විතර්ක විචාර වර්ජිත) පන්තිස් (35) දෙන ද

සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

14. **අවිතක්ක විචාරමත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ද්විතීය ධ්‍යාන සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක විචාර දෙක වර්ජිත සතිස් (36) චෛතසික ද, සවිතක්ක සවිචාර සිත් පස්පණසෙහි වූ පස්පණස් (55) විතර්කය ද ලැබෙන්නාහ.

15. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

16. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය ද, විතර්ක පස්පණස (55) ද සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සිත් එකොළොස විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

17. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ද්විතීය ධ්‍යාන සිත් එකොළොස මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, විතර්ක පස්පණස (55) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරම් වන්නාහ.

18. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ද්විතීය ධ්‍යාන සිත් එකොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, විතර්ක පස්පණස (55) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

19. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික ද්විතීය ධ්‍යාන සිත් තුන ද, තත් සම්ප්‍රයුක්ත විචාර වර්ජිත තෙතිස් (33) චෛතසිකය ද, ලෞකික සවිතක්ක සවිචාර සිත් සත්සාලිසෙහි (47) වූ විතර්ක සත්සාලිස (47) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර ද්විතීය ධ්‍යාන මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ (සම්මා සංකප්ප වර්ජිත) සම්මා දිට්ඨි ආදී සෝවාන් මාර්ගාංග සත් දෙන එක් වරක් ද, සකදාගාමී මාර්ගාංග සත් දෙන එක් වරක් ද, අනාගාමී මාර්ගාංග සත් දෙන එක් වරක් ද, අර්හත් මාර්ගාංග සත් දෙන එක් වරක් ද,

ලෝකෝත්තර ප්‍රථම ධ්‍යානය මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා සංකප්ප සතර දෙන ද මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද අටවිසි (28) දෙන ද, ලෝකෝත්තර ද්විතීය ධ්‍යාන ඵල චිත්තෝත්පාද පන්තිස් (35) දෙන ද, ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන ඵල සිත් සතර සමග යෙදුනා වූ සම්මා සංකප්ප සතර දෙන ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

20. **අවිතක්ක අවිචාරා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අවිතක්ක අවිචාර සිත් පස්පණස (55) ද, තත් සම්ප්‍රයුක්ත සතිස් (36) චෛතසිකය ද, ද්විතීය ධ්‍යාන සිත් එකොළොසෙහි වූ විචාර එකොළොස ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද යන මේ ධර්මයෝ ලැබෙන්නාහ.

21. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් සතළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

22. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය ද, ද්විතීය ධ්‍යාන සිත් එකොළොසෙහි වූ විචාර චෛතසික එකොළොස ද සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අවිතක්ක අවිචාර සිත් පස්පණස (55) විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

23. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ඛු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

24. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන

භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

25. අවිතක්ක අවිචාර සිත් පස්පණස (55) මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, විචාර එකොළොස ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

26. ධාතු වශයෙන් සතළොස් (17) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

27. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

28. චක්ඛුවිඤ්ඤාණ දෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ දෙසිත සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ දෙසිත ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ දෙසිත ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ දෙසිත කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඉතිරි අවිතක්ක අවිචාර සිත් පන්සාලිස (45) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

29. සතිස් (36) චෛතසිකය ද, විචාර එකොළොස ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් සතළොස් (17) වැදෑරුම් වන්නාහ.

30. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික අවිතක්ක අවිචාර සිත් එක්තිස (31) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික තෙතිස (33) ද, රූපාවචර ද්විතීය ධ්‍යාන විචාර තුන ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර අවිතක්ක අවිචාර (තෘතීය, චතුත්ථ, පඤ්චම ධ්‍යාන) දොළොස් මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ (සම්මා සංකප්ප වර්ජිත) සම්මා දිට්ඨි ආදී වූ සෝවාන් මාර්ගාංගයෝ සත් දෙන තුන් වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ සත් දෙන තුන් වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ සත් දෙන තුන් වරක් ද, අර්හත් මාර්ගාංගයෝ සත් දෙන තුන් වරක් ද මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාදයෝ අටවිස්ස (28) ද, ලෝකෝත්තර ද්විතීය ධ්‍යාන මාර්ග චිත්තෝත්පාදයන්හි විචාර සතර ද, ලෝකෝත්තර (තෘතීය, චතුත්ථ, පඤ්චම ධ්‍යාන) ඵල චිත්තෝත්පාදයෝ පන්තිස (35) ද, ලෝකෝත්තර ද්විතීය ධ්‍යාන ඵල චිත්තෝත්පාදයන්හි විචාර සතර ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

31. මේ ශබ්දාවලිය හෙවත් විතර්ක ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

32. සවිතක්ක සවිචාර සිත් පස්පණසෙහි (55) යෙදුනා වූ විචාර පස්පණස (55) ඇතුළත් නො වූ බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **විතර්කය** - ප්‍රකීර්ණක චෛතසිකයකි. ධ්‍යානාංගයකි. ධ්‍යානාංගයක් බැවින් සිත් 121 අනුව ගණන් ගතයුතුය. එනිසා ධ්‍යාන ප්‍රභේදය අනුව විතර්කය සිත් 55 ක යෙදේ. එහි ලක්ෂණය නම් චිත්ත චෛතසිකයන් අරමුණට නැවත නැවත නැංවීමය.

02. **සවිතක්ක** - විතර්කය සමග සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසික සියල්ල සවිතර්කය. **"සහ විතක්කේන යේවත්තන්ති තේ සවිතක්කා"** විතර්කය සමග යමෙක් මිශ්‍ර වෙත් ද ඔවුහු සවිතර්කයෝ වෙති.

03. **විචාරය** - ප්‍රකීර්ණක චෛතසිකයකි. ධ්‍යානාංගයකි. විතර්කය මෙන් සිත් 121 අනුව ගණන් ගත යුතුය. සිත් 66 ක යෙදේ. එහි ලක්ෂණය නම් චිත්ත චෛතසිකයන් අරමුණේ නැවත නැවත හැසිරවීම ය. මීමැස්සා පිපුණු මලට වේගයෙන් පියාසර කරගෙන එන්නාක් මෙන් විතර්කය ද, මල මත්තෙහි හැසිරෙමින් රොන් උරා ගන්නාක් මෙන් විචාරය ද තේරුම් ගත යුතුය.

04. **සවිචාරය** - විචාරය සමග සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසිකයෝ සවිචාරයෝ ය. **"සහ විචාරේන යේ වත්තන්ති තේ සවිචාරා"** විචාරය සමග පවතින්නෝ සවිචාරයෝ ය.

05. **අවිතක්ක** - විතර්කය සමග සම්ප්‍රයෝග නොවන චිත්ත චෛතසික රූප නිර්වාණ සියල්ල අවිතක්ක ගණයට වැටේ.

06. **විචාරමත්ත** - විතර්ක, විචාර දෙක අතුරෙන් විතර්කය නොයෙදී විචාරය පමණක් යෙදෙන සිත් ඇත්තේ 11 කි. එම සිත් 11 ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක විචාර දෙක වර්ජිත සතිස් (36) චෛතසික ද විචාර මාත්‍ර නම් වෙති. එසේම විතර්ක සහිත සිත් පස්පණසෙහි (55) යෙදෙන විතර්ක පස්පණස (55) ද විචාරය සමග සම්ප්‍රයුක්ත වන හෙයින් විචාරමාත්‍ර ගණයට වැටේ.

07. **අවිචාර** - විචාර චෛතසිකය නොයෙදෙන චිත්ත චෛතසික රූප නිර්වාණ සියල්ල අවිචාර ගණයට වැටේ.

08. **සවිතක්ක සවිචාර සිත් 55** - දෙපස් විඥ්ඥාණ සිත් දසය හැර කාමාවචර සිත් 44, ප්‍රථම ධ්‍යාන සිත් 11. සියල්ල 55 කි.

09. **තත් සම්ප්‍රයුක්ත චෛතසික 50** - විතර්ක විචාර දෙක හැර ඉතිරි චෛතසික 50.

10. **ලෞකික සවිතක්ක සවිචාර සිත් 47** - දෙපස් විඥ්ඥාණ දසය හැර කාමාවචර සිත් 44, රූපාවචර ප්‍රථම ධ්‍යාන කුසල විපාක ක්‍රියා යන සිත් 3. සියල්ල 47 කි.

11. **ලෝකෝත්තර සවිතක්ක සවිචාර සිත් 8** - ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන කුසල සිත් 4, විපාක සිත් 4. සියල්ල 8 කි.

12. **ද්විතීය ධ්‍යාන සිත 11** - රූපාවචර ද්විතීය ධ්‍යාන කුසල විපාක ක්‍රියා යන සිත් 3, ලෝකෝත්තර ද්විතීය ධ්‍යාන කුසල සිත් 4, විපාක සිත් 4. සියල්ල 11 කි.

13. **තත් සම්ප්‍රයුක්ත චෛතසික 36** - විතර්ක විචාර දෙක හැර අන්‍ය සමාන 11, සෝභන සාධාරණ 19, විරති 3, අප්පමඤ්ඤා 2, පඤ්ඤින්ද්‍රිය සමග 36 කි.

14. **පස්පණස් (55) විතර්ක** - සවිතක්ක සවිචාර සිත් පස්පණසෙහි ඇත්තා වූ විතර්ක 55 කි.

15. **අවිතක්ක අවිචාර සිත් 55** - දෙපස් විඤ්ඤාණ සිත් 10, තෘතීය ධ්‍යාන 11, චතුර්ථ ධ්‍යාන 11, පඤ්චම ධ්‍යාන 23. සියල්ල 55 කි.

16. **ලෞකික අවිතක්ක අවිචාර සිත් 31** - දෙපස් විඤ්ඤාණ සිත් 10, රූපාවචර තෘතීය ධ්‍යාන සිත් 3, චතුර්ථ ධ්‍යාන සිත් 3, පඤ්චම ධ්‍යාන සිත් 3, අරූපාවචර සිත් 12. සියල්ල 31 කි.

17. **ලෝකෝත්තර අවිතක්ක අවිචාර සිත් 24** - ලෝකෝත්තර තෘතීය ධ්‍යාන සිත් 8, චතුර්ථ ධ්‍යාන සිත් 8, පඤ්චම ධ්‍යාන සිත් 8. සියල්ල 24 කි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. විතර්ක ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**විතර්ක ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 8 වැනි පාඩම

# 7. ප්‍රීති ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **පීති සහගතා ධම්මා - සුඛ සහගතා ධම්මා - උපෙක්ඛා සහගතා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විතර්ක ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව ප්‍රීති ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පීති සහගතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සුඛ සහගතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **උපෙක්ඛා සහගතා ධම්මා** යනුවෙනි.

04. **පීති සහගතා ධම්මා -** ඉෂ්ටාරම්මණයෙහි පිනායාම ලක්ෂණ කොට ඇත්තා වූ, ප්‍රීතිය සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **සුඛ සහගතා ධම්මා** - ඉෂ්ටාරම්මණ රසානුභවන ලක්‍ෂණ වූ, කායික මානසික සුඛ වේදනාව හා සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **උපෙක්ඛා සහගතා ධම්මා** - ඉෂ්ට මධ්‍යස්ථාරම්මණ රසානුභවන ලක්‍ෂණ වූ, උපේක්‍ෂා වේදනාව හා සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **පීති සහගතා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ප්‍රීති සහගත එක්පණස් (51) චිත්තයද, තත්

සම්ප්‍රයුක්ත ප්‍රීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත සසාලිස් (46) චෛතසික ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

09. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ප්‍රීති සහගත සසාලිස් (46) චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූසාලිස් (44) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ප්‍රීති සහගත එක්පණස් (51) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ප්‍රීති සහගත එක්පණස් (51) චිත්තය මනායතනය නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ප්‍රීති සහගත එක්පණස් (51) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික ප්‍රීති සහගත සත්විසි (27) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත පන්සාලිස් (45) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය.

13. ලෝකෝත්තර ප්‍රීති සහගත මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන දෙවරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන දෙවරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන දෙවරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන දෙවරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද අටවිස්ස (28) ද, ලෝකෝත්තර ප්‍රීති සහගත ඵල

චිත්තෝත්පාද සතිස (36) ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

14. **සුඛ සහගතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සුඛ සහගත තෙසැට (63) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත සසාලිස් (46) චෛතසිකය ද ලැබෙන්නාහ.

15. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

16. ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සසාලිස් (46) චෛතසිකය අතුරෙන් සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පන්සාලිස් (45) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සුඛ සහගත තෙසැට (63) චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

17. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සුඛ සහගත තෙසැට (63) චිත්තය මනායතනය නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරම් වන්නාහ.

18. ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සුඛසහගත කායවිඤ්ඤාණ සිත කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සිත් දෙසැට (62) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම් වන්නා හ.

19. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සුඛ සහගත සිත් එක්තිස (31) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත පන්සාලිස් (45) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර සුඛ සහගත මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන තුන් වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන තුන් වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත්දෙන තුන් වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන තුන් වරක්

ද, යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නාහ. ඉතිරි මාර්ග චිත්තෝත්පාද අටවිස්ස (28) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සතිස (36) ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

**20. උපෙක්ඛා සහගතා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උපේක්ෂා සහගත පස්පණස (55) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත වේදනා ප්‍රීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත සසාලිස් (46) චෛතසිකය ද ලැබෙන්නාහ.

**21.** ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් සතකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

22. ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, උපේක්ෂා සහගත සසාලිස් (46) චෛතසිකය අතුරෙන් සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පන්සාලිස් (45) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. උපේක්ෂා සහගත පස්පණස (55) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

23. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, උපේක්ෂා සහගත පස්පණස (55) චිත්තය මනායතනය නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

24. ධාතු වශයෙන් සත් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, උපේක්ෂා සහගත පස්පණස (55) චිත්තය අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සූසාලිස් (44) උපේක්ෂා සහගත චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් සත් වැදෑරුම් වන්නාහ.

25. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික උපේක්ෂා සහගත සිත් සත්සාලිස (47) ද, තත් සම්ප්‍රයුක්ත

ලෝභය වර්ජිත පන්සාලිස් (45) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය.

26. ලෝකෝත්තර උපේක්ෂා සහගත පඤ්චම ධ්‍යාන මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ (සම්මා සංකප්ප වර්ජිත) සම්මා දිට්ඨි ආදී සෝවාන් මාර්ගාංග සත් දෙන එක් වරක් ද, සකදාගාමී මාර්ගාංග සත් දෙන එක් වරක් ද, අනාගාමී මාර්ගාංග සත් දෙන එක් වරක් ද, අර්හත් මාර්ගාංග සත් දෙන එක් වරක් ද, යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද සවිස්ස (26) ද, ලෝකෝත්තර උපේක්ෂා සහගත පඤ්චම ධ්‍යාන ඵල චිත්තෝත්පාද තෙතිස (33) ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

27. මේ ශබ්දාවලිය හෙවත් ප්‍රීති ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

28. දෝස මූල දෙසිත ද, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය ද, තත් සම්ප්‍රයුක්ත දෙවිසි (22) චෛතසිකය ද, සුඛ සහගත කායවිඤ්ඤාණයෙහි සහ චතුර්ථධ්‍යාන සිත් එකොළොසෙහි වූ සුඛ වේදනා දොළොස ද, උපේක්ෂා වේදනා පස්පණස (55) ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද මේ ත්‍රිකයට ඇතුලත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **ප්‍රීතිය** - ප්‍රකීර්ණක චෛතසිකයකි. ප්‍රීතියෙහි ලක්ෂණය අරමුණෙහි පිනායන ස්වභාවය ය. චිත්ත චෛතසිකයන් වෙත පැතිරීමත් ඔවුන් තෘප්තිමත් කිරීමත් ප්‍රීතියේ පැවත්මය. ප්‍රීතිය වැටහෙන්නේ ඔදවැඩුණු තත්වයකිනි. සාමිස ප්‍රීතිය නිරාමිස ප්‍රීතිය නමින් ප්‍රීතිය දෙකකි. ලෝභ මූල සිත් සතරෙහිත් ලෝභ මූල ජවන් වීථියක සෝමනස්ස සන්තීරණයෙහිත් ප්‍රීතිය සාමිස ප්‍රීතිය ය.

නිරාමිස ප්‍රීතිය වනාහි සෝභන සිත්හිම යෙදේ. එය ද පස් ආකාරයකින් හටගනියි. ඛුද්ධිකා ප්‍රීති, ඛණිකා ප්‍රීති, ඔක්කන්තිකා ප්‍රීති, උබ්බේගා ප්‍රීති, ඵරණා ප්‍රීති නමිනි. ශරීරයෙහි ලොමු ඩැහැගැන්වෙන ප්‍රීතිය ඛුද්දිකා ප්‍රීතිය ය. ක්ෂණයෙන් ක්ෂණයට විදුලිය කොටන්නා සේ පහළ වනුයේ ඛණිකා ප්‍රීතිය ය. මුහුදේ රැළි

වෙරළ හැපෙන්නා සේ නැවත නැවතත් එනුයේ ඔක්කන්තිකා ප්‍රීතිය ය.

ශරීරය අහසට නංවන තරමේ බලවත් ප්‍රීතිය උබ්බේගා ප්‍රීතිය ය. බැලුමකට සුළඟ පිරුණා සේ සකල ශරීරයෙහි අතරක් නොහැර පැතිරෙනුයේ ඵරණා ප්‍රීතිය ය. මේ පස්වණක් ප්‍රීතිය වැඩෙන විට කාය-චිත්ත පස්සද්ධිය පහළ වේ. පස්සද්ධිය වැඩීමේ දී කායික චෛතසික සුඛය හටගනියි. නිරාමිස සුඛය වැඩීමේ දී ක්‍ෂණික සමාධියත්, උපචාර සමාධියත්, අර්පණා සමාධියත් වැඩෙති.

02. **ප්‍රීති සහගත සිත 51** - ලෝභ මූල සෝමනස්ස සහගත සිත් 4, සෝමනස්ස සන්තීරණ 1, හසිතෝත්පාද 1, මහා කුසල විපාක ක්‍රියා සෝමනස්ස සහගත සිත් 12, මහග්ගත ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන 11, ද්විතීය ධ්‍යාන 11, තෘතීය ධ්‍යාන 11 යනුවෙන් ප්‍රීති සහගත සිත් සියල්ල 51 කි.

03. **ප්‍රීති සහගත නොවන සිත් 70** - පටිඝ සිත් 2, කායවිඤ්ඤාණ සිත් 2, චතුර්ථ ධ්‍යානික සිත් 11, උපේක්ෂා සහගත සිත් 55. සියල්ල 70 කි.

04. **ප්‍රීති සහගත චෛතසික 46** - සර්වචිත්ත සාධාරණ 7, ප්‍රීතිය හැර ප්‍රකීර්ණක 5, දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා හැර අකුසල 9, සෝභන 25. සියල්ල 46 යි.

05. **ලෞකික ප්‍රීති සහගත සිත් 27** - ලෝභ මූල සෝමනස්ස සහගත සිත් 4, සෝමනස්ස සන්තීරණ 1, හසිතෝත්පාද 1, කාමසෝභන සෝමනස්ස සහගත සිත් 12, මහග්ගත ප්‍රීති සහගත සිත් 9. සියල්ල 27 යි.

06. **සුඛ සහගත සිත් 63** - ලෝභ මූල සෝමනස්ස සහගත සිත් 4, සුඛ සහගත කායවිඤ්ඤාණය, සෝමනස්ස සන්තීරණය, හසිතෝත්පාදය, කාමසෝභන සෝමනස්ස සහගත සිත් 12, මහග්ගත ලෝකෝත්තර ප්‍රථමධ්‍යාන 11, ද්විතීය ධ්‍යාන 11, තෘතීය ධ්‍යාන 11, චතුර්ථ ධ්‍යාන 11. සියල්ල 63 යි.

07. **සුඛ සහගත චෛතසික 46** - වේදනා චෛතසිකය වර්ජිත සර්වචිත්ත සාධාරණ 6, ප්‍රකීර්ණක 6, දෝස චතුෂ්කය සහ විචිකිච්ඡාව හැර ඉතිරි අකුසල චෛතසික 9, සෝභන 25. සියල්ල 46 යි.

08. **උපේක්ෂා සහගත සිත් 55** - උපේක්ෂා සහගත ලෝභ මූල 4, මෝහ මූල 2, අහේතුක 14, කාමසෝභන 12, මහග්ගත ලෝකෝත්තර 23. සියල්ල 55 යි.

09. **උපේක්ෂා සහගත චෛතසික 46** - වේදනා වර්ජිත සර්වචිත්ත සාධාරණ 6, ප්‍රීති වර්ජිත ප්‍රකීර්ණක 5, දෝස චතුෂ්කය වර්ජිත අකුසල 10, සෝභන 25. සියල්ල 46 යි.

10. **ලෞකික උපේක්ෂා සහගත සිත් 47** - ඉහත දැක්වූ උපේක්ෂා සහගත සිත් පස්පණස (55) අතුරෙන් පඤ්චමධ්‍යානික ලෝකෝත්තර සිත් අට හැර ඉතිරි උපේක්ෂා සහගත සිත් 47 යි.

11. **වේදනා ත්‍රිකයට වඩා ප්‍රීති ත්‍රිකයේ වෙනස කිම**? ප්‍රීති ත්‍රිකයේ ප්‍රථම පදය පමණක් වේදනා ත්‍රිකයට අසමාන වෙයි. එහි දෙවැනි, තෙවැනි පද දෙක වනාහි වේදනා ත්‍රිකයේ පළමුවැනි තුන්වැනි දෙපදයට සම්පූර්ණයෙන් සමාන වෙති.

12. ***''නිප්පීතික සුඛස්ස සප්පීතික සුඛතෝ විසේසදස්සන - වසේන අයංතිකෝ වුත්තෝ ''*** - නිෂ්ප්‍රීතික සුඛවේදනා දොළොසෙහිත් සප්‍රීතික සුඛවේදනා එක්පණසෙහිත් (51) වෙනස දැක්වීම පිණිස මේ ප්‍රීති ත්‍රිකය වදාරා ඇත. (අත්ථසාලිනී)

13. **නිෂ්ප්‍රීතික සුඛ වේදනා 12** - සුඛ සහගත කායවිඤ්ඤාණයෙහි සහ චතුර්ථධ්‍යාන සිත් එකොළොසෙහි වූ සුඛ වේදනාවෝ වෙති.

14. **සප්‍රීතික සුඛ වේදනා 51** - ප්‍රීති සහගත සිත් 51 හි වූ සුඛ වේදනා 51 වෙති.

15. ***''අථවා පීති සුඛානංදුබ්බිඤ්ඤෙය්‍යත්තා නානත්තානානත්ත දස්සනත්තං අයං තිකෝ වුත්තෝ ''*** **(මූලටීකා)** ප්‍රීති සුඛ දෙකෙහි සමාන අසමාන බව තේරුම් ගැනීමට අපහසු වන බැවින් ඒ වෙනස දැක්වීමට ප්‍රීති ත්‍රිකය වදාරා ඇත.

16. ***''චතුත්ථජ්ඣාන සුඛං අතිපණීත සුඛන්ති ඕළාරික තතෝ නීහරිත්වා කස්ස පණීතභාවං දස්සේතුං අයං තිතෝ වුත්තෝති කේචි වදන්ති''*** **(මූලටීකා කේචිවාද)** චතුර්ථ ධ්‍යාන එකොළොසෙහි සුඛ වේදනාව අතිශයින් උතුම් බැවින් ප්‍රණීත ය. අතිප්‍රණීත බව දැක්වීමට, ඕළාරික සුඛය එයින් වෙන්කිරීම පිණිස මේ ප්‍රීති ත්‍රිකය වදාරා ඇත යනු එහි අදහසයි. මූලටීකාචාර්යපාදයෝ එයම සනාථ කරති.

# ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. ප්‍රීති ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියාාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**ප්‍රීති ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 9 වැනි පාඩම

# 8. දස්සන ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **දස්සනේන පහාතබ්බා ධම්මා - භාවනාය පහාතබ්බා ධම්මා - නේව දස්සනේන න භාවනාය පහාතබ්බා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ ප්‍රීති ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව දස්සන ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **දස්සනේන පහාතබ්බා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **භාවනාය පහාතබ්බා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නේව දස්සනේන න භාවනාය පහාතබ්බා ධම්මා** යනුවෙනි.

04. **දස්සනේන** - සෝවාන් මාර්ගඥානයෙන්, **පහාතබ්බා ධම්මා** - ප්‍රහාණය කටයුතු වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **භාවනාය** - සකදාගාමී අනාගාමී අර්හත් නම් වූ මතු මාර්ගත්‍රයෙන්, **පහාතබ්බා ධම්මා** - ප්‍රහාණය කටයුතු වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **දස්සනේන** - සෝවාන් මාර්ගඥානයෙන්, **නේව පහාතබ්බා** - ප්‍රහාණය කටයුතු නො වූ ද, **භාවනාය** - සකදාගාමී, අනාගාමී, අර්හත් නම් වූ මතු මාර්ගත්‍රයෙන්, **න පහාතබ්බා ධම්මා** - ප්‍රහාණය කටයුතු නො වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **දස්සනේන පහාතබ්බා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වන්නා වූ සක්කායදිට්ඨි විචිකිච්චා සීලබ්බතපරාමාස සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුසල සිත් සතර ද, මෝහ මූල විචිකිච්චා සහගත අකුසල චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත දෙවිසි (22) චෛතසිකය ද,

08. සෝවාන් මාර්ගයෙන් තුනී කටයුතු වූ අපායගාමිනී ශක්තියෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත අකුසල් සිත් සතර ද, දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසිකය ද යන

09. අකුසල් සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත සත්විසි (27) චෛතසිකය ද ලැබෙන්නාහ.

10. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

11. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සත්විසි (27) චෛතසිකය අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පස්විසි (25) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් එකොළොස විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

12. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් එකොළොස මනායතනය නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් එකොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

14. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත සවිසි (26) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය

සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

15. **භාවනාය පහාතබ්බා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සකදාගාමී මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ ඖදාරික කාමරාගයෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත අකුසල් සිත් සතර ද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල අකුසල් සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසිකය ද,

16. අනාගාමී මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ කාමරාගයෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසිකය ද,

17. අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජාවන් සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල උද්ධච්ච සහගත චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත එක්විසි (21) චෛතසිකය ද යන

18. අකුසල් සිත් සත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා දෙක වර්ජිත පස්විසි (25) චෛතසිකය ද ලැබෙන්නාහ.

19. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

20. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පස්විසි (25) චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි තෙවිසි (23) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් සත විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

21. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සත මනායතනය නම් වන්නේ ය. පස්විසි (25) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සත මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පස්විසි (25) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

23. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සත ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික සූවිස්ස (24) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

24. **නේව දස්සනේන න භාවනාය පහාතබ්බා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කුසල් සිත් එක්විස්ස (21) ද, විපාක සිත් සතිස (36) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

26. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සත්සැත්තෑ (77) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

27. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

28. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය . ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන

භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

29. සත්සැත්තෑ (77) චිත්තය මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

30. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

31. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

32. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සූසැට (64) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

33. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද,

නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

34. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් (38) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

35. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් ද, (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන සතර වරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

36. මේ ශබ්දාවලිය හෙවත් දස්සන ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහිලා ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **දස්සන** - සෝතාපත්ති මාර්ග ඥානය ය. පළමුවරට ආර්ය සත්‍යය දැකගන්නා ඥානය බැවිනි.

02. **භාවනා** - සකදාගාමී අනාගාමී අර්හත් මාර්ගඥාන තුනට නමකි. සෝතාපත්ති මාර්ග ඥානයෙන් දක්නා ලද ආර්ය සත්‍යය සතර පුන පුනා දක්නා බැවිනි.

03. **දස්සනේනා'ති සෝතාපත්ති මග්ගේන, සෝහි පඨමං නිබ්බානං දස්සනතෝ දස්සනන්ති වුත්තෝ (ධම්මසංගණි අට්ඨකතා)**

දස්සනේන යනු සෝවාන් මාර්ගයෙනි. එය වනාහී පළමුවෙන් නිවන දක්නා බැවින් දස්සන යයි කියන ලදී.

04. **භාවනායා'ති සේස මග්ගත්තයේන, සේස මග්ගත්තයං හි පඨම මග්ගේන දිට්ඨස්මිං යේව ධම්මේ භාවනා වසේන උප්පජ්ජති න අදිට්ඨපුබ්බං කිඤ්චි පස්සති, තස්මා භාවනාති වුච්චති.** (එම) භාවනා ය යනු සෙසු මාර්ගත්‍රයෙනි. සෙසු මාර්ගත්‍රය වනාහි පළමුවන මාර්ග ඥානයෙන් දක්නා ලද ධර්මයෙහිම භාවනා වශයෙන් උපදී. නොදුටු කිසිවක් නොදකී. එහෙයින් භාවනා යයි කියනු ලැබේ.

05. **සෝවාන් මාර්ග චිත්ත වීථියෙහි මාර්ග ඥානයට පළමුව ගෝත්‍රභූ සිත දස්සන නම් නොවේ ද?** මාර්ගයට පළමුව ගෝත්‍රභූ සිත නිවන අරමුණු කරන බව සත්‍යයකි. එහෙත් නිවන් දකිමින් කෙලෙස් ප්‍රහාණය නොකරන බැවින් ගෝත්‍රභූ සිත දස්සන නම් නොවේ. සෝවාන් මාර්ග ඥානයම දස්සන නමින් ගැනේ.

06. **සෝවාන් මගින් හෙවත් දර්ශනයෙන් ප්‍රහාණය වන ඒකාන්ත ධර්ම කවරේ ද?** සක්කායදිට්ඨි විචිකිච්චා සීලබ්බතපරාමාස සමග යෙදුනා වූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරත්, විචිකිච්ඡා සහගත සිතත්, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත අන්‍ය සමාන 13ත්, මෝහ චතුෂ්කයත්, ථීන මිද්ධ යුගලයත්, ලෝභ, දිට්ඨි, විචිකිච්ඡා යන චෛතසික 22 යන ධර්මයෝ ඒකාන්තයෙන් ප්‍රහාණය වෙති.

07. **සෝවාන් මගින් ප්‍රහාණය වන අනේකාන්ත ධර්ම?** අපායගාමිනී ශක්තිය ඇත්තා වූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරත්, දෝස මූල සිත් දෙකත්, තත් සම්ප්‍රයුක්ත අන්‍යසමාන 13 ය, මෝහ චතුෂ්කය, දෝස චතුෂ්කය, ලෝභය, මානය, ථීනය, මිද්ධය යන චෛතසික 25ත් වෙති.

08. **සකදාගාමී මාර්ගයෙන් ප්‍රහාණය වන ඒකාන්ත ධර්මයෝ නොමැත. අනේකාන්ත ධර්ම?** ඖදාරික දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරත්, ඖදාරික දෝස මූල සිත් දෙකත්, තත් සම්ප්‍රයුක්ත චෛතසික 25 ත් වෙති.

09. **අනාගාමී මාර්ගයෙන් ප්‍රහාණය වන ඒකාන්ත ධර්ම කවරේද?** කාමරාගයෙන් යුක්ත වූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරත්, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල සිත් දෙකත්, තත් සම්ප්‍රයුක්ත චෛතසික 25ත් වෙති.

10. **අනාගාමී මාර්ගයෙන් ප්‍රහාණය වන අනේකාන්ත ධර්මයෝ ඇත්ද?** අනාගාමී මාර්ගයෙන් ප්‍රහාණය වන අනේකාන්ත ධර්ම වශයෙන් රහත් මාර්ගයෙන් ප්‍රහාණය කළයුතු වූ රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජාවන් සමග යෙදුනා වූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරත්, උද්ධච්ච සහගත සිතත්, තත් සම්ප්‍රයුක්ත අන්‍යසමාන 13 ය, මෝහ චතුෂ්කය, ලෝභය, මානය, ථීනය, මිද්ධය යන චෛතසික 21ත් යන මොවුන් තුනී බවට පැමිණෙති.

11. **රහත් මගින් ප්‍රහාණය වන ධර්ම කවරේ ද?** ඉහත සඳහන් කළ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් 4, උද්ධච්ච සහගත සිත සහ චෛතසික 21 වෙති.

12. **සතර මග නැණින් දස කෙලෙස් ප්‍රහාණය වන පිළිවෙල කෙසේ ද?** සෝවාන් මගින් දිට්ඨි විචිකිච්ඡා දෙක ද, දෝසය අනාගාමී මගින් ද, ලෝභය සතර මාර්ගයෙන් ද, මෝහය, මානය, ථීනය, උද්ධච්චය, අහිරිකය, අනොත්තප්පය රහත් මගින් ද ප්‍රහාණය වෙති.

13. **දස කෙලෙස් යනු කවරේ ද?** ඉහත දැක්වූ ලෝභය, දෝසය, මෝහය, මානය, දිට්ඨිය, ථීනය, උද්ධච්චය, අහිරිකය, අනොත්තප්ප, විචිකිච්ඡාව ද යන දස දෙනා වෙති.

## ත්‍රිලක්‍ෂණ විදර්ශනාව

01. දස්සන ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**දස්සන ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 10 වැනි පාඩම

# 9. දස්සන හේතු ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා - භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා - නේව දස්සනේන න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ දස්සන ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව දස්සනහේතු ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නේව දස්සනේන න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** යනුවෙනි.

04. **දස්සනේන** - සෝතාපත්ති මාර්ග ඥාන දර්ශනයෙන්, **පහාතබ්බ හේතුකා ධම්මා** - ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **භාවනාය** - සකදාගාමී අනාගාමී අර්හත් නම් වූ මතු මාර්ගත්‍රයෙන්, **පහාතබ්බ හේතුකා ධම්මා** - ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **දස්සනේන** - සෝතාපත්ති මාර්ග ඥාන දර්ශනයෙන්, **නේව පහාතබ්බ හේතුකා** - ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ ද, **භාවනාය** - මතු මාර්ගත්‍රයෙන්, **න පහාතබ්බ හේතුකා ධම්මා** - ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝතාපත්ති මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ සක්කායදිට්ඨි විචිකිච්චා සීලබ්බතපරාමාස සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල විචිකිච්ඡා සහගත චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච සහ විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද වර්ජිත ඉතිරි දෙවිසි (22) චෛතසිකය ද,

08. සෝතාපත්ති මාර්ගයෙන් තුනී කටයුතු වූ අපායගාමිනී ශක්තිය ඇති ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසිකය ද යන

09. අකුසල් සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි (27) චෛතසිකය ද ලැබෙන්නාහ.

10. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

11. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි (27) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය වර්ජිත ඉතිරි පස්විසි (25) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් එකොළොස විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

12. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් එකොළොස මනායතනය නම් වන්නේ ය. විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි (27) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් එකොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි (27) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

14. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය සහ විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය වර්ජිත සවිසි (26) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

15. **භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සකදාගාමී මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ ඖදාරික කාමරාගයෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසිකය ද,

16. අනාගාමී මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ කාමරාගයෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසිකය ද,

17. අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිද්‍යාවන් සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල උද්ධච්ච සහගත සිත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච සහ උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත එක්විසි (21) චෛතසිකය ද යන

18. අකුසල් සිත් සත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා සහ උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත පස්විසි (25) චෛතසිකය ද ලැබෙන්නාහ.

19. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

20. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පස්විසි (25) චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත ඉතිරි තෙවිසි (23) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් සත විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

21. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සත මනායතනය නම් වන්නේ ය. උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත පස්විසි (25) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සත මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත පස්විසි (25) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

23. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සත ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය සහ උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සූවිසි (24) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

24. **නේව දස්සනේන න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කුසල් සිත් එක්විස්ස (21) ද, විපාක සිත් සතිස (36) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, රූප අටවිස්ස (28) ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

26. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එක්විසි (21) කුසල චිත්තය ද, සතිස් (36) විපාක චිත්තය ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

27. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම්

වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

28. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

29. එක්විසි (21) කුසල චිත්තය ද, සතිස් (36) විපාක චිත්තය ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

30. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

31. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

32. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. එක්විසි (21) කුසල් චිත්තය ද, ඉතිරි සූවිසි (24)

විපාක චිත්තය ද, එකුන්විසි (19) ක්‍රියා චිත්තය ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

33. අටතිස් (38) චෛතසිකය ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

34. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් (38) චෛතසිකය ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

35. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් ද, (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් ද, සත් දෙන සතර වරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

36. මේ ශබ්දාවලිය හෙවත් දස්සන හේතු ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහිලා ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **දස්සනේන පහාතබ්බෝ හේතූ ඒතේසන්ති, දස්සනේන පහාතබ්බ හේතුකා, දුතිය පදේපි ඒසේව නයෝ** - සෝවාන් මගින් ප්‍රහාණය කටයුතු වූ හේතු ඇත්තේ මොවුන්ට නුයි, දස්සනේන පහාතබ්බ හේතුක නම් වෙති. දෙවැනි පදයෙහි ද මෙසේය.

02. **තතිය පදේ නේව දස්සනේන න භාවනාය පහාතබ්බෝ හේතූ ඒතේසන්ති ඒවමත්ථං අගහෙත්වා නේව දස්සනේන න භාවනාය පහාතබ්බෝ හේතූ ඒතේසං අත්ථීති ඒවමත්ථෝ ගහේතබ්බෝ** - තෙවැනි පදයෙහි නොම දර්ශනයෙන් නොම භාවනාවෙන් ප්‍රහාණය කටයුතු හේතු ඇත්තේ මොවුන්ට නුයි අර්ථය නොගෙන, නොම දර්ශනයෙන් ද නොම භාවනාවෙන් ද ප්‍රහාණය කටයුතු හේතු මොවුන්ට ඇත්තේ නුයි, නේවදස්සනේන න භාවනාය පහාතබ්බ හේතුකා යයි අර්ථ ගතයුතුයි යනු ධම්මසංගණී අට්ඨකථා පාඨයකි.

03. **සෝවාන් මාර්ග ඥාන දර්ශනයෙන් ප්‍රහාණය කටයුතු හේතු ධර්ම කීයද? ඒ කවරේද?** - හේතු තුනකි. ඔවුහු නම් ලෝභ දෝස මෝහ යන හේතු තුනය. ඒ තුන අතුරෙන් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි සහ විචිකිච්ඡා සහගත සිතෙහි ලෝභ මෝහ දෙක සෝවාන් මගින් සම්පූර්ණයෙන් ප්‍රහාණය වෙති. ඉතිරි දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභ මෝහ දෙකත්, දෝස මූල සිත් දෙකෙහි දෝස මෝහ දෙකත් පිළිබඳ අපායගාමී තත්වය සෝවාන් මගින් ප්‍රහාණය වෙති. එහෙයින් එම ඒකාන්ත අනේකාන්ත වශයෙන් ප්‍රහාණය වන ලෝභ දෝස මෝහ තුන දර්ශනයෙන් ප්‍රහාණය වන හේතුහු වෙති.

04. **දස්සනේන පහාතබ්බ හේතුකා යනු කවරේද?** ඉහත සඳහන් සෝවාන් මගින් ප්‍රහාණය වන ලෝභ දෝස මෝහ තුන සමග එකට සම්ප්‍රයුක්ත වන සෙසු අකුසල චිත්ත චෛතසිකයෝ වෙති. එනම් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරත්, එහි ඇති එක්විසි (21) චෛතසිකත්, විචිකිච්ඡා සහගත සිතත්, එහි ඇති මෝහය හැර ඉතිරි චෛතසික දාහතරත්, දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි අපායගාමිනී ශක්තිය ඇති චිත්ත චෛතසිකත්, දෝස මූල සිත් දෙකෙහි අපායගාමිනී ශක්තිය ඇති චිත්ත චෛතසිකත් ගැනෙති.

05. **විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය නොගන්නේ මක්නිසා ද?** ලෝභ මූල සිත් අටෙහි ලෝභය, මෝහ හේතුව නිසා සහේතුක යි. මෝහය ලෝභ හේතුව නිසා සහේතුක යි. දෝස මූල සිත් දෙකෙහි දෝසය මෝහ හේතුවෙන් සහේතුක යි. දෝස මූල සිතෙහි මෝහය දෝස හේතුවෙන් සහේතුක යි. එහෙත් විචිකිච්ඡා සහගත සිතෙහි මෝහ හේතුව පමණක්ම බැවින් අන් හේතුවකින් මිශ්‍ර නැති බැවින් මෝහය අහේතුක යි. භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා යන දෙවැනි පදයේ දී උද්ධච්ච සහගත සිතෙහි මෝහය ද අන් හේතුවකින් මිශ්‍ර නොවන බැවින් භාවනාය පහාතබ්බ හේතුක පදයට නොගැනේ. එහෙත් එම මෝහය ද මාර්ගඥානයෙන් ප්‍රහාණය වන බව දතයුතුය. පහාතබ්බා, පහාතබ්බ හේතුකා යන වචනාර්ථය පැහැදිළි කර ගැනීමට මෙසේ කරුණු දක්වා ඇත.

# ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. දස්සන හේතු ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**දස්සන හේතු ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 11 වැනි පාඩම

# 10. ආචයගාමී ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **ආචයගාමිනෝ ධම්මා - අපචයගාමිනෝ ධම්මා - නේව ආචයගාමිනෝ න අපචයගාමිනෝ ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ දස්සන හේතු ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව ආචයගාමී ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආචයගාමිනෝ ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අපචයගාමිනෝ ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නේව ආචයගාමිනෝ න අපචයගාමිනෝ ධම්මා** යනුවෙනි.

04. **ආචයගාමිනෝ ධම්මා** - කර්ම ක්ලේශ විසින් රැස්කරනු ලැබෙන්නා වූ ද, චුති ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් විපාක ගෙන දෙන්නා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අපචයගාමිනෝ ධම්මා** - ලෝකෝත්තර නිර්වාණය ගෙන දෙන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **නේව ආචයගාමිනෝ** - කර්ම කලේශ විසින් රැස්කරනු නොලබන්නා වූ ද, චුති ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් විපාක ගෙන නොදෙන්නා වූ ද, **න අපචයගාමිනෝ ධම්මා** - නිර්වාණය ගෙන නොදෙන්නා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **ආචයගාමිනෝ ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල්

සිත් සතළොස (17) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස (52) ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

09. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චෛතසික දෙපණස (52) අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි චෛතසික සමපණස (50) සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද මනායතනය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස ද, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත චෛතසික එක්පණස (51) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. **අපචයගාමිනෝ ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර මාර්ග චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස (36) ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

15. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය.

සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සතර මාර්ග චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

16. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතර මාර්ග චිත්තය මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

17. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතර මාර්ග චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

19. **නේව ආචයගාමිනෝ න අපචයගාමිනෝ ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් විපාක සිත් සතිස (36) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

20. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

21. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය

අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි චෛතසික සතිස (36) සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සතිස් (36) විපාක චිත්තය ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

22. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

23. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

24. සතිස් (36) විපාක චිත්තය ද, සමවිසි (20) ක්‍රියා චිත්තය ද මනායතනය නම් වන්නේ ය. චෛතසික අටතිස (38) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

25. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

26. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

27. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සූවිසි (24) විපාක චිත්තය ද, එකුන්විසි (19) ක්‍රියා චිත්තය ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

28. චෛතසිකය අටතිස (38) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

29. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස (35) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

30. මේ ශබ්දාවලිය හෙවත් ආචයගාමී ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහි ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **ආචය** - චුති ප්‍රතිසන්ධි ආදී වශයෙන් පහළවන විපාකස්කන්ධයන්ට නමකි. **"කම්ම කිලේසේහි ආචීයතීති ආචයෝ පටිසන්ධි චුති ගතිප්පවත්තානං ඒතං නාමං"** කර්මක්ලේශයන් විසින් රැස්කරනු ලබන්නේ හුයි ආචය නම් වේ. ප්‍රතිසන්ධි චුති ගති පවත්වන්නන්ට මෙය නමකි.

02. **ආචයගාමිනෝ** - ලෞකික කුසලාකුසල ධර්මයෝ ය. **''තං ආචයං ගච්ඡන්ති, යස්ස වා පවත්තන්ති තං පුග්ගලං යථාවුත්තමේව ආචයං ගමෙන්තීතිපි ආචය ගාමිනෝ, සාසව කුසලාකුසලානං ඒතං අධිවචනං''**

**තේරුම** - ඒ කියන ලද චුති ප්‍රතිසන්ධි ගතියට යෙත් නුයි ද, යමෙකුගේ සන්තානයෙහි කුසලාකුසල කර්ම ඇතොත් ඒ පුද්ගලයා කියන ලද ඒ චුති ප්‍රතිසන්ධි ගතියට යවත් නුයි ද ආචයගාමිනෝ නම් වෙති. ලෞකික කුසලාකුසලයන්ට නමකි.

03. **අපචය** - චුති ප්‍රතිසන්ධි ගතියෙන් තොර වූ නිර්වාණ ධාතුව අපචය නම් වේ.

**" තතෝ ඒව ආචයසංඛාතා චයා අපේතත්තා නිබ්බානං අපේතං චයා'ති අපචයෝ "** ඒ ආචය නම් වූ චුති ප්‍රතිසන්ධි ස්කන්ධ ගතියෙන් තොර බැවින් නිර්වාණය අපචය නම් වේ.

04. **අපචයගාමිනෝ** - සතර ආර්ය මාර්ගයෝ ය. **"තං ආරම්මණං කත්වා පවත්තනතෝ අපචයං ගච්ඡන්තීති අපචයගාමිනෝ, අරියමග්ගානමේතං අධිවචනං"** ඒ නිර්වාණය අරමුණු කොට පවත්නා බැවින් අපචයට යෙත් නුයි අපචයගාමිනෝ නම් වෙති. ආර්ය මාර්ගයන්ට නමකි.

**"අපිච පාකාරං ඉට්ඨකවඩ්ඪකී විය පවත්තං ආචිනන්තා ගච්ඡන්තීති ආචයගාමිනෝ "** තව ද පවුරක් ගොඩනගන උළු වඩුවකු මෙන් පඤ්චස්කන්ධය රැස්කරමින් යන්නෝ ආචයගාමිනෝ නම් වෙති.

**"තේන චිතං චිතං විද්ධංසයමානෝ පුරිසෝ විය තදේව පවත්තං අපචිනන්තා ගච්ඡන්තීති අපචයගාමිනෝ "**

ඒ උළුවඩුවා විසින් ගොඩනගන පවුර කඩා දමමින් යන පුරුෂයකු මෙන් ඒ පඤ්චස්කන්ධ පැවැත්ම කඩා දමමින් යෙත් නුයි අපචයගාමිනෝ නම් වෙති. ඔවුහු නම් ලෝකෝත්තර මාර්ග සිත් සතර සහ එහි යෙදෙන චෛතසික සතිස (36) ද වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. ආචයගාමී ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**ආචයගාමී ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 12 වැනි පාඩම

# 11. සෙක්ඛ ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **සෙක්ඛා ධම්මා - අසෙක්ඛා ධම්මා - නේව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ ආචයගාමී ත්‍රිකයට අනතුරුව සෙක්ඛ ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සෙක්ඛා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අසෙක්ඛා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නේව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා** යනුවෙනි.

04. **සෙක්ඛා ධම්මා** - ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නා වූ, සප්ත ශෛක්ෂයන්හට අයත් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අසෙක්ඛා ධම්මා** - අශෛක්ෂ වූ ක්ෂීණාශ්‍රවයන්හට අයත් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **නේව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා** - සප්ත ශෛක්ෂයන්හට ද අයත් නො වූ, අශෛක්ෂ ක්ෂීණාශ්‍රවයන්හට ද අයත් නො වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **සෙක්ඛා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර මාර්ග චිත්තයත් යට ඵල සිත් තුනත් යන අර්හත් ඵල සිත වර්ජිත ලෝකෝත්තර සිත් සත ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස (36) ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

09. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චෛතසික සතිස (36) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි චෛතසික සූතිස (34) සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සතර මාර්ග චිත්තය ද, යට ඵල සිත් තුන ද යන අර්හත් ඵල සිත වර්ජිත ලෝකෝත්තර සිත් සත විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් සත මනායතනය නම් වන්නේ ය. චෛතසික සතිස (36) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් සත මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික සතිස (36) ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

12. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකූන්තිස (29) ද, ලෝකෝත්තර (අර්හත් ඵල වර්ජිත) ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

13. **අසෙක්ඛා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අර්හත් ඵල චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස (36) ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් සත්‍ය විනිර්මුක්ත වන්නාහ.

15. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චෛතසික සතිස (36) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි චෛතසික සූතිස (34) සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අර්හත් ඵල චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

16. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අර්හත් ඵල චිත්තය මනායතනය නම් වන්නේ ය. චෛතසික සතිස (36) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

17. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අර්හත් ඵල චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික සතිස (36) ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් සත්‍ය විනිර්මුක්ත වන්නේ කෙසේ ද යත්, ලෝකෝත්තර අර්හත් ඵල චිත්තෝත්පාද සත්තිස (37) සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් සත්‍ය විනිර්මුක්ත වන්නේ ය.

19. **නේව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස (52) ද, රූප අටවිස්ස (28) ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

20. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

21. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය

සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෞකික සිත් එක්අසූව (81) විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

22. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

23. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

24. ලෞකික සිත් එක්අසූව (81) මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

25. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කාය ධාතුව නම් වන්නේ ය.

26. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

27. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිවහාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි ලෞකික සිත් අටසැට (68) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

28. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

29. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත චෛතසික එක්පණස (51) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

30. මේ ශබ්දාවලිය හෙවත් සෙක්ඛ ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහිලා ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **සෙක්ඛා ධම්මා** - සේඛා ධම්මා යනුවෙන් ද භාවිතා කෙරේ. ඒ දෙකෙහිම අර්ථය සමානය.

02. **අසෙක්ඛා ධම්මා** - අසේඛා ධම්මා යනුවෙන් ද භාවිතා කෙරේ. ඒ දෙකෙහිම අර්ථය සමානය.

03. **නේව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා -** යන්න ද නේවසේඛා නාසේඛා ධම්මා යනුවෙන් ද භාවිතා කෙරේ. තේරුම සමානය.

04. **සෙක්ඛා ධම්මා යන තැන -** සෝවාන් මාර්ගස්ථයා ය, සෝවාන් ඵලස්ථයා ය, සකදාගාමී මාර්ගස්ථයා ය, සකදාගාමී ඵලස්ථයා ය, අනාගාමී මාර්ගස්ථයා ය, අනාගාමී ඵලස්ථයා ය, අර්හත් මාර්ගස්ථයා ය යන ආර්යයෝ සත් දෙනා ශෛක්ෂයෝ නම් වෙති. ඒ සත් දෙනාට අයත් චිත්ත චෛතසික ධර්මයෝ ශෛක්ෂ ධර්ම නම් වෙති. එනම් රහත් ඵල සිත හැර ඉතිරි ලෝකෝත්තර සිත් සත ද, එහි යෙදෙන චෛතසික සතිස (36) ද යන ධර්ම සමූහය යි.

05. **අසෙක්ඛා ධම්මා යන තැන -** බුදු පසේ බුදු මහරහත් ආදී ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාට අයත් ධර්මයෝ ගැනෙති. එනම් අර්හත් ඵල සිත සහ චෛතසික සතිස (36) ය.

06. **නේව සෙක්ඛා නාසෙක්ඛා ධම්මා යන තැන -** ලෞකික පෘථග්ජන පොදු ජනතාවට අයත් ධර්ම ද, නිර්වාණය ද ගැනෙති. එනම් ලෞකික සිත් 81, චෛතසික 52, රූප 28 සහ නිර්වාණය ද වෙති.

07. **සෙක්ඛත්තිකේ තීසු සික්ඛාසු ජාතාතිපි සෙක්ඛා, සත්තන්නං සෙක්ඛානං ඒතේතිපි සෙක්ඛා, අපරියෝසිත සික්ඛත්තා සයමේව සික්ඛන්තීතිපි සෙක්ඛා,** සෙක්ඛ ත්‍රිකයෙහි සෙක්ඛා යනු ත්‍රිශික්ෂාවන් කෙරෙහි හටගත් බැවින් සෙක්ඛා නම් වෙති. සප්ත ශෛක්ෂයන්හට අයත් බැවින් ද සෙක්ඛා නම් වෙති. අසම්පූර්ණ වූ නිම නො වූ ශික්ෂා ඇති බැවින් ද තෙමේම හික්මෙන බැවින් ද සෙක්ඛා නම් වෙති.

08. **උපරි සික්ඛිතබ්බාභාවතෝ න සෙක්ඛාති අසෙක්ඛා, වුද්ධිප්පත්තා වා සෙක්ඛා තිපි අසෙක්ඛා, අරහත්ත ඵල ධම්මානං ඒතං අධිවචනං තතිය පදං උභය පටික්ඛේපේන වුත්තං" (අත්ථසාලිනී අට්ඨකතා)**

09. මත්තෙහි හික්මිය යුතු බවක් නොමැති බැවින් **අසෙක්ඛා** නම් වෙති. වෘද්ධියට පත් වූ ශික්ෂා ඇති බැවින් ද **අසෙක්ඛා** නම් වෙති. අර්හත් ඵල චිත්ත චෛතසික ධර්මයන්ට **අසෙක්ඛා** යනු නමකි. තෙවැනි පදය වදාරන ලද්දේ **සෙක්ඛා - අසෙක්ඛා** දෙපදයම ප්‍රතික්ෂේප වශයෙනි.

# ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. සෙක්ඛ ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සෙක්ඛ ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 13 වැනි පාඩම

# 12. පරිත්ත ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **පරිත්තා ධම්මා - මහග්ගතා ධම්මා - අප්පමාණා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ සෙක්ඛ ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව පරිත්ත ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරිත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **මහග්ගතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අප්පමාණා ධම්මා** යනුවෙනි.

04. **පරිත්තා ධම්මා -** අල්පානුභාව ඇති බැවින් පරිත්ත නම් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **මහග්ගතා ධම්මා** - මහත් බවට පැමිණි බැවින් ධ්‍යාන ලාභින්හට අයත් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අප්පමාණා ධම්මා** - රාගාදී කෙලෙසුන්ගෙන් තොර බැවින් ප්‍රමාණ කළ නොහැකි ගුණ ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **පරිත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කාමාවචර සිත් සූපණස (54) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස (52) ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

09. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. කාමාවචර සිත් සූපණස (54) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

11. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

12. කාමාවචර සිත් සූපණස (54) මනායතනය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාද රූපය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාද රූපය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාද රූපය කාය ධාතුව නම් වන්නේ ය.

14. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස

රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

15. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කාය විඤ්ඤාණ යුගලය කාය විඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි කාමාවචර සිත් එක්සාලිස (41) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

16. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

17. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, කාමාවචර සිත් සූපණස (54) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත චෛතසික එක්පණස (51) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

18. **මහග්ගතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මහද්ගත සිත් සත්විස්ස (27) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස (35) ද ලැබෙන්නාහ.

19. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

20. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද පන්තිස් (35) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි තෙතිස් (33) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. මහද්ගත සිත් සත්විස්ස (27) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

21. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මහද්ගත සිත් සත්විස්ස (27) මනායතනය නම් වන්නේ ය. පන්තිස් (35) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මහද්ගත සිත් සත්විස්ස (27) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පන්තිස් (35) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

23. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, සත්විසි (27) මහද්ගත චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත පන්තිස් (35) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

24. **අප්පමාණා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස (36) ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

26. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චෛතසික සතිස (36) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි චෛතසිත සූතිස (34) සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෝකෝත්තර සිත් අට විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

27. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනායතනය නම් වන්නේ ය. චෛතසික සතිස (36) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

28. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික සතිස (36) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

29. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතරවරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

30. මේ ශබ්දාවලිය හෙවත් පරිත්ත ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහිලා ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **පරිත්තා ධම්මා** - හාත්පසින් කුඩා වූ බැවින් ස්වල්ප වූ දෙයට පරිත්ත යයි කියනු ලැබේ. කුඩා ගොමපිඩක් යනාදී කථාවෙහි මෙනි. **''සමන්තතෝ ඛණ්ඩිතත්තා අප්පමත්තකං පරිත්තන්ති වුච්චති, පරිත්තං ගෝමය පිණ්ඩන්ති ආදිසු විය'' (අත්ථසාලිනී).** මේ පරිත්ත ධර්මයෝ හෙවත් කාමාවචර චිත්ත චෛතසික රූප ධර්මයෝ ද අල්පානුභාව ඇති බැවින් 'පරිත්තා' යයි කියනු ලැබෙති. **''ඉමේපි අප්පානුභාවතාය පරිත්තා වියාති පරිත්තා''** යනු එම අටුවාවයි. කාමාවචර ධර්ම සියල්ල පරිත්ත ධර්මයෝ ය.

02. **මහග්ගතා ධම්මා** - රූපාවචර අරූපාවචර චිත්ත චෛතසික ධර්මයෝය. කෙලෙසුන් යටපත් කිරීමට සමත් බැවින්, උදාර ඵල විපාක හා දීර්ඝ කාලීන අනුසස් ඇති බැවින් මහත් බවට ගිය නිසා ද, මහත් වූ ඡන්ද චිත්ත විරිය වීමංසාවෙන් යුත් ධර්ම නිසා ද මහග්ගතා නම් වෙති. **''කිලේස වික්ඛම්භන සමත්ථතාය විපුලඵලතාය දීඝසන්තානතාය ච මහන්තභාවං ගතා, මහන්තේහි**

**වා උළාරච්ඡන්ද විරිය චිත්ත පඤ්ඤෙද්හි ගතා පටිපන්නාතීපි මහග්ගතා**'' යනු අට්ඨකතාව ය.

03. **අප්පමාණා ධම්මා** - ලෝකෝත්තර ධර්මයෝ රාගාදී ධර්ම සීමිත ඵල විපාක දෙන්නාහ. අරමුණු වශයෙන් හෝ සම්ප්‍රයුක්ත වශයෙන් හෝ ප්‍රමාණකරන සුළු රාගාදීන් නොමැති ලෝකෝත්තර මාර්ග ඵල නිර්වාණ ධර්ම අප්පමාණ ධර්ම නම් වෙති. ''**පමාණකරා ධම්මා රාගාදයෝ, පමාණං නාම ආරම්මණතෝ වා සම්පයොගතෝ වා, නත්ථි ඒතේසං පමාණං පමාණස්ස ච පටිපක්ඛා'ති අප්පමාණා**'' යනු අත්ථසාලිනී අටුවා පාඨය යි. ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස (36) ද, නිර්වාණය ද අප්‍රමාණ ධර්මයෝ වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. පරිත්ත ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**පරිත්ත ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 14 වැනි පාඩම

# 13. පරිත්තාරම්මණ ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **පරිත්තාරම්මණා ධම්මා - මහග්ගතාරම්මණා ධම්මා - අප්පමාණාරම්මණා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පරිත්ත ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව පරිත්තාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරිත්තාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **මහග්ගතාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද **යත්, අප්පමාණාරම්මණා ධම්මා යනුවෙනි.**

04. **පරිත්තාරම්මණා ධම්මා** - කාමාවචර චිත්ත චෛතසික රූප ධර්මයන් අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **මහග්ගතාරම්මණා ධම්මා** - මහද්ගත චිත්ත චෛතසික ධර්මයන් අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අප්පමාණාරම්මණා ධම්මා** - නිර්වාණය ප්‍රධාන ලෝකෝත්තර ධර්ම අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **පරිත්තාරම්මණා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කාම ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ කාම විපාක සිත් තෙවිස්ස (23) ද,

පඤ්චද්වාරාවර්ජනයද, හසිතෝත්පාදය ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස (33) ද,

08. කාම ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ හසිතෝත්පාද වර්ජිත කාම ජවන් සිත් අටවිස්ස (28) ද, මනෝද්වාරාවර්ජනය ද, අභිඥා කෘත්‍යවත් පඤ්චමධ්‍යාන සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සමපණස (50) ද යන

09. පරිත්තාරම්මණික සිත් සපණස (56) ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සමපණස (50) ද ලැබෙන්නාහ.

10. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

11. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමපණස් (50) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි අටසාලිස් (48) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. පරිත්තාරම්මණික සිත් සපණස (56) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

12. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පරිත්තාරම්මණික සිත් සපණස (56) මනායතනය නම් වන්නේ ය. චෛතසික සමපණස (50) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පරිත්තාරම්මණික සපණස් (56) චිත්තය අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි තෙසාලිස් (43) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සමපණස් (50) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

14. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පරිත්තාරම්මණික සපණස් (56) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එකුන්පණස් (49) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

15. **මහග්ගතාරම්මණා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මහද්ගත ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නා වූ විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් සය ද, තත් සම්ප්‍රයුක්ත සමතිස් (30) චෛතසික ද,

16. මහද්ගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ හසිතෝත්පාද වර්ජිත කාමජවන් අටවිස්ස (28) ද, මනෝද්වාරාවර්ජනය ද, අභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත සත්සාලිස් (47) චෛතසික ද යන

17. මහද්ගතාරම්මණික සිත් සත්තිස (37) ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත සත්සාලිස් (47) චෛතසික ද ලැබෙන්නාහ.

18. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

19. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සත්සාලිස් (47) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පන්සාලිස් (45) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. මහද්ගතාරම්මණික සිත් සත්තිස (37) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

20. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මහද්ගතාරම්මණික සිත් සත්තිස (37) මනායතනය නම් වන්නේ ය. සත්සාලිස් (47) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

21. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මහද්ගතාරම්මණික සිත් සත්තිස (37) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සත්සාලිස් (47) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මහද්ගතාරම්මණික සිත් සත්තිස (37) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත චෛතසික සසාලිස (46) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

23. **අප්පමාණාරම්මණා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස (36) ද,

24. ලෝකෝත්තර ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ මහා කුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් අට ද, මනෝද්වාරාවර්ජනය ද, අභිඥා සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් (33) චෛතසිකයෝ ද යන

25. අප්පමාණාරම්මණික සිත් එකුන්විස්ස (19) ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සතිස (36) ද ලැබෙන්නාහ.

26. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

27. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අප්පමාණාරම්මණික සිත් එකුන්විස්ස (19) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

28. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අප්පමාණාරම්මණික සිත් එකුන්විස්ස (19) මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

29. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අප්පමාණාරම්මණික සිත් එකුන්විස්ස (19) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

30. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අප්පමාණාරම්මණික ලෞකික සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික තෙතිස (33) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත්දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

31. මේ ශබ්දාවලිය හෙවත් පරිත්තාරම්මණ ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

32. ප්‍රඥප්ති ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ රූපාවචර අරූපාවචර සිත් එක්විස්ස (21) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස (35) ද,

33. ප්‍රඥප්ති ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ හසිතෝත්පාද වර්ජිත කාමජවන් අටවිස්ස (28) ද, මනෝද්වාරාවර්ජනය ද, අභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත විරති වර්ජිත චෛතසික එකුන්පණස (49) ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද මේ ත්‍රිකයට ඇතුලත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **කාම විපාක සිත් 23 -** දෙපස්විඤ්ඤාණ සිත් 10, සම්පටිච්ඡන සිත් 2, සන්තිරණ සිත් 3, මහා විපාක සිත් 8. සියල්ල 23 කි.

02. **කාම ධර්ම -** කාමාවචර සිත් 54, චෛතසික 52, රූප 28. මේ සියල්ල කාමාවචර අරමුණු, කාම ධර්ම වෙති.

03. **අප්‍රමාණ්‍ය -** කරුණා මුදිතා දෙක අප්‍රමාණ්‍ය නම් වෙති.

04. **මහද්ගත ධර්ම -** රූපාවචර අරූපාවචර සිත් 27, චෛතසික 35.

05. **විඤ්ඤාණඤ්චායතනය අරමුණු කරන මහද්ගත ධර්ම -** ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්ත චෛතසිකයන් ය.

06. **නේවසඤ්ඤානාසඤ්ඤායතනය අරමුණු කරන මහද්ගත ධර්ම -** ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන චිත්ත චෛතසිකයන් ය.

07. **කාමජවන් අටවිසි (28) දෙන -** අකුසල් සිත් 12, මහා කුසල් සිත් 8, මහා ක්‍රියා සිත් 8. සියල්ල 28 කි. හසිතෝත්පාදය සමග කාමජවන් සියල්ල 29 කි.

08. **අභිඥා දෙසිත -** ඉද්ධිවිධ, දිබ්බසෝත, චේතෝපරිය, පුබ්බේනිවාස, දිබ්බචක්ඛු නම් වූ අභිඥා කෘත්‍ය සිදු කෙරෙන පඤ්චම ධ්‍යාන කුසල ක්‍රියා සිත් දෙක ය.

09. **විරති තුන -** සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන මිථ්‍යා වාචාදියෙන් වැළකීම් වශයෙන් පහළ වන බැවින් විරති නම් වෙති.

10. **විරති තුන යෙදෙන සිත් 16 -** කාමාවචර මහා කුසල් සිත් 8 සහ ලෝකෝත්තර සිත් 8 යන 16 කි.

11. අප්පමාණාරම්මණය අරමුණු කොට පහළවන මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරෙහි විරති අප්‍රමාණ්‍ය නොමයෙදෙති. විරති අප්‍රමාණ්‍ය දෙක ලෝකෝත්තර ධර්ම අරමුණු කරන කාමාවචර සිත්හි නොයෙදෙන බැවිනි.

12. **අප්‍රමාණ්‍ය යෙදෙන සිත් 28 -** කාමාවචර මහා කුසල් 8, මහා ක්‍රියා 8, රූපාවචර පඤ්චමධ්‍යාන සිත් තුන හැර ඉතිරි රූපාවචර සිත් 12. සියල්ල 28 කි. සත්ව ප්‍රඥප්තියම අරමුණු කරන බැවින් පරිත්ත,

මහද්ගත, අප්පමාණ අරමුණු කිසිවක්ම අප්‍රමාණායයන්ට අරමුණු නොවෙති.

13. එකම ගවයා කිරි බොන ළපටි කාලයේ වස්සා යයි ද, කිරිවැරූ කාලයේ නාම්බා යයි ද, බර වැඩකරන කාලයේ ගොනා යයි ද, (වච්ඡෝ - දම්මෝ - බලිවද්දෝ) කියන්නාක් මෙන් හසිතෝත්පාද වර්ජිත කාම ජවන් 28 ද, මනෝද්වාරාවර්ජනය ද, අභිඥා සිත් දෙක ද කාමාවචර ධර්ම අරමුණු කරන විට පරිත්තාරම්මණා ධම්මා කියා ද, රූපාවචර අරූපාවචර ධර්මයන් අරමුණු කරන විට මහග්ගතාරම්මණා ධම්මා කියා ද ව්‍යවහාරයට ගැනෙති. එසේම මහා කුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් 8 ද මනෝද්වාරාවර්ජනය ද අභිඥා දෙක ද යන සිත් එකොළොස ලෝකෝත්තර ධර්ම අරමුණු කරන කල්හි අප්පමාණාරම්මණා ධම්මා යනුවෙන් ද නම් ලබති. එසේ හෙයින් ඒ සිත් අනේකාන්තික අරමුණු ඇති සිත් නම් වන්නාහ.

14. **ප්‍රඥප්ති ධර්ම** - චිත්ත චෛතසික රූප නිර්වාණ නම් වූ සතර පරමාර්ථයට ඇතුලත් නො වූ ලෝක ව්‍යවහාරයට ඇතුලත් වූ නම් ගම් ආදී සම්මුතිය ප්‍රඥප්තිය නම් වන්නේ ය.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. පරිත්තාරම්මණ ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**පරිත්තාරම්මණ ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 15 වැනි පාඩම

# 14. හීන ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **හීනා ධම්මා - මජ්ඣිමා ධම්මා - පණීතා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පරිත්තාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව හීන ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හීනා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **මජ්ඣිමා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පණීතා ධම්මා** යනුවෙනි.

04. **හීනා ධම්මා** - ලාමක වූ නින්දිත අකුසල නම් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **මජ්ඣිමා ධම්මා** - හීන ද නො වූ ප්‍රණීත ද නො වූ මධ්‍යස්ථ නම් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **පණීතා ධම්මා** - උත්තමාර්ථයෙන් ප්‍රණීත නම් වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **හීනා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

08. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චෛතසික සත්විස්ස (27) අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධය නම්

වන්නේ ය. සංඥා චෛතසිකය සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පස්විසි (25) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් දොළොස විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

09. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස මනායතනය නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

10. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සත්විසි (27) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

11. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත සවිසි (26) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

12. **මජ්ඣිමා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් විස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

13. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

14. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

15. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

16. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

17. ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථීන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

18. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

19. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

20. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා විඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ඉතිරි ලෞකික විපාක සිත් සමවිස්ස (20) ද, ක්‍රියා සිත් එකුන්විස්ස (19) ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

21. චෛතසික අටතිස (38) ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

22. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

23. **පණීතා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස (36) ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

24. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

25. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චෛතසික සතිස (36) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෝකෝත්තර සිත් අට විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

26. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

27. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සිත් අට මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

28. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

29. මේ ශබ්දාවලිය හෙවත් හීන ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහිලා ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. "**හීනත්තිකේ හීනාති. - ලාමකා අකුසලා ධම්මා.**"

හීන ත්‍රිකයෙහි 'හීන ධර්ම' යනු ලාමක අකුසල ධර්මයෝය. සියලුම අකුසල ධර්මයෝ 'හීන ධර්ම' නම් වන්නාහ.

02. "**හීනප්පණීතානං මජ්ඣෙ භවාති මජ්ඣිමා.**"

හීන ධර්මයන්ට ද, ප්‍රණීත ධර්මයන්ට ද මැද විද්‍යමාන වන ධර්මයෝ 'මධ්‍යම ධර්ම' නම් වන්නාහ. එනම් හීන ද නොවූ, ප්‍රණීත ද නොවූ ධර්මයෝය.

03. "**අවසේසා තෙභූමකා ධම්මා උත්තමට්ඨේන අතප්පකට්ඨේන ච පණීතා. - ලෝකුත්තරා ධම්මා.**"

උත්තම අර්ථයෙන් ද, තැවීමක් නැති අර්ථයෙන් ද ඉතිරි ත්‍රෛභූමික ධර්මයෝ 'ප්‍රණීත ධර්ම' නම් වන්නාහ. එනම් සියලුම ලෝකෝත්තර ධර්මයෝය.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. හීන ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නිය්‍යාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

**හීන ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 15. මිච්ඡත්ත ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **මිච්ඡත්ත නියතා ධම්මා - සම්මත්ත නියතා ධම්මා - අනියතා ධම්මා' ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ හීන ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව මිච්ඡත්ත ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **මිච්ඡත්ත නියතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සම්මත්ත නියතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනියතා ධම්මා** යනුවෙනි.

04. **මිච්ඡත්ත නියතා ධම්මා -** විපරීත ස්වභාව ඇති බැවින් චුතියට අනතුරුවම විපාක දීම නියත කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **සම්මත්ත නියතා ධම්මා -** අවිපරීත ස්වභාව ඇති බැවින් තමාගේ පැවැත්මට අනතුරුවම විපාකදීම ඒකාන්ත නියත කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අනියතා ධම්මා** - විපරීත ස්වභාවයෙන් හෝ අවිපරීත ස්වභාවයෙන් අනේකාන්ත වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **මිච්ඡත්ත නියතා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නියත මිථ්‍යා දෘෂ්ටි කර්ම වශයෙන් හටගන්නා වූ ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත විථි සතරෙහි

සත්වන ජවනයෝ ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත එක්විසි (21) චෛතසිකයෝ ද,

08. මාතුඝාතනාදී පඤ්චානන්තර්ය කර්ම වශයෙන් පවත්නා වූ දෝස මූල චිත්ත විථි දෙකෙහි සත්වැනි ජවනයෝ ද, තත් සම්ප්‍රයුක්ත ප්‍රීති ලෝභ මාන දිට්ඨි විචිකිච්ඡා වර්ජිත දෙවිසි (22) චෛතසිකයෝ ද යන

09. අකුසල් සිත් සය ද, තත් සම්ප්‍රයුක්ත මාන විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසිකය ද ලැබෙන්නාහ.

10. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

11. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මාන විචිකිච්ඡා වර්ජිත පස්විසි (25) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි තෙවිසි (23) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් සය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

12. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සය මනායතනය නම් වන්නේ ය. පස්විසි (25) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පස්විසි (25) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

14. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් සය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත සූවිසි (24) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

15. **සම්මත්ත නියතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර මාර්ග චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත සතිස් (36) චෛතසිකය ද ලැබෙන්නාහ.

16. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

17. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. මාර්ග සිත් සතර විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

18. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මාර්ග සිත් සතර මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

19. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මාර්ග සිත් සතර මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

20. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස් (29) දෙන සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

21. **අනියතා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මිථ්‍යා දෘෂ්ටි වශයෙන් පැවති දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්තවිථි සතරෙහි වූ සත්වැනි ජවනය ද, පඤ්චානන්තර්ය කර්ම වශයෙන් පැවැති දෝස මූල චිත්තවිථි දෙකෙහි සත්වැනි ජවනය ද, සතර මාර්ග චිත්තය ද වර්ජිත පස්අසූ

(85) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසික ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

22. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පහකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

23. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. පස්අසූ චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

24. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

25. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

26. පස් අසූ චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

27. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම්

වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

28. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

29. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි දෙසැත්තෑ (72) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

30. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

31. ආර්ය සත්‍ය වශයෙන් තුන් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එක්පණස් (51) චෛතසික ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තුන් වැදෑරුම් වන්නාහ.

32. මේ ශබ්දාවලිය හෙවත් මිච්ඡත්ත ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම්

වන්නේ ය. පරමාර්ථ ධර්ම සියල්ල මෙහි ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **මිච්ඡත්තා - ''හිතසුඛාවහා මේ භවිස්සන්තීති ඒවං ආසිංසිතාපි කථා අභාවතෝ, අසුභාදීසු යේව සුභන්ති ආදි විපරීතප්පවත්තිතෝ ච මිච්ඡා සභාවාති මිච්ඡත්තා''**

මා හට හිත සුව පිණිස පවතින්නාහු යයි විශ්වාසයෙන් අපේක්‍ෂා කළ නමුත්, එසේ නොවන්නා වූ අශුභාදියෙහිම සුභ යයි ආදී විපරීතග්‍රහණයෙන් පැවති බැවින් ද මිථ්‍යා ස්වභාව ඇත්තා වූ ධර්මයෝ මිච්ඡත්ත නම් වෙති.

02. **නියතා - ''විපාකදානේ සති ඛන්ධභේදානන්තරමේව විපාකදානතෝ නියතා''** විපාක දීමේදී ස්කන්ධ භේදය නම් වූ චුතියට අනතුරුවම විපාක ගෙන දීම ඒකාන්ත බැවින් මිච්ඡත්ත නියත නම් වෙයි.

03. **සම්මත්තා - ''වුත්ත විපරීතේන අත්ථේන සම්මා සභාවා සම්මත්තා''** කියන ලද අර්ථයට ප්‍රතිවිරුද්ධාර්ථයෙන් යුක්ත වන බැවින් අවිපරිතාර්ථයෙන් සම්‍යක් ස්වභාව ඇති බැවින් සම්මත්ත නම්.

04. **සම්මත්ත නියතා - ''සම්මත්තා ච තේ නියතා ච අනන්තර මේව ඵලදානේනාති සම්මත්ත නියතා''** තමන්ගේ පැවැත්මට අනතුරුවම ඵල ගෙන දෙන බැවින් සම්මත්ත වූවෝත් නියත වූවෝත් ඔවුහුම යයි සම්මත්ත නියතයෝ නම් වෙති. එනම් සතර මාර්ගයෝ ය.

05. **අනියතා - ''උභයතාපි න නියතාපි අනියතා''** මිථ්‍යා ස්වභාවයෙන් චුතියට අනතුරුව විපාක දීමේ නියමයක් නැත්තා වූ ද, ඒ ධර්මයෝ අනියත ධර්ම නම් වෙති.

06. **මිච්ඡත්ත නියත ධර්ම නම් -** නියත මිථ්‍යාදෘෂ්ටි ගැනීම් වශයෙන් හට ගන්නා වූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත වීථි සතරෙහි අන්තිම ජවන් සිත් ද මාතු ඝාතනාදී පඤ්චානන්තර්ය කර්ම වශයෙන් පවත්නා වූ දෝස මූලික චිත්ත වීථි දෙකෙහි සත්වැනි ජවනයෝ ද ඒ සිත් සයෙහි යෙදෙන මාන, විචිකිච්ඡා දෙක හැර චෛතසික 25 ද වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. මිච්ඡත්ත ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**මිච්ඡත්ත ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 17 වැනි පාඩම

# 16. මග්ගාරම්මණ ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **මග්ගාරම්මණා ධම්මා - මග්ගහේතුකා ධම්මා - මග්ගාධිපතිනෝ ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ මිච්ඡත්ත ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව මග්ගාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **මග්ගාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **මග්ග හේතුකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **මග්ගාධිපතිනෝ ධම්මා** යනුවෙනි.

04. **මග්ගාරම්මණා ධම්මා -** මාර්ගයම අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **මග්ගහේතුකා ධම්මා** - මාර්ගයම හේතු කොට ඇත්තා වූ ද, මාර්ග නම් ලත් හේතු ඇත්තා වූ ද, මාර්ගයෙහි පිහිටි හේතු ඇත්තා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **මග්ගාධිපතිනෝ ධම්මා** - මාර්ගයම ආරම්මණාධිපති ප්‍රත්‍ය කොට ඇත්තා වූ ද, මාර්ගයෙහි පිහිටි සහජාතාධිපති ප්‍රත්‍ය ඇත්තා වූ ද, මාර්ගයම සහජාතාධිපති ප්‍රත්‍ය කොට ඇත්තා වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **මග්ගාරම්මණා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ග සිත අරමුණු කොට ඇත්තා වූ, සෝවාන් ආර්ය පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය ද, ඥාන

සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, කුසලාභිඥා සිත ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් (33) චෛතසිකයෝ ද,

08. සෝවාන්, සකදාගාමී මාර්ගද්වය අරමුණු කොට ඇත්තා වූ සකදාගාමී ආර්ය පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය ද, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, කුසලාභිඥා සිත ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් (33) චෛතසිකයෝ ද,

09. සෝවාන්, සකදාගාමී, අනාගාමී මාර්ගත්‍රයම අරමුණු කොට ඇත්තා වූ අනාගාමී ආර්ය පුද්ගලයාගේ මනෝද්වාරාවර්ජනය ද, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, කුසලාභිඥා සිත ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් (33) චෛතසිකයෝ ද,

10. සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මාර්ගය ම අරමුණු කොට ඇත්තා වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ මනෝද්වාරාවර්ජනය ද, ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර ද, ක්‍රියාභිඥා සිත ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් (33) චෛතසිකයෝ ද යන

11. මනෝද්වාරාවර්ජනය ද, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා සිත් අට ද, අභිඥා ද්වය ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් (33) චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

12. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

13. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, තෙතිස් (33) චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි එක්තිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. මග්ගාරම්මණික සිත් එකොළොස විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

14. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මග්ගාරම්මණික සිත් එකොළොස මනායතනය නම් වන්නේ ය. තෙතිස් (33) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

15. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, මග්ගාරම්මණික සිත් එකොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. තෙතිස්

(33) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

16. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, මග්ගාරම්මණික සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත තෙතිස් (33) චෛතසික ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

17. **මග්ගහේතුකා ධම්මා** - යන ද්විතීය පදයාගේ 'මාර්ගයම හේතුකොට ඇත්තා වූ' යන ප්‍රථම අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මාර්ග සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත මාර්ගාංග අට වර්ජිත අටවිසි (28) චෛතසික ද ලැබෙන්නාහ.

18. 'මාර්ග නම් ලත් හේතු ඇත්තා වූ' යන ද්විතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මාර්ග සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත අමෝහ වර්ජිත පන්තිස් (35) චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

19. 'මාර්ගයෙහි පිහිටි හේතු ඇත්තා වූ' යන තෘතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මාර්ග සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත සතිස් (36) චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

20. ත්‍රිවිධ අර්ථ විකල්පයට අයත් වු මාර්ග සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත සතිස් (36) චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

21. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

22. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ලෝකෝත්තර සතර මාර්ග චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

23. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෝකෝත්තර සතර මාර්ග චිත්තය මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

24. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතර මාර්ග චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

25. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

26. **මග්ගාධිපතිනෝ ධම්මා** - යන තෘතීය පදයාගේ 'මාර්ගයම ආරම්මණාධිපති ප්‍රත්‍ය කොට ඇත්තා වූ' යන ප්‍රථම අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගය අධිපති කොට අරමුණු කරන්නා වූ සෝවාන් ආර්ය පුද්ගලයාගේ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, සෝවාන් සකදාගාමී මාර්ගද්වය අධිපති කොට අරමුණු කරන්නා වූ සකදාගාමී ආර්ය පුද්ගලයාගේ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, සෝවාන් සකදාගාමී අනාගාමී මාර්ගත්‍රය අධිපති කොට අරමුණු කරන්නා වූ, අනාගාමී ආර්ය පුද්ගලයාගේ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, සතර මාර්ගයම අධිපති කොට අරමුණු කරන්නා වූ, ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර ද, විරති අප්‍රමාණ්‍ය වර්ජිත තත් සම්ප්‍රයුක්ත තෙතිස් (33) චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

27. 'මාර්ගයෙහි පිහිටි සහජාතාධිපති ප්‍රත්‍ය ඇත්තා වූ' යන ද්විතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සතර මාර්ග චිත්තයෝ ද, වීර්යාධිපති ප්‍රත්‍ය ලැබෙන කල්හි විරිය වර්ජිත පන්තිස් (35) චෛතසිකයෝ ද,

වීමංසාධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි විමංසා වර්ජිත පන්තිස් (35) චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

28. 'මාර්ගයම සහජාතාධිපති ප්‍රත්‍ය කොට ඇත්තා වූ' යන තෘතීය අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සම්මා දිට්ඨි, සම්මා වායාම නම් වූ විරිය, වීමංසාවෝ ලැබෙන්නාහ.

29. ත්‍රිවිධ අර්ථ විකල්පයට අයත් වූ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අට ද, සතර මාර්ග චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත සතිස් (36) චෛතසිකය ද ලැබෙන්නාහ.

30. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

31. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සතිස් (36) චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූතිස් (34) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අට ද, සතර මාර්ග චිත්තය ද විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

32. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අට ද, සතර මාර්ග චිත්තය ද මනායතනය නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

33. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අට ද, සතර මාර්ග චිත්තය ද මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සතිස් (36) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

34. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් (33) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

35. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

36. මේ ශබ්දාවලිය හෙවත් මග්ගාරම්මණ ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

37. දොළොස් අකුසල් චිත්තය ද, සතර මාර්ගය අරමුණු නොකරන කල්හි ලැබෙන්නා වූ මනෝද්වාරාවර්ජනය ඇතුලු අහේතුක සිත් අටළොස (18) ද, සතර මාර්ගය අරමුණු නොකරන කල්හි ලැබෙන්නා වූ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අට ඇතුලු කාමසෝභන සිත් සූවිස්ස (24) ද, එසේම මාර්ගය අරමුණු නොකරන කල්හි ලැබෙන්නා වූ කුසලාභිඥා ක්‍රියාභිඥා දෙසිත ඇතුලු මහද්ගත සිත් සත්විස්ස (27) ද, ලෝකෝත්තර ඵල සිත් සතර ද, චෛතසික දෙපණස (52) ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද මේ ත්‍රිකයට ඇතුලත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **මග්ගාරම්මණා ධම්මා -** ලෝකෝත්තර මාර්ගය අරමුණු කරන චිත්ත චෛතසික ධර්මයෝ ය. ආර්යයෝ තමන් ලත් මාර්ගය ද අරමුණු කරති. අභිඥා සිතින් අනුන් ලත් මාර්ගය ද අරමුණු කරති. තමන්ගේ මාර්ග සිත ආරම්මණාධිපති වශයෙන් ද, අනුන්ගේ මාර්ගය ආරම්මණ වශයෙන් ද අරමුණු කරති. සෝවාන් සකදාගාමී අනාගාමී තිදෙනාට ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, අභිඥා කුසලය ද, රහතන් වහන්සේට ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර ද, ක්‍රියාභිඥා සිත ද ඒ සැමට මනෝද්වාරාවර්ජන සිත ද

මග්ගාරම්මණික වෙති. විරති අප්‍රමාණ්‍ය හැර චෛතසික 33 ක් ද මග්ගාරම්මණික වෙයි.

02. **මග්ගෝ - " නිබ්බාණං මග්ගති ගවේසති, කිලේසේ වා මාරෙන්තෝ ගච්ඡතීති මග්ගෝ "** නිවන සොයන්නේ ගවේෂණය කරන්නේ මාර්ගය යි. තව ද, කෙලෙසුන් මරමින් යන්නේ ද මාර්ගය යි. **''මග්ගෝ ආරම්මණං ඒතේසන්ති මග්ගාරම්මණා''** මාර්ගය අරමුණ වූයේ මොවුන්ටය යනු හෙයින් මග්ගාරම්මණා නම් වෙති.

03. **මග්ගහේතුකා - ''අට්ඨංගිකෝ පි මග්ගෝ පච්චයට්ඨේන ඒතේසං හේතූති මග්ගහේතුකා''** උපකාරකාර්ථයෙන් අෂ්ටාංගික මාර්ගය හේතු වූයේ මොවුන්ට නුයි මග්ගහේතුකා නම් වෙයි. එනම් මාර්ග සිතෙහි වූ මාර්ගාංග හැර ඉතිරි චිත්ත චෛතසිකයෝ ය.

04. **මාර්ගය නම් ලත් හේතු ඇත්තා වූ -** සම්මා දිට්ඨිය නම් වූ අමෝහය, තෙමේ මාර්ගාංග ද වෙයි. අමෝහ කුසල හේතුව ද වෙයි. එහෙයින් සම්මා දිට්ඨිය සමග යෙදුනු ඉතිරි මාර්ග චිත්ත චෛතසික සියල්ල මාර්ගය නම් ලත් හේතු ඇති බැවින් මග්ගහේතුක නම් වෙති.

05. **මාර්ගයෙහි පිහිටි හේතු ඇත්තා වූ -** මාර්ග සිතෙහි යෙදුනු අලෝභ, අදෝස, අමෝහ නම් වූ හේතු ධර්මයෝ ය. ඒ හේතු තුන සමග යෙදුනා වූ මාර්ග චිත්ත චෛතසික සියල්ල මාර්ගයෙහි පිහිටි හේතු ඇති බැවින් මග්ගහේතුක නම් වෙති.

06. **මග්ගාධිපති -** මාර්ගයම ආරම්මණාධිපති ප්‍රත්‍ය කොට ඇති ධර්මයෝය. **''අරිය සාවකානං හි අත්තනෝ මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛණ කාලේ ආරම්මණාධිපති ලබ්භති.''** ආර්ය පුද්ගලයන්ට වනාහි ස්වකීය මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කිරීමේදී ආරම්මණාධිපති වශයෙන් මාර්ගය ප්‍රත්‍ය වේ. ඒ සඳහා සෝවාන් සකදාගාමී අනාගාමී ආර්යයන් තිදෙනාට ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් 4 ද, රහතන් වහන්සේට ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් 4 ද ලැබෙති. එහෙත් අනුන්ගේ මාර්ග සිතක් අරමුණු කරන කල්හි ආරම්මණාධිපති නොමැත.

07. මාර්ගයෙහි පිහිටි සහජාතාධිපති ඇත්තා වූ යන තැන මාර්ගයෙහි මාර්ගාංග වශයෙන් අධිපති ධර්ම දෙකක් ඇත. එනම් විරිය, වීමංසා දෙකය. ඉන් එකක් අධිපති කල්හි ඒ හා සමග යෙදුනා වූ ඉතිරි ධර්ම මග්ගාධිපති නම් වේ.

08. මාර්ගයම සහජාතාධිපති ප්‍රත්‍ය කොට ඇත්තා වූ යන තැන මාර්ගයෙහි පිහිටි විරිය අධිපති ධර්මය වීමංසාවට ද, වීමංසා අධිපති ධර්මය විරියට ද සහාජාතාධිපති වන බැවින් ඒ දෙක මග්ගාධිපති නම් වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. මග්ගාරම්මණ ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**මග්ගාරම්මණ ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 18 වැනි පාඩම

# 17. උප්පන්න ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **උප්පන්නා ධම්මා - අනුප්පන්නා ධම්මා - උප්පාදිනෝ ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ මග්ගාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව උප්පන්න ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **උප්පන්නා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනුප්පන්නා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **උප්පාදිනෝ ධම්මා** යනුවෙනි.

04. **උප්පන්නා ධම්මා -** උත්පාද, ස්ථිති, භංග නම් වූ ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අනුප්පන්නා ධම්මා -** උත්පාද, ස්ථිති, භංග නම් වූ ක්ෂණත්‍රයට නොපැමිණියාවූ ද, ඒ ක්ෂණත්‍රයට පැමිණෙමින් නොපවත්නාවූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **උප්පාදිනෝ ධම්මා** - නිමාවට ගිය කාරණෛකදේශයක් ඇති බැවින් අවශ්‍යයෙන් මතු ඉපදීම ස්වභාව කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **උප්පන්නා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උත්පාද, ස්ථිති, භංග නම් වූ ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ වර්තමාන කාලීන වූ එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස (52) ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

09. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසික සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

11. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

12. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසික ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

14. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

15. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

16. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

17. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එක්පණස් (51) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය.

18. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ සෝවාන් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංගයෝ අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්මයෝ මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

19. **අනුප්පන්නා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කුසල් සිත් එක්විස්ස (21) ද, අකුසල් සිත් දොළොස ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස (52) ද, චිත්තජ රූප සතළොස (17) ද, ඍතුජ රූප පසළොස ද, ආහාරජ රූප තුදුස ද, ජරතා අනිච්චතා රූපද්වය ද ලැබෙන්නාහ.

20. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ. ආයතන වශයෙන් සත් වැදෑරුම් වන්නාහ. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

21. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චිත්තජ රූප සතළොස (17) ද, ඍතුජ රූප පසළොස ද, ආහාරජ රූප තුදුස ද, ජරතා අනිච්චතා රූපද්වය ද රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. කුසල් සිත් එක්විස්ස (21) ද, අකුසල් සිත් දොළොස ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

22. ආයතන වශයෙන් සත් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, තිජ රූපයන් අතුරෙන් වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

23. කුසලාකුසල ක්‍රියා සිත් තෙපණස (53) මනායතනය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප දොළොස ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් සත් වැදෑරුම් වන්නාහ.

24. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, තිජ රූපයන් අතුරෙන් වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද

ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

25. පඤ්චද්වාරාවර්ජන චිත්තය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි කුසලාකුසල ක්‍රියා සිත් දෙපණස (52) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) ද, ආපෝ ධාතුව, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප දොළොස ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

26. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික කුසල් සිත් සතළොස (17) ද, අකුසල් සිත් දොළොස ද, ක්‍රියා සිත් සමවිස්ස (20) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත චෛතසික එක්පණස (51) ද, තිජරූප සතළොස (17) ද, ජරතා අනිච්චතා රූපද්වය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය.

27. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

28. **උප්පාදිනෝ ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වනාහි, විපාක සිත් සතිස (36) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද, කර්මජ රූප සමවිස්ස (20) ද ලැබෙන්නාහ.

29. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් එකොළොසකි. ධාතු වශයෙන් සතළොසකි (17). ආර්ය සත්‍ය සත්‍ය වශයෙන් එකකි.

30. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමවිසි (20) කර්මජ රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් (36) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සතිස් (36) විපාක චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

31. ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමවිසි (20) කර්මජ රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

32. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

33. සතිස් (36) විපාක චිත්තය මනායතනය නම් වන්නේ ය. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, උපචය රූපය, සන්තති රූපය යන සුඛුම රූප නවය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහ.

34. ධාතු වශයෙන් සතළොස් (17) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමවිසි (20) කර්මජ රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

35. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ

වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

36. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සූවිසි (24) විපාක චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

37. අටතිස් (38) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, උපචය රූපය, සන්තති රූපය යන සුඛුම රූප නවය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් සතළොස් (17) වැදෑරුම් වන්නාහ.

38. ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ලෞකික විපාක සිත් දෙතිස (32) ද, තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසික ද, සමවිසි (20) කර්මජ රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වන්නේ ය.

39. මේ ශබ්දාවලිය හෙවත් උප්පන්න ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

40. නිර්වාණය මේ ත්‍රිකයට ඇතුලත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **උප්පන්නා -** පච්චුප්පන්නයට හෙවත් වර්තමානයට කියනු ලැබේ. පච්චුප්පන්නය වනාහි අද්ධාපච්චුප්පන්න, සන්තතිපච්චුප්පන්න, ඛණපච්චුප්පන්න යයි තුනකට බෙදේ. එයින් දීර්ඝකාලීන වර්තමානය අද්ධාපච්චුප්පන්නයයි. එක ඉරියාපථයකට අයිති කාලය සන්තතිපච්චුප්පන්නයයි. චිත්තක්ෂණයක් තරම් කෙටි වර්තමානය

ක්ෂණපච්චුප්පන්න නම් වෙයි. මේ ත්‍රිකයෙහි උප්පන්න යනුවෙන් ගැනෙන්නේ ක්‍ෂණපච්චුප්පන්නයයි. එයින් එක් චිත්තයක ද උත්පාදක්ෂණය, ඨිතික්ෂණය හා භංගක්ෂණය යන අවස්ථා තුන මෙහිලා වර්තමානය නමින් ගැනේ. උප්පන්නා යනු එම කුඩා චිත්තක්ෂණයට අයත් වර්තමාන ධර්මයෝ ය.

02. **අනුප්පන්නා** - අතීතයට අයත් උත්පාදාදී ක්‍ෂණත්‍රයට නොපැමිණියා වූ ද, වර්තමානයෙහි එම ක්ෂණත්‍රයට නොපැමිණෙමින් ඇත්තා වූ ද ධර්ම ගැනෙති. එනම් කුසලාකුසල ක්‍රියා සිත් 53 ත්, එහි යෙදෙන චෛතසික 52 ත් තිජ රූපත් ජරතා අනිච්චතා රූපද්වයත් ය.

03. **තිජරූප** - චිත්තජ, ඍතුජ, ආහාරජ රූපයෝ ය. ඔවුන් සම්පිණ්ඩනය කළ කල්හි 17 කි. එනම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ශබ්ද, ගන්ධ, රස, ආහාර, ආකාස, කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා, උපචය, සන්තති යන 17 වෙති.

04. **නිමාවට ගිය කාරණෛකදේශය** - මතු භවයන්හි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක ඉපදවීමට සමත්වන පරිදි රැස්කරන ලද කුසල වූ ද අකුසල වූ ද කර්ම, කර්මපථ ඇති බවය.

05. **උප්පාදිනෝ** - නිමාවට ගිය කාරණෛකදේශයක් ඇති බැවින් අවශ්‍යයෙන්ම මතු ඉපදීම ස්වභාව කොට ඇත්තා වූ විපාක සිත් 36 ත් චෛතසික 38 ත් කර්මජ රූප 20 ත් ගැනෙති.

## ත්‍රිලක්‍ෂණ විදර්ශනාව

01. උප්පන්න ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**උප්පන්න ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 19 වැනි පාඩම

# 18. අතීත ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **අතීතා ධම්මා - අනාගතා ධම්මා - පච්චුප්පන්නා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ උප්පන්න ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව අතීත ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අතීතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනාගතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පච්චුප්පන්නා ධම්මා** යනුවෙනි.

04. **අතීතා ධම්මා** - උත්පාදාදී ක්‍ෂණත්‍රයට පැමිණ ඉක්මගියා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අනාගතා ධම්මා -** උත්පාදාදී ක්‍ෂණත්‍රයට නොපැමිණියා වූ, මත්තෙහි පැමිණෙනු ලබන්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **පච්චුප්පන්නා ධම්මා** - උත්පාදාදී ක්‍ෂණයට පැමිණෙමින් පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **අතීතා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ඉපිද නිරුද්ධ වූ එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

09. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

11. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය . ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තෙජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

12. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

14. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

15. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

16. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

17. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික එක්පණස (51) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය.

18. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද,

ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

19. **අනාගතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උත්පාදාදී ක්‍ෂණත්‍රයට මතු පැමිණෙන්නා වූ එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

20. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

21. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

22. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපයන් අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

23. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

24. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

25. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

26. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

27. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

28. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

29. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික එක්පණස (51) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය.

30. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා

සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

31. **පච්චුප්පන්නා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උත්පාදාදී ක්‍ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

32. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

33. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

34. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපයන් අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

35. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

36. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය,

වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

37. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

38. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

39. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

40. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

41. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එක්පණස් (51) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය.

42. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

43. මේ ශබ්දාවලිය හෙවත් අතීත ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනකට බෙදා වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

44. නිර්වාණය මේ ත්‍රිකයට ඇතුලත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **අතීතා** - උත්පාද, ඨිති, භංග නම් වූ අවස්ථා තුනට පත්වී ඉක්මගිය අර්ථයෙන් අතීත නම් වේ. චිත්ත චෛතසිකයන්ගේ උත්පාදක්ෂණය, ඨිතික්ෂණය සහ භංගක්ෂණය ක්‍ෂණ වශයෙන් එක හා සමානය. ඉන් එක් එක් ක්‍ෂණයක් ඉක්ම ගියේ නම් එයට අතීත යයි කියනු ලැබේ. රූපයන්ගේ උත්පාද ක්‍ෂණයත්, භංගක්ෂණයත් එක හා සමානය. එක් කුඩා චිත්තක්ෂණයක් වැනිය. රූපයන්ගේ ඨිතික්ෂණය වනාහි කුඩා චිත්තක්ෂණ 49 ක් පමණ වන්නේ ය. ස්වකීය ක්‍ෂණය ඉක්මගිය නාම රූප සියල්ල අතීත ධර්ම නම් වෙති.

02. **අනාගතා** - උත්පාදාදී ක්‍ෂණත්‍රයට නොපැමිණියා වූ ද, මතු පැමිණිය හැකි වූ ද සියල්ල අනාගත යයි කියනු ලැබේ. අනාගතයේ උපදින සියල්ල අනාගත ධර්මයෝ ය. එනම් සිත් 89, චෛතසික 52 සහ රූප 28 ද වෙති.

03. **පච්චුප්පන්නා** - උත්පාද ඨිති භංග යන අවස්ථා තුනට පත්වෙමින් පවත්නා වූ සිත් 89 චෛතසික 52 සහ රූප 28 ද වෙති.

04. **අතීතත්තිකේ අත්තනෝ සභාවං උප්පාදාදී ලක්ඛණංවා පත්වා අතික්කන්තාති - අතීතා, තදුභයම්පි න ආගතාති - අනාගතා, තං තං කාරණං පටිච්ච උප්පන්නාති - පච්චුප්පන්නා (අත්ථසාලිනී)**

05. අතීත ත්‍රිකයෙහි, තමාගේ ස්වභාවයට පැමිණ ඉක්ම ගියාහු නුයි ද, උත්පාදාදී ලක්ෂණයට හෝ පැමිණ ඉක්ම ගියාහු නුයි ද අතීත නම් වෙති. ඒ දෙකටම නොපැමිණියාහු නුයි අනාගත නම් වෙති. ඒ ඒ කාරණය හේතුකොට ගෙන උපන්නාහු නුයි පච්චුප්පන්න නම් වෙති.

මෙම අටුවා පාඨයෙන් තුන් කාලයට යෙදෙන අර්ථය දැක්වේ. නිර්වාණයට කාල නියමයක් නැති බැවින් මේ ත්‍රිකයට ඇතුලත් නොවේ. තුන් කාලයට අයත් සියල්ල ස්වරූපාර්ථ වශයෙන් එක හා සමාන වේ.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. අතීත ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියාාන - හේතු - දස්සන

- ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**අතීත ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 20 වැනි පාඩම

# 19. අතීතාරම්මණ ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **අතීතාරම්මණා ධම්මා - අනාගතාරම්මණා ධම්මා - පච්චුප්පන්නාරම්මණා ධම්මා' ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ අතීත ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව අතීතාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අතීතාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනාගතාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පච්චුප්පන්නාරම්මණා ධම්මා** යනුවෙනි.

04. **අතීතාරම්මණා ධම්මා** - ඉපිද නිරුද්ධ වූ අතීත ධර්මයන් අරමුණු කොට පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අනාගතාරම්මණා ධම්මා** - උත්පාදාදී ක්‍ෂණත්‍රයට නොපැමිණියා වූ ද, මත්තෙහි පැමිණෙනු ලබන්නා වූ ද අනාගත ධර්මයන් අරමුණු කොට පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **පච්චුප්පන්නාරම්මණා ධම්මා** - උත්පාදාදී ක්‍ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා වූ වර්තමාන ධර්මයන් අරමුණු කොට පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **අතීතාරම්මණා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අතීත ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු

කරන්නා වූ විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤා නාසඤ්ඤායතන සිත් සය ද, තත් සම්ප්‍රයුක්ත සමතිස් (30) චෛතසිකය ද,

08. අතීත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ කාම ජවන් එකුන්තිස (29) ද, මනෝද්වාරාවර්ජන සිත ද, මහා විපාක සිත් අට ද, සන්තීරණ සිත් තුන ද, අභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත සත්සාලිස් (47) චෛතසිකය ද යන

09. අතීතාරම්මණික සිත් එකුන්පණස (49) ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත සත්සාලිස් (47) චෛතසිකය ද ලැබෙන්නාහ.

10. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

11. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සත්සාලිස් (47) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පන්සාලිස් (45) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අතීතාරම්මණික සිත් එකුන්පණස (49) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

12. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අතීතාරම්මණික සිත් එකුන්පණස (49) මනායතනය නම් වන්නේ ය. චෛතසික සත්සාලිස (47) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අතීතාරම්මණික සිත් එකුන්පණස (49) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික සත්සාලිස (47) ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

14. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අතීතාරම්මණික සිත් එකුන්පණස (49) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික සසාලිස (46) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

15. **අනාගතාරම්මණා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අනාගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අමුණු කරන්නා වූ මනෝද්වාරාවර්ජන සිත ද, කාමජවන්

එකුන්තිස (29) ද, තදාරම්මණ එකොළොස ද, අභිඥා දෙසිත ද යන අනාගතාරම්මණික සිත් තෙසාලිස (43) ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සමපණස (50) ද ලැබෙන්නාහ.

16. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

17. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සමපණස් (50) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි අටසාලිස් (48) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අනාගතාරම්මණික සිත් තෙසාලිස (43) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

18. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අනාගතාරම්මණික සිත් තෙසාලිස (43) මනායතනය නම් වන්නේ ය. චෛතසික සමපණස (50) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

19. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අනාගතාරම්මණික සිත් තෙසාලිස (43) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික සමපණස (50) ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

20. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අනාගතාරම්මණික සිත් තෙසාලිස (43) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික එකුන්පණස (49) ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

21. **පච්චුප්පන්නාරම්මණා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වර්තමාන ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නා වූ දෙපස් (10) විඤ්ඤාණය ද, මනෝ ධාතු ත්‍රිකය ද, තත් සම්ප්‍රයුක්ත ඡන්ද ප්‍රීති විරිය වර්ජිත අන්‍යසමාන චෛතසික දසය (10) ද,

22. වර්තමාන ධර්මයන් අනේකාන්තයෙන් අරමුණු කරන්නා වූ මනෝද්වාරාවර්ජනය ද, කාමජවන් එකුන්තිස (29) ද, තදාරම්මණ

එකොළොස ද, අභිඥා සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සමපණස (50) ද යන

23. පච්චුප්පන්නාරම්මණික සිත් සපණස (56) ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සමපණස (50) ද ලැබෙන්නාහ.

24. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

25. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චෛතසික සමපණස (50) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි අටසාලිස් (48) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. පච්චුප්පන්නාරම්මණික සිත් සපණස (56) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

26. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පච්චුප්පන්නාරම්මණික සිත් සපණස (56) මනායතනය නම් වන්නේ ය. චෛතසික සමපණස (50) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

27. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පච්චුප්පන්නාරම්මණික සිත් සපණස (56) අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සිත් තෙසාලිස (43) මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සමපණස් (50) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

28. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, වර්තමාන ධර්මයන් අරමුණු කරන සිත් සපණස (56) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත එකුන්පණස් (49) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙ වැදෑරුම් වන්නාහ.

29. මේ ශබ්දාවලිය හෙවත් අතීතාරම්මණ ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට බෙදා වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

30. ප්‍රඥප්ති ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නා වූ අභිඥාද්වය වර්ජිත රූපාවචර සිත් පසළොස ද, ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන සිත් සය ද, තත් සම්ප්‍රයුක්ත විරති වර්ජිත පන්තිස් (35) චෛතසිකය ද,

31. ප්‍රඥප්ති ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ හසිතෝත්පාද වර්ජිත කාමජවන් අටවිස්ස (28) ද, මනෝද්වාරාවර්ජනය ද, අභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත විරති වර්ජිත චෛතසික එකුන්පණස (49) ද,

32. අප්‍රමාණ ධර්මයක් වූ නිර්වාණය ඒකාන්තයෙන් අරමුණු කරන්නා වූ ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත සතිස් (36) චෛතසිකය ද,

33. අප්‍රමාණ ධර්මයක් වූ නිර්වාණය අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අට ද, මනෝද්වාරාවර්ජන සිත ද, අභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍යා වර්ජිත චෛතසික තෙතිස (33) ද,

34. අටවිසි (28) රූපය ද, නිර්වාණය ද මේ ත්‍රිකයට ඇතුළත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **අභිඥා දෙසිත** - ශෛක්ෂ, පෘථග්ජන අභිඥා ලාභීන්ගේ පඤ්චම ධ්‍යාන කුසලාභිඥා සිත ද, බුදු, පසේබුදු, මහරහත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ ක්‍රියාභිඥා සිත ද යන සිත් දෙක අභිඥා දෙසිත වෙති.

02. **කාමජවන් එකුන්තිස (29)** - අකුසල් සිත් 12, මහා කුසල් සිත් 8, මහා ක්‍රියා සිත් 8, හසිතෝත්පාද ක්‍රියා සිත යන සිත් 29 කාමජවන් එකුන්තිස (29) නම් වෙති.

03. **තදාරම්මණ එකොළොස -** සන්තීරණ සිත් 3, මහා විපාක සිත් 8 යන මේ සිත් 11  තදාරම්මණ එකොළොස ය.

04. **විරති තුන -** සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන විරති තුන නම් වෙති.

05. **අප්‍රමාණ්‍ය දෙක -** කරුණා, මුදිතා දෙකය.

06. **ප්‍රඥප්ති අරමුණ -** සතර පරමාර්ථයට අයත් නොවන සම්මුති ව්‍යවහාරය ප්‍රඥප්ති නම් වේ. එම සම්මුති ව්‍යවහාරයට අයත් දෙයක් අරමුණු කිරීම ප්‍රඥප්ති අරමුණ ගැනීම නම් වේ.

07. **අප්‍රමාණ අරමුණ -** ලෝකෝත්තර සතර මග ඵල හා නිවන් අරමුණ වනාහි අප්‍රමාණ ධර්ම අරමුණ නම් වෙයි. රාගාදී කෙලෙසුන්ගෙන් හෝ අතිතාදී කාලයකින් ප්‍රමාණය කළ නොහෙන බැවිනි.

08. **ඒකාන්ත, අනේකාන්ත ආරම්මණික සිත් -** යම් සිතකින් යම් අරමුණක් නියත වශයෙන් ගනු ලැබේ ද, එසේ අරමුණු ගන්නා සිත් ඒකාන්ත **ආරම්මණික සිත්** නම් වේ. යම් සිතකින් නා නා අරමුණු ගනු ලැබේ ද, එසේ අරමුණු ගන්නා සිත් අනේකාන්ත **ආරම්මණික සිත්** නම් වේ.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. අතීතාරම්මණ ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**අතීතාරම්මණ ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 21 වැනි පාඩම

# 20. අජ්ඣත්ත ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **අජ්ඣත්තා ධම්මා - බහිද්ධා ධම්මා - අජ්ඣත්ත බහිද්ධා ධම්මා' ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ අතීතාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව අජ්ඣත්ත ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අජ්ඣත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **බහිද්ධා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අජ්ඣත්ත බහිද්ධා ධම්මා** යනුවෙනි.

04. **අජ්ඣත්තා ධම්මා** - ස්ව සන්තානයෙහි පවත්නා වූ හෙවත් තම තමාගේ සන්තානයෙහි පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **බහිද්ධා ධම්මා -** ස්ව සන්තානයෙන් අන්‍යව පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අජ්ඣත්ත බහිද්ධා ධම්මා** - ස්ව සන්තානයෙහි ද, අන්‍ය සන්තානයන්හි ද වශයෙන් පොදුවේ පවත්නා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **අජ්ඣත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ස්ව සන්තානයෙහි පහළවන්නා වූ එකූන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

08. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

09. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

11. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය . ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

12. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

14. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

15. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

16. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

17. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික එක්පණස (51) ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ චෛතසිකය සමුදය සත්‍යය නම් වන්නේ ය.

18. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකූන්තිස (29) ද,

ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

19. **බහිද්ධා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ස්ව සන්තානයෙන් අන්‍යව පවත්නා වූ එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

20. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි.

21. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසික අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

22. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපයන් අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

23. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

24. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය

නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

25. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

26. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

27. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

28. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

29. ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එක්පණස් (51) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

30. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා

ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ගචිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

31. **අජ්ඣත්ත බහිද්ධා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ස්ව සන්තානයෙහි ද අන්‍ය සන්තානයන්හි ද වශයෙන් පොදුවේ පවත්නා වූ එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද ලැබෙන්නාහ.

32. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

33. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

34. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපයන් අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

35. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන

භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඓාට්ඨබ්බායතනය නම් වන්නේ ය.

36. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

37. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි (28) රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

38. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඓාට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

39. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

40. දෙපණස් (52) චෛතසිකය ද, ආපෝ ධාතුව, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

41. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එක්පණස් (51) චෛතසිකය ද, අටවිසි (28) රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය.

42. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි නම් වූ සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

43. මේ ශබ්දාවලිය හෙවත් අජ්ඣත්ත ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනකට බෙදා වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **අජ්ඣත්තා** - ස්වකීය සන්තානයෙහි වූ ධර්මයෝය.

02. **බහිද්ධා** - ස්ව සන්තානයෙන් පිටත වූ සියලු ධර්මයෝ බහිද්ධා ධර්මයෝ නම් වෙති. නිර්වාණය ද සමග ය.

03. **අජ්ඣත්ත පදයාගේ ප්‍රභේද** - ගෝචරජ්ඣත්ත, නියකජ්ඣත්ත, අජ්ඣත්තජ්ඣත්ත, විසයජ්ඣත්ත නමින් අජ්ඣත්ත සතරක් ඇත.

04. **ගෝචරජ්ඣත්ත** - භාවනා වශයෙන් වඩන ලද පුරුදු කරන ලද්දා වූ සමාධිමය භාවනා අරමුණු ගෝචරජ්ඣත්ත නම්වේ.

05. **නියකජ්ඣත්ත** - ස්වකීය සන්තානයට අයත් ධර්ම සියල්ල නියකජ්ඣත්ත නම් වේ.

06. **අජ්ඣත්තජ්ඣත්ත** - යනු චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය මන නම් වූ සළායතනයට නමකි.

07. **විසයජ්ඣත්ත** - යනු අර්හත් ඵල චිත්තයටම නමකි.

08. මේ ත්‍රිකයෙහි අජ්ඣත්ත යනු ස්වකීය සන්තානයටම අයිති පෞද්ගලික චිත්ත චෛතසික රූප ධර්ම සමූහයට නමකි.

09. **බහිද්ධා යනු** - ස්වසන්තානයෙන් පිටත වූ ඉන්ද්‍රිය බද්ධ වූ හෝ අනින්ද්‍රිය බද්ධ වූ හෝ චිත්ත චෛතසික රූප නිර්වාණ ධර්ම සියල්ලට නමකි.

10. **අජ්ඣත්ත බහිද්ධා** - යනු නිර්වාණය ද, අනින්ද්‍රිය බද්ධ වූ රූප ද හැර සෙසු ඉන්ද්‍රිය බද්ධ වූ චිත්ත චෛතසික රූප ධර්ම සියල්ලට නමකි.

# ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. අජ්ඣත්ත ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**අජ්ඣත්ත ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 22 වැනි පාඩම

# 21. අජ්ඣත්තාරම්මණ ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **අජ්ඣත්තාරම්මණා ධම්මා - බහිද්ධාරම්මණා ධම්මා - අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ අජ්ඣත්ත ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව අජ්ඣත්තාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අජ්ඣත්තාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **බහිද්ධාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා** යනුවෙනි.

04. **අජ්ඣත්තාරම්මණා ධම්මා** - ස්ව සන්තානයෙහි පවත්නා වූ හෙවත් තම තමාගේ සන්තානයෙහි පවත්නා වූ ධර්මයන් අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **බහිද්ධාරම්මණා ධම්මා** - ස්ව සන්තානයෙන් අන්‍යව පවත්නා වූ ධර්මයන් අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා** - ස්ව සන්තානයෙහි ද, අන්‍ය සන්තානයන්හි ද වශයෙන් පොදුවේ පවත්නා වූ ධර්මයන් අරමුණු කොට ඇත්තා වූ නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **අජ්ඣත්තාරම්මණා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අධ්‍යාත්මික ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කොට ඇත්තා වූ විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් සය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සමතිස (30) ද,

08. අධ්‍යාත්මික ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ කාමාවචර සිත් සූපණස (54) ද, අභිඥා සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත ඉස්සා අප්‍රමාණ්‍ය වර්ජිත එකුන්පණස් (49) චෛතසික ද යන

09. අජ්ඣත්තාරම්මණික සිත් දෙසැට (62) ද, තත් සම්ප්‍රයුක්ත එකුන්පණස් (49) චෛතසිකය ද ලැබෙන්නාහ.

10. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

11. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එකුන්පණස් (49) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සත්සාලිස් (47) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අජ්ඣත්තාරම්මණික සිත් දෙසැට (62) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

12. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අජ්ඣත්තාරම්මණික සිත් දෙසැට (62) මනායතනය නම් වන්නේ ය. තත් සම්ප්‍රයුක්ත එකුන්පණස් (49) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අජ්ඣත්තාරම්මණික සිත් දෙසැට (62) අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

14. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි එකුන්පණස් (49) සිත මනෝවිඤ්ඤාණ

ධාතුව නම් වන්නේ ය. එකූන්පණස් (49) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

15. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අජ්ඣත්තාරම්මණික සිත් දෙසැට (62) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත අටසාලිස් (48) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

16. **බහිද්ධාරම්මණා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් බාහිර ධර්මයන් ඒකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ ආකාසානඤ්චායතන සිත් තුන ද, අභිඥාවර්ජිත රූපාවචර සිත් පසළොස ද, ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස (38) ද,

17. බාහිර ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ කාම සිත් සූපණස (54) ද, අභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත මච්ඡරිය වර්ජිත එක්පණස් (51) චෛතසිකය ද යන

18. බහිද්ධාරම්මණික සිත් සමඅසූව (80) ද, තත් සම්ප්‍රයුක්ත එක්පණස් (51) චෛතසිකය ද ලැබෙන්නාහ.

19. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

20. ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එක්පණස් (51) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි එකූන්පණස් (49) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. බහිද්ධාරම්මණික සිත් සමඅසූව (80) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

21. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, බහිද්ධාරම්මණික සිත් සමඅසූව (80) මනායතනය නම් වන්නේ ය. එක්පණස් (51) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, බහිද්ධාරම්මණික සිත් සමඅසූව (80) අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ

යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සිත් සත්සැට (67) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික එක්පණස (51) ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදැරුම් වන්නාහ.

23. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදැරුම් වන්නාහු කෙසේ ද යත්, බහිද්ධාරම්මණික ලෞකික සිත් දෙසැත්තෑව (72) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත සමපණස් (50) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය.

24. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස් (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදැරුම් වන්නාහ.

25. **අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අධ්‍යාත්මික වූ ද, බාහිර වූ ද ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ සූපණස් (54) කාමාවචර චිත්තය ද, අභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත ඉස්සා මච්ඡරිය අප්‍රමාණ්‍ය වර්ජිත අටසාලිස් (48) චෛතසිකය ද ලැබෙන්නාහ.

26. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

27. ස්කන්ධ වශයෙන් සිව් වැදැරුම් වන්නාහු කෙසේ ද යත්, අටසාලිස් (48) චෛතසිකයන් අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම්

වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සසාලිස් (46) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අජ්ඣත්ත බහිද්ධාරම්මණික සිත් සපණස (56) විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

28. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අජ්ඣත්ත බහිද්ධාරම්මණික සිත් සපණස (56) මනායතනය නම් වන්නේ ය. අටසාලිස් (48) චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

29. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අජ්ඣත්ත බහිද්ධාරම්මණික සපණස් (56) චිත්තය අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි තෙසාලිස් (43) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. අටසාලිස් (48) චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

30. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අජ්ඣත්ත බහිද්ධාරම්මණික සිත් සපණස (56) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත සත්සාලිස් (47) චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

31. මේ ශබ්දාවලිය හෙවත් අජ්ඣත්තාරම්මණ ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට බෙදා වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය.

32. ආකිඤ්චඤ්ඤායතන සිත් තුන ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සමතිස (30) ද,

33. ඔවුන්ගේ අරමුණු නාස්තිභාවප්‍රඥප්තිය අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නා වූ අකුසල් සිත් දොළොස ද, මහා කුසල මහා ක්‍රියා සිත් සොළොස (16) ද, මනෝද්වාරාවර්ජනය ද, අභිඥා දෙසිත

ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය ඉස්සා මච්ඡරිය වර්ජිත චෛතසික පන්සාලිස (45) ද, අටවිසි (28) රූපය ද, නිර්වාණය ද මේ ත්‍රිකයට ඇතුළත් නොවන බැවින් සප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **ඉස්සා** - අන්‍යයන්ගේ ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා, යස, ඉසුරු, සැප, සම්පත්, වැඳුම්, පිදුම්, ගරු, සම්මාන දැකීමෙන් සිතේ ඇතිවන නොඉවසීම, නොරුස්සනබව, අසතුට, අප්‍රසාදය, රවා ගොරවා බලන ස්වභාවය ඉස්සාව යි. එසේ හෙයින් අධ්‍යාත්මික අරමුණෙහි ඉස්සාව පහළ නොවෙයි.

02. **අප්පමඤ්ඤා (අප්‍රමාණ්‍ය)** - අප්‍රමාණ සත්වයන් වෙත පැවැත්විය යුතු වූ කරුණාව සහ මුදිතාව යන දෙක අප්පමඤ්ඤා නම් වෙති. ඒ දෙක ද බාහිර සත්ව ප්‍රඥප්තියම අරමුණු කරන බැවින් අධ්‍යාත්මික අරමුණෙහි නොවැටෙති.

03. **මච්ඡරිය** - ස්වකීය සම්පත් අනුන්ට සාධාරණවීමට අකැමැත්ත මච්ඡරිය යි. එය තමාගේ සම්පත්ම අරමුණු කරන බැවින් බහිද්ධාරම්මණ පදයට ඇතුලත් නොවේ.

04. **ඉස්සාව** - අනුන්ගේ සම්පත්ම නොරුස්සන ගතියෙන් අරමුණු කරන බැවින් බහිද්ධාරම්මණික වූම ධර්මයකි.

05. **අප්පමඤ්ඤා (අප්‍රමාණ්‍ය)** - කරුණා මුදිතා යන චෛතසිකයෝ දුක්ඛිත සත්ත්වයන් සහ සුඛිත සත්ත්වයන්ම අරමුණු කරන බැවින් බහිද්ධාරම්මණික වූම ධර්මයෝ ය.

06. **මච්ඡරිය** - මසුරුකම වනාහි තමාගේ සම්පතක්ම අරමුණු කරන බැවින් අජ්ඣත්තාරම්මණික වූම ධර්මයකි. කරුණු මෙසේ හෙයින් දෙපණස් (52) චෛතසික අතුරෙන් ඉස්සා, මච්ඡරිය, අප්‍රමාණ්‍ය යන සතර හැර ඉතිරි චෛතසික අටසාලිස (48) අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා යන තෘතීය පදයට ඇතුලත් වෙති.

07. **නාස්තිභාව ප්‍රඥප්තිය** - ආකිඤ්චඤ්ඤායතන සිත් තුනට අරමුණු වන්නේ එයට ප්‍රථම සන්තානයෙහි පහළ වූ පළමුවැනි ආකාසානඤ්චායතන චිත්තයාගේ උත්පාද, ඨිති, භංග යන අවස්ථා තුනෙන් එකකුත් දැනට නොමැති බවය. එය ප්‍රඥප්තියක්

බැවින් අජ්ඣත්තාරම්මණයට හෝ බහිද්ධාරම්මණ බවට හෝ අජ්ඣත්ත බහිද්ධාරම්මණ බවට හෝ නොවැටේ.

## ත්‍රිලක්‍ෂණ විදර්ශනාව

01. අජ්ඣත්තාරම්මණ ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**අජ්ඣත්තාරම්මණ ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 23 වැනි පාඩම

# 22. සනිදස්සන ත්‍රිකය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

01. **සනිදස්සන සප්පටිඝා ධම්මා - අනිදස්සන සප්පටිඝා ධම්මා - අනිදස්සන අප්පටිඝා ධම්මා'ති.**

02. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ අජ්ඣත්තාරම්මණ ත්‍රිකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව සනිදස්සන ත්‍රිකය දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය, ද්විතීය පදය, තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

03. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සනිදස්සන සප්පටිඝා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනිදස්සන සප්පටිඝා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව තෘතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනිදස්සන අප්පටිඝා ධම්මා** යනුවෙනි.

04. **සනිදස්සන සප්පටිඝා ධම්මා** - චක්ඛු විඤ්ඤාණයෙන් දැකිය යුතු බව නම් වූ නිදර්ශන සහිත වූ හෙවත් දැකීම් සහිත වූ ද, චක්ෂු ද්වාරයෙහි ආපාතගත වියයුතු බව නම් වූ පටිඝ සහිත වූ හෙවත් හැපීම් සහිත වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

05. **අනිදස්සන සප්පටිඝා ධම්මා** - චක්ඛු විඤ්ඤාණයෙන් දැකිය නොහැකි බැවින් අනිදර්ශන නම් වූ ද, එහෙත් ද්වාරාරම්මණ වශයෙන් ගැටීම් සහිත වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

06. **අනිදස්සන අප්පටිඝා ධම්මා** - චක්ඛු විඤ්ඤාණයෙන් දැකිය නොහැකි බැවින් අනිදර්ශන නම් වූ ද, ද්වාරාරම්මණ වශයෙන් ගැටීමක් නැති බැවින් අප්පටිඝ නම් වූ ද නිස්සත්ව නිජ්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

07. **සනිදස්සන සප්පටිඝා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි (28) රූපය අතුරෙන් එකම වර්ණ රූපය ලැබෙන්නේය.

08. වර්ණ රූපය වනාහි ස්කන්ධ වශයෙන් එකම රූපස්කන්ධය නම් වන්නේ ය. ආයතන වශයෙන් එකම රූපායතනය නම් වන්නේ ය. ධාතු වශයෙන් එකම රූප ධාතුව නම් වන්නේ ය. ආර්ය සත්‍ය වශයෙන් එකම දුක්ඛාර්ය සත්‍යය නම් වන්නේ ය.

09. **අනිදස්සන සප්පටිඝා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වර්ණ රූපය වර්ජිත එකොළොස් ඖදාරික රූපයෝ ලැබෙන්නාහ.

10. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් නවයකි. ධාතු වශයෙන් නවයකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි.

11. ස්කන්ධ වශයෙන් වර්ණ රූපය වර්ජිත එකොළොස් ඖදාරික රූපයෝ රූපස්කන්ධය නම් වන්නේ ය.

12. ආයතන වශයෙන් නව වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ඖදාරික රූප එකොළොස අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

13. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් නව වැදෑරුම් වන්නාහ.

14. ධාතු වශයෙන් නව වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

15. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ

වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් නව වැදෑරුම් වන්නාහ.

16. ආර්ය සත්‍ය වශයෙන් වර්ණ රූපය වර්ජිත එකොළොස් ඖදාරික රූපයෝ එකම දුක්ඛාර්ය සත්‍යය නම් වන්නේ ය.

17. **අනිදස්සන අප්පටිඝා ධම්මා** - යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද, සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

18. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි.

19. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සුඛුම රූප සොළොස (16) රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් (50) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

20. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් (52) චෛතසිකය ද, සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

21. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එකුන්අනූ (89) චිත්තය අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

22. පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, සම්පටිච්ඡන යුගලය ද මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ

ධාතුව නම් වන්නේ ය. චෛතසික දෙපණස (52) ද, සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

23. ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව (81) ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික එක්පණස (51) ද, සොළොස් සුඛුම රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

24. ලෝකෝත්තර මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන සෝවාන් මාර්ගාංග අට දෙන එක් වරක් හා (සම්මා සංකප්ප වර්ජිත) සත් දෙන සතර වරක් ද, සකදාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අනාගාමී මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද, අර්හත් මාර්ගාංග අට දෙන එක් වරක් හා සත් දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස (29) ද, ලෝකෝත්තර ඵල චිත්තෝත්පාද සත්තිස (37) ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

25. මේ ශබ්දාවලිය හෙවත් සනිදස්සන ත්‍රිකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට බෙදා වදාළ බැවින් ත්‍රික නම් වන්නේ ය. මුල් පදයෙන් ලබන ලද නම් ඇති බැවින් ආදිලබ්ධ නාම ත්‍රික නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහිලා ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදේස ත්‍රික නම් වන්නේ ය.

## පද විවරණය

01. **සනිදස්සන -** යනු ඇසට ලක්වන ස්වභාවයයි. වර්ණ රූපයට නමකි. වර්ණ රූපය හැඳින්වීම පිණිස සනිදස්සන ලක්ෂණය කිව යුතුය. සනිදස්සන හැඳින්වීම පිණිස වර්ණ රූපය යයි කිව යුතු වේ. එසේ හෙයින් වර්ණ රූපයත් සනිදස්සනයත් දෙක වෙන්කළ නොහැකි ය. මෙය වනාහි අභිධර්මයෙහි දැක්වෙනුයේ අභේදේ භේදෝපචාරය නමිනි. නිදසුනක් වශයෙන් මෙසේ දක්වා ඇත. **'සිලාපුත්ථකස්ස සරීරං'** යනුවෙනි. ගල්පොතේ සිරුර යයි කී

කල්හි ගල්පොත ගලෙන් හෝ ගල්පොතෙන් ගල හෝ වෙන්කළ හැකි දෙයක් නොවෙන්නාක් මෙනි.

මෙසේ ම රූපාරම්මණයෙන් අන්‍ය වූ දැක්ක යුතුවක් ද නැත. දැක්ක යුතු දෙයින් අන්‍ය වූ රූපාරම්මණයක් ද නැත. එසේ හෙයින් රූපාරම්මණයත් සනිදස්සනයත් දෙකක් නොව එකකි.

02. **සප්පටිඝ** - සන්තිකේ රූප, ඕළාරික රූප, සප්පටිඝ රූප නමින් ප්‍රසාද රූප පස සහ විෂය රූප සත වෙන් කොට ගනු ලැබෙති. ප්‍රසාද වස්තු පස ස්වකීය ගෝචර රූප සමග එකට එක හමුවීම සප්පටිඝ නමින් හැඳින්වේ. ඇසත් වර්ණයත්, කනත් ශබ්දයත්, ඝාණයත් ගන්ධයත්, දිවත් රසයත්, කයත් ස්පර්ශයත් එකිනෙකට හමුවීම, ආපාතගතවීම, එකිනෙක ගැටීමක් වැනි බැවින් එම රූප දොළොසම සප්පටිඝ නම් වෙති. සනිදස්සන පදයෙන් රූපාරම්මණය වෙන් කළ බැවින් අනිදස්සන සප්පටිඝ පදයට ගැනෙනුයේ රූපධර්ම එකොළොසකි.

03. **අනිදස්සන අප්පටිඝ** - අපට පෙනෙන්නේ ද නැති, පඤ්චද්වාරයෙහි ගැටෙන්නේ ද නැති පරමාර්ථ ධර්ම සියල්ල මේ පදයට ඇතුලත් වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

01. සනිදස්සන ත්‍රික මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප, ස්කන්ධ, ආයතන, ධාතු නම් වූ පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සනිදස්සන ත්‍රිකය යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# අභිධර්ම දුකමාතිකා පාලිය

**හෙතුගොච්ඡකං**

1. හෙතු ධම්මා. න හෙතු ධම්මා.
2. සහෙතුකා ධම්මා. අහෙතුකා ධම්මා.
3. හෙතුසම්පයුත්තා ධම්මා. හෙතුවිප්පයුත්තා ධම්මා.
4. හෙතු චෙව ධම්මා සහෙතුකා ච. සහෙතුකා චෙව ධම්මා න ච හෙතු.
5. හෙතු චෙව ධම්මා හෙතුසම්පයුත්තා ච. හෙතුසම්පයුත්තා චෙව ධම්මා න ච හෙතු.
6. න හෙතු බො පන ධම්මා සහෙතුකාපි. අහෙතුකාපි.

**චූල්ලන්තරදුකං**

1. සප්පච්චයා ධම්මා. අප්පච්චයා ධම්මා.
2. සඞ්ඛතා ධම්මා. අසඞ්ඛතා ධම්මා.
3. සනිදස්සනා ධම්මා. අනිදස්සනා ධම්මා.
4. සප්පටිඝා ධම්මා. අප්පටිඝා ධම්මා.
5. රූපිනො ධම්මා. අරූපිනො ධම්මා.
6. ලොකියා ධම්මා. ලොකුත්තරා ධම්මා.
7. කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා. කෙනචි න විඤ්ඤෙය්‍යා ධම්මා.

**ආසවගොච්ඡකං**

1. ආසවා ධම්මා. නො ආසවා ධම්මා.
2. සාසවා ධම්මා. අනාසවා ධම්මා.
3. ආසවසම්පයුත්තා ධම්මා. ආසවවිප්පයුත්තා ධම්මා.
4. ආසවා චෙව ධම්මා සාසවා ච. සාසවා චෙව ධම්මා නො ච ආසවා.
5. ආසවා චෙව ධම්මා ආසවසම්පයුත්තා ච. ආසවසම්පයුත්තා චෙව ධම්මා නො ච ආසවා.
6. ආසවවිප්පයුත්තා බො පන ධම්මා සාසවාපි. ආසවවිප්පයුත්තා බො පන ධම්මා අනාසවාපි.

**සංයොජනගොච්ඡකං**

1. සංයොජනා ධම්මා. නො සංයොජනා ධම්මා.
2. සංයොජනියා ධම්මා. අසංයොජනියා ධම්මා.
3. සංයොජනසම්පයුත්තා ධම්මා. සංයොජනවිප්පයුත්තා ධම්මා.
4. සංයොජනා චෙව ධම්මා සංයොජනියා ච. සංයොජනියා චෙව ධම්මා නො ච සංයොජනා.
5. සංයොජනා චෙව ධම්මා සංයොජනසම්පයුත්තා ච. සංයොජනසම්පයුත්තා චෙව ධම්මා නො ච සංයොජනා.
6. සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා සංයොජනියාපි. සංයොජනවිප්පයුත්තා ඛො පන ධම්මා අසංයොජනියාපි.

**ගන්ථගොච්ඡකං**

1. ගන්ථා ධම්මා. නො ගන්ථා ධම්මා.
2. ගන්ථනියා ධම්මා. අගන්ථනියා ධම්මා.
3. ගන්ථසම්පයුත්තා ධම්මා. ගන්ථවිප්පයුත්තා ධම්මා.
4. ගන්ථා චෙව ධම්මා ගන්ථනියා ච. ගන්ථනියා චෙව ධම්මා නො ච ගන්ථා.
5. ගන්ථා චෙව ධම්මා ගන්ථසම්පයුත්තා ච. ගන්ථසම්පයුත්තා චෙව ධම්මා නො ච ගන්ථා.
6. ගන්ථවිප්පයුත්තා ඛො පන ධම්මා ගන්ථනියාපි. ගන්ථවිප්පයුත්තා ඛො පන ධම්මා අගන්ථනියාපි.

**ඔඝගොච්ඡකං**

1. ඔඝා ධම්මා. නො ඔඝා ධම්මා.
2. ඔඝනියා ධම්මා. අනොඝනියා ධම්මා.
3. ඔඝසම්පයුත්තා ධම්මා. ඔඝවිප්පයුත්තා ධම්මා.
4. ඔඝා චෙව ධම්මා ඔඝනියා ච. ඔඝනියා චෙව ධම්මා නො ච ඔඝා.
5. ඔඝා චෙව ධම්මා ඔඝසම්පයුත්තා ච. ඔඝසම්පයුත්තා චෙව ධම්මා නො ච ඔඝා.
6. ඔඝවිප්පයුත්තා ඛො පන ධම්මා ඔඝනියාපි. අනොඝනියාපි.

**යොගගොච්ඡකං**

1. යොගා ධම්මා.  නො යොගා ධම්මා.
2. යොගනියා ධම්මා. අයොගනියා ධම්මා.
3. යොගසම්පයුත්තා ධම්මා. යොගවිප්පයුත්තා ධම්මා.
4. යොගා චෙව ධම්මා යොගනියා ච. යොගනියා චෙව ධම්මා නො ච යොගා.
5. යොගා චෙව ධම්මා යොගසම්පයුත්තා ච. යොගසම්පයුත්තා චෙව ධම්මා නො ච යොගා.
6. යොගවිප්පයුත්තා ඛො පන ධම්මා යොගනියාපි. යොගවිප්පයුත්තා ඛො පන ධම්මා අයොගනියාපි.

**නීවරණගොච්ඡකං**

1. නීවරණා ධම්මා. නො නීවරණා ධම්මා.
2. නීවරණියා ධම්මා. අනීවරණියා ධම්මා.
3. නීවරණසම්පයුත්තා ධම්මා. නීවරණවිප්පයුත්තා ධම්මා.
4. නීවරණා චෙව ධම්මා නීවරණියා ච. නීවරණියා චෙව ධම්මා නො ච නීවරණා.
5. නීවරණා චෙව ධම්මා නීවරණසම්පයුත්තා ච. නීවරණසම්පයුත්තා චෙව ධම්මා නො ච නීවරණා.
6. නීවරණවිප්පයුත්තා ඛො පන ධම්මා නීවරණියාපි. නීවරණවිප්පයුත්තා ඛො පන ධම්මා අනීවරණියාපි.

**පරාමාසගොච්ඡකං**

1. පරාමාසා ධම්මා. නො පරාමාසා ධම්මා.
2. පරාමට්ඨා ධම්මා.  අපරාමට්ඨා ධම්මා.
3. පරාමාසසම්පයුත්තා ධම්මා. පරාමාසවිප්පයුත්තා ධම්මා.
4. පරාමාසා චෙව ධම්මා පරාමට්ඨා ච. පරාමට්ඨා චෙව ධම්මා නො ච පරාමාසා.
5. පරාමාසවිප්පයුත්තා ඛො පන ධම්මා පරාමට්ඨාපි. පරාමාසවිප්පයුත්තා ඛො පන ධම්මා අපරාමට්ඨාපි.

**මහන්තරදුකං**

1. සාරම්මණා ධම්මා. අනාරම්මණා ධම්මා.
2. චිත්තා ධම්මා. නො චිත්තා ධම්මා.
3. චෙතසිකා ධම්මා. අචෙතසිකා ධම්මා.
4. චිත්තසම්පයුත්තා ධම්මා. චිත්තවිප්පයුත්තා ධම්මා.
5. චිත්තසංසට්ඨා ධම්මා. චිත්තවිසංසට්ඨා ධම්මා.
6. චිත්තසමුට්ඨානා ධම්මා. නො චිත්තසමුට්ඨානා ධම්මා.
7. චිත්තසහභුනො ධම්මා. නො චිත්තසහභුනො ධම්මා.
8. චිත්තානුපරිවත්තිනො ධම්මා. නො චිත්තානුපරිවත්තිනො ධම්මා.
9. චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා. නො චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා.
10. චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො ධම්මා. නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො ධම්මා.
11. චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා. නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා.
12. අජ්ඣත්තිකා ධම්මා. බාහිරා ධම්මා.
13. උපාදා ධම්මා. නො උපාදා ධම්මා.
14. උපාදින්නා ධම්මා. අනුපාදින්නා ධම්මා.

**උපාදානගොච්ඡකං**

1. උපාදානා ධම්මා. නො උපාදානා ධම්මා.
2. උපාදානියා ධම්මා. අනුපාදානියා ධම්මා.
3. උපාදානසම්පයුත්තා ධම්මා. උපාදානවිප්පයුත්තා ධම්මා.
4. උපාදානා චෙව ධම්මා උපාදානියා ච. උපාදානියා චෙව ධම්මා නො ච උපාදානා.
5. උපාදානා චෙව ධම්මා උපාදානසම්පයුත්තා ච. උපාදානසම්පයුත්තා චෙව ධම්මා නො ච උපාදානා.
6. උපාදානවිප්පයුත්තා ඛො පන ධම්මා උපාදානියාපි. උපාදානවිප්පයුත්තා ඛො පන ධම්මා අනුපාදානියාපි.

**කිලෙසගොච්ඡකං**

1. කිලෙසා ධම්මා. නො කිලෙසා ධම්මා.
2. සංකිලෙසිකා ධම්මා. අසංකිලෙසිකා ධම්මා.

3. සංකිලිට්ඨා ධම්මා. අසංකිලිට්ඨා ධම්මා.
4. කිලෙසසම්පයුත්තා ධම්මා. කිලෙසවිප්පයුත්තා ධම්මා.
5. කිලෙසා චෙව ධම්මා සංකිලෙසිකා ච. සංකිලෙසිකා චෙව ධම්මා නො ච කිලෙසා.
6. කිලෙසා චෙව ධම්මා සංකිලිට්ඨා ච. සංකිලිට්ඨා චෙව ධම්මා නො ච කිලෙසා.
7. කිලෙසා චෙව ධම්මා කිලෙසසම්පයුත්තා ච. කිලෙසසම්පයුත්තා චෙව ධම්මා නො ච කිලෙසා.
8. කිලෙසවිප්පයුත්තා බො පන ධම්මා සංකිලෙසිකාපි. කිලෙසවිප්පයුත්තා බො පන ධම්මා අසංකිලෙසිකාපි.

**පිට්ඨිදුකං**

1. දස්සනෙන පහාතබ්බා ධම්මා. න දස්සනෙන පහාතබ්බා ධම්මා.
2. භාවනාය පහාතබ්බා ධම්මා. න භාවනාය පහාතබ්බා ධම්මා.
3. දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා. න දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා.
4. භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා. න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා.
5. සවිතක්කා ධම්මා. අවිතක්කා ධම්මා.
6. සවිචාරා ධම්මා. අවිචාරා ධම්මා.
7. සප්පීතිකා ධම්මා. අප්පීතිකා ධම්මා.
8. පීතිසහගතා ධම්මා. න පීතිසහගතා ධම්මා.
9. සුඛසහගතා ධම්මා. න සුඛසහගතා ධම්මා.
10. උපෙක්ඛාසහගතා ධම්මා. න උපෙක්ඛාසහගතා ධම්මා.
11. කාමාවචරා ධම්මා. න කාමාවචරා ධම්මා.
12. රූපාවචරා ධම්මා. න රූපාවචරා ධම්මා.
13. අරූපාවචරා ධම්මා. න අරූපාවචරා ධම්මා.
14. පරියාපන්නා ධම්මා. අපරියාපන්නා ධම්මා.
15. නිය්‍යානිකා ධම්මා. අනිය්‍යානිකා ධම්මා.
16. නියතා ධම්මා. අනියතා ධම්මා.
17. සඋත්තරා ධම්මා. අනුත්තරා ධම්මා.
18. සරණා ධම්මා. අරණා ධම්මා.

# අභිධර්ම දුක මාතිකා

## 1 වැනි පාඩම

### හේතු ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. හේතු දුකය

1. **හේතු ධම්මා - න හේතු ධම්මා'ති.**

2. තික මාතිකා දේශනාවට අනතුරුව **දුක මාතිකාව** දේශනා කොට වදාළ සේක. ඒ දුක මාතිකාව ද හේතු ගොච්ඡකය, චුල්ලන්තර දුකය, ආසව ගොච්ඡකය, සංයෝජන ගොච්ඡකය, ගන්ථ ගොච්ඡකය, ඕඝ ගොච්ඡකය, යෝග ගොච්ඡකය, නීවරණ ගොච්ඡකය, පරාමාස ගොච්ඡකය, මහන්තර දුකය, උපාදාන ගොච්ඡකය, කිලේස ගොච්ඡකය, පිට්ඨි දුකය වශයෙන් තෙළෙස් වැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් **හේතු ගොච්ඡකය** පළමු කොට වදාළ සේක. එය ද හේතු දුකය, සහේතුක දුකය, හේතු සම්පයුත්ත දුකය, හේතු සහේතුක දුකය, හේතු හේතු සම්පයුත්ත දුකය, න හේතු සහේතුක දුකය වශයෙන් සය වැදෑරුම් වන්නේ ය.

4. ඔවුනතුරෙන් **හේතු දුකය** පළමු කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හේතු ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **න හේතු ධම්මා** යනුවෙනි.

5. **හේතු ධම්මා** - මූලාර්ථයෙන් හේතු නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **න හේතු ධම්මා** - මූලාර්ථයෙන් හේතු නම් නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

7. **හේතු ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහ නම් වූ චෛතසික සය ලැබෙන්නාහ.

8. ඒ ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සංස්කාර ස්කන්ධය නම් වන්නේ ය. ආයතන වශයෙන් ධම්මායතනය නම් වන්නේ ය. ධාතු වශයෙන් ධම්ම ධාතුව නම් වන්නේ ය.

9. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. ලෞකික සහේතුක තෙසැටක් සිත්හි යෙදුනා වූ ලෝභය වර්ජිත හේතු ධර්ම පස දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභ හේතුව සමුදය සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ වූ අමෝහ හේතු සතර මාර්ග සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ වූ අලෝභ අදෝස හේතු ධර්ම දෙක සහ ඵල චිත්තයන්හි සම්ප්‍රයුක්ත අලෝභ අදෝස අමෝහ හේතු ධර්මයෝ සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

10. **න හේතු ධම්මා** - ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සිත් එකුන්අනූව (89) ද, තත් සම්ප්‍රයුක්ත හේතු සය වර්ජිත චෛතසික සසාලිස (46) ද, රූප අටවිස්ස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

11. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

12. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. සසාලිස් (46) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූසාලිස් (44) චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

13. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

14. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

15. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. චෛතසික සසාලිස (46) ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

16. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

17. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

18. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

19. චෛතසික සසාලිස (46) ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා

රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

20. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සසාළිස (46) ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි වර්ජිත මාර්ගාංග සත් දෙන එක් වරක් ද, සංකප්ප වර්ජිත සය දෙන සතර වරක් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද සත්විස්ස (27) ද, ඵල චිත්තෝත්පාද සූතිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

21. මේ ශබ්දාවලිය හෙවත් හේතු දුකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්මයන් මෙහි වදාරා ඇති බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**හේතු දුකය යි.**

## 2. සහේතුක දුකය

22. **සහේතුකා ධම්මා - අහේතුකා ධම්මා'ති.**

23. හේතු දුකයට අනතුරුව **සහේතුක දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සහේතුකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අහේතුකා ධම්මා** යනුවෙනි.

24. **සහේතුකා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ හේතු ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

**අහේතුකා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ හේතු නැත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

25. **සහේතුකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සහේතුක සිත් එක් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත මෝහ මූල දෙසිතෙහි මෝහය වර්ජිත චෛතසික දෙපණස ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ විස්තර කරනු.)

26. **අහේතුකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අහේතුක සිත් අටළොස (18) ද, තත් සම්ප්‍රයුක්ත ඡන්ද වර්ජිත අන්‍යසමාන චෛතසික දොළොස ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ විස්තර කරනු.)

27. මේ ශබ්දාවලිය හෙවත් සහේතුක දුකය පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ හෙයින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් හෙයින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**සහේතුක දුකය යි.**

## 3. හේතු සම්පයුත්ත දුකය

28. **හේතු සම්පයුත්තා ධම්මා - හේතු විප්පයුත්තා ධම්මා'ති**.

29. සහේතුක දුකයට අනතුරුව **හේතු සම්පයුත්ත දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හේතු සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හේතු විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

30. **හේතු සම්පයුත්තා ධම්මා** - හේතු ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

**හේතු විප්පයුත්තා ධම්මා -** හේතු ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(සහේතුක දුකය හා සමානව විස්තර කරනු. දේශනා විලාශ වශයෙන් හා පුද්ගලාධ්‍යාශය වශයෙන් මේ දුක පද වාර දෙක සමානව වදාරා ඇත. ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. නිප්පදේස දුක නම් වන්නේ ය.)

**හේතු සම්පයුත්ත දුකය යි.**

## 4. හේතු සහේතුක දුකය

31. **හේතු චේව ධම්මා සහේතුකා ච - සහේතුකා චේව ධම්මා න ච හේතූ'ති.**

32. හේතු සම්පයුත්ත දුකයට අනතුරුව හේතු සහේතුක දුකය වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හේතු චේව ධම්මා සහේතුකා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සහේතුකා චේව ධමමා න ච හේතූ** යනුවෙනි.

33. **හේතු චේව ධම්මා සහේතුකා ච** - හේතු නම් වූ ද, හේතූන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ හේතු ඇත්තා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

34. **සහේතුකා චේව ධම්මා න ච හේතූ** - හේතූන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ හේතු ඇත්තා වූ ද, එහෙත් හේතු නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

35. **හේතු චේව ධම්මා සහේතුකා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මෝහ මූල දෙසිතෙහි මෝහ වර්ජිත හේතු ධර්ම සය ලැබෙන්නාහ. (පෙරසේ විස්තර කරනු.)

36. **සහේතුකා චේව ධම්මා න ච හේතූ** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සහේතුක සිත් එක්

සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත හේතූන් සය වර්ජිත සසාලිස් (46) චෛතසිකයෝ ද ලැබෙන්නාහ. (පෙරසේ විස්තර කරනු.)

37. මේ ශබ්දාවලිය හෙවත් හේතු සහේතුක දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය.

38. අහේතුක සිත් අටළොස (18) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දොළොස ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද මේ දුකයට ඇතුළත් නොවන බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**හේතු සහේතුක දුකය යි.**

## 5. හේතු හේතු සම්පයුත්ත දුකය

39. **හේතු චේව ධම්මා හේතු සම්පයුත්තා ච - හේතු සම්පයුත්තා චේව ධම්මා න ච හේතූ'ති.**

40. හේතු සහේතුක දුකයට අනතුරුව හේතු හේතු සම්පයුත්ත දුකය වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදය වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හේතු චේව ධම්මා හේතු සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **හේතු සම්පයුත්තා චේව ධම්මා න ච හේතු** යනුවෙනි.

41. **හේතු චේව ධම්මා හේතු සම්පයුත්තා ච** - හේතු නම් වූ ද, හේතු ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

42. **හේතු සම්පයුත්තා චේව ධම්මා න ච හේතු** - හේතු ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ ද, එහෙත් හේතු නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

43. **හේතු චේව ධම්මා හේතු සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මෝහ මූල දෙසිතෙහි

මෝහ වර්ජිත හේතු ධර්ම සය ලැබෙන්නාහ. (පෙරසේ විස්තර කරනු.)

44. **හේතු සම්පයුත්තා චේව ධම්මා න ච හේතු** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සහේතුක සිත් එක්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත හේතු ධර්ම සය වර්ජිත චෛතසික සසාලිස (46) ද ලැබෙන්නාහ. (පෙරසේ විස්තර කරනු.)

45. මේ ශබ්දාවලිය හෙවත් හේතු හේතු සම්පයුත්ත දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය.

46. අහේතුක සිත් අටළොස (18) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දොළොස ද, මෝහ මූල දෙසිතෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ඇතුලත් නොවන බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**හේතු හේතු සම්පයුත්ත දුකය යි.**

## 6. න හේතු සහේතුක දුකය

47. **න හේතු ඛෝ පන ධම්මා සහේතුකාපි - න හේතු ඛෝ පන ධම්මා අහේතුකාපී'ති.**

48. හේතු හේතු සම්පයුත්ත දුකයට අනතුරුව **න හේතු සහේතුක දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදය වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **න හේතු ඛෝ පන ධම්මා සහේතුකාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **න හේතු ඛෝ පන ධම්මා අහේතුකාපි** යනුවෙනි.

49. **න හේතු ඛෝ පන ධම්මා සහේතුකාපි** - හේතු ධර්ම නො වූ ද, එහෙත් ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ හේතූන් සමග යෙදුනා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

50. **න හේතු ඛෝ පන ධම්මා අහේතුකාපි** - හේතු ධර්ම නො වූ ද, ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ

හේතූන් සමග නොයෙදුනා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

51. **න හේතු ඛෝ පන ධම්මා සහේතුකාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සහේතුක සිත් එක්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත හේතූන් සය වර්ජිත චෛතසික සසාලිස (46) ද ලැබෙන්නාහ. ( පෙරසේ විස්තර කරනු.)

52. **න හේතු ඛෝ පන ධම්මා අහේතුකාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අහේතුක සිත් අටළොස (18) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දොළොස ද, අටවිසි රූපය ද, නිර්වාණයද ලැබෙන්නාහ. (පෙරසේ විස්තර කරනු.)

53. මේ ශබ්දාවලිය හෙවත් න හේතු සහේතුක දුකය වනාහි, පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. දෙපදයෙන් ලත් නම් ඇති බැවින් සර්වලබ්ධ නාම දුක නම් වන්නේ ය.

54. හේතු ධර්ම සය ඇතුලත් නොවන බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**න හේතු සහේතුක දුකය යි.**

## පද විවරණය

1. **හේතු ධම්මාති මූලට්ඨේන හේතු සංඛතා ධම්මා** - හේතු ධම්මා යනු මූලාර්ථයෙන් හෙවත් ශක්තිමත්ව පිහිටීම් අර්ථයෙන් හේතු නම් වූ ධර්මයෝ ය. ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහ යන චෛතසික සය දෙන ය.

2. **සම්පයෝගතෝ පවත්තේන සහ හේතුනාති සහේතුකා** - සම්ප්‍රයෝග වශයෙන් එකට පවත්නා වූ හේතුවක් සමග මිශ්‍ර වූ ධර්ම සහේතුක නම් වෙති. ඔවුන් නම් සහේතුක සිත් 71 ද, මෝහ මූල දෙසිතෙහි මෝහය හැර සෙසු චෛතසික 52 ද වෙති.

3. **ඒකුප්පාදාදිතාය හේතුනා සම්පයුත්තාති හේතු සම්පයුත්තා** - එකට ඉපදීම, එකට නිරුද්ධවීම, එක අරමුණක පැවතීම, එක වස්තුවක් ඇසුරු කිරීම නම් වූ සතරාකාරයෙන්ම හේතු ධර්මයන් සමග මිශ්‍ර වූ ධර්ම, හේතු සම්ප්‍රයුක්ත ධර්ම නම් වෙති.

4. හේතු ගොච්ඡකයෙහි 4 වෙනි හේතු සහේතුක දුකයත්, 5 වෙනි හේතු හේතු සම්පයුත්ත දුකයත් දුක වශයෙන් දෙකක් වූ නමුත් අර්ථ වශයෙන් එක හා සමාන ය. තථාගතයන් වහන්සේගේ දේශනා විලාශ වශයෙනුත් වේනෙය්‍ය ජනයන්ගේ අධ්‍යාශය අනුව අවබෝධය පහසුවනු පිණිසත් එකම අර්ථය දුක පද වාර දෙකකින් දේශනා කොට ඇත.

5. **ගොච්ඡකය** - යනු මල් පොකුර, මල් කළඹ කියන්නා සේ මාතිකා පද රැසක්, මාතිකා පද කළඹක් යන අර්ථයෙන් ගොච්ඡකය යයි කියනු ලැබේ.

6. **හේතු** - යනු සතරාකාර වෙත්. හේතු හේතුව ය - උත්තම හේතුව ය - පච්චය හේතුව ය - සාධාරණ හේතුව ය යනුවෙනි. එයින් **හේතු හේතුව** යනු කුසල් වූ ද, අකුසල් වූ ද, විපාක වූ ද, ක්‍රියා වූ ද සහේතුක සිත්හි යෙදෙන හේතු සදෙනට නමකි. **උත්තම හේතුව** යනු කුසල් හේතු තුනට නමකි. **පච්චය හේතුව** යනු පටිච්චසමුප්පාද පට්ඨාන නය ක්‍රමයෙන් සියලු ප්‍රත්‍ය ධර්මයන්ට නමකි. **සාධාරණ හේතුව** යනු අවිද්‍යා ආදී පටිච්චසමුප්පාද අංග 12 ට නමකි.

7. **සතර සම්ප්‍රයෝග ලක්ෂණය** - "ඒකුප්පාද නිරෝධා ච - ඒකාලම්බණ වත්ථුකා - චේතෝ යුත්තා ද්විපඤ්ඤාස - ධම්මා චේතසිකා මතා". සිත සමග එකටම ඉපදීම, එකටම නැතිවීම, එකම අරමුණක් ගැනීම, එකම වස්තු රූපයක් ඇසුරු කිරීම යන සතරාකාරයෙන් සිතත් සමග මිශ්‍ර වූ ධර්ම 52 චෛතසික නම් වෙති. මේ අභිධර්මාර්ථ සංග්‍රහ ගාථාවේ සඳහන් පරිදි සිත චෛතසික සමග ද, චෛතසික ඔවුනොවුන් සමග ද සිතක් පාසා මිශ්‍ර වෙති. සම්ප්‍රයුක්ත වෙති.

8. **දේශනා විලාශය** - බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවේදී එකම කාරණය නා නා විධ ආකාර වචන වලින් දේශනා කරන සේක. එය දේශනා විලාශය වෙයි.

9. **වේනෙය්‍ය ජනයාගේ අධ්‍යාශය** - යනු මග ඵල නිවන් ලැබීමට හේතු සම්පත් ඇති අය අතුරෙන් ඇතැමෙක් ඉතා කෙටි සාරවත් දහමක් ඇසූ පමණින් මග ඵල නිවනට පැමිණෙති. ඇතැමෙක් වනාහි එකම දෙය වුවත් නා නා ආකාර වචනවලින් පැහැදිලි කළහොත් මග ඵල නිවනට පැමිණෙති. එවැනි විස්තර රුචික වේනෙය්‍ය දනන් උදෙසා, එකම කාරණය වෙනත් ක්‍රමයන්ගෙන් ඉදිරිපත් කරමින් දම් දෙසති.

10. **සහේතුක සිත් එක්සැත්තෑව** - අහේතුක සිත් 18 හැර ඉතිරි සිත් 71 සහේතුක සිත් නම් වෙති.

11. **මෝහ මූල ද්වයෙහි මෝහය** - මෝහ මූල දෙසිතෙහි යෙදෙන මෝහය, ලෝභ ද්වේෂ දෙක නැතිව එකලාවම පවතින හෙයින් තමන්ට හේතු ප්‍රත්‍යයෙන් පිහිටක් නැති බැවින් අහේතුකම වෙයි.

12. **සම්මා දිට්ඨි වර්ජිත මාර්ගාංග 7 දෙන එක් වරක් ද, සංකප්ප වර්ජිත මාර්ගාංග 6 සතර වරක් ද** - යනු ප්‍රථම ධ්‍යානය සමග සම්ප්‍රයුක්ත සතර මාර්ගයේදී සම්මා දිට්ඨිය හැර ඉතිරි මාර්ගාංග 7 දෙනෙකි. ද්විතීය, තෘතීය, චතුර්ථ, පඤ්චම ධ්‍යාන සමග යෙදෙන මාර්ගයේදී වනාහි සම්මා සංකල්පයත් නොයෙදෙන බැවින් මාර්ගාංග 6 සතර වරක් යයි කියනු ලැබේ. ද්විතීය ධ්‍යානයේ සිට ඉහළට සම්මා සංකල්පය නොයෙදෙන බැවිනි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. හේතු ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපත්‍යයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**හේතු ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 2 වැනි පාඩම

# චුල්ලන්තර දුකය (දුක 7)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

## 1. සප්පච්චය දුකය

1. **සප්පච්චයා ධම්මා - අප්පච්චයා ධම්මා'ති.**
2. හේතු ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **චුල්ලන්තර දුකය** වදාළ සේක. එයද සප්පච්චය දුකය, සංඛත දුකය, සනිදස්සන දුකය, සප්පටිඝ දුකය, රූපී දුකය, ලෝකීය දුකය, කේනචි විඤ්ඤෙය්‍යා දුකය යනුවෙන් සත් වැදෑරුම් වන්නේ ය.
3. ඔවුනතුරෙන් **සප්පච්චය දුකය** පළමුකොට වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සප්පච්චයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අප්පච්චයා ධම්මා** යනුවෙනි.
4. **සප්පච්චයා ධම්මා** - අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, කර්ම, චිත්ත, ඍතු, ආහාරාදී ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
5. **අප්පච්චයා ධම්මා** - ප්‍රත්‍යයන්ගෙන් හට නොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
6. **සප්පච්චයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසික ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.
7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

8. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. දෙපණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

9. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූප අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

10. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

11. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

12. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්‍ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

13. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

14. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජනය සහ සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

15. දෙපණස් චෛතසිකය ද, අපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූප, ආහාර රූප, ආකාශ රූප, කායවිඤ්ඤත්ති රූප, වචීවිඤ්ඤත්ති රූප, ලහුතා රූප, මුදුතා රූප, කම්මඤ්ඤතා රූප, උපචය රූප, සන්තති රූප, ජරතා රූප, අනිච්චතා රූප යන සුඛුම රූප සොළස ද, ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

16. ආර්‍ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත එක්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍ය නම් වන්නේ ය.

17. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත යි. මෙසේ ආර්‍ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

18. **අප්පච්චයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකම නිර්වාණ ධර්මය ලැබෙන්නේ ය.

19. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත යි. ආයතන වශයෙන් එකම ධම්මායතනයකි. ධාතු වශයෙන් එකම ධම්ම ධාතුවකි. ආර්‍ය සත්‍ය වශයෙන් එකම නිරෝධ සත්‍යයකි.

20. මේ ශබ්දාවලිය හෙවත් සප්පච්චය දුකය, පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත්

නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**සප්පච්චය දුකය යි.**

## 2. සංඛත දුකය

21. **සංඛතා ධම්මා - අසංඛතා ධම්මා'ති.**

22. සප්පච්චය දුකයට අනතුරුව **සංඛත දුකය** වදාළ සේක. එය ප්‍රථම පදය ද්විතිය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංඛතා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අසංඛතා ධම්මා** යනුවෙනි.

23. **සංඛතා ධම්මා** - අවිද්‍යා තෘෂ්ණා උපාදාන කර්ම චිත්ත සෘතු ආහාරාදී ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

24. **අසංඛතා ධම්මා** - ප්‍රත්‍යයන් විසින් සකස් නොකරන ලද්දා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(සංඛත දුකයෙහි ස්වරූපාර්ථ සම්පූර්ණයෙන්ම සප්පච්චය දුකයට සමානය. ඒ අනුවම විස්තර කරනු. - ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. නිප්පදේස දුක නම් වන්නේ ය.)

**සංඛත දුකය යි.**

## 3. සනිදස්සන දුකය

25. **සනිදස්සනා ධම්මා - අනිදස්සනා ධම්මා'ති.**

26. සංඛත දුකයට අනතුරුව **සනිදස්සන දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් පළමු කොට ප්‍රථම පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සනිදස්සනා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනිදස්සනා ධම්මා** යනුවෙනි.

27. **සනිදස්සනා ධම්මා** - ඇසට ලක්වන ස්වභාවය නම් වූ දැකීම් සහිත වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාවය ධර්මයෝ ඇත්තාහ.

28. **අනිදස්සනා ධම්මා** - ඇසට ලක් නොවන්නා වූ දැකීම් රහිත වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

29. **සනිදස්සනා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකම වර්ණ රූපය ලැබෙන්නේ ය.

30. වර්ණ රූපය වනාහි, රූපස්කන්ධයකි. රූපායතනයකි. රූප ධාතුවකි. දුක්ඛාර්ය සත්‍යයකි.

31. **අනිදස්සනා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, වර්ණ රූපය වර්ජිත සත්විසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

32. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙක් එකොළොසකි. ධාතු වශයෙන් සතළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සනිදස්සන දුකය යි.**

## 4. සප්පටිඝ දුකය

33. **සප්පටිඝා ධම්මා - අප්පටිඝා ධම්මා'ති.**

34. සනිදස්සන දුකයට අනතුරුව **සප්පටිඝ දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සප්පටිඝා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අප්පටිඝා ධම්මා** යනුවෙනි.

35. **සප්පටිඝා ධම්මා** - ද්වාරාරම්මණ වශයෙන් හැපීම් සහිත වූ නොහොත් හැපීම් සහිතව හටගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

36. **අප්පටිඝා ධම්මා** - ද්වාරාරම්මණ වශයෙන් හැපීම් නැත්තා වූ හැපීම් සහිතව හට නොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

37. **සප්පටිඝා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ඖදාරික රූප දොළොස ලැබෙන්නාහ.

38. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම රූපස්කන්ධයකි. ආයතන වශයෙන් දශයකි. ධාතු වශයෙන් දශයකි. ආර්ය සත්‍ය වශයෙන් එකම දුක්ඛාර්ය සත්‍යයකි. (පෙරසේ බෙදා දක්වනු.)

39. **අප්පටිඝා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකූන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

40. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ බෙදා දක්වනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සප්පටිඝ දුකය යි.**

## 5. රූපී දුකය

41. **රූපිනෝ ධම්මා - අරූපිනෝ ධම්මා’ති.**

42. සප්පටිඝ දුකයට අනතුරුව **රූපී දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **රූපිනෝ ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අරූපිනෝ ධම්මා** යනුවෙනි.

43. **රූපිනෝ ධම්මා** - සීතෝෂ්ණාදී විරුද්ධ ප්‍රත්‍යයෙන් විකාර වන ස්වභාවය ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

44. **අරූපිනෝ ධම්මා** - සීතෝෂ්ණාදියෙන් විකාර නොවන ස්වභාවය ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

45. **රූපිනෝ ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි රූපයෝ ලැබෙන්නාහ.

46. ඒ ධර්මයෝ එකම රූපස්කන්ධයකි. ආයතන එකොළොසකි. ධාතු එකොළොසකි. එකම දුක්ඛාර්ය සත්‍යයකි. (පෙරසේ විස්තර කරනු.)

47. **අරූපිනෝ ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, නිර්වාණයද ලැබෙන්නාහ.

48. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ විස්තර කරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**රූපී දුකය යි.**

## 6. ලෝකීය දුකය

49. **ලෝකියා ධම්මා - ලෝකුත්තරා ධම්මා'ති.**

50. රූපී දුකයට අනතුරුව **ලෝකීය දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ලෝකියා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ලෝකුත්තරා ධම්මා** යනුවෙනි.

51. **ලෝකියා ධම්මා** - තෘෂ්ණා දෘෂ්ටි නම් වූ උපාදානයන් හට අරමුණු වන්නා වූ ද සංසාර වට්ට දුක්ඛයට ඇතුලත් වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

52. **ලෝකුත්තරා ධම්මා** - උපාදානයන් හට අරමුණු නොවන්නා වූ ද සංසාර වට්ට දුක්ඛයෙන් එතෙර වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

53. **ලෝකියා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද අටවිසි රූපයද ලැබෙන්නාහ.

54. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

55. **ලෝකුත්තරා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

56. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**ලෝකීය දුකය යි.**

## 7. කේනචි විඤ්ඤෙය්‍ය දුකය

57. **කේනචි විඤ්ඤෙය්‍යා ධම්මා - කේනචි න විඤ්ඤෙය්‍යා ධම්මා'ති.**

58. ලෝකීය දුකයට අනතුරුව **කේනචි විඤ්ඤෙය්‍ය දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **කේනචි විඤ්ඤෙය්‍යා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **කේනචි න විඤ්ඤෙය්‍යා ධම්මා** යනුවෙනි.

59. **කේනචි විඤ්ඤෙය්‍යා ධම්මා** - චක්ඛුවිඤ්ඤාණාදී ඇතැම් විඤ්ඤාණයකින් ම දත හැකි වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

60. **කේනචි න විඤ්ඤෙය්‍යා ධම්මා** - ඇතැම් විඤ්ඤාණයකින් දත නොහැක්කා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

61. **කේනචි විඤ්ඤෙය්‍යා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

62. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

63. **කේනචි න විඤ්ඤෙය්‍යා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

64. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**කේනචි විඤ්ඤෙය්‍යා දුකය යි.**

## පද විවරණය

1. **ඖදාරික රූප 12** - චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය නම් වූ ප්‍රසාද රූප 5 ත්, වර්ණ ශබ්ද ගන්ධ රස නම් වූ රූප 4 ත්, පඨවි තේජෝ වායෝ නම් වූ භූත රූප 3 ත් යන රූප 12 ඖදාරික රූපයෝ නම් වෙති. ඉතිරි රූප 16 සුඛුම රූපයෝ ය.

2. **සප්පච්චයා** - ''අත්තනෝ නිප්ඵාදකේන සහපච්චයේනාති සප්පච්චයා'' තමන් නිපදවන ප්‍රත්‍යය සමග පවත්නා බැවින් සප්පච්චය නම් වෙයි. නිර්වාණ ධාතුව හැර සියළු ධර්මයෝ ප්‍රත්‍යයන්ගෙන් නිපදෙන්නෝ වෙති. ප්‍රත්‍ය සහිතයෝ ය. ප්‍රත්‍යයන් හට අයත් ය.

3. **අප්පච්චයා** - 'නත්ථි ඒතේසං උප්පාදේ වා ඨිතියං වා පච්චයෝ ති අප්පච්චයා' මොවුන්ගේ උත්පාදයෙහි හෝ ඨිතියෙහි හෝ ප්‍රත්‍යයක් නැත්තේ නුයි අප්පච්චය නම් වෙයි. උප්පාද ඨිති භංග යන අවස්ථා කිසිවක් නැත්තේ ප්‍රත්‍යයකින් හට නොගන්නා බැවිනි. අසංඛත ධාතු නිර්වාණයට මේ නමකි.

   ප්‍රත්‍යයෙන් හටගන්නා වූ සියළු ධර්මයෝ උත්පාද ඨිති භංග අවස්ථාවන් හට පත්වන්නාහ. එහෙයින් ඒ ධර්ම ප්‍රත්‍ය සහිත ය. නිර්වාණ ධාතුව ප්‍රත්‍යයකින් හට නොගන්නා බැවින් ප්‍රත්‍ය රහිත ය. එහෙයින්ම නිර්වාණ ධාතුව අසංඛතයකි.

4. **කේනචි විඤ්ඤෙය්‍යා** - රූප අරමුණු චක්ඛුවිඤ්ඤාණයෙන්ම දත හැකි ය. එහෙත් සෝතවිඤ්ඤාණයෙන් එය දත නොහැකි ය. මෙසේ සමහර සිතකින් පමණක් දත හැකි වූ ධර්ම කේනචි විඤ්ඤෙය්‍යා ධර්මයෝ නම් වෙති. වෙනත් සිතකින් දත නොහැකි වන ධර්ම කේනචි න විඤ්ඤෙය්‍යා ධර්ම නම් වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. චුල්ලන්තර දුක මාතෘකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**චුල්ලන්තර දුකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 3 වැනි පාඩම

## ආසව ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. ආසව දුකය

1. **ආසවා ධම්මා - නෝ ආසවා ධම්මා'ති.**

2. චුල්ලන්තර දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **ආසව ගොච්ඡකය** දේශනා කොට වදාළ සේක. එය ද ආසව දුකය, සාසව දුකය, ආසව සම්පයුත්ත දුකය, ආසව සාසව දුකය, ආසව ආසව සම්පයුත්ත දුකය, ආසව විප්පයුත්ත සාසව දුකයන් ගේ වශයෙන් සවැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් පළමු කොට **ආසව දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසවා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ ආසවා ධම්මා** යනුවෙනි.

4. **ආසවා ධම්මා** - බොහෝ කල් පල් වූ සුරා මේරයක් වැනි බැවින් ආශ්‍රව නම් වූ ද, භූමි වශයෙන් භවාග්‍රය දක්වා ද ධර්ම වශයෙන් ගෝත්‍රභූ සිත දක්වා ද වහනය වෙමින් පවත්නා බැවින් ද ආශ්‍රව නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

5. **නෝ ආසවා ධම්මා** - ආශ්‍රව නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **ආසවා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි මෝහ නම් වූ චෛතසික තිදෙන ලැබෙන්නාහ.

7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම සංස්කාර ස්කන්ධයකි. ආයතන වශයෙන් එකම ධම්මායතනයකි. ධාතු වශයෙන් එකම

ධම්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් දිට්ඨි මෝහ දෙක දුක්ඛ සත්‍යයකි. ලෝභය සමුදය සත්‍යයකි.

8. **නෝ ආසවා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ආශ්‍රව ධර්ම තිදෙන වර්ජිත එකුන්පණස් චෛතසික ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

10. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සත්සාලිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඤ්ඤාණස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත යි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

11. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

12. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

13. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා

රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

14. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

15. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

16. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

17. එකුන්පණස් චෛතසික ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි මෝහ වර්ජිත එකුන්පණස් චෛතසික ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද සංකප්ප වර්ජිත සත් දෙන

සතර වරක් බැගින් ද මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තුන් වැදෑරුම් වන්නාහ.

19. මේ ශබ්දාවලිය හෙවත් ආසව දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**ආසව දුකය යි.**

## 2. සාසව දුකය

20. **සාසවා ධම්මා - අනාසවා ධම්මා'ති.**

21. ආසව දුකයට අනතුරුව **සාසව දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සාසවා ධම්මා** යනුවෙනි. අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනාසවා ධම්මා** යනුවෙනි.

22. **සාසවා ධම්මා** - කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව නම් වූ ආශ්‍රවයන්ට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

23. **අනාසවා ධම්මා** - ආශ්‍රවයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

24. **සාසවා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ උදුරනු.)

26. **අනාසවා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

27. ඒ ධර්මයෝ ස්කන්ධ සතරකි. ආයතන දෙකකි. ධාතු දෙකකි. ආර්ය සත්‍ය දෙකකි. (පෙරසේ උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි. අර්ථ පුරවා කියනු.)

**සාසව දුකය යි.**

## 3. ආසව සම්පයුත්ත දුකය

28. **ආසව සම්පයුත්තා ධම්මා - ආසව විප්පයුත්තා ධම්මා'ති.**

29. සාසව දුකයට අනතුරුව **ආසව සම්පයුත්ත දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසව සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසව විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

30. **ආසව සම්පයුත්තා ධම්මා** - ආශ්‍රව ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

31. **ආසව විප්පයුත්තා ධම්මා** - ආශ්‍රව ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

32. **ආසව සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත ද්වේෂ මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ.

33. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ උදුරනු.)

34. **ආසව විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, ද්වේෂ මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

35. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**ආසව සම්පයුත්ත දුකය යි.**

## 4. ආසව සාසව දුකය

36. **ආසවා චේව ධම්මා සාසවා ච - සාසවා චේව ධම්මා නෝ ච ආසවා'ති.**

37. ආසව සම්පයුත්ත දුකයට අනතුරුව **ආසව සාසව දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසවා චේව ධම්මා සාසවා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සාසවා චේව ධම්මා නෝ ච ආසවා** යනුවෙනි.

38. **ආසවා චේව ධම්මා සාසවා ච** - ආශ්‍රව නම් වූ ද, ආශ්‍රවයන් හට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

39. **සාසවා චේව ධම්මා නෝ ච ආසවා** - ආශ්‍රවයන් හට අරමුණු වන්නා වූ ද, එහෙත් ආශ්‍රව නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

40. **ආසවා චේව ධම්මා සාසවා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි මෝහ නම් වූ ආශ්‍රව ධර්ම තිදෙන ලැබෙන්නාහ.

41. ඒ ධර්මයෝ එකම සංස්කාර ස්කන්ධයකි. එකම ධම්මායතනයකි. එකම ධම්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් දිට්ඨි මෝහ දෙක දුක්ඛ සත්‍යයකි. ලෝභය සමුදය සත්‍යයකි.

42. **සාසවා චේව ධම්මා නෝ ච ආසවා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත ආශ්‍රව ධර්ම වර්ජිත චෛතසික එකුන්පණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

43. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකම දුක්ඛ සත්‍යයකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.)

**ආසව සාසව දුකය යි.**

## 5. ආසව ආසව සම්පයුත්ත දුකය

44. **ආසවා චේව ධම්මා ආසව සම්පයුත්තා ච - ආසව සම්පයුත්තා චේව ධම්මා නෝ ච ආසවා'ති.**

45. ආසව සාසව දුකයට අනතුරුව **ආසව ආසව සම්පයුත්ත දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසවා චේව ධම්මා ආසව සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසව සම්පයුත්තා චේව ධම්මා නෝ ච ආසවා** යනුවෙනි.

46. **ආසවා චේව ධම්මා ආසව සම්පයුත්තා ච** - ආශ්‍රව නම් වූ ද, ආශ්‍රවයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

47. **ආසව සම්පයුත්තා චේව ධම්මා නෝ ච ආසවා** - ආශ්‍රවයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ ද, එහෙත් ආශ්‍රව නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

48. **ආසවා චේව ධම්මා ආසව සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල අකුසල් සිත් අටෙහි යෙදුනා වූ ලෝභ දිට්ඨි මෝහ නම් වූ ආශ්‍රව ධර්ම තුන ලැබෙන්නාහ.

49. ඒ ධර්මයෝ සංස්කාරස්කන්ධයකි. ධම්මායතනයකි. ධම්ම ධාතුවකි. ආර්ය සත්‍ය දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

50. **ආසව සම්පයුත්තා චේව ධම්මා නෝ ච ආසවා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත ආශ්‍රව ධර්ම වර්ජිත චෛතසික සූවිස්ස ද ලැබෙන්නාහ.

51. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

52. මේ ශබ්දාවලිය හෙවත් ආසව ආසව සම්පයුත්ත දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය.

53. දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, ද්වේෂ මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද මේ දුකයට ඇතුලත් නොවන බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**ආසව ආසව සම්පයුත්ත දුකය යි.**

## 6. ආසව විප්පයුත්ත සාසව දුකය

54. **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා සාසවාපි - ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා අනාසවාපී'ති.**

55. ආසව ආසව සම්පයුත්ත දුකයට අනතුරුව **ආසව විප්පයුත්ත සාසව දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා සාසවාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා අනාසවාපි** යනුවෙනි.

56. **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා සාසවාපි** - ආශ්‍රව ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් ආශ්‍රවයන් හට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ධර්මයෝ ඇත්තාහ.

57. **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා අනාසවාපි** - ආශ්‍රව ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, ආශ්‍රවයන් හට අරමුණු

නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

58. **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා සාසවාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, ද්වේෂ මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

59. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

60. **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා අනාසවාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

61. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

62. මේ ශබ්දාවලිය හෙවත් ආසව විප්පයුත්ත සාසව දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය.

63. අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත ද්වේෂ මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ද මෙහි ඇතුලත් නොවන බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**ආසව විප්පයුත්ත සාසව දුකය යි.**

## පද විවරණය

1. **ආසවා** - 'භූමිතෝ ආභවග්ගං ධම්මතෝ ආගෝත්‍රභුං සවන්ති ති' ආසවාභූමි වශයෙන් භවාග්‍රය තෙක් ද ධර්ම වශයෙන් සෝවාන් ආදී මාර්ග චිත්ත විථියෙහි ගෝත්‍රභූ සිත දක්වා ද වහනය වෙමින් පවතින බැවින් ආශ්‍රව නම් වෙති.

අපි ච චිරපාරිවාසයට්ඨේන මදිරාදයෝ ආසවා වියාති ආසවා - තවද බොහෝ දීර්ඝ කාලාන්තරයක් තිස්සේ පල් වූ අර්ථයෙන් ද, පල් කරන ලද මීරා ආදී ආසව අරිෂ්ඨ ජාතියක් වැනි බැවින් ද ආශ්‍රව නම් වෙති.

මෙහි ලා ආශ්‍රවයන් වහනය වීම නම් මළ සිරුරින් නවදොරින් කුණු සැරව ඕජා වැගිරෙන්නා සේ සිත වැඩකරන දොරටු සයකින්, රූපාදී අරමුණු සය අනුව සිතෙහි පහළවන ලෝභ දිට්ඨි මෝහ තිදෙන කෙලෙස් කුණු සැරව ඕජා වශයෙන් වැගිරී යාමට කියන නමකි. ආශ්‍රවයෝ ඇසෙන් ද වැගිරෙති. කණෙන් ද නාසයෙන් ද දිවෙන් ද කයෙන් ද සිතෙන්ම ද වැගිරෙන්නාහ. එහෙයින් ඒ ධර්ම තුන ආශ්‍රව නම් වෙති.

2. **සාසවා** - සහ ආසවේහි යෝවත්තතේ සෝ සාසවෝ, අරමුණු වීම් වශයෙන් ආශ්‍රවයන් සමග පවත්නේ සාසව නම් වෙයි. මෙහි 'සහ + ආසවේහි' යන දෙපදය සමාස වීමේ දී සහ ශබ්දයට සකාරාදේශයෙන් සන්ධි වී සාසව කියා පදය සෑදේ. ආශ්‍රවයන් සමග මිශ්‍ර වූ බවත් ආශ්‍රවයන් හට අරමුණු වූ බව ගොදුරු වූ බව එයින් කියැවේ. ලෞකික චිත්ත චෛතසික රූප ධර්ම සියල්ලම ආශ්‍රව ධර්මයන් හට අරමුණු වන බැවින් සාසව නම් වෙයි.

3. **අනාසවා** - නත්ථි ඒතේසං ආසවාති අනාසවා - සම්ප්‍රයුක්ත වශයෙන් හෝ අරමුණු කිරීම් වශයෙන් ආශ්‍රව නොමැති බැවින් අනාසවා නම් වෙති, 'න + ආසවා' = අනාසවා ; 'න' යන නිපාතයට 'අන්' ආදේශ වී සන්ධි වූ විට අනාසව පදය සෑදේ. ලෝකෝත්තර චිත්ත චෛතසික නිර්වාණ යන සියල්ල ආශ්‍රවයන්ට අරමුණු වන්නේම නැත. එහෙයින් ලෝකෝත්තර ධර්මයෝ අනාසව නම් වෙති.

4. **ආසව විප්පයුත්තා ඛෝ පන ධම්මා සාසවාපි - අනාසවාපි**, යන මේ දුක පදයෙහි 'අපි' ශබ්දයෙන් වනාහි, ආසව ගොච්ඡකයෙහි වැඩිපුර පද යොදා ගත හැකි බව ධම්මසංගණී අට්ඨකථාවෙහි දැක්වේ. එහෙයින් ඒ 'අපි' ශබ්දය නොකියන ලද්ද එකතු කිරීම සඳහා යෙදු සමුච්චයාර්ථයෙහි නිපාතයකි. සමුච්චයාර්ථය යනු එකතු කොට ගැනීමයි.

5. **ආසව විප්පයුත්තා 'ඛෝ පන' ධම්මා සාසවාපි - අනාසවාපි**, යන පාඨයෙහි 'ඛෝ පන' නිපාත දෙකෙන් ද අධිකාර්ථයක් ඉදිරිපත්

කරයි. 'සද්දාධිකා අත්ථාධිකෝ හොති' යන න්‍යායට අනුව අකුරකින් හෝ පදයක් වැඩි වී නම් එයින් අර්ථයෙහි අධික බවක් ප්‍රකාශ වීම නියමයකි. ඒ නිසා 'බෝ පන' යන අධික පදය අනුවද තවත් එවැනි මාතිකා පද මෙයට ම සම්බන්ධ බව කියයි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. ආසව ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.
2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නිය්‍යාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.
8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**ආසව ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 4 වැනි පාඩම
## සංයෝජන ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. සංයෝජන දුකය

1. **සංයෝජනා ධම්මා - නෝ සංයෝජනා ධම්මා'ති.**

2. ආසව ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **සංයෝජන ගොච්ඡකය** වදාළ සේක. එයද සංයෝජන දුකය, සංයෝජනීය දුකය, සංයෝජන සම්පයුත්ත දුකය, සංයෝජන සංයෝජනීය දුකය, සංයෝජන සංයෝජන සම්පයුත්ත දුකය, සංයෝජන විප්පයුත්ත සංයෝජනීය දුකයන් ගේ වශයෙන් සය වැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් **සංයෝජන දුකය** පළමුකොට වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජනා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ සංයෝජනා ධම්මා** යනුවෙනි.

4. **සංයෝජනා ධම්මා** - සංසාරික සත්‍වයන් භවරථයෙහි බැඳ තබන අර්ථයෙන් සංයෝජන නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

5. **නෝ සංයෝජනා ධම්මා** - සංයෝජන නම් නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **සංයෝජනා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දෝස මාන දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය මෝහ සංඛ්‍යාත චෛතසික ධර්මයෝ අට ලැබෙන්නාහ.

7. ඒ ධර්මයෝ එකම සංස්කාරස්කන්ධයකි. එකම ධම්මායතනයකි. එකම ධම්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

8. **නෝ සංයෝජනා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත සංයෝජන ධර්ම අට වර්ජිත සූසාලිස් (44) චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

10. ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. සූසාලිස් (44) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි දෙසාලිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධය සංග්‍රහයෙන් විනිර්මුක්තය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

11. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

12. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

13. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. චෛතසික සූසාළිස ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද, ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරම් වන්නාහ.

14. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

15. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

16. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය සහ සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

17. චෛතසික සූසාළිස ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සූසාළිස ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මාදිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද, සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍ය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

19. මේ ශබ්දාවලිය හෙවත් සංයෝජන දුකය, පරමාර්ථ ධර්මයන් පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුලත් වන බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**සංයෝජන දුකය යි.**

## 2. සංයෝජනීය දුකය

20. **සංයෝජනීයා ධම්මා - අසංයෝජනීයා ධම්මා'ති.**

21. සංයෝජන දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **සංයෝජනීය දුකය** දේශනා කොට වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජනීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අසංයෝජනීයා ධම්මා** යනුවෙනි.

22. **සංයෝජනීයා ධම්මා** - සංයෝජන ධර්මයන් හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

23. **අසංයෝජනීයා ධම්මා** - සංයෝජන ධර්මයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

24. **සංයෝජනීයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

26. **අසංයෝජනීයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

27. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි)

**සංයෝජනීය දුකය යි.**

## 3. සංයෝජන සම්පයුත්ත දුකය

28. **සංයෝජන සම්පයුත්තා ධම්මා - සංයෝජන විප්පයුත්තා ධම්මා'ති.**

29. සංයෝජනීය දුකයට අනතුරුව **සංයෝජන සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජන සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජන විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

30. **සංයෝජන සම්පයුත්තා ධම්මා** - සංයෝජන ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

31. **සංයෝජන විප්පයුත්තා ධම්මා** - සංයෝජන ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

32. **සංයෝජන සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසික ද ලැබෙන්නාහ.

33. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

34. **සංයෝජන විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, උද්ධච්ච සහගත සිතෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

35. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.) **සංයෝජන සම්පයුත්ත දුකය යි.**

## 4. සංයෝජන සංයෝජනීය දුකය

36. **සංයෝජනා චෙව ධම්මා සංයෝජනීයා ච - සංයෝජනීයා චෙව ධම්මා නෝ ච සංයෝජනා'ති.**

37. සංයෝජන සම්පයුත්ත දුකයට අනතුරුව **සංයෝජන සංයෝජනීය දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජනා චෙව ධම්මා සංයෝජනීයා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජිනීයා චෙව ධම්මා නෝ ච සංයෝජනා** යනුවෙනි.

38. **සංයෝජනා චෙව ධම්මා සංයෝජනීයා ච** - සංයෝජන නම් වූ ද, සංයෝජනයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

39. **සංයෝජනීයා චෙව ධම්මා නෝ ච සංයෝජනා** - සංයෝජන ධර්මයන්ට අරමුණු වන්නා වූ ද, එහෙත් සංයෝජන නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

40. **සංයෝජනා චෙව ධම්මා සංයෝජනීයා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සංයෝජන ධර්ම අට ලැබෙන්නාහ.

41. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සංස්කාරස්කන්ධයකි. ධම්මායතනයකි. ධම්ම ධාතුවකි. ආර්ය සත්‍ය දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

42. **සංයෝජනීයා චෙව ධම්මා නෝ ච සංයෝජනා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත සංයෝජන ධර්ම වර්ජිත චෛතසික සූසාළිස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

43. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (ස්වරූප උදුරනු.)

44. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම කිසිවක් ඇතුළත් නො වූ බැවින් සප්පදේස දුක නම් වෙයි.

**සංයෝජන සංයෝජනීය දුකය යි.**

## 5. සංයෝජන සංයෝජන සම්පයුත්ත දුකය

45. **සංයෝජනා චේව ධම්මා සංයෝජන සම්පයුත්තා ච - සංයෝජන සම්පයුත්තා චේව ධම්මා නෝ ච සංයෝජනා'ති.**

46. සංයෝජන සංයෝජනීය දුකයට අනතුරුව **සංයෝජන සංයෝජන සම්පයුත්ත දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජනා චේව ධම්මා සංයෝජන සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජන සම්පයුත්තා චේව ධම්මා නෝ ච සංයෝජනා** යනුවෙනි.

47. **සංයෝජනා චේව ධම්මා සංයෝජන සම්පයුත්තා ච** - සංයෝජන නම් වූ ද, සංයෝජනයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

48. **සංයෝජන සම්පයුත්තා චේව ධම්මා නෝ ච සංයෝජනා** - සංයෝජන සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, එහෙත් සංයෝජන නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

49. **සංයෝජනා චේව ධම්මා සංයෝජන සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උද්ධච්ච සිතෙහි මෝහය වර්ජිත සංයෝජන ධර්ම අට ලැබෙන්නාහ.

50. ඒ ධර්මයෝ ස්කන්ධ එකකි. ආයතන එකකි. ධාතු එකකි. ආර්ය සත්‍ය දෙකකි. (ස්වරූප උදුරනු.)

51. **සංයෝජන සම්පයුත්තා චේව ධම්මා නෝ ච සංයෝජනා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත සංයෝජන ධර්ම වර්ජිත චෛතසික එකුන්විස්ස ද ලැබෙන්නාහ.

52. ඒ ධර්මයෝ ස්කන්ධ සතරකි. ආයතන දෙකකි. ධාතු දෙකකි. ආර්ය සත්‍ය එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

53. ආදිලබ්ධ නාම දුකයකි. අකුසල් සිත් වර්ජිත ඉතිරි සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, උද්දච්ච සිතේ

මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද යන ධර්ම ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**සංයෝජන සංයෝජන සම්පයුත්ත දුකය යි.**

## 6. සංයෝජන විප්පයුත්ත සංයෝජනීය දුකය

54. **සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා සංයෝජනීයාපි - සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා අසංයෝජනීයාපී'ති.**

55. සංයෝජන සංයෝජන සම්පයුත්ත දුකයට අනතුරුව **සංයෝජන විප්පයුත්ත සංයෝජනීය දුකය** වදාළ සේක. එයද දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා සංයෝජනීයාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා අසංයෝජනීයාපි** යනුවෙනි.

56. **සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා සංයෝජනීයාපි** - සංයෝජන ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් සංයෝජනයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

57. **සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා අසංයෝජනීයාපි** - සංයෝජන ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නොවූ ද, සංයෝජනයන්ට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

58. **සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා සංයෝජනීයාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, උද්ධච්ච සහගත සිතෙහි මෝහය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

59. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

60. **සංයෝජන විප්පයුත්තා ඛෝ පන ධම්මා අසංයෝජනීයාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්

ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

61. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

62. මේ ශබ්දාවලිය හෙවත් සංයෝජන විප්පයුත්ත සංයෝජනීය දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය.

63. අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ද මෙහි ඇතුලත් නොවන බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**සංයෝජන විප්පයුත්ත සංයෝජනීය දුකය යි.**

## පද විවරණය

1. **සංයෝජන ධර්ම අට -** ලෝභ, දෝස, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය යන මේ අට වෙති. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි වනාහි 'නව සංයෝජනාමතා' යනුවෙන් සංයෝජන නවදෙනෙකු දක්වා ඇත. එය වනාහි සූත්‍රාන්ත නය ක්‍රමයත් අභිධර්ම නය ක්‍රමයත් එක්කොට දැක්වීමකි. සූත්‍රාන්තයෙහි උද්ධච්චය ඇතුලත් කිරීමෙන් සංයෝජන නවයක් ගැනෙති.

2. **සූත්‍රාන්ත නය ක්‍රමය** - සක්කාය දිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බත පරාමාස - කාමරාග - පටිඝ - රූපරාග - අරූපරාග - මාන - උද්ධච්ච - අවිජ්ජා යන සංයෝජන දස දෙනෙකි. පරමාර්ථ වශයෙන් එහි ඇත්තේ ලෝභ - දෝස - මෝහ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - උද්ධච්ච යනුවෙන් පරමාර්ථ ධර්ම සතකි.

3. **අභිධර්ම නය ක්‍රමය** - කාමරාග - පටිඝ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - ඉස්සා - මච්ඡරිය - අවිජ්ජා යනුවෙන් සංයෝජන අට දෙනෙකි. අභිධර්ම මාතෘකාවට අභිධර්ම නය ක්‍රමයෙන්ම සංයෝජන අටක් පමණක් ගන්නා ලදහ.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. සංයෝජන ගොච්ඡක දුකමාතිකා විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියාාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සංයෝජන ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 5 වැනි පාඩම

## ගන්ථ ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. ගන්ථ දුකය

1. **ගන්ථා ධම්මා - නෝ ගන්ථා ධම්මා'ති.**

2. සංයෝජන ගොච්ඡකයට අනතුරුව **ගන්ථ ගොච්ඡකය** දේශනා කොට වදාළ සේක. එය ද ගන්ථ දුකය, ගන්ථනීය දුකය, ගන්ථ සම්පයුත්ත දුකය, ගන්ථ ගන්ථනීය දුකය, ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය, ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකයන් ගේ වශයෙන් සය වැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් **ගන්ථ දුකය** පළමු කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ ගන්ථා ධම්මා** යනුවෙනි.

4. **ගන්ථා ධම්මා** - සංසාරයෙහි සත්වයන් ගැට ගසන අර්ථයෙන් ග්‍රන්ථ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

5. **නෝ ගන්ථා ධම්මා** - ග්‍රන්ථ නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **ගන්ථා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ ද්වේෂ දිට්ඨි යන ග්‍රන්ථ ධර්ම තිදෙන ලැබෙන්නාහ.

7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම සංස්කාරස්කන්ධයකි. ආයතන වශයෙන් එකම ධම්මායතනයකි. ධාතු වශයෙන් එකම ධම්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. දෝස දිට්ඨි දෙක දුක්ඛ

සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍ය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

8. **නෝ ගන්ථා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ග්‍රන්ථ ධර්ම වර්ජිත සියලු පරමාර්ථ ධර්මයෝ ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

10. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සත්සාළිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

11. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

12. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

13. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය

නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

14. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

15. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

16. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

17. එකුන්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එකුන්පණස ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද, සංකප්ප වර්ජිත සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද

එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

19. මේ ශබ්දාවලිය හෙවත් ගන්ථ දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**ගන්ථ දුකය යි.**

## 2. ගන්ථනීය දුකය

20. **ගන්ථනීයා ධම්මා - අගන්ථනීයා ධම්මා'ති.**

21. ගන්ථ දුකයට අනතුරුව **ගන්ථනීය දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථනීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අගන්ථනීයා ධම්මා** යනුවෙනි.

22. **ගන්ථනීයා ධම්මා** - ගන්ථ ධර්මයන්ට හිත වූ හෙවත් ග්‍රන්ථ ධර්මයන් හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

23. **අගන්ථනීයා ධම්මා** - ග්‍රන්ථ ධර්මයන් හට හිත නො වූ හෙවත් ග්‍රන්ථ ධර්මයන් හට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

24. **ගන්ථනීයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු)

26. **අගන්ථනීයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

27. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**ගන්ථනීය දුකය යි.**

## 3. ගන්ථ සම්පයුත්ත දුකය

28. **ගන්ථ සම්පයුත්තා ධම්මා - ගන්ථ විප්පයුත්තා ධම්මා'ති**

29. ගන්ථනීය දුකයට අනතුරුව **ගන්ථ සම්පයුත්ත දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

30. **ගන්ථ සම්පයුත්තා ධම්මා** - ග්‍රන්ථ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

31. **ගන්ථ විප්පයුත්තා ධම්මා** - ග්‍රන්ථ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

32. **ගන්ථ සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය ද, තත් සම්ප්‍රයුක්ත දෝස විචිකිච්ඡා සහ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය වර්ජිත පස්විසි චෛතසිකය ද ලැබෙන්නාහ.

33. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

34. **ගන්ථ විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය වර්ජිත එකුන්අසූ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික තෙසාළිස ද, දෝස මූල දෙසිතෙහි දෝසය ද, ලෝභ මූල දිට්ඨිගත

විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

35. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**ගන්ථ සම්පයුත්ත දුකය යි.**

## 4. ගන්ථ ගන්ථනීය දුකය

36. **ගන්ථා චේව ධම්මා ගන්ථනීයා ච - ගන්ථනීයා චේව ධම්මා නෝ ච ගන්ථා'ති.**

37. ගන්ථ සම්පයුත්ත දුකයට අනතුරුව **ගන්ථ ගන්ථනීය දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථා චේව ධම්මා ගන්ථනීයා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථනීයා චේව ධම්මා නෝ ච ගන්ථා** යනුවෙනි.

38. **ගන්ථා චේව ධම්මා ගන්ථනීයා ච** - ග්‍රන්ථ නම් වූ ද, ග්‍රන්ථයන් හට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

39. **ගන්ථනීයා චේව ධම්මා නෝ ච ගන්ථා** - ග්‍රන්ථයන්ට අරමුණු වන්නා වූ ද, එහෙත් ග්‍රන්ථ නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

40. **ගන්ථා චේව ධම්මා ගන්ථනීයා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දෝස දිට්ඨි නම් වූ ග්‍රන්ථ ධර්මයෝ තිදෙන ලැබෙන්නාහ.

41. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

42. **ගන්ථනීයා චේව ධම්මා නෝ ච ගන්ථා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව

ද, තත් සම්ප්‍රයුක්ත ග්‍රන්ථ ධර්ම තුන වර්ජිත චෛතසික එකුන්පණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

43. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

44. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**ගන්ථ ගන්ථනීය දුකය යි.**

## 5. ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය

45. **ගන්ථා චේව ධම්මා ගන්ථ සම්පයුත්තා ච - ගන්ථ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ගන්ථා'ති.**

46. ගන්ථ ගන්ථනීය දුකයට අනතුරුව **ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථා චේව ධම්මා ගන්ථ සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ගන්ථා** යනුවෙනි.

47. **ගන්ථා චේව ධම්මා ගන්ථ සම්පයුත්තා ච** - ග්‍රන්ථ නම් වූ ද, ග්‍රන්ථ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

48. **ගන්ථ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ගන්ථා** - ග්‍රන්ථ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, එහෙත් ගන්ථ නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

49. **ගන්ථා චේව ධම්මා ගන්ථ සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභ දිට්ඨි යන ග්‍රන්ථ ධර්ම දෙදෙන ලැබෙන්නාහ.

50. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

51. **ගන්ථ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ගන්ථා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය ද, තත් සම්ප්‍රයුක්ත ග්‍රන්ථ ධර්ම තුන හා විචිකිච්ඡා වර්ජිත තෙවිසි චෛතසිකය ද ලැබෙන්නාහ.

52. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

53. ආදිලබ්ධ නාම දුකයකි. ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය වර්ජිත ඉතිරි සිත් එකුන්අසූව ද, තත් සම්ප්‍රයුක්ත තෙසාලිස් චෛතසිකය ද, දෝස මූල දෙසිතෙහි දෝසය ද, ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකය යි.**

## 6. ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකය

54. **ගන්ථ විප්පයුත්තා ඛෝ පන ධම්මා ගන්ථනීයාපි - ගන්ථ විප්පයුත්තා ඛෝ පන ධම්මා අගන්ථනීයාපී'ති.**

55. ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකයට අනතුරුව **ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ විප්පයුත්තා ඛෝ පන ධම්මා ගන්ථනීයාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ගන්ථ විප්පයුත්තා ඛෝ පන ධම්මා අගන්ථනීයාපි** යනුවෙනි.

56. **ගන්ථ විප්පයුත්තා ඛෝ පන ධම්මා ගන්ථනීයාපි** - ග්‍රන්ථ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් ග්‍රන්ථයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

57. **ගන්ථ විප්පයුත්තා බෝ පන ධම්මා අගන්ථනීයාපි** - ග්‍රන්ථ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, ග්‍රන්ථයන්ට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

58. **ගන්ථ විප්පයුත්තා බෝ පන ධම්මා ගන්ථනීයාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය වර්ජිත ඉතිරි ලෞකික සිත් එක් සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික තෙසාළිස ද, දෝස මූල දෙසිතෙහි දෝසය ද, ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

59. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

60. **ගන්ථ විප්පයුත්තා බෝ පන ධම්මා අගන්ථනීයාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

61. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

62. ආදිලබ්ධ නාම දුකයකි. ලෝභ මූල දෝස මූල අකුසල් සිත් දශය ද, තත් සම්ප්‍රයුක්ත දෝස විචිකිච්ඡා සහ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය වර්ජිත පස්විසි චෛතසිකය ද ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**ගන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකය යි.**

## පද විවරණය

1. ගන්ථා ''යස්ස සංවිජ්ජන්ති තං චුති පටිසන්ධි වසේන වට්ටස්මිං ගන්ථෙන්ති ඝටෙන්තී ති ගන්ථා'' **(අත්ථසාලිනි)**

යමෙකුගේ සන්තානයෙහි ඇත්තාහු නම්, ඔහු චුති පටිසන්ධි වශයෙන් සංසාර වට්ටයෙහි ගැටගසත්නු යි සන්ධි කරත්නු යි, ග්‍රන්ථ නම් වෙති යනු ඒ අටුවා පාඨයෙහි කෙටි තේරුමයි.

අභිජ්ඣා කායග්‍රන්ථ, ව්‍යාපාද කායග්‍රන්ථ, සීලබ්බතපරාමාස කායග්‍රන්ථ, ඉදංසච්චාභිනිවේස කායග්‍රන්ථ නමින් ග්‍රන්ථ සතරකි. ධර්මතා වශයෙන් ලෝභ - දෝස - දිට්ඨි යන තුන ලැබෙති. පඤ්චස්කන්ධ නම් වූ ආත්ම භාවය සංසාරයෙහි ගැට ගසන ලෝභය, අභිජ්ඣා කායග්‍රන්ථ යයි. දෝසය, ව්‍යාපාද කායග්‍රන්ථයයි. සීල ව්‍රත සාර වශයෙන් පිළිගන්නා වූ දිට්ඨියත්, සෙසු දෙසැටක් මිසදිටු සාර වශයෙන් ගන්නා වූ දිට්ඨියත්, දෙකම කායග්‍රන්ථ දෙකකි. දිට්ඨි දෙකම චෛතසික වශයෙන් එකක් කොට ගත් කල්හි ග්‍රන්ථ සියල්ල තුනක් වෙති.

2. **නෝ ගන්ථා** - ග්‍රන්ථ ධර්ම තිදෙන හැර ඉතිරි සියල්ල නෝ ගන්ථා යන පදයට ඇතුළත් වෙයි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. ගන්ථ ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**ගන්ථ ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 6 වැනි පාඩම

## ඕඝ ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. ඕඝ දුකය

1. **ඕඝා ධම්මා - නෝ ඕඝා ධම්මා'ති.**

2. ගන්ථ ගොච්ඡකයට අනතුරුව **ඕඝ ගොච්ඡකය** දේශනා කොට වදාළ සේක. එය ද ඕඝ දුකය, ඕඝනීය දුකය, ඕඝ සම්පයුත්ත දුකය, ඕඝ ඕඝනීය දුකය, ඕඝ ඕඝ සම්පයුත්ත දුකය, ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකයන් ගේ වශයෙන් සය වැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් පළමු කොට **ඕඝ දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ ඕඝා ධම්මා** යනුවෙනි.

4. **ඕඝා ධම්මා** - සත්වයන් සංසාර සාගර පත්ලෙහි ගසන්නා වූ අර්ථයෙන් ඕඝ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

5. **නෝ ඕඝා ධම්මා** - ඕඝ නම් නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **ඕඝා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ, දිට්ඨි, මෝහ නම් වූ ඕඝ ධර්මයෝ තිදෙන ලැබෙන්නාහ.

7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

8. **නෝ ඕසා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ඕඝ ධර්ම තුන වර්ජිත එකුන්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

10. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සත්සාලිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥානස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

11. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

12. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

13. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

14. ධාතු වශයෙන් (18) අටළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

15. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

16. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

17. එකුන්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් (18) අටළොස් වැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එකුන්පණස ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද, සංකප්ප වර්ජිත මාර්ගාංග සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය

විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

19. මේ ශබ්දාවලිය හෙවත් ඕඝ දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**ඕඝ දුකය යි.**

## 2. ඕඝනීය දුකය

20. **ඕඝනීයා ධම්මා - අනෝඝනීයා ධම්මා'ති.**

21. ඕඝ දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **ඕඝනීය දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝනීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනෝඝනීයා ධම්මා** යනුවෙනි.

22. **ඕඝනීයා ධම්මා** - ඕඝ ධර්මයන්ට හිත වූ හෙවත් ඕඝයන් හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

23. **අනෝඝනීයා ධම්මා -** ඕඝ ධර්මයන්ට හිත නො වූ හෙවත් ඕඝයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

24. **ඕඝනීයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපයද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

26. **අනෝඝනීයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

27. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**ඕඝනීය දුකය යි.**

## 3. ඕඝ සම්පයුත්ත දුකය

28. **ඕඝ සම්පයුත්තා ධම්මා - ඕඝ විප්පයුත්තා ධම්මා'ති.**

29. ඕඝනීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **ඕඝ සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝ සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝ විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

30. **ඕඝ සම්පයුත්තා ධම්මා** - ඕඝ ධර්මයන් සමග ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

31. **ඕඝ විප්පයුත්තා ධම්මා** - ඕඝ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

32. **ඕඝ සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත දෝස මූල සහ මෝහ මූල සිත්හි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ද ලැබෙන්නාහ.

33. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

34. **ඕඝ විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ඉතිරි සත්සැත්තෑ (77) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද,

දෝස මූල සහ මෝහ මූල සිත්හි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

35. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**ඕඝ සම්පයුත්ත දුකය යි.**

## 4. ඕඝ ඕඝනීය දුකය

36. **ඕඝා චේව ධම්මා ඕඝනීයා ච - ඕඝනීයා චේව ධම්මා නෝ ච ඕඝා'ති.**

37. ඕඝ සම්පයුත්ත දුකයට අනතුරුව **ඕඝ ඕඝනීය දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝා චේව ධම්මා ඕඝනීයා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝනීයා චේව ධම්මා නෝ ච ඕඝා** යනුවෙනි.

38. **ඕඝා චේව ධම්මා ඕඝනීයා ච** - ඕඝ නම් වූ ද, ඕඝ ධර්මයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

39. **ඕඝනීයා චේව ධම්මා නෝ ච ඕඝා** - ඕඝයන්ට අරමුණු වන්නා වූ ද, එහෙත් ඕඝ නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

40. **ඕඝා චේව ධම්මා ඕඝනීයා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි මෝහ නම් වූ ඕඝ ධර්ම තිදෙන ලැබෙන්නාහ.

41. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

42. **ඕඝනීයා චේව ධම්මා නෝ ච ඕඝා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත ඕඝ ධර්ම තුන වර්ජිත චෛතසික එකුන්පණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

43. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම සියල්ල ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.)

**ඕඝ ඕඝනීය දුකය යි.**

## 5. ඕඝ ඕඝ සම්පයුත්ත දුකය

44. **ඕඝා චේව ධම්මා ඕඝ සම්පයුත්තා ච - ඕඝ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ඕඝා'ති.**

45. ඕඝ ඕඝනීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **ඕඝ ඕඝ සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝා චේව ධම්මා ඕඝ සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය දේශනා කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ඕඝා** යනුවෙනි.

46. **ඕඝා චේව ධම්මා ඕඝ සම්පයුත්තා ච** - ඕඝ නම් වූ ද, ඕඝ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

47. **ඕඝ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ඕඝා** - ඕඝ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, එහෙත් ඕඝ නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

48. **ඕඝා චේව ධම්මා ඕඝ සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල අකුසල් සිත් අටෙහි යෙදුනා වූ ඕඝ ධර්ම තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

49. **ඕඝ සම්පයුත්තා චේව ධම්මා නෝ ච ඕඝා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත ඕඝ ධර්ම තුන වර්ජිත සූවිසි චෛතසිකය ද ලැබෙන්නාහ.

50. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

51. ආදිලබ්ධ නාම දුකයකි. අකුසල ධර්ම වර්ජිත සත් සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, දෝස මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**ඕඝ ඕඝ සම්පයුත්ත දුකය යි.**

## 6. ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකය

52. **ඕඝ විප්පයුත්තා ඛෝ පන ධම්මා ඕඝනීයාපි - ඕඝ විප්පයුත්තා ඛෝ පන ධම්මා අනෝඝනීයාපී'ති.**

53. ඕඝ ඕඝ සම්පයුත්ත දුකයට අනතුරුව **ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝ විප්පයුත්තා ඛෝ පන ධම්මා ඕඝනීයාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **ඕඝ විප්පයුත්තා ඛෝ පන ධම්මා අනෝඝනීයාපි** යනුවෙනි.

54. **ඕඝ විප්පයුත්තා ඛෝ පන ධම්මා ඕඝනීයාපි** - ඕඝ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් ඕඝයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

55. **ඕඝ විප්පයුත්තා ඛෝ පන ධම්මා අනෝඝනීයාපි** - ඕඝ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, ඕඝයන්ට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

56. **ඕඝ විප්පයුත්තා ඛෝ පන ධම්මා ඕඝනීයාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසික ද, දෝස මූල සහ මෝහ මූල අකුසල් සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

57. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

58. **ඕඝ විප්පයුත්තා බෝ පන ධම්මා අනෝඝනීයාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

59. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

60. ආදිලබ්ධ නාම දුකයකි. අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත දෝස මූල සහ මෝහ මූල අකුසල් සිත් සතරෙහි මෝහය වර්ජිත චෛතසික සත්විස්ස (27) ද ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**ඕඝ විප්පයුත්ත ඕඝනීය දුකය යි.**

## පද විවරණය

1. **ඕඝා ධම්මා** - ''යමෙකුගේ සන්තානයෙහි ලෝභ දිට්ඨි මෝහ යන මේ පාප ධර්ම ඇතොත් ඒ පුද්ගලයා සංසාර වට්ටයෙහි - සංසාර සාගරයෙහි පත්ලටම ගිල්වා දමත්නු යි ඕඝ නම් වන්නාහ.''

   '' ඕඝ ගොච්ඡකේ යස්ස සංවිජ්ජන්ති තං වට්ටස්මිං යේව ඕහනන්ති ඕසීදාපෙන්තී ති ඕඝා'' **(අත්ථසාලිනි)**

2. **ඕඝනීයා** - ''අරමුණු කොට ඕඝයන් විසින් ගිලගනිත්තු යි ඕඝනීය නම් වෙති. ආරම්මණං කත්වා අතික්කමනියතෝ ඕඝේහි අතික්කමිතබ්බා ති ඕඝනීයා, ඕඝානං ආරම්මණ ධම්මා ඒවං වේදිතබ්බා. **(අත්ථසාලිනි)**

3. **ආසව - ඕඝ - යෝග** - ලෝභ දිට්ඨි මෝහ යන අකුසල් චෛතසික තුන ආසව නමින් ද, ඕඝ නමින් ද, යෝග නමින් ද

දැක්වෙති. ඒ වනාහි සර්වඥයන් වහන්සේ ගේ දේශනා විලාස වශයෙන් හා අවබෝධ කරන්නා වූ වේනෙය්‍ය පුද්ගලයන්ගේ වශයෙන් ද දේශනා කරන ලද්දකි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. ඕඝ ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.
2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.
8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**ඕඝ ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 7 වැනි පාඩම

## යෝග ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. යෝග දුකය

1. **යෝගා ධම්මා - නෝ යෝගා ධම්මා'ති.**
2. ඕඝ ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **යෝග ගොච්ඡකය** දේශනා කොට වදාළ සේක. එය ද යෝග දුකය, යෝගනීය දුකය, යෝග සම්පයුත්ත දුකය, යෝග යෝගනීය දුකය, යෝග යෝග සම්පයුත්ත දුකය, යෝග විප්පයුත්ත යෝගනීය දුකයාගේ වශයෙන් සය වැදෑරුම් වන්නේ ය.
3. ඔවුනතුරෙන් **යෝග දුකය** පළමු කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝගා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ යෝගා ධම්මා** යනුවෙනි.
4. **යෝගා ධම්මා** - සත්වයන් සංසාර වට්ට දුක්ඛයෙහි යොදවන අර්ථයෙන් යෝග නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
5. **නෝ යෝගා ධම්මා** - යෝග නම් නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
6. **යෝගා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ, දිට්ඨි, මෝහ නම් වූ චෛතසික තිදෙන ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

7. **නෝ යෝගා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත යෝග ධර්ම තුන වර්ජිත එකුන්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

8. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

9. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සත්සාලිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

10. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

11. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

12. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. එකුන්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

13. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

14. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

15. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

16. එකුන්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

17. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එකුන්පණස ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද, සංකප්ප වර්ජිත සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

18. මේ ශබ්දාවලිය හෙවත් යෝග දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**යෝග දුකය යි.**

## 2. යෝගනීය දුකය

19. **යෝගනීයා ධම්මා - අයෝගනීයා ධම්මා'ති.**

20. යෝග දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **යෝගනීය දුකය** වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝගනීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අයෝගනීයා ධම්මා** යනුවෙනි.

21. **යෝගනීයා ධම්මා** - යෝග ධර්මයන්ට හිත වූ හෙවත් යෝගයන්ට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

22. **අයෝගනීයා ධම්මා** - යෝග ධර්මයන්ට හිත නො වූ හෙවත් යෝගයන් හට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

23. **යෝගනීයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

24. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

25. **අයෝගනීයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

26. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි)

**යෝගනීය දුකය යි.**

## 3. යෝග සම්පයුත්ත දුකය

27. **යෝග සම්පයුත්තා ධම්මා - යෝග විප්පයුත්තා ධම්මා'ති.**

28. යෝගනීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **යෝග සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝග සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝග විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

29. **යෝග සම්පයුත්තා ධම්මා** - යෝග ධර්මයන් සමග ඒකොත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

30. **යෝග විප්පයුත්තා ධම්මා** - යෝග ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

31. **යෝග සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත දෝස මූල සහ මෝහ මූල සිත්හි මෝහය වර්ජිත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ.

32. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

33. **යෝග විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ඉතිරි සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, දෝස මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

34. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**යෝග සම්පයුත්ත දුකය යි.**

## 4. යෝග යෝගනීය දුකය

35. **යෝගා චේව ධම්මා යෝගනීයා ච - යෝගනීයා චේව ධම්මා නෝ ච යෝගා'ති.**

36. යෝග සම්පයුත්ත දුකයට අනතුරුව **යෝග යෝගනීය දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝගා චේව ධම්මා යෝගනීයා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක්ද යත්, **යෝගනීයා චේව ධම්මා නෝ ච යෝගා** යනුවෙනි.

37. **යෝගා චේව ධම්මා යෝගනීයා ච** - යෝග නම් වූ ද, යෝග ධර්මයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

38. **යෝගනීයා චේව ධම්මා නෝ ච යෝගා** - යෝග ධර්මයන් හට අරමුණු වන්නා වූ ද, එහෙත් යෝග නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

39. **යෝගා චේව ධම්මා යෝගනීයා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි මෝහ නම් වූ යෝග ධර්ම තිදෙන ලැබෙන්නාහ.

40. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

41. **යෝගනීයා චේව ධම්මා නෝ ච යෝගා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත යෝග ධර්ම වර්ජිත එකුන්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

42. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

43. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම සියල්ල ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**යෝග යෝගනීය දුකය යි.**

## 5. යෝග යෝග සම්පයුත්ත දුකය

44. **යෝගා චේව ධම්මා යෝග සම්පයුත්තා ච - යෝග සම්පයුත්තා චේව ධම්මා නෝ ච යෝගා'ති.**

45. යෝග යෝගනීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **යෝග යෝග සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝගා චේව ධම්මා යෝග සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය දේශනා කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝග සම්පයුත්තා චේව ධම්මා නෝ ච යෝගා** යනුවෙනි.

46. **යෝගා චේව ධම්මා යෝග සම්පයුත්තා ච** - යෝග නම් වූ ද, යෝග ධර්මයන් සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

47. **යෝග සම්පයුත්තා චේව ධම්මා නෝ ච යෝගා** - යෝග ධර්මයන් සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර වූ ද, එහෙත් යෝග නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

48. **යෝගා චේව ධම්මා යෝග සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල අකුසල් සිත් අටෙහි යෙදුනා වූ යෝග ධර්ම තිදෙන ලැබෙන්නාහ.

49. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

50. **යෝග සම්පයුත්තා චේව ධම්මා නෝ ච යෝගා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත යෝග ධර්ම වර්ජිත සූවිසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

51. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

52. ආදිලබ්ධ නාම දුකයකි. දොළොස් අකුසල් සිත් වර්ජිත ඉතිරි සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, දෝස මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**යෝග යෝග සම්පයුත්ත දුකය යි.**

## 6. යෝග විප්පයුත්ත යෝගනීය දුකය

53. **යෝග විප්පයුත්තා ඛෝ පන ධම්මා යෝගනීයාපි - යෝග විප්පයුත්තා ඛෝ පන ධම්මා අනෝසනීයාපී'ති.**

54. යෝග යෝග සම්පයුත්ත දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **යෝග විප්පයුත්ත යෝගනීය දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝග විප්පයුත්තා ඛෝ පන ධම්මා යෝගනීයාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **යෝග විප්පයුත්තා ඛෝ පන ධම්මා අයෝගනීයාපි** යනුවෙනි.

55. **යෝග විප්පයුත්තා ඛෝ පන ධම්මා යෝගනීයාපි** - යෝග ධර්මයන් සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් යෝග ධර්මයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

56. **යෝග විප්පයුත්තා ඛෝ පන ධම්මා අයෝගනීයාපි** - යෝග ධර්මයන් සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර නො වූ ද, යෝග ධර්මයන් හට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

57. **යෝග විප්පයුත්තා ඛෝ පන ධම්මා යෝගනීයාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, දෝස මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

58. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

59. **යෝග විප්පයුත්තා බෝ පන ධම්මා අයෝගනීයාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

60. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

61. ආදිලබ්ධ නාම දුකයකි. අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත දෝස මූල සහ මෝහ මූල සිත් සතරෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ද ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**යෝග විප්පයුත්ත යෝගනීය දුකය යි.**

## පද විවරණය

1. **යෝගා** - යමෙකුගේ සන්තානයෙහි ලෝභ දිට්ඨි මෝහයෝ ඇත්තාහු ද, ඒ පුද්ගලයා සංසාර වට්ට දුක්ඛයෙහි යොදවන්නාහ යන අර්ථයෙන් යෝග නම් වෙති. **''යෝග ගොච්ඡකේ යස්ස සංවිජ්ජන්ති, තං වට්ටස්මිං යෝජෙන්තී ති යෝගා'' (අත්ථසාලිනී)**

**ආසව - ඕඝ - යෝග ගොච්ඡක තුනම ධර්මතා වශයෙන් එක සමාන වෙති.**

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. යෝග ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**යෝග ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 8 වැනි පාඩම
## නීවරණ ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. නීවරණ දුකය

1. **නීවරණා ධම්මා - නෝ නීවරණා ධම්මා'ති.**

2. යෝග ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **නීවරණ ගොච්ඡකය** වදාළ සේක. එය ද නීවරණ දුකය, නීවරණීය දුකය, නීවරණ සම්පයුත්ත දුකය, නීවරණ නීවරණීය දුකය, නීවරණ නීවරණ සම්පයුත්ත දුකය, නීවරණ විප්පයුත්ත නීවරණීය දුකයාගේ වශයෙන් සවැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් **නීවරණ දුකය** පළමු කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ නීවරණා ධම්මා** යනුවෙනි.

4. **නීවරණා ධම්මා** - නිවන් මඟ හාත්පසින් ම ආවරණය කරන අර්ථයෙන් නීවරණ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

5. **නෝ නීවරණා ධම්මා** - නීවරණ නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **නීවරණා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ, දෝස, මෝහ, ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණ ධර්මයෝ අට ලැබෙන්නාහ.

7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

8. **නෝ නීවරණා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත නීවරණ ධර්ම වර්ජිත සූසාලිස් (44) චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

10. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. සූසාලිස් (44) චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි දෙසාලිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තයි. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

11. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

12. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

13. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. සූසාලිස් (44) චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

14. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

15. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

16. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

17. සූසාලිස් (44) චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත සූසාලිස් (44) චෛතසිකය ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් බැගින් ද, සංකප්ප වර්ජිත මාර්ගාංගයෝ සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ග සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල

චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

19. මේ ශබ්දාවලිය හෙවත් නීවරණ දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**නීවරණ දුකය යි.**

## 2. නීවරණීය දුකය

20. **නීවරණීයා ධම්මා - අනීවරණීයා ධම්මා'ති.**

21. නීවරණ දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **නීවරණීය දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණීයා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනීවරණීයා ධම්මා** යනුවෙනි.

22. **නීවරණීයා ධම්මා** - නීවරණ ධර්මයන් හට හිත වූ හෙවත් නීවරණයන් හට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

23. **අනීවරණීයා ධම්මා** - නීවරණ ධර්මයන් හට හිත නො වූ හෙවත් නීවරණයන් හට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

24. **නීවරණීයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරමෙන් ස්වරූප උදුරනු.)

26. **අනීවරණීයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

27. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි)

**නීවරණීය දුකය යි.**

## 3. නීවරණ සම්පයුත්ත දුකය

28. **නීවරණ සම්පයුත්තා ධම්මා - නීවරණ විප්පයුත්තා ධම්මා'ති.**

29. නීවරණීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **නීවරණ සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණ සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණ විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

30. **නීවරණ සම්පයුත්තා ධම්මා** - නීවරණ ධර්මයන් සමග ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

31. **නීවරණ විප්පයුත්තා ධම්මා** - නීවරණ ධර්මයන් සමග ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

32. **නීවරණ සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ද ලැබෙන්නාහ.

33. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

34. **නීවරණ විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ඉතිරි සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

35. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය

වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**නීවරණ සම්පයුත්ත දුකය යි.**

## 4. නීවරණ නීවරණීය දුකය

36. **නීවරණා චේව ධම්මා නීවරණීයා ච - නීවරණීයා චේව ධම්මා නෝ ච නීවරණා'ති.**

37. නීවරණ සම්පයුත්ත දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **නීවරණ නීවරණීය දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණා චේව ධම්මා නීවරණීයා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණීයා චේව ධම්මා නෝ ච නීවරණා** යනුවෙනි.

38. **නීවරණා චේව ධම්මා නීවරණීයා ච** - නීවරණ නම් වූ ද, නීවරණ ධර්මයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

39. **නීවරණීයා චේව ධම්මා නෝ ච නීවරණා** - නීවරණ ධර්මයන් හට අරමුණු වන්නා වූ ද, එහෙත් නීවරණ නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

40. **නීවරණා චේව ධම්මා නීවරණීයා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නීවරණ ධර්ම අට ලැබෙන්නාහ.

41. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

42. **නීවරණීයා චේව ධම්මා නෝ ච නීවරණා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත නීවරණ ධර්ම වර්ජිත සූසාලිස් (44) චෛතසිකය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

43. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

44. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම සියල්ල ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**නීවරණ නීවරණීය දුකය යි.**

## 5. නීවරණ නීවරණ සම්පයුත්ත දුකය

45. **නීවරණා චේව ධම්මා නීවරණ සම්පයුත්තා ච - නීවරණ සම්පයුත්තා චේව ධම්මා නෝ ච නීවරණා'ති.**

46. නීවරණ නීවරණීය දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **නීවරණ නීවරණ සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණා චේව ධම්මා නීවරණ සම්පයුත්තා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය දේශනා කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණ සම්පයුත්තා චේව ධම්මා නෝ ච නීවරණා** යනුවෙනි.

47. **නීවරණා චේව ධම්මා නීවරණ සම්පයුත්තා ච** - නීවරණ නම් වූ ද, නීවරණයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

48. **නීවරණ සම්පයුත්තා චේව ධම්මා නෝ ච නීවරණා** - නීවරණ ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, එහෙත් නීවරණ නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

49. **නීවරණා චේව ධම්මා නීවරණ සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නීවරණ ධර්ම අට ලැබෙන්නාහ.

50. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

51. **නීවරණ සම්පයුත්තා චේව ධම්මා නෝ ච නීවරණා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් චිත්තයෝ ද, තත් සම්ප්‍රයුක්ත නීවරණ ධර්ම වර්ජිත එකුන්විසි චෛතසිකයෝ ද ලැබෙන්නාහ.

52. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

53. ආදිලබ්ධ නාම දුකයකි. අකුසල් සිත් වර්ජිත ඉතිරි සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**නීවරණ නීවරණ සම්පයුත්ත දුකය යි.**

## 6. නීවරණ විප්පයුත්ත නීවරණීය දුකය

54. **නීවරණ විප්පයුත්තා බෝ පන ධම්මා නීවරණියාපි - නීවරණ විප්පයුත්තා බෝ පන ධම්මා අනීවරණියාපී'ති.**

55. නීවරණ නීවරණ සම්පයුත්ත දුකයට අනතුරුව **නීවරණ විප්පයුත්ත නීවරණීය දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණ විප්පයුත්තා බෝ පන ධම්මා නීවරණියාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නීවරණ විප්පයුත්තා බෝ පන ධම්මා අනීවරණියාපි** යනුවෙනි.

56. **නීවරණ විප්පයුත්තා බෝ පන ධම්මා නීවරණියාපි** - නීවරණයන් සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් නීවරණයන් හට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

57. **නීවරණ විප්පයුත්තා බෝ පන ධම්මා අනීවරණියාපි** - නීවරණයන් සමග ඒකෝත්පාදාදී භාවයෙන් මිශ්‍ර නො වූ ද, නීවරණයන් හට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

58. **නීවරණ විප්පයුත්තා ඛෝ පන ධම්මා නීවරණියාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

59. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

60. **නීවරණ විප්පයුත්තා ඛෝ පන ධම්මා අනීවරණියාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

61. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

62. ආදිලබ්ධ නාම දුකයකි. අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්විස්ස (27) ද ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**නීවරණ විප්පයුත්ත නීවරණිය දුකය යි.**

## පද විවරණය

1. **නීවරණා** - ''කුසල් සිත හාත්පසින් වෙලා ගෙන ධ්‍යාන මාර්ග ඵලයන්ට පැමිණිය නොහෙන සේ බාධා කෙරෙන බැවින් නීවරණ නම් වෙති.''

'' නීවරණ ගොච්ඡකේ, චිත්තං නීවරන්ති පරියෝනද්ධන්තී ති නීවරණා.'' යනු **අත්ථසාලිනී** පාඨයයි.

තව ද, **විභාවිනී ටීකාව** අනුව මෙසේ ය.

ධ්‍යානාදී වශයෙන් උපදින කුසල් සිත වලකා ධ්‍යානාදියක් ඉපදීමට නොදී ආවරණය කරන බැවින් නීවරණ නම් වෙති. ප්‍රඥා චක්ෂුව අන්ධ කරන ආවරණය කරන බැවින් ද, නීවරණ නම් වෙති'' යනු යි. අභිධර්ම ක්‍රමයට නීවරණ අටකි. එනම්, ලෝභ, දෝස, මෝහ,

ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා යන අට දෙන ය. සූත්‍රාන්ත ක්‍රමයට ඒ අට පිඬු කොට නීවරණ පස් දෙනෙකි.

ලෝභය නම් වූ කාමච්ඡන්දය, ද්වේෂය නම් වූ ව්‍යාපාදය, ථීන මිද්ධ යුගලය, උද්ධච්ච කුක්කුච්ච යුගලය, විචිකිච්ඡාව ද යන පස් දෙන වෙති.

මෝහය නීවරණ ධර්ම පස හා සම්ප්‍රයුක්ත වේ. ථීන මිද්ධ දෙක එකක් වශයෙන් ගනු ලැබුවේ ඒ දෙකටම, හේතුව හා කෘත්‍යයත් ප්‍රතිපක්ෂ ධර්මයත් සමාන බැවිනි. උද්ධච්ච කුක්කුච්ච දෙක එකක් කොට ගත්තේ ද එසේම ය. ථීන මිද්ධයට හේතුව හෙවත් ආහාරය නම් ඇලි මැලි ගතියයි. කෘත්‍යය සිතේ හැකුළුන බව ය. ප්‍රතිපක්ෂය වීර්ය යි. උද්ධච්ච කුක්කුච්ච දෙකට හේතුව ඥාති ව්‍යසනාදිය විතර්ක කිරීමය. කෘත්‍යය සිතේ නොසන්සුන් බව ය. ප්‍රතිපක්ෂය චිත්ත සමාධිය යි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. නීවරණ ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.
2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපත්‍යයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**නීවරණ ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 9 වැනි පාඩම
## පරාමාස ගොච්ඡකය (දුක 5)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. පරාමාස දුකය

1. **පරාමාසා ධම්මා - නෝ පරාමාසා ධම්මා'ති.**

2. නීවරණ ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **පරාමාස ගොච්ඡකය** වදාළ සේක. එය ද පරාමාස දුකය, පරාමට්ඨ දුකය, පරාමාස සම්පයුත්ත දුකය, පරාමාස පරාමට්ඨ දුකය, පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකයා ගේ වශයෙන් පස් වැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් **පරාමාස දුකය** පළමු කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමාසා ධම්මා** යනුවෙනි. ඉන් අනරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ පරාමාසා ධම්මා** යනුවෙනි.

4. **පරාමාසා ධම්මා** - මිථ්‍යා වශයෙන් විපරීත ග්‍රහණයෙන් අල්වා ගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

5. **නෝ පරාමාසා ධම්මා** - මිථ්‍යා වශයෙන් විපරීත ග්‍රහණයෙන් නොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **පරාමාසා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකම දිට්ඨි චෛතසිකය ලැබෙන්නේ ය.

7. ඒ දිට්ඨි චෛතසිකය ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

8. **නෝ පරාමාසා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත

දිට්ඨිය වර්ජිත එක්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි.

10. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. එක්පණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි එකුන්පණස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89) චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

11. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

12. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

13. එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. එක්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

14. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය.

සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

15. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

16. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

17. එක්පණස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

18. ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි වර්ජිත සමපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය.

19. නිර්වාණය නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද, සංකප්ප වර්ජිත මාර්ගාංග සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ගය සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් සිව් වැදෑරුම් වන්නාහ.

20. මේ ශබ්දාවලිය හෙවත් පරාමාස දුකය වනාහි, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**පරාමාස දුකය යි.**

## 2. පරාමට්ඨ දුකය

21. **පරාමට්ඨා ධම්මා - අපරාමට්ඨා ධම්මා'ති.**

22. පරාමාස දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **පරාමට්ඨ දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමට්ඨා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අපරාමට්ඨා ධම්මා** යනුවෙනි.

23. **පරාමට්ඨා ධම්මා** - පරාමාසයන්ට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

24. **අපරාමට්ඨා ධම්මා** - පරාමාසයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

25. **පරාමට්ඨා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

26. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

27. **අපරාමට්ඨා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

28. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**පරාමට්ඨ දුකය යි.**

## 3. පරාමාස සම්පයුත්ත දුකය

29. **පරාමාස සම්පයුත්තා ධම්මා - පරාමාස විප්පයුත්තා ධම්මා'ති.**

30. පරාමට්ඨ දුකයට අනතුරුව **පරාමාස සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමාස සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමාස විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

31. **පරාමාස සම්පයුත්තා ධම්මා** - දිට්ඨි පරාමාසය සමග ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

32. **පරාමාස විප්පයුත්තා ධම්මා** - දිට්ඨි පරාමාසය සමග ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

33. **පරාමාස සම්පයුත්තා ධම්මා** - යන පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි වර්ජිත සමවිසි චෛතසිකය ද ලැබෙන්නාහ.

34. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

35. **පරාමාස විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ඉතිරි පස්අසූ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨිය වර්ජිත එක්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

36. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

37. ආදිලබ්ධ නාම දුකයකි. දිට්ඨිය ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**පරාමාස සම්පයුත්ත දුකය යි.**

## 4. පරාමාස පරාමට්ඨ දුකය

38. **පරාමාසා චේව ධම්මා පරාමට්ඨා ච - පරාමට්ඨා චේව ධම්මා නෝ ච පරාමාසා'ති.**

39. පරාමාස සම්පයුත්ත දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **පරාමාස පරාමට්ඨ දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමාසා චේව ධම්මා පරාමට්ඨා ච** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමට්ඨා චේව ධම්මා නෝ ච පරාමාසා** යනුවෙනි.

40. **පරාමාසා චේව ධම්මා පරාමට්ඨා ච** - පරාමාස නම් වූ ද, පරාමාස ධර්මයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

41. **පරාමට්ඨා චේව ධම්මා නෝ ච පරාමාසා** - පරාමාස ධර්මයන් හට අරමුණු වන්නා වූ ද, එහෙත් පරාමාස නම් නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

42. **පරාමාසා චේව ධම්මා පරාමට්ඨා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකම දිට්ඨි පරාමාස ධර්මය ලැබෙන්නේ ය.

43. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

44. **පරාමට්ඨා චේව ධම්මා නෝ ච පරාමාසා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි වර්ජිත එක්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

45. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

46. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම කිසිවක් ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**පරාමාස පරාමට්ඨ දුකය යි.**

## 5. පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය

47. **පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා පරාමට්ඨාපි - පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා අපරාමට්ඨාපී'ති.**

48. පරාමාස පරාමට්ඨ දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා පරාමට්ඨාපි** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය දේශනා කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා අපරාමට්ඨාපි** යනුවෙනි.

49. **පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා පරාමට්ඨාපි** - පරාමාස ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් පරාමාස ධර්මයන්ට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

50. **පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා අපරාමට්ඨාපි** - පරාමාස ධර්මයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, පරාමාස ධර්මයන්ට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

51. **පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා පරාමට්ඨාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර වර්ජිත ඉතිරි ලෞකික සිත් සත්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි වර්ජිත එක්පණස් චෛතසිකය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

52. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

53. **පරාමාස විප්පයුත්තා ඛෝ පන ධම්මා අපරාමට්ඨාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

54. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික එක්විස්ස ද මේ දුකයට ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.)

**පරාමාස විප්පයුත්ත පරාමට්ඨ දුකය යි.**

## පද විවරණය

1. **පරාමාසා** - ධර්මයන්ගේ තත්වාකාරයෙන් ඇත්තා වූ අනිත්‍යාදී ආකාරය ඉක්මවා නිත්‍යාදී වශයෙන් සිතා විපරීතව අල්වා ගන්නා බැවින් පරාමාස නම් වේ.

   ''පරාමාස ගොච්ඡකේ ධම්මානං යථාභූතං අනිච්චාදි ආකාරං අතික්කමිත්වා නිච්චන්ති ආදි පවත්තමානා, පරතෝ ආමසන්තීති පරාමාසා'' **(අත්ථසාලිනි)**

2. **පරාමාසා ධම්මා** - දිට්ඨි යනු එකම චෛතසිකයකි. එය මෙහිදී **පරාමාසා ධම්මා** යයි බහු වචනයෙන් දේශනා කොට ඇත්තේ දිට්ඨියේ ප්‍රභේද රාශියක් ඇති බැවිනි. අතීත මිථ්‍යා දෘෂ්ටිය, අනාගත මිථ්‍යා දෘෂ්ටිය, වර්තමාන මිථ්‍යා දෘෂ්ටිය, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර, සක්කාය දිට්ඨි, දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි යනාදී වශයෙන් නානාප්‍රකාර මිථ්‍යා දෘෂ්ටිය මෙහි ඇතුළත් වන බැවින් එකම දිට්ඨි චෛතසිකය බහු වචනයෙන් දේශනා කළ සේක. එකම වේදනා චෛතසිකය ද, එකම සඤ්ඤා චෛතසිකය ද වේදනාස්කන්ධය සංඥාස්කන්ධය යනාදී වශයෙන් ස්කන්ධ අර්ථයෙන් ගෙන රාශියක් සේ දේශනා කොට ඇත්තේ ද මේ අයුරෙනි. දිට්ඨිය ද සංස්කාරස්කන්ධ යයි රාශියක් වශයෙන් වදාරා ඇත්තේ ද මේ තේරුමෙනි.

3. **පරාමාස පරාමාස විප්පයුත්ත දුකය** - යන මාතෘකාව මේ පරාමාස ගොච්ඡකයට වදාරා නැත්තේ එකම සිතේ ඇති දිට්ඨි චෛතසිකය සමග තවත් දිට්ඨි චෛතසිකයන් නොමැති බැවිනි. එහෙයින් ම පරාමාස ගොච්ඡකයෙහි දුක මාතෘකා හයක් නොදෙසා පහක් පමණක් දේශනා කොට ඇතැයි දතයුතු.

# ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. පරාමාස ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**පරාමාස ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 10 වැනි පාඩම

## මහන්තර දුකය (දුක 14)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. සාරම්මණ දුකය

1. **සාරම්මණා ධම්මා - අනාරම්මණා ධම්මා'ති.**
2. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පරාමාස ගොච්ඡකයට අනතුරුව **මහන්තර දුකය** දේශනා කොට වදාළ සේක. එයද සාරම්මණ දුකාදීන්ගේ වශයෙන් තුදුස් වැදෑරුම් වන්නේ ය.
3. ඔවුනතුරෙන් **සාරම්මණ දුකය** පළමු කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සාරම්මණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනාරම්මණා ධම්මා** යනුවෙනි.
4. **සාරම්මණා ධම්මා** - අරමුණු ගැනීම ස්වභාව කොට ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
5. **අනාරම්මණා ධම්මා** - අරමුණු නොගැනීමේ ස්වභාව ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
6. **සාරම්මණා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් (52) චෛතසිකය ද ලැබෙන්නාහ.
7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.
8. ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, දෙපණස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සමපණස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. එකුන්අනූ (89)

චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

9. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එකුන්අනූ (89) චිත්තය මනායතනය නම් වන්නේ ය. දෙපණස් චෛතසිකය ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

10. ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, එකුන්අනූ (89) චිත්තයන් අතුරෙන් චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන සිත හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සසැත්තෑ (76) චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. දෙපණස් චෛතසිකය ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම් වන්නාහ.

11. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත චෛතසික එක්පණස ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍ය නම් වන්නේ ය.

12. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ වූ සම්මාදිට්ඨි ආදී මාර්ගාංගයෝ අට දෙන එක් වරක් බැගින් ද, සත් දෙන සතර වරක් බැගින් ද මාර්ග සත්‍යය නම් වන්නේ ය. අවශේෂ මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

13. **අනාරම්මණා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකොළොසකි. ධාතු වශයෙන් එකොළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

15. ස්කන්ධ වශයෙන් එකම රූපස්කන්ධය ලැබෙන්නේ ය. නිර්වාණ ධාතුව ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත වන්නේ ය. ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

16. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

17. ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණ ධාතුව ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහ.

18. ධාතු වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

19. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඵොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

20. ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම

රූප සොළොස (16) ද, නිර්වාණ ධාතුව ද ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් එකොළොස් වැදෑරුම් වන්නාහ.

21. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණ ධාතුව නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. මේ ශබ්දාවලිය හෙවත් සාරම්මණ දුකය වනාහි, පරමාර්ථ ධර්ම දෙපදයකින් වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**සාරම්මණ දුකය යි.**

## 2. චිත්ත දුකය

23. **චිත්තා ධම්මා - නෝ චිත්තා ධම්මා'ති.**

24. සාරම්මණ දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **චිත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ චිත්තා ධම්මා** යනුවෙනි.

25. **චිත්තා ධම්මා** - චින්තනාර්ථයෙන් චිත්ත නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

**26. නෝ චිත්තා ධම්මා** - චින්තනාර්ථයෙන් චිත්ත නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

27. **චිත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ලැබෙන්නේ ය.

28. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් සතකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

29. **නෝ චිත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

30. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් එකොළොසකි. ධාතු වශයෙන් එකොළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

31. මේ ශබ්දාවලිය හෙවත් චිත්ත දුකය පරමාර්ථ ධර්ම දෙපදයකින් වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම මෙහි ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**චිත්ත දුකය යි.**

## 3. චේතසික දුකය

32. **චේතසිකා ධම්මා - අචේතසිකා ධම්මා’ති.**

33. චිත්ත දුකයට අනතුරුව **චේතසික දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චේතසිකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අචේතසිකා ධම්මා** යනුවෙනි.

34. **චේතසිකා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සිතෙහි හටගන්නා බැවින් චෛතසික නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

35. **අචේතසිකා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සිතෙහි හට නොගන්නා බැවින් අචේතසික නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

36. **චේතසිකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් චෛතසික ධර්ම දෙපණස ලැබෙන්නාහ.

37. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

38. **අචේතසිකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

39. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

40. මේ ශබ්දාවලිය හෙවත් චේතසික දුකය වනාහි, පරමාර්ථ ධර්ම දෙපදයකින් වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. පරමාර්ථ ධර්ම සියල්ල ඇතුලත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**චේතසික දුකය යි.**

## 4. චිත්ත සම්පයුත්ත දුකය

41. **චිත්ත සම්පයුත්තා ධම්මා - චිත්ත විප්පයුත්තා ධම්මා'ති.**

42. චේතසික දුකයට අනතුරුව **චිත්ත සම්පයුත්ත දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්ත සම්පයුත්තා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්ත විප්පයුත්තා ධම්මා** යනුවෙනි.

43. **චිත්ත සම්පයුත්තා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සිත සමග මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

44. **චිත්ත විප්පයුත්තා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සිත සමග මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

45. **චිත්ත සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දෙපණස් චෛතසික ධර්මයෝ ලැබෙන්නාහ.

46. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

47. **චිත්ත විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

48. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකොළොසකි. ධාතු වශයෙන් එකොළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

49. ආදිලබ්ධ නාම දුකයකි. එකුන්අනූ (89) චිත්තය ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**චිත්ත සම්පයුත්ත දුකය යි.**

## 5. චිත්ත සංසට්ඨ දුකය

50. **චිත්ත සංසට්ඨා ධම්මා - චිත්ත විසංසට්ඨා ධම්මා'ති.**

51. චිත්ත සම්පයුත්ත දුකයට අනතුරුව **චිත්ත සංසට්ඨ දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්ත සංසට්ඨා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්ත විසංසට්ඨා ධම්මා** යනුවෙනි.

52. **චිත්ත සංසට්ඨා ධම්මා** - ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් සිත සමග මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

53. **චිත්ත විසංසට්ඨා ධම්මා** - ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් සිත සමග මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(චිත්ත සම්පයුත්ත දුකයට සමානය. පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. එකුන්අනූ (89) චිත්තය ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.)

**චිත්ත සංසට්ඨ දුකය යි.**

## 6. චිත්ත සමුට්ඨාන දුකය

54. **චිත්ත සමුට්ඨානා ධම්මා - නෝ චිත්ත සමුට්ඨානා ධම්මා'ති.**

55. චිත්ත සංසට්ඨ දුකයට අනතුරුව **චිත්ත සමුට්ඨාන දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්ත සමුට්ඨානා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ චිත්ත සමුට්ඨානා ධම්මා** යනුවෙනි.

56. **චිත්ත සමුට්ඨානා ධම්මා** - සිත හේතු කොට හටගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

57. **නෝ චිත්ත සමුට්ඨානා ධම්මා** - සිත හේතු කොට හට නොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

58. **චිත්ත සමුට්ඨානා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් චෛතසික දෙපණස ද, චිත්තජ රූප සතළොස ද ලැබෙන්නාහ.

59. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් සයකි. ධාතු වශයෙන් සයකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

60. **නෝ චිත්ත සමුට්ඨානා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, කර්මජ රූප විස්ස ද, උතුජ රූප පසළොස ද, ආහාරජ රූප තුදුස ද, ජරතා අනිච්චතා රූපද්වය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

61. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**චිත්ත සමුට්ඨාන දුකය යි.**

## 7. චිත්ත සහභූ දුකය

62. **චිත්ත සහභුනෝ ධම්මා - නෝ චිත්ත සහභුනෝ ධම්මා’ති.**

63. චිත්ත සමුට්ඨාන දුකයට අනතුරුව **චිත්ත සහභූ දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්ත සහභුනෝ ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ චිත්ත සහභුනෝ ධම්මා** යනුවෙනි.

64. **චිත්ත සහභුනෝ ධම්මා** - සිත හා සමග එකට හටගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

65. **නෝ චිත්ත සහභුනෝ ධම්මා** - සිත හා සමග එකට හට නොගන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

66. **චිත්ත සහභුනෝ ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් චෛතසික දෙපණස ද, විඥ්ඤත්ති රූප දෙක ද ලැබෙන්නාහ.

67. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

68. **නෝ චිත්ත සහභුනෝ ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, විඥ්ඤත්ති රූප වර්ජිත සවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

69. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**චිත්ත සහභූ දුකය යි.**

## 8. චිත්තානුපරිවත්ති දුකය

70. **චිත්තානුපරිවත්තිනෝ ධම්මා - නෝ චිත්තානුපරිවත්තිනෝ ධම්මා'ති.**

71. චිත්ත සහභූ දුකයට අනතුරුව **චිත්තානුපරිවත්ති දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්තානුපරිවත්තිනෝ ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ චිත්තානුපරිවත්තිනෝ ධම්මා** යනුවෙනි.

72. **චිත්තානුපරිවත්තිනෝ ධම්මා** - සිත හා සමග හට ගෙන සිත සමගම පෙරළෙන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

73. **නෝ චිත්තානුපරිවත්තිනෝ ධම්මා** - සිත හා සමග හට නොගෙන සිත සමගම නොපෙරළෙන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(චිත්ත සහභූ දුකයටම සමානය. ඒ අනුවම ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**චිත්තානුපරිවත්ති දුකය යි.**

## 9. චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය

74. **චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා - නෝ චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා'ති.**

75. චිත්තානුපරිවත්ති දුකයට අනතුරුව **චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා** යනුවෙනි.

76. **චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සිත හා සමග මිශ්‍ර වූ ද, සිත නිසා හටගන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

77. **නෝ චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් සිත හා සමග මිශ්‍ර නො වූ ද, සිත නිසා හට නොගන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(චේතසික දුකයට සම්පූර්ණයෙන් සමානය. පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**චිත්ත සංසට්ඨ සමුට්ඨාන දුකය යි.**

## 10. චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ දුකය

78. **චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනෝ ධම්මා - නෝ චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූනෝ ධම්මා'ති.**

79. **චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූනෝ ධම්මා** - සිත සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, සිත නිසා හටගන්නා වූ ද, සිත සමග හට ගන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

80. **නෝ චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූනෝ ධම්මා** - සිත සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, සිත නිසා හට නොගන්නා වූ ද, සිත සමග හට නොගන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(චේතසික දුකයට සම්පූර්ණයෙන් සමානය. පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූ දුකය යි.**

## 11. චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්ති දුකය

81. **චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්තිනෝ ධම්මා - නෝ චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්තිනෝ ධම්මා'ති.**

82. **චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්තිනෝ ධම්මා** - සිත හා සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, සිත නිසා හට ගන්නා වූ ද, සිත

අනුව පෙරළෙන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

83. **නෝ චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්තිනෝ ධම්මා** - සිත හා සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, සිත නිසා හට නොගන්නා වූ ද, සිත අනුව නොපෙරළෙන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(චේතසික දුකයට අනුවම ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**චිත්ත සංසට්ඨ සමුට්ඨානානුපරිවත්ති දුකය යි.**

## 12. අජ්ඣත්තික දුකය

84. **අජ්ඣත්තිකා ධම්මා - බාහිරා ධම්මා'ති.**

85. **අජ්ඣත්තිකා ධම්මා** - ආත්මභාවය අධිපති කොට ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

86. **බාහිරා ධම්මා** - ආත්මභාවය අධිපති කොට නැත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

87. **අජ්ඣත්තිකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අධ්‍යාත්මික ආයතන සයට ඇතුළත් වූ එකුන්අනූ (89) චිත්තය ද, ප්‍රසාද රූප පස ද ලැබෙන්නාහ.

88. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් දෙකකි. ආයතන වශයෙන් සයකි. ධාතු වශයෙන් දොළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

89. **බාහිරා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් චෛතසික දෙපණසෙ ද, ප්‍රසාද රූප වර්ජිත රූප තෙවිස්ස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

90. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් සයකි. ධාතු වශයෙන් සයකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**අජ්ඣත්තික දුකය යි.**

## 13. උපාදා දුකය

91. **උපාදා ධම්මා - නෝ උපාදා ධම්මා'ති.**

92. **උපාදා ධම්මා** - නිශ්‍රය, ආධාරය, පිහිට, පිළිසරණ නිසා හට ගන්නා වූ ද, පවත්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

93. **නෝ උපාදා ධම්මා** - නිශ්‍රය, ආධාරය, පිහිට, පිළිසරණ නිසා නොම හට ගන්නා වූ ද, නොම පවත්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

94. **උපාදා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටවිසි රූපය අතුරෙන් සතර මහා භූත රූප වර්ජිත වූ උපාදා රූප සූවිස්ස ලැබෙන්නාහ.

95. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් දසයකි. ධාතු වශයෙන් දසයකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

96. **නෝ උපාදා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, භූත රූප සතර ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

97. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් තුනකි. ධාතු වශයෙන් නවයකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**උපාදා දුකය යි.**

## 14. උපාදින්න දුකය

98. **උපාදින්නා ධම්මා - අනුපාදින්නා ධම්මා'ති.**

99. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ උපාදා දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **උපාදින්න දුකය** වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **උපාදින්නා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය

පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනුපාදින්නා ධම්මා** යනුවෙනි.

100. **උපාදින්නා ධම්මා** - තෘෂ්ණා දෘෂ්ටින් විසින් ගන්නා ලද අරමුණක් අනුව කර්ම ක්ලේශයන් විසින් ස්වකීය ඵලය වශයෙන් ළඟා කොට ගන්නා ලද්දා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

101. **අනුපාදින්නා ධම්මා** - තෘෂ්ණා දෘෂ්ටින් විසින් ගන්නා ලද අරමුණක් අනුව කර්ම ක්ලේශයන් විසින් ස්වකීය ඵලය වශයෙන් ළඟා කොට නොගන්නා ලද්දා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

102. **උපාදින්නා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික විපාක සිත් දෙතිස ද, තත් සම්ප්‍රයුක්ත වූ චෛතසික පන්තිස ද, කර්මජ රූප විස්ස ද ලැබෙන්නාහ.

103. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් එකොළොසකි. ධාතු වශයෙන් සතළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

104. **අනුපාදින්නා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික විපාක සිත් වර්ජිත ඉතිරි සිත් සත්පණස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, චිත්තජ රූප සතළොස ද, උතුජ රූප පසළොස ද, ආහාරජ රූප තුදුස ද, ජරතා අනිච්චතා රූපද්වය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

105. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් සතකි. ධාතු වශයෙන් අටකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**උපාදින්න දුකය යි.**

## පද විවරණය

1. **මහන්තර දුකය** - ගොච්ඡක අතරතුර ඇත්තා වූ, ගොච්ඡක නම් නො වූ දුක මාතිකා කොටස් තුනක් ඇත. එයින් මාතිකා පද සතකින් යුක්ත වූ වාරය චුල්ලන්තර දුකය කියා ද, මාතිකා පද දහහතරකින් යුක්ත වූ වාරය මහන්තර දුකය කියාද හැඳින්වේ.

මාතිකා පද අටළොසක් (18) ඇත්තා වූ අන්තිම වාරය පිට්ඨි දුකය නම් වේ.

2. **චිත්ත සංසට්ඨ** - සිත සමග මිශ්‍ර වූ ධර්ම දෙපණස චෛතසිකයෝ ය. සිත සමග එකට ඉපදීම, එකට නිරුද්ධ වීම, එකම අරමුණක් ගැනීම හා එකම වස්තුවක පැවතීම යන ලක්‍ෂණ සතරින් යුක්ත වූ චෛතසික පමණක් චිත්ත සංසට්ඨ නම් වෙති. චිත්තජ රූප වනාහි සිත සමග එකට උපදින නමුත් ඉහත සඳහන් සම්ප්‍රයෝග ලක්‍ෂණ සතරින් ම යුක්ත නොවන බැවින් චිත්ත සංසට්ඨ නම් නොවෙති.

3. **චිත්ත සමුට්ඨාන** - මෙහි පළමු පදයට චිත්තජ රූප සතළොසක් ගැනෙති. එහෙත් ඒ සතළොස අතුරෙන් විඤ්ඤත්ති රූප දෙක හැර ඉතිරි රූප පසළොස කර්මජ - උතුජ - ආහාරජ රූප කොටස් වලට ද අදාළ පරිදි ඇතුලත් වෙති. අන්‍යසමාන චෛතසික මෙනි.

4. **අජ්ඣත්තික** - තික මාතිකාවෙහි අජ්ඣත්ත ත්‍රිකයෙහි ද මේ දුක මාතිකාවේ අජ්ඣත්තික දුකයෙහි ද වෙනසක් ඇත. අජ්ඣත්තික පදයෙහි අර්ථ සතරක් ඇත. 1.ගෝචරජ්ඣත්තය 2.නියකජ්ඣත්ත 3.අජ්ඣත්තජ්ඣත්ත 4.විසයජ්ඣත්ත නමිනි. එයින් ගෝචරජ්ඣත්තය යනු රූප ශබ්ද ආදී අරමුණු සයට නමකි. නියකජ්ඣත්ත යනු ස්වකීය සන්තානයට ඇතුළත් නාමරූප සියල්ලට නමකි. අජ්ඣත්තජ්ඣත්ත යනු චක්ඛායතනාදී අධ්‍යාත්මික ආයතන සයට නමකි. විසයජ්ඣත්ත යනු ලෝකෝත්තර ඵල සමාපත්ති යයි.

   ඔවුනතුරෙන් අජ්ඣත්ත ත්‍රිකයෙහි ගැනෙනුයේ නියකජ්ඣත්ත බැවින් ස්වසන්තාන ගත නාම රූප සියල්ල ඇතුලත් වෙයි. මෙහි අජ්ඣත්තික දුකයෙහි වනාහි, අජ්ඣත්තජ්ඣත්තය ගැනෙන බැවින් චක්ඛායතනාදී ප්‍රසාද ආයතන පසත්, මනායතනයත් ඇතුළත් වන බව දතයුතු.

## ත්‍රිලක්‍ෂණ විදර්ශනාව

1. මහන්තර දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපත්‍යයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**මහන්තර දුකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 11 වැනි පාඩම

## උපාදාන ගොච්ඡකය (දුක 6)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. උපාදාන දුකය

1. **උපාදානා ධම්මා - නෝ උපාදානා ධම්මා'ති.**

2. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ මහන්තර දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **උපාදාන ගොච්ඡකය** දේශනා කොට වදාළ සේක. එයද උපාදාන දුකාදී වශයෙන් සය වැදෑරුම් වන්නේ ය.

3. ඔවුනතුරෙන් **උපාදාන දුකය** පළමු කොට වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **උපාදානා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ උපාදානා ධම්මා** යනුවෙනි.

4. **උපාදානා ධම්මා** - මම මාගේ යයි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් දැඩි කොට අල්වා ගන්නා අර්ථයෙන් උපාදාන නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

5. **නෝ උපාදානා ධම්මා** - මම මාගේ යයි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් දැඩි කොට අල්වා නොගන්නා බැවින් උපාදාන නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

6. **උපාදානා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි නම් වූ චෛතසික දෙදෙන ලැබෙන්නාහ.

7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

8. **නෝ උපාදානා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකූන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි වර්ජිත සමපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**උපාදාන දුකය යි.**

## 2. උපාදානීය දුකය

10. **උපාදානීයා ධම්මා - අනුපාදානීයා ධම්මා'ති.**

11. **උපාදානීයා ධම්මා** - තෘෂ්ණා දෘෂ්ටි නම් වූ උපාදානයන්ට අරමුණු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

12. **අනුපාදානීයා ධම්මා** - තෘෂ්ණා දෘෂ්ටි නම් වූ උපාදානයන්ට අරමුණු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

13. **උපාදානීයා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

15. **අනුපාදානීයා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

16. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**උපාදානීය දුකය යි.**

## 3. උපාදාන සම්පයුත්ත දුකය

17. **උපාදාන සම්පයුත්තා ධම්මා - උපාදාන විප්පයුත්තා ධම්මා'ති.**

18. **උපාදාන සම්පයුත්තා ධම්මා** - තෘෂ්ණා දෘෂ්ටි උපාදානයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

19. **උපාදාන විප්පයුත්තා ධම්මා** - තෘෂ්ණා දෘෂ්ටි උපාදානයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

20. **උපාදාන සම්පයුත්තා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල අකුසල් සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා සහ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය වර්ජිත චෛතසික දෙවිස්ස ද ලැබෙන්නාහ.

21. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

22. **උපාදාන විප්පයුත්තා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල සිත් වර්ජිත එක්අසූ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි මාන වර්ජිත එකුන්පණස් චෛතසිකය ද, ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

23. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**උපාදාන සම්පයුත්ත දුකය යි.**

## 4. උපාදාන උපාදානීය දුකය

24. **උපාදානා චේව ධම්මා උපාදානීයා ච - උපාදානීයා චේව ධම්මා නෝ ච උපාදානා'ති.**

25. **උපාදානා චේව ධම්මා උපාදානීයා ච** - උපාදාන නම් වූ ද, උපාදානයන් හට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

26. **උපාදානීයා චේව ධම්මා නෝ ච උපාදානා** - උපාදානයන් හට අරමුණු වන්නා වූ ද, එහෙත් උපාදාන නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

27. **උපාදානා චේව ධම්මා උපාදානීයා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි නම් වූ චෛතසික දෙක ලැබෙන්නාහ.

28. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

29. **උපාදානීයා චේව ධම්මා නෝ ච උපාදානා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි වර්ජිත චෛතසික සමපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

30. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

31. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම ඇතුළත් නො වූ බැවින් සප්පදේස දුකයකි.

**උපාදාන උපාදානීය දුකය යි.**

## 5. උපාදාන උපාදාන සම්පයුත්ත දුකය

32. **උපාදානා චේව ධම්මා උපාදාන සම්පයුත්තා ච - උපාදාන සම්පයුත්තා චේව ධම්මා නෝ ච උපාදානා'ති.**

33. **උපාදානා චේව ධම්මා උපාදාන සම්පයුත්තා ච** - උපාදාන නම් වූ ද, උපාදානයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

34. **උපාදාන සම්පයුත්තා චේව ධම්මා නෝ ච උපාදානා** - උපාදානයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, එහෙත් උපාදාන නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

35. **උපාදානා චේව ධම්මා උපාදාන සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි වූ ලෝභ දිට්ඨි නම් වූ උපාදාන ධර්මයෝ ලැබෙන්නාහ.

36. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප පෙරසේ උදුරනු.)

37. **උපාදාන සම්පයුත්තා චේව ධම්මා නෝ ච උපාදානා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි වර්ජිත චෛතසික සමවිස්ස ද ලැබෙන්නාහ.

38. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

39. ආදිලබ්ධ නාම දුකයකි. ලෝභ මූල සිත් වර්ජිත එක්අසූ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත එකුන්පණස් චෛතසිකය ද, ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද මෙහි ඇතුලත් නො වූ බැවින් සප්පදේස දුකයකි.

**උපාදාන උපාදාන සම්පයුත්ත දුකය යි.**

## 6. උපාදාන විප්පයුත්ත උපාදානීය දුකය

40. **උපාදාන විප්පයුත්තා ඛෝ පන ධම්මා උපාදානීයාපි - උපාදාන විප්පයුත්තා ඛෝ පන ධම්මා අනුපාදානීයාපී'ති.**

41. **උපාදාන විප්පයුත්තා ඛෝ පන ධම්මා උපාදානීයාපි** - උපාදානයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් උපාදානයන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

42. **උපාදාන විප්පයුත්තා බෝ පන ධම්මා අනුපාදානීයාපි** - උපාදානයන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, උපාදානයන්ට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

43. **උපාදාන විප්පයුත්තා බෝ පන ධම්මා උපාදානීයාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ මූල සිත් වර්ජිත ලෞකික සිත් තෙසැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ දිට්ඨි මාන වර්ජිත චෛතසික එකුන්පණස ද, ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

44. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

45. **උපාදාන විප්පයුත්තා බෝ පන ධම්මා අනුපාදානීයාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

46. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. ලෝභ මූල සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි ලෝභය වර්ජිත චෛතසික දෙවිස්ස ද ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.)

**උපාදාන විප්පයුත්ත උපාදානීය දුකය යි.**

## පද විවරණය

1. **උපාදාන** - උප + ආදාන = උපාදාන, දැඩි කොට ගැනීම් අර්ථය කියවේ. උපාදානය බෙදීම් වශයෙන් සතරාකාරය. 1. කාමූපාදානය, 2. දිට්ඨූපාදානය, 3. සීලබ්බතූපාදානය. 4. අත්තවාදූපාදානය යනුවෙනි. මෙහි 2, 3, 4 යන වාර තුනම දිට්ඨියට අයත්ය. එහෙයින් තෘෂ්ණාවත් දෘෂ්ටියත් යන දෙක පරමාර්ථ වශයෙන් උපාදාන නම් වෙයි.

2. **උපාදානීය** - උපාදානයන්ට හිත වූ, උපාදානයන්ට අරමුණු වූ ධර්මයෝ ය. ලෞකික චිත්ත චෛතසික රූප සියල්ලම උපාදානයන්ට ගොදුරුය. එහෙයින් උපාදානස්කන්ධ පසම උපාදානීය නම් වෙති.

3. උපාදානයාගේ ලක්ෂණය හෙවත් ස්වභාව, දැඩිව අල්වා ගැනීමය. එහි රසය හෙවත් කෘත්‍යය, අල්වා ගත් දේ අත නොහැරීමය. එහි පච්චුපට්ඨානය හෙවත් සිතට වැටහෙන ආකාරය වනුයේ, අධික තෘෂ්ණා අධික දෘෂ්ටි වශයෙනි. එයට පදට්ඨානය හෙවත් ආසන්නම හේතුව වනුයේ, නොලද සම්පත් පැතීමේ ආශාවය.

4. භවයෙන් භවයට ස්කන්ධ පරම්පරාව ගෙන යන්නා වූ අවිජ්ජා තණ්හා උපාදාන සංස්කාර කර්ම යන හේතු අතර උපාදානය එක හේතුවකි.

# ත්‍රිලක්‍ෂණ විදර්ශනාව

1. උපාදාන ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.
2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.
8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**උපාදාන ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

# 12 වැනි පාඩම

## කිලේස ගොච්ඡකය (දුක 8)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. කිලේස දුකය

1. **කිලේසා ධම්මා - නෝ කිලේසා ධම්මා'ති.**
2. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ උපාදාන ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **කිලේස ගොච්ඡකය** දේශනා කොට වදාළ සේක. එයද කිලේස දුකාදීන්ගේ වශයෙන් අට වැදෑරුම් වන්නේ ය.
3. ඔවුනතුරෙන් **කිලේස දුකය** පළමු කොට වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **කිලේසා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නෝ කිලේසා ධම්මා** යනුවෙනි.
4. **කිලේසා ධම්මා** - සත්ව සන්තානය කෙලෙසන්නා වූ ද, දවන තවන උපතාපනය හිංසන පීඩන කරන්නා වූ ද අර්ථයෙන් ක්ලේශ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
5. **නෝ කිලේසා ධම්මා** - සත්ව සන්තානය නොකෙලෙසන්නා වූ ද, දවන තවන උපතාපනය හිංසන පීඩන නොකරන්නා වූ ද අර්ථයෙන් ක්ලේශ නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
6. **කිලේසා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝභ, දෝස, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන ක්ලේශ වස්තු නම් වූ දස චෛතසිකයෝ ලැබෙන්නාහ.

7. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

8. **නෝ කිලේසා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකුන්අනූ (89) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දශ ක්ලේශ ධර්මයෝ වර්ජිත චෛතසික දෙසාළිස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**කිලේස දුකය යි.**

## 2. සංකිලේස දුකය

10. **සංකිලේසිකා ධම්මා - අසංකිලේසිකා ධම්මා'ති.**

11. **සංකිලේසිකා ධම්මා** - කෙලෙසුන් හට අරමුණු වන්නා වූ හෙවත් කෙලෙසුන් හට ගොදුරු වන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

12. **අසංකිලේසිකා ධම්මා** - කෙලෙසුන් හට අරමුණු නොවන්නා වූ හෙවත් කෙලෙසුන්ට ගොදුරු නොවන්නා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

13. **සංකිලේසිකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

15. **අසංකිලේසිකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

16. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සංකිලේස දුකය යි.**

## 3. සංකිලිට්ඨ දුකය

17. **සංකිලිට්ඨා ධම්මා - අසංකිලිට්ඨා ධම්මා'ති.**

18. **සංකිලිට්ඨා ධම්මා** - කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දා වූ හෙවත් සංකිලිට්ඨ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

19. **අසංකිලිට්ඨා ධම්මා** - කෙලෙසුන් විසින් නොකෙලෙසන ලද්දා වූ හෙවත් අසංකිලිට්ඨ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

20. **සංකිලිට්ඨා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ.

21. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

22. **අසංකිලිට්ඨා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

23. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සංකිලිට්ඨ දුකය යි.**

## 4. කිලේස සම්පයුත්ත දුකය

24. **කිලේස සම්පයුත්තා ධම්මා - කිලේස විප්පයුත්තා ධම්මා'ති.**

25. **කිලේස සම්පයුත්තා ධම්මා** - කෙලෙසුන් සමග ඒකෝත්පාදාදී සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

26. **කිලේස විප්පයුත්තා ධම්මා** - කෙලෙසුන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(සංකිලිට්ඨ දුකය මෙනි. ඒ අනුව ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**කිලේස සම්පයුත්ත දුකය යි.**

## 5. කිලේස සංකිලේසික දුකය

27. **කිලේසා චේව ධම්මා සංකිලේසිකා ච - සංකිලේසිකා චේව ධම්මා නෝ ච කිලේසා'ති.**

28. **කිලේසා චේව ධම්මා සංකිලේසිකා ච** - කෙලෙස් නම් වූ ද, කෙලෙසුන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

29. **සංකිලේසිකා චේව ධම්මා නෝ ච කිලේසා** - කෙලෙසුන්ට අරමුණු වන්නා වූ ද, එහෙත් කෙලෙස් නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

30. **කිලේසා චේව ධම්මා සංකිලේසිකා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දශ ක්ලේශ ධර්මයෝ ලැබෙන්නාහ.

31. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

32. **සංකිලේසිකා චේව ධම්මා නෝ ච කිලේසා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව

ද, තත් සම්ප්‍රයුක්ත දශ කෙලෙස් වර්ජිත දෙසාලිස් චෛතසිකය ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

33. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

34. ආදිලබ්ධ නාම දුකයකි. ලෝකෝත්තර ධර්ම ඇතුළත් නො වූ බැවින් සප්පදේස දුකයකි.

**කිලේස සංකිලේසික දුකය යි.**

## 6. කිලේස සංකිලිට්ඨ දුකය

35. **කිලේසා චේව ධම්මා සංකිලිට්ඨා ච - සංකිලිට්ඨා චේව ධම්මා නෝ ච කිලේසා'ති.**

36. **කිලේසා චේව ධම්මා සංකිලිට්ඨා ච** - කෙලෙස් නම් වූ ද, කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

**37. සංකිලිට්ඨා චේව ධම්මා නෝ ච කිලේසා** - කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දා වූ ද, එහෙත් කෙලෙස් නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

38. **කිලේසා චේව ධම්මා සංකිලිට්ඨා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දශ ක්ලේශ ධර්මයෝ ලැබෙන්නාහ.

39. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (ස්වරූප පෙරසේ උදුරනු.)

40. **සංකිලිට්ඨා චේව ධම්මා නෝ ච කිලේසා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත දශ කෙලෙස් වර්ජිත චෛතසික සතළොස ද ලැබෙන්නාහ.

41. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

42. ආදිලබ්ධ නාම දුකයකි. දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද මෙහි ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**කිලේස සංකිලිට්ඨ දුකය යි.**

## 7. කිලේස කිලේස සම්පයුත්ත දුකය

43. **කිලේසා චේව ධම්මා කිලේස සම්පයුත්තා ච - කිලේස සම්පයුත්තා චේව ධම්මා නෝ ච කිලේසා'ති.**

44. **කිලේසා චේව ධම්මා කිලේස සම්පයුත්තා ච** - කෙලෙස් නම් වූ ද, කෙලෙසුන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

**45. කිලේස සම්පයුත්තා චේව ධම්මා නෝ ච කිලේසා** - කෙලෙසුන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ ද, එහෙත් කෙලෙස් නම් නො වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

46. **කිලේසා චේව ධම්මා කිලේස සම්පයුත්තා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දශ ක්ලේශ ධර්මයෝ ලැබෙන්නාහ.

47. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකකි. ආයතන වශයෙන් එකකි. ධාතු වශයෙන් එකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

48. **කිලේස සම්පයුත්තා චේව ධම්මා නෝ ච කිලේසා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත දශ කෙලෙස් වර්ජිත චෛතසික සතළොස ද ලැබෙන්නාහ.

49. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු. සියල්ලම කිලේස සංකිලිට්ඨ දුකයට සමානය.)

50. ආදිලබ්ධ නාම දුකයකි. දොළොස් අකුසල් සිත් වර්ජිත සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද මෙහි ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**කිලේස කිලේස සම්පයුත්ත දුකය යි.**

## 8. කිලේස විප්පයුත්ත සංකිලේසික දුකය

51. **කිලේස විප්පයුත්තා ඛෝ පන ධම්මා සංකිලේසිකාපි - කිලේස විප්පයුත්තා ඛෝ පන ධම්මා අසංකිලේසිකාපී'ති.**

52. **කිලේස විප්පයුත්තා ඛෝ පන ධම්මා සංකිලේසිකාපි** - කෙලෙසුන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, එහෙත් කෙලෙසුන්ට අරමුණු වන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

53. **කිලේස විප්පයුත්තා ඛෝ පන ධම්මා අසංකිලේසිකාපි** - කෙලෙසුන් සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර නො වූ ද, කෙලෙසුන්ට අරමුණු නොවන්නා වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

54. **කිලේස විප්පයුත්තා ඛෝ පන ධම්මා සංකිලේසිකාපි** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

55. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

56. **කිලේස විප්පයුත්තා ඛෝ පන ධම්මා අසංකිලේසිකාපි** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

57. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

58. ආදිලබ්ධ නාම දුකයකි. අකුසල ධර්ම ඇතුළත් නොවන බැවින් සප්පදේස දුකයකි.

**කිලේස විප්පයුත්ත සංකිලේසික දුකය යි.**

## පද විවරණය

1. **කිලේසා** - අකුසල කර්ම සිදු කෙරෙන කල්හිද, එහි විපාකය අපායාදියෙහි විඳින කල්හි ද, සිත් සතන් දවන තවන උපතාපන හිංසන පීඩන කරවන බැවින් චෛතසික දශයක් කෙලෙස් නමින් හැඳින්වෙති. දශ කෙලෙස් බෙදි බෙදී ගොස් කෙලෙස් එක් දහස් පන් සියයක් පමණ ප්‍රභේද වෙති.

2. **සංකිලේසිකා** - කෙලෙසුන්ට හිත වූ ද, අරමුණු වූ ද, ගොදුරු වූ ද, ලෞකික ධර්ම සියල්ලට නමකි. ලෝකෝත්තර චිත්ත චෛතසික නිර්වාණ ධර්ම කිසිවක් කෙලෙසුන්ට අරමුණු නොවෙති.

3. **සංකිලිට්ඨා** - කෙලෙසුන් සමග මිශ්‍ර වූ සියලු අකුසලයන්ට නමකි. අන්‍යසමාන චෛතසික තෙළෙස ද කෙලෙසුනට මිශ්‍ර වූ විට සංකිලිට්ඨ නම් ලබති.

4. **කිලේස සම්පයුත්තා** - සංකිලිට්ඨ පදයට සමාන අර්ථ ඇති පදයකි. දේශනා විලාශ වශයෙන් හා වේනෙය්‍ය අධ්‍යාශ වශයෙන් මෙසේ දේශනා කොට ඇත.

5. **නිප්පදේස** - මෙම කිලේස ගොච්ඡකයෙන් මුල් දුක පද සතරම සියලු පරමාර්ථ ධර්ම ඇතුලත් බැවින් නිප්පදේස නම් වෙති.

6. **සප්පදේස** - 5, 6, 7, 8 දුක පද වනාහි පරමාර්ථ සියල්ල ඇතුලත් නො වූ බැවින් සප්පදේස නම් වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. කිලේස ගොච්ඡක දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**කිලේස ගොච්ඡකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## 13 වැනි පාඩම

## පිට්ඨී දුකය (දුක 18) - 1 වැනි කොටස (01-14)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. දස්සනේන පහාතබ්බ දුකය

1. **දස්සනේන පහාතබ්බා ධම්මා - න දස්සනේන පහාතබ්බා ධම්මා'ති.**
2. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ කිලේස ගොච්ඡකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **පිට්ඨී දුකය** දේශනා කොට වදාළ සේක. එය ද දස්සනේන පහාතබ්බ දුකාදීන් ගේ වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නේ ය.
3. ඔවුනතුරෙන් **දස්සනේන පහාතබ්බ දුකය** පළමු කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **දස්සනේන පහාතබ්බා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **න දස්සනේන පහාතබ්බා ධම්මා** යනුවෙනි.
4. **දස්සනේන පහාතබ්බා ධම්මා** - සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කටයුතු වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
5. **න දස්සනේන පහාතබ්බා ධම්මා -** සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය නොකටයුතු වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
6. **දස්සනේන පහාතබ්බා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වන්නා වූ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල විචිකිච්ඡා සහගත චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත චෛතසික දෙවිස්ස ද,

7. සෝවාන් මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ අපායගාමී ශක්තිය ඇත්තා වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද යන

8. අකුසල් සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ද ලැබෙන්නාහ.

9. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

10. **න දස්සනේන පහාතබ්බා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන්ම ප්‍රහාණය වන්නා වූ ධර්මයන් වර්ජිත කොට, සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය නොවන්නා වූ අපායගාමී ශක්තියෙන් තොර වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, දෝස මූල දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

11. සෝවාන් මාර්ගයෙන් ඒකාන්තයෙන් ප්‍රහාණය නොවන්නා වූ මෝහ මූල උද්ධච්ච සහගත සිත ද, තත් සම්ප්‍රයුක්ත පසළොස් චෛතසිකය ද,

12. දොළොස් අකුසල් වර්ජිත සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද යන

13. සිත් සූවාසූව (84) ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත චෛතසික සමපණස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

14. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**දස්සනේන පහාතබ්බ දුකය යි.**

## 2. භාවනාය පහාතබ්බ දුකය

15. **භාවනාය පහාතබ්බා ධම්මා - න භාවනාය පහාතබ්බා ධම්මා'ති.**

16. **භාවනාය පහාතබ්බා ධම්මා** - සකදාගාමී අනාගාමී අර්හත් යන මතු මාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතු වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

17. **න භාවනාය පහාතබ්බා ධම්මා** - මතු මාර්ගත්‍රයෙන් ප්‍රහාණය නොකටයුතු වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

18. **භාවනාය පහාතබ්බා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සකදාගාමී මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ ඖදාරික කාමරාගයෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත අකුසල් සිත් සතර ද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල අකුසල් සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

19. අනාගාමී මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ කාමරාගයෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

20. අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජාවන් සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල උද්ධච්ච සහගත චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත එක්විසි චෛතසිකය ද යන

21. අකුසල් සිත් සත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා දෙක වර්ජිත පස්විසි චෛතසිකය ද ලැබෙන්නාහ.

22. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

23. **න භාවනාය පහාතබ්බා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන් නිරවශේෂව ප්‍රහාණය වන ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල විචිකිච්ඡා සහගත සිත ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත චෛතසික දෙවිස්ස ද,

24. සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය වන අපායගාමී ශක්තියෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, ද්වේෂ මූල දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

25. දොළොස් අකුසල් වර්ජිත ඉතිරි සිත් සත්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද යන

26. සිත් අටඅසූව (88) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

27. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**භාවනාය පහාතබ්බ දුකය යි.**

## 3. දස්සනේන පහාතබ්බ හේතුක දුකය

28. **දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා - න දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා'ති.**

29. **දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා** - සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

30. **න දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා** - සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

31. **දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝතාපත්ති මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල විචිකිච්ඡා සහගත චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච සහ විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද වර්ජිත ඉතිරි දෙවිසි චෛතසිකය ද,

32. සෝතාපත්ති මාර්ගයෙන් තුනී කටයුතු වූ අපායගාමිනී ශක්තිය ඇති ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද යන

33. අකුසල් සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ද ලැබෙන්නාහ.

34. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

35. **න දස්සනේන පහාතබ්බ හේතුකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන්ම ප්‍රහාණය වන්නා වූ ධර්මයන් වර්ජිත කොට, සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය නොවන්නා වූ අපායගාමී ශක්තියෙන් තොර වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, දෝස මූල දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

36. සෝවාන් මගින් ප්‍රහාණය නොවන මෝහ මූල උද්ධච්ච සහගත සිත ද, තත් සම්ප්‍රයුක්ත පසළොස් චෛතසිකය ද,

37. දොළොස් අකුසල් වර්ජිත ඉතිරි සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද යන

38. සිත් සුවාසූව (84) ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත චෛතසික සමපණස ද,

විචිකිච්ඡා සහගත සිතෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

35. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**දස්සනේන පහාතබ්බ හේතුක දුකය යි.**

## 4. භාවනාය පහාතබ්බ හේතුක දුකය

36. **භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා - න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා'ති.**

37. **භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** - සකදාගාමී අනාගාමී අර්හත් නම් වූ මාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතු හේතු ඇත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

38. **න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** - මතු මාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතු හේතු නැත්තා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

39. **භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සකදාගාමී මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතු වූ ඖදාරික කාමරාගයෙන් යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

40. අනාගාමී මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ කාමරාගයෙන් යුක්ත වූ යුක්ත වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, පටිඝයෙන් යුක්ත වූ දෝස මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

41.අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතු වූ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිද්‍යාවන් සමග යෙදුනා වූ ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, මෝහ මූල උද්ධච්ච සහගත සිත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච සහ උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත එක්විසි චෛතසිකය ද යන

42.අකුසල් සිත් සත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා සහ උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත පස්විසි චෛතසිකය ද ලැබෙන්නාහ.

43.ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

44.**න භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් මාර්ගයෙන් ඒකාන්තයෙන් ප්‍රහාණය කටයුතු වන දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතර ද, විචිකිච්ඡා සහගත සිත ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත චෛතසික දෙවිස්ස ද,

45.සෝවාන් මාර්ගයෙන් අනේකාන්තයෙන් ප්‍රහාණය කටයුතු වූ අපායගාමී ශක්තියෙන් යුක්ත වූ දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතර ද, ද්වේෂ මූල දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ද,

45.දොළොස් අකුසල් සිත් වර්ජිත අවශේෂ සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද යන

46.සිත් අටඅසූව (88) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද,

උද්ධච්ච සහගත සිතෙහි මෝහය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

47.ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන්

සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**භාවනාය පහාතබ්බ හේතුක දුකය යි.**

## 5. සවිතක්ක දුකය

48. **සවිතක්කා ධම්මා - අවිතක්කා ධම්මා'ති.**

49. **සවිතක්කා ධම්මා** - විතර්කය සමග සම්ප්‍රයුක්ත වන බැවින් සවිතක්ක නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

50. **අවිතක්කා ධම්මා** - විතර්කය සමග සම්ප්‍රයුක්ත නො වූ අවිතක්ක නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

51. **සවිතක්කා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සවිතර්ක සිත් පස්පණස ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක වර්ජිත චෛතසික එක්පණස ද ලැබෙන්නාහ.

52. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප පෙරසේ උදුරනු.)

53. **අවිතක්කා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අවිතර්ක සිත් සසැට (66) ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක වර්ජිත චෛතසික සත්තිස (37) ද, සවිතර්ක සිත් පස්පණසෙහි (55) විතර්ක පස්පණස (55) ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

54. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් සතළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සවිතක්ක දුකය යි.**

## 6. සවිචාර දුකය

55. **සවිචාරා ධම්මා - අවිචාරා ධම්මා'ති.**

56. **සවිචාරා ධම්මා** - සම්ප්‍රයුක්ත වශයෙන් විචාරය සහිත වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

57. **අවිචාරා ධම්මා** - සම්ප්‍රයුක්ත වශයෙන් විචාරය රහිත වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

58. **සවිචාරා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සවිචාර සිත් සසැට ද, තත් සම්ප්‍රයුක්ත විචාර වර්ජිත චෛතසික එක්පණස ද ලැබෙන්නාහ.

59. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

60. **අවිචාරා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අවිචාර සිත් පස්පණස ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක විචාර වර්ජිත චෛතසික සතිස ද, සවිචාර සිත් සසැටෙහි විචාර චෛතසික සසැට ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

61. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් සතළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සවිචාර දුකය යි.**

## 7. සප්පීතික දුකය

62. **සප්පීතිකා ධම්මා - අප්පීතිකා ධම්මා'ති.**

63. **සප්පීතිකා ධම්මා** - සම්ප්‍රයුක්ත වශයෙන් ප්‍රීතිය සමග යෙදුනා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

64. **අප්පීතිකා ධම්මා** - සම්ප්‍රයුක්ත වශයෙන් ප්‍රීතිය රහිත වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

65. **සප්පීතිකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සප්පීතික සිත් එක්පණස ද, තත් සම්ප්‍රයුක්ත

ප්‍රීති දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත චෛතසික සසාලිස (46) ද ලැබෙන්නාහ.

66. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (ස්වරූප උදුරනු.)

67. **අප්පීතිකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අප්‍රීතික සිත් සමසැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත ප්‍රීති වර්ජිත එක්පණස් චෛතසිකය ද, සප්‍රීතික සිත් එක්පණසෙහි ප්‍රීති චෛතසික එක්පණස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

68. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සප්පීතික දුකය යි.**

## 8. පීති සහගත දුකය

69. **පීති සහගතා ධම්මා - න පීති සහගතා ධම්මා'ති.**

70. **පීති සහගතා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් ප්‍රීතිය සමග මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

71. **න පීති සහගතා ධම්මා** - ප්‍රීතිය සමග මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ. (ඉතිරි සියල්ල සප්පීතික දුකයට සමානය. පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**පීති සහගත දුකය යි.**

## 9. සුඛ සහගත දුකය

72. **සුඛ සහගතා ධම්මා - න සුඛ සහගතා ධම්මා'ති.**

73. **සුඛ සහගතා ධම්මා** - සුඛ වේදනාව සමග ඒකෝත්පාදාදී වශයෙන් මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

74. **න සුඛ සහගතා ධම්මා** - සුඛ වේදනාව සමග මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

75. **සුඛ සහගතා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සුඛ සහගත සිත් තෙසැට ද, තත් සම්ප්‍රයුක්ත වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත චෛතසික සසාලිස (46) ද ලැබෙන්නාහ.

76. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් තුනකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

77. **න සුඛ සහගතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දෝස මූල දෙසිත ද, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය ද, උපේක්ෂා සහගත සිත් පස්පණස ද, තත් සම්ප්‍රයුක්ත ප්‍රීති වර්ජිත එක්පණස් චෛතසිකය ද, සුඛ වේදනා තෙසැට ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

78. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සුඛ සහගත දුකය යි.**

## 10. උපේක්ඛා සහගත දුකය

79. **උපේක්ඛා සහගතා ධම්මා - න උපේක්ඛා සහගතා ධම්මා'ති.**

80. **උපේක්ඛා සහගතා ධම්මා** - ඒකෝත්පාදාදී වශයෙන් උපේක්ෂා වේදනාව සමග මිශ්‍ර වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

81. **න උපේක්ඛා සහගතා ධම්මා** - උපේක්ෂා වේදනාව සමග මිශ්‍ර නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

82. **උපේක්ඛා සහගතා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් උපේක්ෂා සහගත සිත් පස්පණස ද, තත් සම්ප්‍රයුක්ත ප්‍රීති වේදනා දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත චෛතසික සසාලිස (46) ද ලැබෙන්නාහ.

83. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුනකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් සතකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

84. **න උපේක්ඛා සහගතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සුඛ සහගත සිත් තෙසැට ද, දුක්ඛ සහගත සිත් තුන ද, තත් සම්ප්‍රයුක්ත විචිකිච්ඡා වර්ජිත චෛතසික එක්පණස ද, උපේක්‍ෂා සහගත සිත් පස්පණසෙහි උපේක්‍ෂා වේදනා පස්පණස ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

85. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් තෙළෙසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**උපේක්ඛා සහගත දුකය යි.**

## 11. කාමාවචර දුකය

86. **කාමාවචරා ධම්මා - න කාමාවචරා ධම්මා'ති.**

87. **කාමාවචරා ධම්මා** - කාම තණ්හාවට අරමුණු වන බැවින් ද, එකොළොස් කාමභූමියට ඇතුලත් බැවින් ද කාමාවචර නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

88. **න කාමාවචරා ධම්මා** - කාමාවචර නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

89. **කාමාවචරා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කාමාවචර සිත් සිව්පණස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

90. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

91. **න කාමාවචරා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මහග්ගත සහ ලෝකෝත්තර සිත් පන්තිස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

92. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**කාමාවචර දුකය යි.**

## 12. රූපාවචර දුකය

93. **රූපාවචරා ධම්මා - න රූපාවචරා ධම්මා'ති.**

94. **රූපාවචරා ධම්මා** - රූප භව තණ්හාවට අරමුණු වන්නා වූ ද, පසළොස් රූප භූමියට අයත් වූ ද, රූපාවචර නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

95. **න රූපාවචරා ධම්මා** - රූපාවචර නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

96. **රූපාවචරා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් රූපාවචර සිත් පසළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස ද ලැබෙන්නාහ.

97. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

98. **න රූපාවචරා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කාමාවචර අරූපාවචර සහ ලෝකෝත්තර යන සිත් සිව්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

99. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**රූපාවචර දුකය යි.**

## 13. අරූපාවචර දුකය

100. **අරූපාවචරා ධම්මා - න අරූපාවචරා ධම්මා'ති.**

101. **අරූපාවචරා ධම්මා** - අරූප භව තණ්හාවට අරමුණු වන්නා වූ ද, අරූපාවචර භූමියට ඇතුලත් වන බැවින් ද, අරූපාවචර නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

102. **න අරූපාවචරා ධම්මා** - අරූපාවචර නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

103. **අරූපාවචරා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අරූපාවචර සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සමතිස ද ලැබෙන්නාහ.

104. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

105. **න අරූපාවචරා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කාමාවචර රූපාවචර සහ ලෝකෝත්තර යන සිත් සත්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

106. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් සතරකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**අරූපාවචර දුකය යි.**

## 13. පරියාපන්න දුකය

107. **පරියාපන්නා ධම්මා - අපරියාපන්නා ධම්මා'ති.**

108. **පරියාපන්නා ධම්මා** - කර්මවට්ට විපාකවට්ට කිලේසවට්ට නම් වූ ත්‍රිවිධ සංසාර වට්ට දුක්ඛයට ඇතුළත් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

109. **අපරියාපන්නා ධම්මා** - ත්‍රිවිධ සංසාර වට්ට දුක්ඛයට ඇතුළත් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

110. **පරියාපන්නා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

111. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

112. **අපරියාපන්නා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

113. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**පරියාපන්න දුකය යි.**

**(15, 16, 17, 18 යන දුක පද සතර මතු පාඩමට ඇතුළත් වෙති.)**

## පද විවරණය

1. **දස්සන** - සෝවාන් මගට නමකි. පළමු කොට ආර්ය සත්‍ය දක්නා මාර්ගය බැවිනි.

2. **භාවනා** - යනු සකදාගාමී අනාගාමී අර්හත් යන මාර්ග තුනට නමකි. සෝවාන් මාර්ගයෙන් දක්නා ලද ආර්ය සත්‍යය නැවත නැවත වැඩියෙන් පිරිසිදුව දක්නා බැවිනි.

3. **අපායගාමිනී ශක්තිය** - යනු දිට්ඨිගත විප්‍රයුක්ත ලෝභ මූල සිත් සතරටත් දෝස මූල සිත් දෙකටත් සාධාරණ වචනයකි. එම සිත් වලින් කර්මපථ බවට පත්වන පාපයන් සිදු වෙතොත් එය අපායගාමී ශක්තියෙන් යුක්ත ය. එසේ නැති අවස්ථාවේදී ඒ සිත් හඳුන්වනුයේ අපායගාමී ශක්තියෙන් තොර වූ සිත් වශයෙනි.

4. **සවිතක්ක දුකය** - මේ දුකයෙහි සවිතර්ක සිත් පස්පණසෙහි විතර්ක චෛතසික පස්පණස නොගැනෙති. එය අවිතර්ක පදයට ඇතුළත් වෙයි. හේතුව විතර්කය එකක්ම බැවින් තමන්ට සම්ප්‍රයුක්ත වීමට වෙනත් විතර්කයක් නොමැති බැවිනි.

5. **සවිචාර දුකය** - මේ දුකයෙහි ද විචාර සහිත සිත් සසැටෙකි. විචාර චෛතසික සසැට අවිචාර පදයට ඇතුළත් වෙති.

6. **සප්පීතික අප්පීතික දුක** - මෙහි ද පළමු පදයෙන් ඉවත් වන ප්‍රීති එක්පණස දෙවන පදයට ඇතුළත් වෙති.

7. **සුඛ සහගත දුකය** - පළමු පදයෙන් බැහැර වන සුඛ වේදනා තෙසැට දෙවන පදයට ගැනෙති.

8. **උපේක්ඛා සහගත දුකය** - පළමු පදයෙන් නොගැනෙන උපේක්ෂා පස්පණස දෙවන පදයට ඇතුළත් වෙති.

9. පිට්ඨි දුක පද අටළොසම (18) සියලු පරමාර්ථ ඇතුළත් වන බැවින් නිප්පදේස දුක නම් වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. පිට්ඨී දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**

# 14 වැනි පාඩම

## පිට්ඨී දුක - 2 වැනි කොටස ( 15 - 18)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 15. නියාහානික දුකය

1. **නියාහානිකා ධම්මා - අනියාහානිකා ධම්මා'ති.**
2. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පරියාපන්න දුකයට අනතුරුව **නියාහානික දුකය** දේශනා කොට වදාළ සේක. එයද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **නියාහානිකා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අනියාහානිකා ධම්මා** යනුවෙනි.
3. **නියාහානිකා ධම්මා** - සංසාර වට්ට දුක්ඛයෙන් එතෙර කරවන බැවින් නෛර්යාණික නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
4. **අනියාහානිකා ධම්මා** - නෛර්යාණික නම් නො වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.
5. **නියාහානිකා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාහාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර මාර්ග සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද ලැබෙන්නාහ.
6. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් එකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)
7. **අනියාහානිකා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාහාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අවශේෂ පස්අසූ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.
8. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය

වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**නියය්‍යානික දුකය යි.**

## 16. නියත දුකය

9. **නියතා ධම්මා - අනියතා ධම්මා'ති.**

10. **නියතා ධම්මා** - චුතියට අනතුරුව හෝ තමාගේ පැවැත්මට අනතුරුව ඒකාන්තයෙන් විපාක දෙන බැවින් නියත නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

11. **අනියතා ධම්මා** - චුතියට අනතුරුව හෝ තමාගේ පැවැත්මට අනතුරුව ඒකාන්ත වශයෙන් විපාක නොදෙන බැවින් අනියත නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

12. **නියතා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නියත මිථ්‍යා දෘෂ්ටි වශයෙන් පහළ වන්නා වූ ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත විථි සතරෙහි සත් වන ජවනයෝ ද, තත් සම්ප්‍රයුක්ත මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත එක්විසි චෛතසිකයෝ ද,

13. පඤ්චානන්තර්ය කර්ම වශයෙන් පහළ වන්නා වූ දෝස මූල චිත්ත විථි දෙකෙහි සත් වන ජවනයෝ ද, තත් සම්ප්‍රයුක්ත ප්‍රීති ලෝභ දිට්ඨි මාන විචිකිච්ඡා වර්ජිත දෙවිසි චෛතසිකයෝ ද,

14. සතර මාර්ග චිත්තයෝ ද, තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකයෝ ද යන

15. සය අකුසල චිත්තයෝ ද සතර මාර්ග චිත්තයෝ ද යන දස චිත්තයෝ ද, තත් සම්ප්‍රයුක්ත මාන විචිකිච්ඡා අප්‍රමාණ්‍ය වර්ජිත අටසාලිස් චෛතසිකය ද ලැබෙන්නාහ.

16. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

17. **අනියතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නියත මිථ්‍යා දෘෂ්ටි වශයෙන් සහ ආනන්තර්ය කර්ම වශයෙන් පැවැතියා වූ ලෝභ මූල දෝස මූල සත් වන ජවනයන් ද සතර මාර්ගය ද වර්ජිත කොට ඇත්තා වූ අවශේෂ

පස්අසූ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණය ද ලැබෙන්නාහ.

18. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**නියත දුකය යි.**

## 17. සඋත්තර දුකය

19. **සඋත්තරා ධම්මා - අනුත්තරා ධම්මා'ති.**

20. **සඋත්තරා ධම්මා** - තමහට වඩා උත්තරීතර ධර්ම ඇති බැවින් සඋත්තර නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

21. **අනුත්තරා ධම්මා** - තමහට වඩා උත්තරීතර ධර්මයක් නොමැති බැවින් අනුත්තර නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

22. **සඋත්තරා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෞකික සිත් එක්අසූව ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, අටවිසි රූපය ද ලැබෙන්නාහ.

23. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු.)

24. **අනුත්තරා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

25. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**සඋත්තර දුකය යි.**

## 18. සරණ දුකය

26. **සරණා ධම්මා - අරණා ධම්මා'ති.**

27. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ, සඋත්තර දුකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව **සරණ දුකය** දේශනා කොට වදාළ සේක. එය ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **සරණා ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අරණා ධම්මා** යනුවෙනි.

28. **සරණා ධම්මා** - සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසයන් ගෙන දෙන්නා වූ කෙලෙසුන් සමග මිශ්‍ර වූ බැවින් සරණ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

29. **අරණා ධම්මා** - සෝක පරිදේවාදියට හේතු වන කෙලෙසුන් සමග මිශ්‍ර නො වූ බැවින් අරණ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

30. **සරණා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ.

31. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

32. ස්කන්ධ වශයෙන් සිවු වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සත්විසි චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි පස්විසි චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. අකුසල් සිත් දොළොස විඥානස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

33. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස මනායතනය නම් වන්නේ ය. චෛතසික සත්විස්ස (27) ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

34. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත් අකුසල් සිත් දොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික සත්විස්ස (27) ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

35. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත ලෝභය වර්ජිත සවිසි චෛතසිකය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

36. **අරණා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් දොළොස් අකුසල් සිත් වර්ජිත සෙසු සත්සැත්තෑ චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ.

37. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පසකි. ආයතන වශයෙන් දොළොසකි. ධාතු වශයෙන් (18) අටළොසකි. ආර්ය සත්‍ය වශයෙන් තුනකි.

38. ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය රූපස්කන්ධය නම් වන්නේ ය. අටතිස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සතිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සත්සැත්තෑ චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්තය. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම් වන්නාහ.

39. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛායතනය නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝතායතනය නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණායතනය නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හායතනය නම් වන්නේ ය. කාය ප්‍රසාදය කායායතනය නම් වන්නේ ය.

40. වර්ණ රූපය රූපායතනය නම් වන්නේ ය. ශබ්ද රූපය සද්දායතනය නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධායතනය නම් වන්නේ ය. රස රූපය රසායතනය නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන

භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඓොට්ඨබ්බායතනය නම් වන්නේ ය.

41. සත්සැත්තෑ චිත්තය මනායතනය නම් වන්නේ ය. අටතිස් චෛතසිකය ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණ ධාතුව ද ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම් වන්නාහ.

42. ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අටවිසි රූපය අතුරෙන් චක්ෂු ප්‍රසාදය චක්ඛු ධාතුව නම් වන්නේ ය. සෝත ප්‍රසාදය සෝත ධාතුව නම් වන්නේ ය. ඝාණ ප්‍රසාදය ඝාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හා ප්‍රසාදය ජිව්හා ධාතුව නම් වන්නේ ය. කාය ප්‍රසාදය කාය ධාතුව නම් වන්නේ ය.

43. වර්ණ රූපය රූප ධාතුව නම් වන්නේ ය. ශබ්ද රූපය සද්ද ධාතුව නම් වන්නේ ය. ගන්ධ රූපය ගන්ධ ධාතුව නම් වන්නේ ය. රස රූපය රස ධාතුව නම් වන්නේ ය. පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ රූපය ඓොට්ඨබ්බ ධාතුව නම් වන්නේ ය.

44. චක්ඛුවිඤ්ඤාණ යුගලය චක්ඛුවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. සෝතවිඤ්ඤාණ යුගලය සෝතවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ඝාණවිඤ්ඤාණ යුගලය ඝාණවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. ජිව්හාවිඤ්ඤාණ යුගලය ජිව්හාවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. කායවිඤ්ඤාණ යුගලය කායවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. පඤ්චද්වාරාවර්ජන චිත්තය හා සම්පටිච්ඡන යුගලය මනෝ ධාතුව නම් වන්නේ ය. ඉතිරි සූසැට චිත්තය මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය.

45. චෛතසික අටතිස ද, ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය, ආකාස රූපය, කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය, ලහුතා රූපය, මුදුතා රූපය, කම්මඤ්ඤතා රූපය, උපචය රූපය, සන්තති රූපය, ජරතා රූපය, අනිච්චතා රූපය යන සුඛුම රූප සොළොස (16) ද, නිර්වාණය ද

ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් අටළොස් (18) වැදෑරුම් වන්නාහ.

46. ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, ලෞකික සිත් එකුන්සැත්තෑව ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, අටවිසි රූපය ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. නිර්වාණ ධාතුව නිරෝධ සත්‍යය නම් වන්නේ ය. මාර්ග චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදුනා වූ සම්මා දිට්ඨි ආදී මාර්ගාංග අට දෙන එක් වරක් බැගින් ද, සත් දෙන සතර වරක් බැගින් ද යන මේ ධර්ම සමූහය මාර්ගය සත්‍යය නම් වන්නේ ය. ඉතිරි මාර්ග චිත්තෝත්පාද එකුන්තිස ද, ඵල චිත්තෝත්පාද සත්තිස ද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම් වන්නාහ.

47. මේ ශබ්දාවලිය හෙවත් සරණ දුකය, පරමාර්ථ ධර්ම පද දෙකක් කොට වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. සියලු පරමාර්ථ ධර්ම ඇතුළත් බැවින් නිප්පදේස දුක නම් වන්නේ ය.

**සරණ දුකය යි.**

## පද විවරණය

1. **නියයානිකා** - අවිද්‍යා තෘෂ්ණා නම් වූ සංසාර චක්‍රයේ වට්ට මූලයන් දෙදෙනා ලෝකෝත්තර මාර්ග සිත් සතරින්ම සිඳෙන බැවින් මාර්ග චිත්තෝත්පාද පමණක් නියයානික නම් වෙති. ඵල සිත් සතර වනාහි ලෝකෝත්තර වූ නමුත් කෙලෙසුන් සිඳිමක් නොකරන බැවින් නියයානික පදයට ඇතුළත් නොවෙති. ඵල සිත් සතර දෙවැනි පදයට ගැනෙති.

2. **නියතා** - ලෝකෝත්තර මාර්ග සතර වනාහි මාර්ග චිත්ත විථියේදී මාර්ගයට අනතුරුවම ලෝකෝත්තර ඵලය නියත වශයෙන්ම ගෙන දෙන බැවින් නියත නම් වෙති. එය හඳුන්වනුයේ සම්මත්ත නියත නමිනි.

   අහේතුක, නාස්තික, අකිරිය යන තෙවැදෑරුම් වූ නියත මිථ්‍යා දෘෂ්ටි වශයෙන් ලැබෙන දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත විථි සතරෙහි සත්වැනි ජවනත්, ආනන්තර්ය කර්ම වශයෙන් ලැබෙන දෝස මූල දෙසිතෙහි සත්වන ජවනත් යන දෙකොටස වනාහි චුති චිත්තයට අනතුරුවම නිරයෙහි ප්‍රතිසන්ධි ගෙන දෙන බැවින් නියත නම් වෙති. එය හඳුන්වනුයේ මිච්ඡත්ත නියත නමිනි.

3. **සඋත්තරා** - ලෞකික ධර්ම සියල්ලට වඩා ලෝකෝත්තර ධර්ම උතුම් බැවින් ලෞකික ධර්ම සියල්ලම සඋත්තර නම් වෙති. ලෝකෝත්තර ධර්ම අනුත්තර නම් වෙති.

4. **සරණා** - කෙලෙසුන් හට නමකි. සෝක පරිදේවාදී අනන්ත දුක්ඛයන් ගෙන දෙන බැවින් කෙලෙස්, සරණ නම් වෙති.

5. **අරණා** - කෙලෙසුන්ගෙන් මිශ්‍ර නො වූ ධර්ම සියල්ලටම අරණ ධර්ම යයි කියනු ලැබේ.

6. **සප්පදේස තික දුක** - ත්‍රික මාතෘකාවන් අතුරෙන් 1.වේදනා 2.විතර්ක 3.ප්‍රීති 4.පරිත්තාරම්මණ 5.මග්ගාරම්මණ 6.උප්පන්න 7.අතීත 8.අතීතාරම්මණ 9.අජ්ඣත්තාරම්මණ නම් වූ ත්‍රික මාතෘකා නවය සප්පදේස නම් වෙති. ඉතිරි ත්‍රික මාතෘකා තෙළෙස නිප්පදේස නම් වෙති.

   1.හේතු 2.ආසව 3.සංයෝජන 4.ග්‍රන්ථ 5.ඕඝ 6.යෝග 7.නීවරණ 8.උපාදාන 9. පරාමාස යන ගොච්ඡක නවයෙහි අවසාන දුක තුන බැගින් දුක සත්විස්ස (27) ද, කිලේස ගොච්ඡකයෙහි අවසාන දුක

සතර ද, චිත්ත සම්පයුත්ත - චිත්ත සංසට්ඨ යන දුක දෙක ද යන දුක තෙතිස සප්පදේස නම් වෙති. ඉතිරි දුක සත්සැට නිප්පදේස නම් වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. දුක මාතිකා පිට්ඨි දුක විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.
2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.
8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**පිට්ඨි දුකය සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**

## සුත්තන්තිකදුකමාතිකා

1. විජ්ජාභාගිනො ධම්මා. අවිජ්ජාභාගිනො ධම්මා.
2. විජ්ජූපමා ධම්මා. වජිරූපමා ධම්මා.
3. බාලා ධම්මා. පණ්ඩිතා ධම්මා.
4. කණ්හා ධම්මා. සුක්කා ධම්මා.
5. තපනීයා ධම්මා. අතපනීයා ධම්මා.
6. අධිවචනා ධම්මා. අධිවචනපථා ධම්මා.
7. නිරුත්ති ධම්මා. නිරුත්තිපථා ධම්මා.
8. පඤ්ඤත්ති ධම්මා. පඤ්ඤත්තිපථා ධම්මා.
9. නාමඤ්ච. රූපඤ්ච.
10. අවිජ්ජා ච. භවතණ්හා ච.
11. භවදිට්ඨි ච. විභවදිට්ඨි ච.
12. සස්සතදිට්ඨි ච. උච්ඡෙදදිට්ඨි ච.
13. අන්තවා දිට්ඨි ච. අනන්තවා දිට්ඨි ච.
14. පුබ්බන්තානුදිට්ඨි ච. අපරන්තානුදිට්ඨි ච.
15. අහිරිකඤ්ච. අනොත්තප්පඤ්ච.
16. හිරී ච. ඔත්තප්පඤ්ච.
17. දොවචස්සතා ච. පාපමිත්තතා ච.
18. සොවචස්සතා ච. කල්‍යාණමිත්තතා ච.
19. ආපත්තිකුසලතා ච. ආපත්තිවුට්ඨානකුසලතා ච.
20. සමාපත්තිකුසලතා ච. සමාපත්තිවුට්ඨානකුසලතා ච.
21. ධාතුකුසලතා ච. මනසිකාරකුසලතා ච.
22. ආයතනකුසලතා ච. පටිච්චසමුප්පාදකුසලතා ච.
23. ඨානකුසලතා ච. අට්ඨානකුසලතා ච.
24. අජ්ජවො ච. මද්දවො ච.
25. ඛන්ති ච. සොරච්චඤ්ච.
26. සාඛල්‍යඤ්ච. පටිසන්ථාරො ච
27. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච. භොජනෙ අමත්තඤ්ඤුතා ච.

28. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ච. භොජනෙ මත්තඤ්ඤුතා ච.

29. මුට්ඨසච්චඤ්ච. අසම්පජඤ්ඤඤ්ච.

30. සති ච. සම්පජඤ්ඤඤ්ච.

31. පටිසඞ්ඛානබලඤ්ච. භාවනාබලඤ්ච.

32. සමථො ච. විපස්සනා ච.

33. සමථනිමිත්තඤ්ච. පග්ගාහනිමිත්තඤ්ච.

34. පග්ගාහො ච. අවික්ඛෙපො ච.

35. සීලවිපත්ති ච. දිට්ඨිවිපත්ති ච.

36. සීලසම්පදා ච. දිට්ඨිසම්පදා ච.

37. සීලවිසුද්ධි ච. දිට්ඨිවිසුද්ධි ච.

38. දිට්ඨිවිසුද්ධි ඛො පන. යථාදිට්ඨිස්ස ච පධානං.

39. සංවෙගො ච සංවෙජනියෙසු ඨානෙසු. සංවිග්ගස්ස ච යොනිසො පධානං.

40. අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු. අප්පටිවානිතා ච පධානස්මිං.

41. විජ්ජා ච. විමුත්ති ච.

42. ඛයෙ ඤාණං. අනුප්පාදෙ ඤාණන්ති.

# 15 වැනි පාඩම

## සූත්‍රාන්ත මාතිකා (දුක 42) - 1 වැනි කොටස (01 - 22)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 1. විජ්ජාභාගී දුකය

1. **විජ්ජා භාගිනෝ ධම්මා - අවිජ්ජා භාගිනෝ ධම්මා'ති.**

2. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාරණ ලද්දා වූ ශ්‍රී සද්ධර්මය වනාහි, ධර්ම විනය වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. විනය, සූත්‍රාන්ත, අභිධර්ම යන පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ ය. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය යන නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ ය. සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූත ධර්ම, වේදල්ල යන අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ ය. ධර්මස්කන්ධ වශයෙන් වනාහි, සුවාසූ දහසක් වන්නේ ය.

3. අභිධර්මය හදාරන්නා වූ ශ්‍රාවකයන් හට සූත්‍රාන්ත පිටකය පිළිබඳ නොපැකිල අවබෝධය පහසු වනු පිණිස වනාහි, ධර්ම සේනාධිපති අග්‍රශ්‍රාවක ශාරිපුත්‍ර මහ රහතන් වහන්සේ විසින් බුද්ධ භාෂිත වූ දීඝ නිකායෙහි සංගීති - දසුත්තර සූත්‍රයන්ගෙන් ද අංගුත්තර නිකායෙහි ඒකක නිපාත සහ දුක නිපාතයන්ගෙන් ද ගෙන හැර දක්වන ලද්දා වූ **සූත්‍රාන්ත මාතෘකාව** විජ්ජාභාගී දුකය ආදී කොට දෙසාලිස් වැදෑරුම් වන්නේ ය.

4. ඒ සූත්‍රාන්ත මාතෘකාව ද ධම්මසංගණී ආදී අභිධර්ම සප්තප්‍රකරණය අතුරෙන් ධම්මසංගණී ප්‍රකරණයෙහි නික්ඛේප කාණ්ඩයෙහි ම වදාරණ ලද බැවින් අභිධම්ම මාතිකා නම් වන්නාහ.

5. සූත්‍රාන්ත මාතෘකාවන් වනාහි, බුද්ධ භාෂිත වූ ම දීඝ නිකාය අංගුත්තර නිකායන්ගෙන් මතු කොට ධම්සෙනවි සැරියුත් මහා රහතන් වහන්සේ විසින් ආභිධාර්මිකයන්ගේ පහසුව පිණිස සංග්‍රහ කොට වදාළ බැවින් සූත්‍රාන්ත මාතිකා නම් වන්නාහ. ඔවුනතුරෙන් **විජ්ජාභාගී දුකය** පළමු කොට වදාළහ.

6. ඒ **විජ්ජාභාගී දුකය** ද ප්‍රථම පදය ද්විතීය පදයාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **විජ්ජා භාගිනෝ ධම්මා** යනුවෙනි. ඉන් අනතුරුව ද්විතීය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **අවිජ්ජා භාගිනෝ ධම්මා** යනුවෙනි.

7. **විජ්ජා භාගිනෝ ධම්මා** - සම්ප්‍රයුක්ත වශයෙන් අෂ්ට විද්‍යාවන් භජනය කරන බැවින් විජ්ජාභාගී නම් වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

8. **අවිජ්ජා භාගිනෝ ධම්මා** - සම්ප්‍රයුක්ත වශයෙන් චතුරාර්ය සත්‍ය මුවහ කරන ලක්‍ෂණ මෝහය භජනය කරන්නා වූ, නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

9. **විජ්ජා භාගිනෝ ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් විදර්ශනා ඥාන වශයෙන් ලැබෙන්නා වූ, ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතර ද, ඤාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය අමෝහ වර්ජිත චෛතසික දෙතිස ද,

10. මනෝමය ඍද්ධි ඥාණය, ඍද්ධිවිධ ඥාණය, දිව්‍යශ්‍රෝත ඥාණය, පරචිත්ත විජානන ඥාණය, පූර්වේනිවාසානුස්මෘති ඥාණය සහ දිව්‍යචක්ෂුරහි ඥාණය යන ඥාණයන්ගෙන් සම්ප්‍රයුක්ත වූ රූපාවචර පඤ්චම ධ්‍යාන කුසලාභිඥා ක්‍රියාභිඥා දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත විතර්ක විචාර ප්‍රීති විරති අප්‍රමාණ්‍ය අමෝහ වර්ජිත චෛතසික එකුන්තිස ද,

11. ආසවක්ඛය ඥාණය වශයෙන් වූ අර්හත් මාර්ග චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අමෝහ වර්ජිත චෛතසික පන්තිස ද යන

12. සිත් එකොළොස ද, තත් සම්ප්‍රයුක්ත අමෝහ අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික පන්තිස ද ලැබෙන්නාහ.

13. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

14. ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, පන්තිස් චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සඤ්ඤාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි තෙතිස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. සිත් එකොළොස

විඥාණස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

15. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, විද්‍යාභාගී සිත් එකොළොස මනායතනය නම් වන්නේ ය. චෛතසික පන්තිස ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

16. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, විද්‍යාභාගී සිත් එකොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික පන්තිස ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

17. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, විද්‍යාභාගී ලෞකික සිත් දස දෙන ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙතිස ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. අර්හත් මාර්ග චිත්තය සමග සම්ප්‍රයුක්ත වූ සම්මා දිට්ඨි වර්ජිත මාර්ගාංග සත් දෙන මාර්ග සත්‍යය නම් වන්නේ ය. අවශේෂ මාර්ග චිත්තෝත්පාද එකුන්තිස සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

18. **අවිජ්ජා භාගිනෝ ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත මෝහය වර්ජිත චෛතසික සවිස්ස ද ලැබෙන්නාහ.

19. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සතරකි. ආයතන වශයෙන් දෙකකි. ධාතු වශයෙන් දෙකකි. ආර්ය සත්‍ය වශයෙන් දෙකකි.

20. ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, සවිසි චෛතසිකය අතුරෙන් වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේ ය. සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේ ය. ඉතිරි සූවිසි චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේ ය. දොළොස් අකුසල් චිත්තය විඥාණස්කන්ධය නම් වන්නේ ය. මෙසේ ස්කන්ධ වශයෙන් සතර වැදෑරුම් වන්නාහ.

21. ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස මනායතනය නම් වන්නේ ය. චෛතසික සවිස්ස ධම්මායතනය නම් වන්නේ ය. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

22. ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස මනෝවිඤ්ඤාණ ධාතුව නම් වන්නේ ය. චෛතසික සවිස්ස ධම්ම ධාතුව නම් වන්නේ ය. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

23. ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහු කෙසේ ද යත්, අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත ලෝභ මෝහ වර්ජිත චෛතසික පස්විස්ස ද දුක්ඛ සත්‍යය නම් වන්නේ ය. ලෝභය සමුදය සත්‍යය නම් වන්නේ ය. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන්නාහ.

24. මේ විජ්ජාභාගී දුකය වනාහි, පරමාර්ථ ධර්මයන් දෙපදයකින් වදාළ බැවින් දුක නම් වේ. මුල පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වේ. දොළොස් අකුසල් චිත්තය ද, අර්හත් මාර්ග චිත්තය ද, අෂ්ඨ විද්‍යාවන් හජනය කෙරෙන අවස්ථාවෙහි වූ ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා සිත් අට ද, අභිඥා දෙසිත ද වර්ජිත අවශේෂ සසැත්තෑ (76) චිත්තය ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද, විජ්ජාභාගීනෝ චිත්තයන්ගේ අමෝහ චෛතසික එකොළොස ද, මෝහ චෛතසික දොළොස ද, අටවිසි රූපය ද, නිර්වාණය ද මේ දුකයෙහි ඇතුළත් නො වූ බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**විජ්ජාභාගී දුකය යි.**

## 2. විජ්ජූපම දුකය

25. **විජ්ජූපමා ධම්මා - වජිරූපමා ධම්මා'ති.**

26. **විජ්ජූපමා ධම්මා** - විදුලියකට බඳු උපමා ඇත්තා වූ විජ්ජූපම නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

27. **වජිරූපමා ධම්මා** - වජ්‍රයකට හෙවත් හෙන පහරකට සමාන උපමා ඇත්තා වූ වජිරූපම නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

28. **විජ්ජූපමා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සෝවාන් සකදාගාමී අනාගාමී යන මාර්ග සිත් තුනෙහි යෙදුනා වූ ප්‍රඥා චෛතසික තිදෙන ලැබෙන්නාහ.

29. **වජිරූපමා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අර්හත් මාර්ග චිත්තයෙහි ප්‍රඥා චෛතසිකය ලැබෙන්නේ ය. (පෙරසේ ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**විජ්ජූපම දුකය යි.**

## 3. බාල දුකය

30. **බාලා ධම්මා - පණ්ඩිතා ධම්මා'ති.**

31. **බාලා ධම්මා** - අඥාන බැවින් ද, අඥානයන් කෙරෙහි පිහිටි බැවින් ද, බාල නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

32. **පණ්ඩිතා ධම්මා** - පණ්ඩිත බැවින් ද, පණ්ඩිතයන් කෙරෙහි පිහිටි බැවින්ද, පණ්ඩිත නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

33. **බාලා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ.

34. ස්කන්ධ හතරකි. ආයතන දෙකකි. ධාතු දෙකකි. ආර්ය සත්‍ය දෙකකි. (ස්වරූප උදුරනු.)

35. **පණ්ඩිතා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභිධෙයාාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කුසල් සිත් එක්විස්ස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද ලැබෙන්නාහ. (ස්කන්ධ සතරකි. ආයතන දෙකකි. ධාතු දෙකකි. ආර්ය සත්‍ය දෙකකි. ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. විපාක සිත් සතිස ද, ක්‍රියා සිත් විස්ස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද, අටවිසි රූපය ද, නිර්වාණ ධාතුව ද ඇතුලත් නොවන බැවින් සප්පදේස දුකයකි.)

**බාල දුකය යි.**

## 4. කණ්හ දුකය

36. **කණ්හා ධම්මා - සුක්කා ධම්මා'ති.**

37. **කණ්හා ධම්මා** - කාල වර්ණ වූ බැවින් ද, සතර අපායාදියෙහි දුක් විපාක ගෙන දෙන බැවින් ද කණ්හ නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

38. **සුක්කා ධම්මා** - ස්වේත වර්ණ වූ බැවින් ද, ලෞකික ලෝකෝත්තර සැප විපාක ගෙන දෙන බැවින් ද සුක්ල ධර්ම නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(මේ කණ්හ දුකය බාල දුකයටම සමානය. ඒ අනුව ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**කණ්හ දුකය යි.**

## 5. තපනීය දුකය

39. **තපනීයා ධම්මා - අතපනීයා ධම්මා'ති.**

40. **තපනීයා ධම්මා** - මෙලොවත් පරලොවත් දෙලොවෙහිම තැවීම ගෙන දෙන බැවින් තපනීය නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

41. **අතපනීයා ධම්මා** - මෙලොවත් පරලොවත් තැවීමක් ගෙන නොදෙන බැවින් අතපනීය නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(මේ තපනීය දුකය ද බාල දුකයටම සමානය. ඒ අනුව ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**තපනීය දුකය යි.**

## 6. අධිවචන දුකය

42. **අධිවචනා ධම්මා - අධිවචන පථා ධම්මා'ති.**

43. **අධිවචනා ධම්මා** - නාම, නාමකර්ම, නාමධෙය්‍ය, නාමනිරුක්ති, නාමව්‍යඤ්ජන, නාමාභිලාප නම් වූ හෙවත් වාග් ද්වාරයෙන් නිකුත් වන ශබ්ද ප්‍රඥප්තිය නම් වූ ද, අර්ථයට නමන අර්ථයෙන් නාම නම්

වූ ද, අර්ථයෙහි නැමෙන අර්ථයෙන් නාමකර්ම නම් වූ ද, අර්ථයෙහි නැමී පිහිටි අර්ථ නැමති නාමධෙය්‍ය නම් වූ ද, අර්ථය නිකුත් කොට කියන ලද හෙයින් නාමනිරුක්ති නම් වූ ද, අර්ථ ප්‍රකාශ කරන වාක්‍යය නමැති නාමව්‍යඤ්ජන නම් වූ ද, අර්ථයට අභිමුඛව නැමෙන හෙයින් නාමාභිලාප නම් වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

44. **අධිවචන පථා ධම්මා** - ශබ්ද මාත්‍රයක් අධිපති කොට ගන්නා වූ ශබ්ද ප්‍රඥප්තියට හේතු කාරණ වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

45. **අධිවචනා ධම්මා** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අසන්නන්හට අර්ථාවබෝධය ගෙන දෙන ශබ්ද ප්‍රඥප්තිය නම් වූ වචීවිඤ්ඤත්තිය සහිත වචී ශබ්දය ලැබෙන්නේ ය. රූපස්කන්ධයකි. සද්දායතන - ධම්මායතන දෙකකි. සද්ද ධාතු - ධම්ම ධාතු දෙකකි. දුක්ඛ සත්‍යයකි. (ස්වරූප උදුරනු.)

46. **අධිවචන පථා ධම්මා** - යන ද්විතීය පදයාගේ අභියෝය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන්, කථා කිරීම පිණිස අරමුණු වශයෙන් හේතු වන්නා වූ සිත් එකුන්අනූව (89) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, රූප අටවිස්ස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. (ස්කන්ධ පසකි. ආයතන දොළොසකි. ධාතු (18) අටළොසකි. ආර්ය සත්‍ය සතරකි. ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**අධිවචන දුකය යි.**

## 7. නිරුත්ති දුකය

47. **නිරුත්ති ධම්මා - නිරුත්ති පථා ධම්මා'ති.**

48. **නිරුත්ති ධම්මා** - අර්ථය නිකුත් කොට කියන ලද ශබ්ද ප්‍රඥප්ති නම් වූ නාම, නාමකර්ම, නාමධෙය්‍ය, නාමනිරුත්ති, නාමව්‍යඤ්ජන, නාමාභිලාප නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

49. **නිරුත්ති පථා ධම්මා** - යථෝක්ත නිරුත්තියට හේතු කාරණ වන්නා වූ අර්ථ ප්‍රඥප්ති නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(අධිවචන දුකයටම සමානය. ඒ අනුව ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**නිරුත්ති දුකය යි.**

## 8. පඤ්ඤත්ති දුකය

50. **පඤ්ඤත්ති ධම්මා - පඤ්ඤත්ති පථා ධම්මා'ති.**

51. **පඤ්ඤත්ති ධම්මා** - ප්‍රභේද වශයෙන් දැනගත යුතු වන ශබ්ද ප්‍රඥප්තිය නම් වූ නාම, නාමකර්ම, නාමධෙය්‍ය, නාමනිරුත්ති, නාමව්‍යඤ්ජන, නාමාභිලාප යයි කියන ලද්දා වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

52. **පඤ්ඤත්ති පථා ධම්මා** - ශබ්ද ප්‍රඥප්තියට කාරණ වූ අර්ථ ප්‍රඥප්තිය නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

(අධිවචන දුකයට සමානමය. ඒ අනුව ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**පඤ්ඤත්ති දුකය යි.**

## 9. නාමරූප දුකය

53. **නාමඤ්ච - රූපඤ්චා'ති.**

54. **නාමඤ්ච** - අරමුණට අභිමුඛව නැමෙන අර්ථයෙන් නාම නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

55. **රූපඤ්ච** - ශීතෝෂ්ණාදී විරෝධ ප්‍රත්‍යයෙන් රුප්පනය වීම හෙවත් විකාර වීම වෙනස් වීම ස්වභාව කොට ඇති බැවින් රූප නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයෝ ඇත්තාහ.

56. මෙහි ප්‍රථම පදයට සිත් එකුන්අනූව (89) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. ද්විතීය පදයට අටවිසි රූපය ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. සර්වලබ්ධ නාම දුකයකි. නිප්පදේස දුකයකි.)

**නාමරූප දුකය යි.**

## 10. අවිජ්ජා දුකය

57. **අවිජ්ජා ච - භවතණ්හා චා'ති.**

58. **අවිජ්ජා ච** - චතුරාර්ය සත්‍යය මුවහ කරන බැවින් මෝහ යයි කියන ලද අවිද්‍යා නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේ ය.

59. **භවතණ්හා ච** - සාස්වත දෘෂ්ටියෙන් යුක්ත වූ ද, භවයට ඇලුම් කරන බැවින් ලෝභ නම් වූ ද නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්ම කෙනෙක් ඇත්තේ ය.

60. මෙහි ප්‍රථම පදයෙන් මෝහය ලැබෙන්නේ ය. ද්විතීය පදයෙන් ලෝභය ලැබෙන්නේ ය. ඉතිරි සියලු ධර්මයෝ දුක මුක්තයෝ ය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**අවිජ්ජා දුකය යි.**

## 11. භවදිට්ඨි දුකය

61. **භවදිට්ඨි ච - විභවදිට්ඨි චා'ති.**

62. **භවදිට්ඨි ච** - නිත්‍ය සදාකාලික ආත්මභාවයක් ඇතැයි පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ටි නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේ ය.

63. **විභවදිට්ඨි ච** - මරණින් මතු ඉපදීමක් නැතැ යි පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ටි නම් වූ නිස්සත්ව නිර්ජීව පරමාර්ථ ස්වභාව ධර්මයක් ඇත්තේ ය.

64. මෙහි දෙපදයෙන් ම දිට්ඨි චෛතසිකය ලැබෙන්නේ ය. සෙසු සියලු ධර්ම දුක මුක්ත වෙති. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**භවදිට්ඨි දුකය යි.**

## 12. සස්සත දිට්ඨි දුකය

65. **සස්සත දිට්ඨි ච - උච්ඡේද දිට්ඨි චා’ති.**

66. **සස්සත දිට්ඨි ච** - ලෝකය ද ආත්මභාවය ද නිත්‍ය යයි ද සදාකාලික යයි ද පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේ ය.

67. **උච්ඡේද දිට්ඨි ච** - ලෝකය ද ආත්මභාවය ද විනාශ වීමෙන් පසු නැවත නූපදින්නේ යයි පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේ ය.

68. දෙපදයෙන් ම දිට්ඨි චෛතසිකය ලැබෙන්නේ ය. සෙසු සියලු ධර්ම දුක මුක්තය. (ස්වරූප උදුරනු. භවදිට්ඨි දුකයට සමානමය. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සස්සත දිට්ඨි දුකය යි.**

## 13. අන්තවා දිට්ඨි දුකය

69. **අන්තවා දිට්ඨි ච - අනන්තවා දිට්ඨි චා’ති.**

70. **අන්තවා දිට්ඨි ච** - ලෝකය ද ආත්මභාවය ද කෙළවර සහිත යයි පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේ ය.

**71.** **අනන්තවා දිට්ඨි ච** - ලෝකය ද ආත්ම භාවය ද කෙළවරක් නොමැත්තේ යයි පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේ ය.

**72.** මෙහි දෙපදයෙන් ම දිට්ඨි චෛතසිකය ලැබෙන්නේ ය. සෙසු සියලු ධර්ම දුක මුක්ත වෙති. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**අන්තවා දිට්ඨි දුකය යි.**

## 14. පුබ්බන්තානු දිට්ඨි දුකය

73. **පුබ්බන්තානු දිට්ඨි ච - අපරන්තානු දිට්ඨි චා’ති.**

74. **පුබ්බන්තානු දිට්ඨි ච** - සංසාරයෙහි පූර්වාන්තය හෙවත් අතීතය අරමුණු කොට විපරීතව පිළිගන්නා වූ මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේ ය.

75. **අපරන්තානු දිට්ඨී ච** - සංසාරයෙහි අපරාන්තය හෙවත් අනාගතය අරමුණු කොට විපරීතව පිළිගන්නා වූ, මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත ධර්මයක් ඇත්තේ ය.

76. මෙහි ද දෙපදයෙහි ම දිට්ඨී චෛතසිකය ලැබෙන්නේ ය. සෙසු සියලු ධර්ම දුක මුක්තය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**පුබ්බන්තානු දිට්ඨී දුකය යි.**

## 15. අහිරික දුකය

77. **අහිරිකඤ්ච - අනොත්තප්පඤ්චා'ති.**

78. **අහිරිකඤ්ච** - කාය වාග් මනෝ දුශ්චරිතාදී පාපයෙහි ලජ්ජා නොවීම ලක්ෂණ කොට ඇත්තා වූ අහිරික නම් වූ ධර්මයක් ඇත්තේ ය.

79. **අනොත්තප්පඤ්ච** - පාපයෙහි බිය නොවීම ලක්ෂණ කොට ඇත්තා වූ අනොත්තප්ප නම් වූ ධර්මයක් ඇත්තේ ය.

80. මෙහි ප්‍රථම පදයෙන් අහිරිකය ලැබෙන්නේ ය. ද්විතීය පදයෙන් අනොත්තප්පය ලැබෙන්නේ ය. සෙසු සියලු ධර්ම දුක මුක්ත වෙති. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**අහිරික දුකය යි.**

## 16. හිරි දුකය

81. **හිරි ච - ඔත්තප්පඤ්චා'ති.**

82. **හිරි ච** - පාපයෙහි ලජ්ජා වීම, පිළිකුල් කිරීම ලක්ෂණ කොට ඇත්තා වූ, හිරි නම් වූ ධර්මයක් ඇත්තේ ය.

83. **ඔත්තප්පඤ්ච** - පාපයෙහි බිය වීම, තැති ගැනීම ලක්ෂණ කොට ඇත්තා වූ, ඔත්තප්ප නම් වූ ධර්මයක් ඇත්තේ ය.

84. මෙහි ප්‍රථම පදයෙන් හිරිය ලැබෙන්නේ ය. ද්විතීය පදයෙන් ඔත්තප්පය ලැබෙන්නේ ය. සෙසු සියලු ධර්ම දුක මුක්ත වෙති. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**හිරි දුකය යි.**

## 17. දෝවචස්සතා දුකය

85. **දෝවචස්සතා ච - පාපමිත්තතා චා'ති.**

86. **දෝවචස්සතා ච** - අවවාද අනුශාසනා මුදුනින් නොපිළිගන්නා වූ දුර්වච හෙවත් අකීකරු පුද්ගලයාගේ ස්වභාවය නම් වූ දෝවචස්සතා ධර්මයක් ඇත්තේ ය.

87. **පාපමිත්තතා ච** - පාපමිත්‍රයන් කෙරෙහි භක්තිය පිළිගැනීම ඇත්තා වූ පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණය නම් වූ පාපමිත්තතා ධර්මයක් ඇත්තේ ය.

88. **දෝවචස්සතා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ශීලාදී ගුණයෙන් උසස් උතුමන් විසින් අවවාද අනුශාසනා කිරීමේදී ද, බුද්ධ ප්‍රඥප්ති විනය ධර්මයෙන් අනුශාසනා කිරීමේදී ද, පටහැනි වචන කියමින් දුර්වච බව පාන්නා වූ පුද්ගලයාගේ ද්වේෂ මූල දෙසිත ද, තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකය ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

89. **පාපමිත්තතා ච** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් පාපමිත්‍රයන් භජනය කිරීමේ වරද නොදැනීම් වශයෙන් ද, ඔවුන් කෙරෙහි ඇලුම් කිරීම් වශයෙන් ද, පහළ වන්නා වූ ලෝභ මූල සිත් අට ද, මෝහ මූල සිත් දෙක ද, තත් සම්ප්‍රයුක්ත දෝස චතුෂ්ක වර්ජිත චෛතසික තෙවිස්ස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**දෝවචස්සතා දුකය යි.**

## 18. සෝවචස්සතා දුකය

90. **සෝවචස්සතා ච - කල්‍යාණමිත්තතා චා'ති.**

91. **සෝවචස්සතා ච** - අවවාද අනුශාසනා මුදුනින් පිළිගන්නා වූ පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණය නම් වූ සෝවචස්සතා ධර්මයක් ඇත්තේ ය.

92. **කල්‍යාණමිත්තතා ච** - කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි භක්තිය පිළිගැනීම ඇත්තා වූ පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණය නම් වූ කල්‍යාණමිත්තතා ධර්මයක් ඇත්තේ ය.

93. **සෝවචස්සතා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ශීලාදී ගුණයෙන් උසස් උතුමන් විසින් අවවාද

අනුශාසනා කිරීමේදී ද, බුද්ධ ප්‍රඥප්ති විනය ධර්මයකින් අනුශාසනා කිරීමේදී ද, ගෞරව සම්ප්‍රයුක්තව මුදුනින් පිළිගන්නා වූ පුද්ගලයාට ලැබෙන මහා කුසල මහා ක්‍රියා සිත් සොළොස (16) ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

94. **කල්‍යාණමිත්තතා ච** - යන ද්විතීය පදයට ද ඉහත ධර්මයෝ ම ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සෝවචස්සතා දුකය යි.**

## 19. ආපත්ති කුසලතා දුකය

95. **ආපත්ති කුසලතා ච - ආපත්ති වුට්ඨාන කුසලතා චා'ති.**

96. **ආපත්ති කුසලතා ච** - ආපත්ති දැනගැනීමෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණය වූ ආපත්ති කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

97. **ආපත්ති වුට්ඨාන කුසලතා ච** - පැමිණි ඇවතින් නැගී සිටීමේ දක්ෂ පුද්ගලයාගේ ලක්ෂණය වූ ආපත්ති වුට්ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

98. **ආපත්ති කුසලතා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සප්ත ආපත්ති ස්කන්ධයන් දැනගැනීමෙහි දක්ෂ පුද්ගලයාගේ ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අටෙහි ප්‍රඥා චෛතසික අට ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

99. **ආපත්ති වුට්ඨාන කුසලතා ච** - යන ද්විතීය පදයාගේ ද පැමිණි ඇවතින් නැගී සිටීමෙහි දක්ෂ පුද්ගලයාගේ එම ප්‍රඥා චෛතසික අට ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**ආපත්ති කුසලතා දුකය යි.**

## 20. සමාපත්ති කුසලතා දුකය

100. **සමාපත්ති කුසලතා ච - සමාපත්ති වුට්ඨාන කුසලතා චා'ති.**

101. **සමාපත්ති කුසලතා ච** - රූපාරූප ධ්‍යාන නම් වූ අෂ්ඨ සමාපත්තීන්හි ද, නවානුපූර්ව විහාර සමාපත්තීන්හි ද දක්ෂතාව නම් වූ සමාපත්ති කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

102. **සමාපත්ති වුට්ඨාන කුසලතා ච** - අෂ්ඨ සමාපත්තියෙන් ද, නවානුපූර්ව විහාර සමාපත්තියෙන් ද නැගී සිටීමේ දක්ෂතාව නම් වූ සමාපත්ති වුට්ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

(ස්වරූපාර්ථ ආපත්ති කුසලතා දුකයට සමානමය. ඒ අනුව ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සමාපත්ති කුසලතා දුකය යි.**

## 21. ධාතු කුසලතා දුකය

103. **ධාතු කුසලතා ච - මනසිකාර කුසලතා චා'ති.**

104. **ධාතු කුසලතා ච** - අටළොස් (18) ධාතුන් දැන ගැනීමෙහි දක්ෂතාව නම් වූ ධාතු කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

105. **මනසිකාර කුසලතා ච** - අටළොස් (18) ධාතුන් මෙනෙහි කිරීමෙහි දක්ෂතාව නම් වූ මනසිකාර කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

106. **ධාතු කුසලතා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අටළොස් (18) ධාතුන් දැනගන්නා වූ මහා කුසල මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් අටෙහි ද, අභිඥා දෙසිතෙහි ද, මාර්ග සිත් සතරෙහි ද උපදින්නා වූ ප්‍රඥා චෛතසික තුදුස ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

107. **මනසිකාර කුසලතා ච** - යන ද්විතීය පදයට ද ඉහත ධර්මයෝ ම ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**ධාතු කුසලතා දුකය යි.**

## 22. ආයතන කුසලතා දුකය

108. **ආයතන කුසලතා ච - පටිච්චසමුප්පාද කුසලතා චා'ති.**

109. **ආයතන කුසලතා ච** - දොළොස් ආයතනයන් දැනගැනීමෙහි දක්ෂතාව නම් වූ ආයතන කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

110. **පටිච්චසමුප්පාද කුසලතා ච** - ද්වාදසාංග පටිච්චසමුප්පාද ධර්මය දැනගැනීමෙහි දක්ෂතාව නම් වූ පටිච්චසමුප්පාද කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.

(ස්වරූපාර්ථ ධාතු කුසලතා දුකයට සමානමය. ඒ අනුව ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**ආයතන කුසලතා දුකය යි.**

**(ඉතිරි සූත්‍රාන්තික මාතෘකා සමවිස්ස 16 වෙනි පාඩමට ඇතුලත් වෙති.)**

## පද විවරණය

1. **ධර්ම විනය** - සූත්‍රාන්තය හා අභිධර්මය ධර්මය යයි ද, විනය පිටකය විනය යයි ද හැඳින්වේ.
2. **විනය පිටකය** - භික්ෂු භික්ෂුණී උභය පක්ෂයට නියමිත වූ ග්‍රන්ථ පසකින් යුත් ආඥා දේශනාව ය.
3. **සූත්‍රාන්ත පිටකය** - ලෞකික මහජනතාවට පහසුවෙන් අවබෝධ වීම පිණිස සම්මුති සත්‍යයෙහි පිහිටා දේශනා කළ ව්‍යවහාර දේශනාව ය. (ග්‍රන්ථ දහනවයකි.)
4. **අභිධර්ම පිටකය** - ගම්භීර පරමාර්ථයම ප්‍රකාශ කොට ඇත්තා වූ ග්‍රන්ථ සතකින් යුක්ත වූ පරමාර්ථ දේශනාව ය.
5. **දීඝ නිකාය** - දීර්ඝ ප්‍රමාණ සූත්‍ර සූතිසකින් යුක්ත වූ ග්‍රන්ථය ය.
6. **මජ්ඣිම නිකාය** - මධ්‍යම ප්‍රමාණ සූත්‍ර එකසිය පණස් දෙකක් ඇතුලත් වූ ග්‍රන්ථය ය.
7. **සංයුක්ත නිකාය** - දේවතා සංයුක්ත ආදී සංයුක්ත නමින් සංග්‍රහ කොට ඇත්තා වූ සූත්‍ර සත්දහස් සත්සිය හැට දෙකකින් යුත් ග්‍රන්ථය ය.

8. **අංගුත්තර නිකාය** - ඒකක නිපාතයේ සිට ඒකාදසක නිපාතය තෙක් දේශනා කොට ඇති සූත්‍ර නවදහස් පන්සිය පණස් සතකින් යුත් ග්‍රන්ථය ය.

9. **ඛුද්දක නිකාය** - ඛුද්දක පාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමාන වත්ථු, පේත වත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, ජාතක, නිද්දේස, පටිසම්භිදා, අපදාන, චරියාපිටක, බුද්ධවංස නම් වූ කුඩා ප්‍රමාණයේ ග්‍රන්ථ පසළොසකින් යුක්ත වූයේ ඛුද්දක නිකාය ය.

10. **නවාංගය** -1. **සූත්‍ර** - ඒ නමින් යුත් දේශනාව සූත්‍රය ය.
2. **ගෙය්‍ය** - ගාථා සහිත සූත්‍ර ගෙය්‍ය නම් වේ.
3. **වෙය්‍යාකරණ** - ගාථා රහිත දේශනාව වෙය්‍යාකරණ නම් වේ.
4. **ගාථා** - ගාථා පමණක් ම ඇති දේශනා ගාථා නම් වේ.
5. **උදාන** - ප්‍රීති වාක්‍ය වශයෙන් පැවැත් වූ දේශනාව උදාන නම් වේ.
6. **ඉතිවුත්තක** - මේ නමින් දේශනා කළ සියයක් පමණ වූ සූත්‍රයන්ට නමකි.
7. **ජාතක** - පන්සිය පණස් ජාතක දේශනාව ය.
8. **අබ්භූත ධම්ම** - ආශ්චර්ය අද්භූත වශයෙන් ඇති දේශනාව ය.
9. **වේදල්ල** - ධර්ම සාකච්ඡා වශයෙන් දේශනා කළ සතුටත් නුවණත් වඩන දේශනාව ය.

11. **ධර්මස්කන්ධ** - අභිධර්ම පිටකයේ දෙසාලිස් දහසක් පමණ වූ ද, විනය - සූත්‍ර දෙපිටකයෙහි දෙසාලිස් දහසක් පමණ වූ ද ධර්ම කොට්ඨාශ අසූසාර දහසකි.

12. **වජිර** - දියමන්තියට ද හෙන පහරට ද නමකි.

13. **කණ්හ ධර්ම** - අඳුරු, අපිරිසිදු සිතින් කෙරෙන බැවින් සියලුම අකුසල් කණ්හ, කාල වර්ණ වෙති.

14. **සුක්ක ධර්ම** - ප්‍රසන්න, පිරිසිදු සිතින් කෙරෙන බැවින් සියලුම කුසල් ශ්වේත, සුදු වර්ණ නම් වෙති.

15. **අධිවචන** - ශබ්ද ප්‍රඥප්තිය නම් වූ වචනය අධිවචන යයි. අර්ථ ප්‍රඥප්තිය නම් වූ ඒ වචනයේ තේරුමට ඇතුලත් වන සියල්ල

අධිවචන පථයයි. නිරුත්ති - නිරුත්ති පථ, පඤ්ඤත්ති - පඤ්ඤත්ති පථ යන දෙපදය ද ඒ හා සමාන ය.

16. **ආපත්ති** - භික්ෂු, භික්ෂුණී උභය පක්ෂයට සංවරය පිණිස වදාළ සිකපද බිඳීමෙන් සිදු වන වරද ආපත්ති නම් වෙති. ආපත්ති වර්ග සතකි. ඇවැත් කඳු සත නමින් එය හැඳින් වෙයි.

## සූත්‍රාන්ත මාතෘකා නිර්වචන හෙවත් අර්ථකථා ටීකාගත විවරණ

## (01 වැනි කොටස)

1. **සම්පයෝග වසේන විජ්ජං භජන්තී ති විජ්ජාභාගිනෝ, විජ්ජාභාගේ විජ්ජා කොට්ඨාසේ වත්තන්ති පි විජ්ජාභාගිනෝ, සම්පයෝග වසේන අවිජ්ජං භජන්තී ති අවිජ්ජාභාගිනෝ, අවිජ්ජාභාගේ අවිජ්ජා කොට්ඨාසේ වත්තන්ති පි අවිජ්ජා භාගිනෝ.**

   **තේරුම** - සම්ප්‍රයුක්ත වශයෙන් විද්‍යාව භජනය කරන බැවින් ද, විද්‍යා කොටසට අයත් බැවින් ද විජ්ජාභාගී නම් වෙති. සම්ප්‍රයුක්ත වශයෙන් අවිද්‍යාව භජනය කරන බැවින් ද, අවිද්‍යා කොටසට අයත් බැවින් ද අවිජ්ජාභාගී නම් වෙති.

2. **පුන අනජ්ඣොත්තරණ භාවේන කිලේසන්ධකාරං විද්ධංසේතුං සමත්ථතාය විජ්ජූපමා ඒතේසන්ති විජ්ජූපමා, නිස්සේසං විද්ධංසන සමත්ථතාය වජිරං උපමා ඒතේසන්ති වජිරූපමා.**

   **තේරුම** - නැවත යට නොවන ලෙස කෙලෙස් අඳුර නැසීමට සමත් බැවින් විදුලියට උපමා ඇත්තෝ විජ්ජූපම නම් වෙති. නිරවශේෂව කෙලෙසුන් නැසීමට සමත් බැවින් වජ්‍රයට උපමා ඇත්තෝ වජිරූපම නම් වෙති.

3. **බාලේසු ඨිතත්තා බාලා, පණ්ඩිතේසු ඨිතත්තා පණ්ඩිතා, බාලකරත්තා වා බාලා, පණ්ඩිතකරත්තා වා පණ්ඩිතා.**

   **තේරුම** - අනුවණයන් කෙරෙහි පිහිටි බැවින් බාල නම් වෙති. නැණවතුන් කෙරෙහි පිහිටි බැවින් පණ්ඩිත නම් වෙති. අනුවණ බවට පත් කරන බැවින් ද බාල නම් වෙති. නැණවත් බවට පත් කරන බැවින් ද පණ්ඩිත නම් වෙති.

4. **කං - සුඛං හනතී ති කණ්හා, කණ්හාභිජාති හේතුතෝ කණ්හා, සුක්කාභිජාති හේතුතෝ සුක්කා.**

   **තේරුම** - සැපය නසන බැවින් කණ්හ නම් වෙති. දුගති උපතට හේතු බැවින් ද කණ්හ ධර්ම නම් වෙති. සුගති උපතට හේතු බැවින් සුක්ක ධර්ම නම් වෙති.

5. **ඉධ චේව සම්පරායේ ච තාපෙන්තී ති තපනීයා, න තපනීයා අතපනීයා.**

**තේරුම** - මෙලොවත් පරලොවත් තවන බැවින් තපනීය නම් වෙති. නොතවන බැවින් අතපනීය ධර්ම නම් වෙති.

6. **සිරිවඩ්ඪකෝ ධනවඩ්ඪකෝ ති ආදායෝ විය වචන මත්තමේව අධිකාරං කත්වා පවත්තා අධිවචනා නාම, අධිවචනානං පථා අධිවචන පථා.**

**තේරුම** - සිරිවර්ධන ධනවර්ධන ආදිය මෙන් වචන මාත්‍රයම අපේක්ෂා කොට පැවැති නාම අධිවචන නම් වෙති. අධිවචනයට හේතු වන මාර්ගය අධිවචන පථ නම් වෙති.

7. **අභිසංඛරොන්තී ති ඛෝ භික්ඛවේ තස්මා සංඛාරා ති, ඒවං නිද්ධාරෙත්වා සහේතුකං කත්වා වුච්චමානා අභිලාපා නිරුත්ති නාම, නිරුත්තීනං පථා නිරුත්ති පථා.**

**තේරුම** - මහණෙනි! අභිසංකරණය කරන බැවින් සංඛාර නම් වෙති, යයි මෙසේ අර්ථ මතු කොට සහේතුකව කියන වචන නිරුත්ති නම් වෙති. නිරුත්තියට මාර්ගය නිරුත්ති පථ නම් වෙති.

8. **තක්කෝ - විතක්කෝ - සංකප්පෝ ති ඒවං තේන තේන පකාරේන ඤාපනතෝ පඤ්ඤත්ති නාම, පඤ්ඤත්තීනං පථා පඤ්ඤත්ති පථා.**

**තේරුම** - එකම විතර්කය හැඳින්වීමට, තක්කෝ විතක්කෝ සංකප්පෝ යනුවෙන් කළ දේශනාව මෙන් ඒ ඒ ආකාරයෙන් කරුණු වටහා දීමට වචන පැනවීම පඤ්ඤත්ති නම් වෙයි. එයට මාර්ගය පඤ්ඤත්ති පථ නම් වේ.

9. **නාමකරනට්ඨේන නමනට්ඨේන ච නාමං, රුප්පනට්ඨේන රූපං.**

**තේරුම** - නම් කරන බැවින් ද, අර්ථයට නැමෙන බැවින් ද, අර්ථයට නම්වන බැවින් ද නාම නම් වෙයි. ශීතෝෂ්ණාදියෙන් වෙනස් වන අර්ථයෙන් රූප නම් වෙයි.

10. **අවින්දියං වින්දති වින්දියං න වින්දතී ති වා අවිජ්ජා, යෝ තං පස්සති තං තසිතං කරෝතී ති තණ්හා, භවස්ස තණ්හා භව තණ්හා.**

**තේරුම** - නොවිඳිය යුතු අකුසල් විඳින බැවින් ද, විඳිය යුතු කුසල් නොවිඳින බැවින් ද මෝහය අවිජ්ජා නම් වේ. සදොරින් යමක් දැක යමක් ගැන පිපාසිත බවට සැලෙන බවට පත් කරනුයේ තණ්හාව ය. භව සම්පත් පිණිස පිපාසිත බව භව තණ්හාව නම් වේ.

11. **භවෝ වුච්චති සස්සතං, සස්සත වසේන උප්පජ්ජන දිට්ඨී භව දිට්ඨී, විභවෝ වුච්චති උච්ඡේදං, උච්ඡේද වසේන උප්පජ්ජන දිට්ඨී.**

**තේරුම** - භවය යනු සාස්වත යයි. සාස්වත වශයෙන් උපදින දෘෂ්ටිය භව දෘෂ්ටි නම් වේ. විභව යනු උච්ඡේද යයි. උච්ඡේද වශයෙන් උපදින දෘෂ්ටිය විභව දෘෂ්ටිය නම් වේ.

12. **සස්සතෝ අත්තා ච ලෝකෝ චා ති පවත්තා දිට්ඨී සස්සත දිට්ඨී, උච්ඡිජ්ජිස්සතී ති පවත්තා දිට්ඨී උච්ඡේද දිට්ඨී.**

**තේරුම** - ආත්මයත් ලෝකයත් සදාකාලික යයි ගන්නා දෘෂ්ටිය සාස්වත දෘෂ්ටි යයි. මරණින් මතු නැවත නූපදින්නේ යයි පැවැති දෘෂ්ටිය උච්ඡේද දෘෂ්ටිය යි.

13. **අන්තවා ති පවත්තා දිට්ඨී අන්තවා දිට්ඨී, අනන්තවා ති පවත්තා දිට්ඨී අනන්තවා දිට්ඨී.**

**තේරුම** - ආත්මයත් ලෝකයත් කෙළවර සහිත යයි පැවති දෘෂ්ටිය අන්තවා දෘෂ්ටි යයි. කෙළවරක් නැතැයි පැවති දෘෂ්ටිය අනන්තවා දෘෂ්ටිය යි.

14. **පුබ්බන්තං අනුගතා දිට්ඨී පුබ්බන්තානු දිට්ඨී, අපරන්තං අනුගතා දිට්ඨී අපරන්තානු දිට්ඨී.**

**තේරුම** - අතීත භවයන් අනුව පැවති දෘෂ්ටිය පුබ්බන්තානු දෘෂ්ටිය යි. අනාගත භවයන් අනුව පැවති දෘෂ්ටිය අපරන්තානු දෘෂ්ටිය යි.

15. **හිරීයනා හිරි, න හිරිකං අහිරිකං, ඔත්තප්පායනා ඔත්තප්පං, න ඔත්තප්පං අනොත්තප්පං.**

**තේරුම** - පාපයට ලජ්ජා වීම හිරිය නම් වේ, ලජ්ජා නොමැති වීම අහිරික නම් වේ. පාපයට බිය වීම ඔත්තප්පය නම් වේ, බිය නොවීම අනොත්තප්ප නම් වේ.

16. **හිරීයති පාපා ති හිරි, ඔත්තප්පති භායති පාපතෝ ති ඔත්තප්පං.**

**තේරුම** - පාපයෙන් ලැජ්ජා වේනු යි හිරි නම් වේ. පාපයෙන් තැති ගනී, බිය වේනු යි ඔත්තප්ප නම් වේ.

17. **දුක්ඛං වචෝ ඒතස්මිං විප්පටික්කූල ගාහිම්හි විපච්චනික සාතේ අනාදරේ පුග්ගලේ ති දුබ්බචෝ, තස්ස කම්මං දෝවචස්සං තස්ස**

**භාවෝ දෝවචස්සතා - පාපා අස්සද්ධාදයෝ පුග්ගලා ඒතස්ස මිත්තා ති පාප මිත්තෝ - තස්ස භාවෝ පාප මිත්තතා.**

**තේරුම** - අවවාදයට කිපෙන අගෞරව කරන විපරීතව පිළිගන්නා වූ පුද්ගලයා දුර්වචයා ය. ඔහු ගේ ක්‍රියාව දෝවචස්ස නම්. ඔහු ගේ ස්වභාව දෝවචස්සතාව යි. පව්ටු වූ ද, තෙරුවන් නොඅදහන්නා වූ ද මිත්‍රයන් ඇසුරු කරන්නේනු යි පාපමිත්‍ර නම්. ඔහු ගේ ස්වභාවය පාපමිත්‍රතාව යි.

18. **සෝවචස්සතා ච කල්‍යාණමිත්තතා ච වුත්ත පටිපක්ඛ නයේන වේදිතබ්බා.**

**තේරුම** - සෝවචස්සතාව ද, කල්‍යාණමිත්තතාව ද ඉහත කියන ලද්දට ප්‍රතිපක්ෂ නයින් දත යුතුයි.

19. **පඤ්ච පි ආපත්තික්ඛන්ධා ආපත්තියෝ සත්ත පි ආපත්තික්ඛන්ධා ආපත්තියෝ ති ඒවං වුත්තාසු ආපත්තීසු කුසල භාවෝ ආපත්ති කුසලතා - තාහි ආපත්තීහි වුට්ඨානේ කුසල භාවෝ ආපත්ති වුට්ඨාන කුසලතා.**

**තේරුම** - ඇවැත් කඳු පස ද ආපත්තීහු ය. ඇවැත් කඳු සත ද ආපත්තීහුම යයි මෙසේ වදාරා අති ඇවැත් පිළිබඳ දක්ෂ බව ආපත්ති කුසලතාව යි. ඒ ඇවැත්වලින් නැගී සිටීමේ දක්ෂ බව ආපත්ති වුට්ඨාන කුසලතාව යි.

20. **සමාපත්තීසු කුසලභාවෝ සමාපත්ති කුසලතා - සමාපත්තීහි වුට්ඨානේ කුසලභාවෝ සමාපත්ති වුට්ඨාන කුසලතා.**

**තේරුම** - ධ්‍යාන සමාපත්තීන් කෙරෙහි දක්ෂ බව සමාපත්ති කුසලතාවයි. සමාපත්තීන්ගෙන් නැගී සිටීමේ දක්ෂ බව සමාපත්ති වුට්ඨාන කුසලතාව යි.

21. **අට්ඨාරසසු ධාතුසු කුසලභාවෝ ධාතු කුසලතා - තාසං යේව ධාතූනං මනසිකාරේ කුසලභාවෝ මනසිකාර කුසලතා.**

**තේරුම** - අටළොස් (18) ධාතූන් කෙරෙහි දක්ෂ බව ධාතු කුසලතාවයි. ඒ ධාතූන් ගේ ම මනසිකාරයෙහි දක්ෂ බව මනසිකාර කුසලතාව යි.

22. **චක්ඛායතනාදීසු කුසලභාවෝ ආයතන කුසලතා - ද්වාදසංගේ පටිච්ච සමුප්පාදේ කුසලභාවෝ පටිච්ච සමුප්පාද කුසලතා.**

**තේරුම** - චක්ඛායතනාදියෙහි දක්ෂ බව ආයතන කුසලතාවයි. දොළොස් අංගයක් ඇති පටිච්ච සමුප්පාදයෙහි දක්ෂ බව පටිච්ච සමුප්පාද කුසලතාව යි.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. සූත්‍රාන්තික දුක මාතිකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.
2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.
8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**

## 16 වැනි පාඩම

## සූත්‍රාන්ත මාතිකා - 2 වැනි කොටස (23 - 42)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### 23. ඨාන කුසලතා දුකය

1. **ඨාන කුසලතා ච - අට්ඨාන කුසලතා චා'ති.**
2. **ඨාන කුසලතා ච** - ස්ථාන හෙවත් නියමිත හේතුව - ප්‍රත්‍යය - සමුදය - නිදානය - කාරණය පිළිබඳ දක්ෂතාව නම් වූ ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.
3. **අට්ඨාන කුසලතා ච** - අස්ථාන හෙවත් නොම හේතුව - නොම ප්‍රත්‍යය - නොම සමුදය - නොම නිදානය - නොම කාරණය පිළිබඳ දක්ෂතාව නම් වූ අට්ඨාන කුසලතා ධර්මයක් ද ඇත්තේ ය.
4. **ඨාන කුසලතා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් නියමිත හේතුව දැනීමෙහි දක්ෂ වූ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අටෙහි ද, අභිඥා දෙසිතෙහි ද උපදින්නා වූ දස ප්‍රඥා චෛතසිකයෝ ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)
5. **අට්ඨාන කුසලතා ච** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් පොල් ගෙඩියෙන් තල් පැලයක් හට නොගන්නා සේ, චක්ෂු ප්‍රසාදය සෝත විඥානයට හේතුවක් නොවන්නේ ය, යනාදී වශයෙන් අස්ථාන හෙවත් නොම හේතුව දැනීමෙහි සමත් වූ, ඉහත සඳහන් දස ප්‍රඥා චෛතසිකයෝ ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි. )

**ඨාන කුසලතා දුකය යි.**

## 24. අජ්ජව දුකය

6. **අජ්ජවෝ ච - මද්දවෝ චා'ති.**

7. **අජ්ජවෝ ච** - අවංක අකුටිල ඍජු සිත් ඇති පුද්ගලයාගේ ස්වභාවය නම් වූ අජ්ජව ධර්මයක් ඇත්තේ ය.

8. **මද්දවෝ ච** - මෘදු මොළොක් සිත් ඇති පුද්ගලයාගේ ස්වභාවය නම් වූ මද්දව ධර්මයක් ද ඇත්තේ ය.

   මෙහි පළමු පදයට කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා යන චෛතසික දෙක ද, දෙවැනි පදයට කාය මුදුතා චිත්ත මුදුතා යන චෛතසික දෙක ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**අජ්ජව දුකය යි.**

## 25. ඛන්ති දුකය

9. **ඛන්තී ච - සෝරච්චඤ්චා'ති.**

10. **ඛන්තී ච** - අධිවාසන ක්ෂාන්තිය හෙවත් ඉවසීම් ස්වභාව ඇත්තා වූ ඛන්තී නම් ධර්මයක් ඇත්තේ ය.

    **සෝරච්චඤ්ච** - සුරත බව හෙවත් සීලාදී ගුණ ධර්මයෙහි ඇල්ම නම් වූ සෝරච්ච ධර්මයක් ද ඇත්තේ ය.

11. **ඛන්තී ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ඉවසීම නම් වූ අද්වේෂය ප්‍රධාන වූ මහා කුසල මහා ක්‍රියා සිත් සොළොස (16) ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

12. **සෝරච්චඤ්ච** - යන ද්විතීය පදයට වනාහි, සීල චේතනාව ප්‍රධාන කොට ඇත්තා වූ මහා කුසල මහා ක්‍රියා සිත් සොළොස (16) ද, තත් සම්ප්‍රයුක්ත අප්‍රමාණ වර්ජිත චෛතසික සතිස ද ලැබෙති. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**ඛන්තී දුකය යි.**

## 26. සාබල්‍ය දුකය

13. **සාබල්‍යඤ්ච - පටිසන්ථාරෝ චා'ති.**

14. **සාබල්‍යඤ්ච** - මෘදු මොළොක් පරිපූර්ණ වචන කථා කරන්නාගේ ස්වභාවය නම් වූ සාබල්‍යතා ධර්මයක් ද ඇත්තේ ය.

15. **පටිසන්ථාරෝ ච** - ධර්ම ප්‍රතිසන්ථාර - ආමිස ප්‍රතිසන්ථාර නම් වූ පිළිසඳර පැවැත්වීමේ පටිසන්ථාර ධර්මයක් ද ඇත්තේ ය.

16. **සාබල්‍යඤ්ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මෘදු මොළොක් වචන භාවිතයේ දී උපදින්නා වූ මහා කුසල මහා ක්‍රියා සිත් සොළොස (16) ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයෝ ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

17. **පටිසන්ථාරෝ ච** - යන ද්විතීය පදයට වනාහි, කුදු මහත් වත් පිළිවෙත් පිරීමේ දී උපදින ඉහත සඳහන් ධර්මයෝම ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සාබල්‍ය දුකය යි.**

## 27. ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා දුකය

18. **ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා ච - භෝජනේ අමත්තඤ්ඤුතා චා'ති.**

19. **ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා ච** - චක්ඛුරාදී ෂඩේන්ද්‍රියන්හි අසංවර ස්වභාව නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

20. **භෝජනේ අමත්තඤ්ඤුතා ච** - සිවුපස පරිභෝගයෙහි පමණ නොදන්නා ස්වභාව නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

21. **ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සදොර අසංවර වීමේ දී උපදින ලෝභ මූල ද්වේෂ මූල සිත් දසය ද, තත් සම්ප්‍රයුක්ත විචිකිච්ඡා වර්ජිත චෛතසික සවිස්ස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

22. **භෝජනේ අමත්තඤ්ඤුතා ච** - යන ද්විතීය පදයට වනාහි, සිව්පසයෙහි පමණ නොදැනීමේ දී උපදින ලෝභ මූල මෝහ මූල සිත් දසය ද, තත් සම්ප්‍රයුක්ත දෝස චතුෂ්ක වර්ජිත චෛතසික තෙවිස්ස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා දුකය යි.**

## 28. ඉන්ද්‍රියේසු ගුත්තද්වාරතා දුකය

23. **ඉන්ද්‍රියේසු ගුත්තද්වාරතා ච - භෝජනේ මත්තඤ්ඤුතා චා'ති.**

24. **ඉන්ද්‍රියේසු ගුත්තද්වාරතා ච** - චක්ෂුරාදී ෂඩේන්ද්‍රියන් හි සංවර ස්වභාව නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

25. **භෝජනේ මත්තඤ්ඤුතා ච** - සිව්පස පරිභෝගයෙහි පමණ දන්නා බව නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

26. **ඉන්ද්‍රියේසු ගුත්තද්වාරතා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් මහා කුසල මහා ක්‍රියා සිත් සොළොස (16) ද, ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

27. **භෝජනේ මත්තඤ්ඤුතා ච** - යන ද්විතීය පදයට වනාහි, සිව්පස පරිභෝගයේ දී උපදින මහා කුසල මහා ක්‍රියා සිත් සොළොස (16) ද, තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**ඉන්ද්‍රියේසු ගුත්තද්වාරතා දුකය යි.**

## 29. මුට්ඨ සච්ච දුකය

28. **මුට්ඨ සච්චඤ්ච - අසම්පජඤ්ඤඤ්චා'ති.**

29. **මුට්ඨ සච්චඤ්ච** - සිහි මුලා බව නම් වූ මුට්ඨස්සති ධර්මයක් ද ඇත්තේ ය.

30. **අසම්පජඤ්ඤඤ්ච** - සාර්ථක, සත්ප්‍රාය, ගෝචර, අසම්මෝහ නම් වූ සතර සම්‍යග් ප්‍රඥාවෙන් තොර වූ ස්වභාවය නම් වූ අසම්ප්‍රජණ්‍ය ධර්මයක් ද ඇත්තේ ය.

31. **මුට්ඨ සච්චඤ්ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සිහි මුලා වූ පුද්ගලයන්ට උපදින අකුසල් සිත් දොළොස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

32. **අසම්පජඤ්ඤඤ්ච** - යන ද්විතීය පදයට ද ප්‍රඥාවට ප්‍රතිපක්ෂ වූ ඉහත සඳහන් ධර්මයෝම ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**මුට්ඨ සච්ච දුකය යි.**

## 30. සති දුකය

33. **සති ච - සම්පජඤ්ඤඤ්චා'ති.**

34. **සති ච** - ඈත අතීතයේ දී කළ කී දේ නම් වූ චිරකෘතාදිය සිහි කිරීමෙහි සමත් බව නම් වූ ස්මෘති ධර්මයක් ද ඇත්තේ ය.

35. **සම්පජඤ්ඤඤ්ච** - සාර්ථකාදී සතර සම්‍යග් ප්‍රඥාවෙන් සමන්විත බව නම් වූ සම්ප්‍රජඤ්‍ය ධර්මයක් ද ඇත්තේ ය.

36. **සති ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් එකම සති චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු.)

37. **සම්පජඤ්ඤඤ්ච** - යන ද්විතීය පදයට එකම ප්‍රඥා චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සති දුකය යි.**

## 31. පටිසංඛාන දුකය

38. **පටිසංඛාන බලඤ්ච - භාවනා බලඤ්චා'ති.**

39. **පටිසංඛාන බලඤ්ච** - ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් නොසැලෙන බලවත් බවට පත් වූ ප්‍රඥාව නම් වූ පරිසංඛාන බල ධර්මයක් ද ඇත්තේ ය.

40. **භාවනා බලඤ්ච** - නුවණත් වීර්‍ය්‍යත් පෙරටු කොට ගෙන සප්ත බොජ්ඣංග ධර්ම වැඩීමේ දී ලැබෙන්නා වූ නොසැලෙන සුළු භාවනා බල නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

41. **පටිසංඛාන බලඤ්ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ප්‍රඥා චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු.)

42. **භාවනා බලඤ්ච** - යන ද්විතීය පදයට වනාහි, කුසල් සිත් එක්විස්ස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**පටිසංඛාන දුකය යි.**

## 32. සමථ දුකය

43. **සමථෝ ච - විපස්සනා චා'ති.**

44. **සමථෝ ච** - කුසලයට පටහැනි වූ නීවරණාදී උපක්ලේශයන් සංසිඳුවීමෙහි සමත් වූ සමථ නම් ධර්මයක් ද ඇත්තේ ය.

45. **විපස්සනා ච** - ත්‍රෛභූමික නාමරූප සංස්කාරයන් ස්කන්ධාදී වශයෙන් ද, අනිත්‍යාදී වශයෙන් ද විවිධාකාරයෙන් දකින්නා වූ විපස්සනා ඥාණ නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

46. **සමථෝ ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ඒකාග්‍රතා චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු.)

47. **විපස්සනා ච** - යන ද්විතීය පදයට වනාහි, ප්‍රඥා චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සමථ දුකය යි.**

## 33. සමථ නිමිත්ත දුකය

48. **සමථ නිමිත්තඤ්ච - පග්ගාහ නිමිත්තඤ්චා'ති.**

49. **සමථ නිමිත්තඤ්ච** - උපචාර අර්පණා සමාධියට කාරණ වූ සමථ නිමිත්ත නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

50. **පග්ගාහ නිමිත්තඤ්ච** - සම්‍යක් ව්‍යායාමයට කාරණ වූ පග්ගාහ නිමිත්ත නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

51. **සමථ නිමිත්තඤ්ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් පශ්චිම පශ්චිම උපචාර අර්පණා ධ්‍යානයට හේතු වන්නා වූ පූර්ව පූර්ව සමාධිය වශයෙන් ඒකාග්‍රතා චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු.)

52. **පග්ගාහ නිමිත්තඤ්ච** - යන ද්විතීය පදයට වනාහි, පශ්චිම පශ්චිම සම්‍යක් ව්‍යායාම වීර්යයට හේතු වන්නා වූ පූර්ව පූර්ව සම්‍යක් ව්‍යායාම වශයෙන් වීර්යය චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සමථ නිමිත්ත දුකය යි.**

## 34. පග්ගාහ දුකය

53. **පග්ගාහෝ ච - අවික්ඛේපෝ චා'ති.**

54. **පග්ගාහෝ ච** - සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන්ට රුකුල් දෙන්නා වූ, පග්ගාහ වීර්යය නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

55. **අවික්ඛේපෝ ච** - සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන්ට විසිර යා නොදී ඒකාග්‍රතාවෙහි පිහිටුවන්නා වූ අවික්ෂේප නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

56. **පග්ගාහෝ ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් වීර්යය චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු.)

57. **අවික්ඛේපෝ ච** - යන ද්විතීය පදයට ඒකාග්‍රතා චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**පග්ගාහ දුකය යි.**

## 35. සීල විපත්ති දුකය

58. **සීල විපත්ති ච - දිට්ඨි විපත්ති චා'ති.**

59. **සීල විපත්ති ච** - සමාදන්ව ගන්නා ලද ශීලයාගේ සිකපද බිඳීම නම් වූ සීල විපත්ති ධර්මයක් ද ඇත්තේ ය.

60. **දිට්ඨි විපත්ති ච** - විපරීත දෘෂ්ටි නම් වූ දෘෂ්ටි විපත්ති ධර්මයක් ද ඇත්තේ ය.

61. **සීල විපත්ති ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් අකුසල් සිත් දොළොස ද, තත් සම්පයුත්ත චෛතසික සත්විස්ස (27) ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

62. **දිට්ඨි විපත්ති ච** - යන ද්විතීය පදයට වනාහි, දිට්ඨි චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සීල විපත්ති දුකය යි.**

## 36. සීල සම්පදා දුකය

63. **සීල සම්පදා ච - දිට්ඨි සම්පදා චා'ති.**

64. **සීල සම්පදා ච** - අඛණ්ඩ අච්ඡිද්‍රාදී වශයෙන් රක්නා ලද සීල සම්පත්තිය ගේ පරිපූර්ණ භාවය නම් වූ සීල සම්පදා ධර්මයක් ද ඇත්තේ ය.

65. **දිට්ඨි සම්පදා ච** - සම්‍යක් දෘෂ්ටියගේ පරිපූර්ණ භාවය නම් වූ දෘෂ්ටි සම්පදා ධර්මයක් ද ඇත්තේ ය.

66. **සීල සම්පදා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සීල සම්පන්නයාගේ මහා කුසල් මහා ක්‍රියා සිත් සොළොස (16) ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

67. **දිට්ඨි සම්පදා ච** - යන ද්විතීය පදයට වනාහි, සම්‍යක් දෘෂ්ටි නම් වූ ප්‍රඥා චෛතසිකය ලැබෙන්නේ ය. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සීල සම්පදා දුකය යි.**

## 37. සීල විසුද්ධි දුකය

68. **සීල විසුද්ධි ච - දිට්ඨි විසුද්ධි චා'ති.**

69. **සීල විසුද්ධි ච** - සිව් පිරිසිදු සීලයක් ඇති බව හෙවත් පරිපූර්ණ සිල් ඇති බව නම් වූ සීල විසුද්ධි ධර්මයක් ද ඇත්තේ ය.

70. **දිට්ඨි විසුද්ධි ච** - පිරිසිදු සම්‍යක් දෘෂ්ටි ඇති බව හෙවත් සම්‍යක් දෘෂ්ටියගේ පරිපූර්ණ බව නම් වූ දිට්ඨි විසුද්ධි ධර්මයක් ද ඇත්තේ ය.

71. **සීල විසුද්ධි ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් ලෝකෝත්තර සිත් අට ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

72. **දිට්ඨි විසුද්ධි ච** - යන ද්විතීය පදයට වනාහි, කම්මස්සකතා ඤාණය ද, මස්තකප්‍රාප්ත විදර්ශනා ඥාන සංඛ්‍යාත සත්‍යානුලෝමික ඤාණය වශයෙන් ලැබෙන්නා වූ, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා සිත් අටෙහි යෙදෙන්නා වූ ප්‍රඥා චෛතසික අට ද, ලෝකෝත්තර සිත් අටෙහි යෙදෙන්නා වූ ප්‍රඥා චෛතසික අට ද යන ප්‍රඥා චෛතසික සොළොස (16) ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සීල විසුද්ධි දුකය යි.**

## 38. දිට්ඨි විසුද්ධි දුකය

73. **දිට්ඨි විසුද්ධි ඛෝ පන - යථා දිට්ඨිස්ස ච පධානං.**

74. **දිට්ඨි විසුද්ධි ඛෝ පන** - සම්‍යක් දෘෂ්ටියගේ සුවිශේෂ පිරිසිදු බව නම් වූ දිට්ඨි විසුද්ධි ධර්මයක් ද ඇත්තේ ය.

75. **යථා දිට්ඨිස්ස ච පධානං** - විශේෂයෙන් සුවිසුද්ධ වූ සම්‍යක් දෘෂ්ටියට අනුරූප වූ සම්‍යක් ප්‍රධාන වීර්යය නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

76. **දිට්ඨි විසුද්ධි ඛෝ පන** - යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කම්මස්සකතා ඥානය ද, මස්තකප්‍රාප්ත විදර්ශනා ඥාන සංඛ්‍යාත සත්‍යානුලෝමික ඥානය වශයෙන් ලැබෙන්නා වූ, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා සිත් අටෙහි යෙදෙන්නා වූ ප්‍රඥා චෛතසික අට ද, ලෝකෝත්තර සිත් අටෙහි යෙදෙන්නා වූ ප්‍රඥා චෛතසික අට ද යන ප්‍රඥා චෛතසික සොළොස (16) ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

77. **යථා දිට්ඨිස්ස ච පධානං** - යන ද්විතීය පදයට වනාහි, යථෝක්ත සතරාකාර ප්‍රඥාව වශයෙන් ලැබෙන්නා වූ, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා සිත් අටෙහි සහ ලෝකෝත්තර සිත් අටෙහි

යෙදෙන්නා වූ ප්‍රඥා චෛතසික සොළොස (16) ද, ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා සිත් අටෙහි සහ ලෝකෝත්තර සිත් අටෙහි යෙදෙන්නා වූ වීර්යය චෛතසික සොළොස (16) ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**දිට්ඨි විසුද්ධි දුකය යි.**

## 39. සංවේජනීයට්ඨාන දුකය

78. **සංවේගෝ ච සංවේජනීයේසු ඨානේසු - සංවිග්ගස්ස ච යෝනිසෝ පධානන්'ති.**

79. **සංවේගෝ ච සංවේජනීයේසු ඨානේසු** - සංවේග විය යුතු වූ ජාති ජරා ව්‍යාධි මරණාදී කාරණයක් ඇති කල්හි, සංවේග වීම් නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

80. **සංවිග්ගස්ස ච යෝනිසෝ පධානං** - සංවේගයට පත් වූ පුද්ගලයෙකු විසින් නුවණින් වඩන වීර්යය නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

81. **සංවේගෝ ච සංවේජනීයේසු ඨානේසු** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සංවේග වස්තුවක් ඇති කල්හි උපදින්නා වූ ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරෙහි ප්‍රඥා චෛතසික සතර ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

82. **සංවිග්ගස්ස ච යෝනිසෝ පධානං** - යන ද්විතීය පදයට වනාහි, කුසල් සිත් එක්විස්සෙහි ද, ඵල සිත් සතරෙහි ද යෙදුනා වූ වීර්යය චෛතසික පස්විස්ස ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**සංවේජනීයට්ඨාන දුකය යි.**

## 40. අසන්තුට්ඨිතා දුකය

83. **අසන්තුට්ඨිතා ච කුසලේසු ධම්මේසු - අප්පටිවාණිතා ච පධානස්මිං.**

84. **අසන්තුට්ඨිතා ච කුසලේසු ධම්මේසු** - දාන සීල භාවනාදී කුසල ධර්මයන්හි තෘප්තියකට සෑහීමකට පත් නොවීම නම් වූ අසන්තුට්ඨිතා ධර්මයක් ද ඇත්තේ ය.

85. **අප්පටිවාණිතා ච පධානස්මිං** - සිල සමාධි ප්‍රඥාදී කුසල ධර්මයන් වැඩීමෙහි නොපසුබස්නා උත්සාහ ස්වභාව නම් වූ අප්පටිවාණිතා ධර්මයක් ද ඇත්තේ ය.

86. **අසන්තුට්ඨිතා ච කුසලේසු ධම්මේසු** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් කුසල් සිත් එක්විස්ස ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික අටතිස ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

87. **අප්පටිවාණිතා ච පධානස්මිං** - යන ද්විතීය පදයට කුසල් සිත් එක්විස්සෙහි යෙදුනා වූ වීර්යය චෛතසික එක්විස්ස ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**අසන්තුට්ඨිතා දුකය යි.**

## 41. විජ්ජා දුකය

88. **විජ්ජා ච - විමුත්ති චා'ති.**

89. **විජ්ජා ච** - ධර්ම ස්වභාවයන් විවිධාකාරයෙන් විනිවිද දක්නා අර්ථයෙන් විජ්ජා නම් වූ ධර්මයක් ද ඇත්තේ ය.

90. **විමුත්ති ච** - උත්තරී මනුෂ්‍ය ධර්මයන්ට සතුරු වූ නීවරණාදී උපක්ලේශයන් ගෙන් මනාසේ මිදුනා වූ අෂ්ඨ සමාපත්ති නම් වූ විමුක්තියක් ද, සකල ක්ලේශයන් කෙරෙන් සර්වාකාරයෙන් මිදුනා වූ නිර්වාණ ධාතුව නම් වූ විමුක්ති ධර්මයක් ද ඇත්තේ ය.

91. **විජ්ජා ච** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් පූර්වේනිවාසානුස්මෘති ඥානය ද, දිව්‍යචක්ෂුරභි ඥානය ද, ආශ්‍රවක්ෂයකර ඥානය ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු.)

92. **විමුත්ති ච** - යන ද්විතීය පදයට වනාහි, මහත්ගත කුසල් සිත් නවය ද, ක්‍රියා සිත් නවය ද, තත් සම්ප්‍රයුක්ත චෛතසික පන්තිස ද, නිර්වාණ ධාතුව ද ලැබෙන්නාහ. (ස්වරූප උදුරනු. ආදිලබ්ධ නාම දුකයකි. සප්පදේස දුකයකි.)

**විජ්ජා දුකය යි.**

## 42. ඛයේ ඤාණ දුකය

93. **ඛයේ ඤාණං - අනුප්පාදේ ඤාණන්'ති.**

94. **ඛයේ ඤාණං** - සමුච්ඡේද ප්‍රහාණයෙන් කෙලෙසුන් ගෙවා දැමීමට සමත් වූ මාර්ග ඥාන නම් වූ ඛයේ ඤාණ ධර්මයක් ද ඇත්තේ ය.

95. **අනුප්පාදේ ඤාණං** - සතර මාර්ග ඥානයෙන් නැසූ කෙලෙසුන් නැවත නූපදනා බවට පමුණුවන්නා වූ සතර ඵලයෙහි යෙදුනා වූ ප්‍රඥාව නම් වූ අනුප්පාදේ ඤාණ ධර්මයක් ද ඇත්තේ ය.

96. **ඛයේ ඤාණං** - යන ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර මාර්ග සිත්හි යෙදුනා වූ ප්‍රඥා චෛතසික සතර ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම සංස්කාරස්කන්ධයකි. ආයතන වශයෙන් එකම ධම්මායතනයකි. ධාතු වශයෙන් එකම ධම්ම ධාතුවකි. ආර්ය සත්‍ය වශයෙන් සතර මාර්ග ඥානය එකම මාර්ග සත්‍යයකි.

97. **අනුප්පාදේ ඤාණං** - යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථ හෙවත් ස්වරූපාර්ථ වශයෙන් සතර ඵල සිත්හි යෙදුනා වූ ප්‍රඥා චෛතසික සතර ලැබෙන්නාහ. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් එකම සංස්කාරස්කන්ධයකි. ආයතන වශයෙන් එකම ධම්මායතනයකි. ධාතු වශයෙන් එකම ධම්ම ධාතුවකි. සතර ඵල ඤාණයෝ සත්‍ය විනිර්මුක්ත වන්නාහ.

98. මේ ශබ්දාවලිය හෙවත් ඛයේ ඤාණ දුකය, පරමාර්ථ ධර්ම දෙපදයකින් වදාළ බැවින් දුක නම් වන්නේ ය. මුල් පදයෙන් ලත් නම් ඇති බැවින් ආදිලබ්ධ නාම දුක නම් වන්නේ ය. මාර්ග ඵල ඥාන පමණක් ලැබෙන බැවින් සප්පදේස දුක නම් වන්නේ ය.

**ඛයේ ඤාණ දුකය යි.**

## සූත්‍රාන්ත මාතෘකා නිර්වචන හෙවත් අර්ථකථා ටීකාගත විවරණ

## (02 වැනි කොටස)

23. **තස්මිං තස්මිං ඨානේ කුසලභාවෝ ඨාන කුසලතා, අට්ඨානේ කුසලභාවෝ අට්ඨාන කුසලතා** - ඒ ඒ හේතු කාරණයෙහි ලා දක්ෂභාවය ඨාන කුසලතාව යි. අහේතු අකාරණයෙහි ලා දක්ෂභාවය අට්ඨාන කුසලතාව යි.

24. **උජුභාවෝ අජ්ජවෝ, මුදුභාවෝ මද්දවෝ** - තිදොර පැවැත්මෙහි ඍජු බව අජ්ජව යයි. මෘදු මොළොක් බව මද්දවය යි.

25. **අධිවාසන සංඛාතෝ ඛමනභාවෝ ඛන්ති, සුරතභාවෝ සෝරච්චං** - අධිවාසන නම් වූ ඉවසන සුළු බව ඛන්ති යයි. පිරිසිදු සුසිල්වත් බව සෝරච්ච යයි.

26. **සම්මෝදක මුදුභාව සංඛාතෝ සඛිලභාවෝ සාඛල්‍යං, ධම්මාමිසේහි පටිසන්ථරණං පටිසන්ථාරෝ** - සතුටු මුහුණින් යුතු වූ සාදර ගෞරව පිරිපුන් වචන ඇති බව සාඛල්‍ය යයි. ධර්මයෙන් ආමිසයෙන් සංග්‍රහ කරන බව පටිසන්ථාර යයි.

27. **ඉන්ද්‍රිය සංවර භේද සංඛාතෝ මනච්ඡට්ඨේසු ඉන්ද්‍රියේසු අගුත්තද්වාර භාවෝ ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා, පටිග්ගහණ පරිභෝග වසේන මත්තං අජානන භාවෝ භෝජනේ අමත්තඤ්ඤුතා** - ඉන්ද්‍රිය සංවරය බිඳීම නම් වූ මනායතනය සවැනි කොට ඇති ඉන්ද්‍රියයන් කෙරෙහි දොර නොවැසූ බව ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතාව යි. සිවුපසය පිළිගැනීමෙහි ද, පරිභෝගයෙහි ද පමණ නොදන්නා බව භෝජනේ අමත්තඤ්ඤුතාව යි.

28. **ඉන්ද්‍රියේසු ගුත්තද්වාරතා ච භෝජනේ මත්තඤ්ඤුතා ච, වුත්ත පටිපක්ඛ නයේන වේදිතබ්බා** - ඉන්ද්‍රියේසු ගුත්තද්වාරතාව ද, භෝජනේ මත්තඤ්ඤුතාව ද ඉහත කියන ලද්දට ප්‍රතිපක්ෂ නයින් දත යුතුය.

29. **සති විප්පවාස සංඛාතෝ මුට්ඨස්සතිභාවෝ මුටඨ සච්චං, අසම්පජානන භාවෝ අසම්පජඤ්ඤං** - සිහි මුළා බව නම් වූ මුට්ඨස්සති බව මුට්ඨ සච්ච නම් වේ. නුවණින් මෙනෙහි නොකරන බව අසම්පජඤ්ඤ නම් වේ.

30. **සරතී ති සති, සම්පජානාතී ති සම්පජඤ්ඤං** - ඈත අතීතයේ කළ කී දේ පවා සිහි කෙරේනු යි සති නම් වේ. සාර්ථක ආදී සතරාකාරයෙන් නුවණින් මෙනෙහි කරන්නේනු යි සම්පජඤ්ඤ නම් වේ.

31. **අප්පටිසංඛානේ අකම්පනට්ඨේන පටිසංඛාන සංඛාතං බලං පටිසංඛාන බලං, විරියසීසේන සත්තබොජ්ඣංගේ භාවෙන්තස්ස උප්පන්නං බලං භාවනා බලං** - ප්‍රත්‍යවේක්ෂාවෙහි නොසැලෙන බව නම් වූ බලය පටිසංඛාන බලය යි. වීර්යය ප්‍රධාන කොට සප්ත බොජ්ඣංග වඩන්නාගේ බලය භාවනා බලය නම් වේ.

32. **පච්චනික ධම්මේ සමේතී ති සමථෝ, අනිච්චාදී වසේන විවිධේන ආකාරේන පස්සතී ති විපස්සනා** - චිත්ත සමාධියට පටහැනි වූ නීවරණාදී උපක්ලේශ ධර්ම සංසිඳුවන්නේ නු යි සමථ නම් වේ. අනිත්‍යාදී වශයෙන් විවිධාකාරයෙන් නුවණින් බලන්නේනු යි විපස්සනා නම් වේ.

33. **සමථෝ ච තං ආකාරං ගහෙත්වා පුන පවත්තේතබ්බස්ස සමථස්ස නිමිත්තං චාති, සමථ නිමිත්තං, පග්ගහනිමිත්තේ පි ඒසේව නයෝ** - සමථය වූයේ ද, ඒ ආකාරය ගෙන නැවත පැවැත්විය යුතු සමථයට නිමිත්ත වූයේ ද එයම නුයි සමථ නිමිත්ත නම් වේ. පග්ගහ නිමිත්තෙහි ද මේ ක්‍රමයම යි.

34. **සම්පයුත්ත ධම්මේ පග්ගණ්හාතී ති පග්ගාහෝ, න වික්ඛිපතී ති අවික්ඛේපෝ** - සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන්ට රුකුල් දී ඔසවා තබන්නේ නුයි පග්ගාහ නම් වේ. චිත්ත චෛතසික ධර්මයන් විසිර යාමට ඉඩ නොදෙන්නේ නුයි අවික්ඛේප නම් වේ.

35. **සීල විනාසකා අසංවර සංඛාතා සීලස්ස විපත්ති, සීල විපත්ති, සම්මා දිට්ඨී විනාසකා මිච්ඡා දිට්ඨී සංඛාතා දිට්ඨියා විපත්ති දිට්ඨී විපත්ති** - සීලය නසන අසංවර බව නම් වූ විපත සීල විපත්ති යයි. සම්‍යක් දෘෂ්ටිය නසන මිසදිටු බව නම් වූ විපත දිට්ඨී විපත්ති යයි.

36. **සෝරච්චමේව සීලස්ස සම්පාදනතෝ සීල පරිපූරණතෝ සීලස්ස සම්පදා සීල සම්පදා, දිට්ඨී පරිපූරිභූතං ඤාණං දිට්ඨියා සම්පදා ති දිට්ඨිසම්පදා** - සුරත බවම සංවර බවම සීලය සම්පාදනය කරන බැවින්, සීලය පුරණ බැවින් සීල සම්පදා නම් වේ. සම්මා දිට්ඨියා ගේ පිරිපුන් බව නම් වූ ඤාණයම දිට්ඨී සම්පදා නම් වේ.

37. **විසුද්ධිභාවං සම්පත්තා සීලසංඛාතා සීලස්ස විසුද්ධි සීලවිසුද්ධි, නිබ්බාන සංඛාතං විසුද්ධිං පාපේතුං සමත්ථා දස්සන සංඛාතා දිට්ඨියා විසුද්ධි දිට්ඨිවිසුද්ධි** - විසුද්ධ බවට පැමිණියා වූ සීලය ම සීල විසුද්ධි නම් වේ. නිර්වාණ සංඛ්‍යාත විසුද්ධියට පැමිණ වීමට සමත් වූ ඥාන දර්ශනය ම දිට්ඨි විසුද්ධි නම් වේ.

38. දිට්ඨි විසුද්ධි දුකයෙහි ඥානයත් වීර්යයත් දෙක යෙදෙති.

39. සංවේජනීය දුකයෙහි ද ඥානයත් වීර්යයත් දෙක ගැනෙති.

40. අසන්තුට්ඨිතා දුකයෙහි සියලු කුසල චිත්ත චෛතසික ද දෙවැනි පදයෙන් වීර්යය ද ගැනෙති.

41. විජ්ජා දුකයෙහි ත්‍රි විද්‍යාවත්, දෙවැනි පදයෙන් මහග්ගත කුසල ක්‍රියා චිත්ත චෛතසිකත් නිර්වාණයත් ගැනෙති.

42. ඛයේ ඤාණ දුකයෙහි, මාර්ග ඥාන සතර හා ඵල ඥාන සතර ලැබෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. සූත්‍රන්ත මාතෘකා විදර්ශනා භාවනාවේ දී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන - සංඛත - සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහන - නිදාන - සංයෝග - පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ - විවේක - අසංඛත - අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාන - හේතු - දස්සන - ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

8. මාගේ භාවනාමය කුසලය මෙම චතුරාර්ය සත්‍යය ධර්මය සුවසේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

**සූත්‍රාන්ත මාතෘකාව සමාප්ත යි.**

**සාධු ! සාධු !! සාධු !!!**